සති අග
# අරුණ

2021 සැප්තැම්බර් 05 ඉරිදා | තෙවැනි කාණ්ඩය 47 කලාපය | මිල ~~රු 90.00~~ රු 80.00 | www.aruna.lk




'මැණිකේ' හමුවුණේ අහම්බෙන්

පිනිපලස 8-9 පිටු



09 පිටුව

අවුරුදු පනහක් සිරිකොත රකින ධනපාල 11 පිටුව



පින්නවල සුරංගිට අලි බබාලා දෙන්නයි

සිදෙස 01 පිටුව



සුදුම සුදු සුරූපී ජැකොලයින් කළුම කළු කතාවක පැටලෙයි

# 18000ක් ගුරුවරු වෙන වැඩවල

## මසකට බිලියනයක වැටුප අධ්‍යාපන අමාත්‍යාංශයෙන්

■ ඉන්දික ශ්‍රී අරවින්ද

ගුරුවරුන් 18,000ක් පමණ මේ වන විට වෙනත් රාජකාරීන් හෙවත් සක්‍රිය සේවය සඳහා නිදහස් කර ඇති බව අධ්‍යාපන අමාත්‍යංශය පවසයි. 02 වැනි පිටුවට ››

# පාලන මිලට එරෙහිව හාල් හිඟයක් හදයි

## වී කෙටීම අඩු කරයි

## හාල් කඩේට නොයවා ලොරි ගැරේජ්වලට

## යන්ත්‍ර අක්‍රිය කර සේවකයන්ට කොවිඩ් හදයි

## නාඩු කිලෝවකට 110ක් ඉල්ලයි

■ චමින්ද සේනාරත්න

සහල් මිල සඳහා පසුගිය බ්‍රහස්පතින්දා (02 වැනිදා) රාත්‍රියේ නිකුත් කළ ගැසට් නිවේදනයත් සමග ප්‍රධාන සහල් මෝල්වලින් දෛනිකව නිකුත් කරනු ලබන සහල් තොග ප්‍රමාණය සීමා කිරීමට සැලසුම් කර ඇත.

පසුගිය සිකුරාදා පෙරවරුවේ පොළොන්නරුවේ ප්‍රධාන හෝටලයක පැවැති රහසිගත සාකච්ඡාවේදී දිස්ත්‍රික්කයේ ප්‍රධාන මෝල් හිමියන් එම එකඟත්වයට පැමිණ තිබේ.

එහිදී දැනට දෛනිකව නිෂ්පාදනය කරනු ලබන සහල් ප්‍රමාණය තුනෙන් එකකට අඩු කිරීමට තීරණය කර තිබේ.

02 වැනි පිටුවට ››

# 13 දා අලුයම 4 දක්වා නිරෝධායන ඇඳිරිනීතිය

# ඉදිරි මාස හයට රට සීනි රට තුළ


■ චමින්ද සේනාරත්න

ආනයනය කර ඇති සීනි තොග තවත් මාස හයකට ආසන්න කාලයකට මෙරටට ප්‍රමාණවත් බව එම සංඛ්‍යා ලේඛන විශ්ලේෂණ කිරීමේ දී හෙළි වේ.

2020 ඔක්තෝබර් 12 වැනිදා වන විට රුපියල් 50ක බදු මුදල යටතේ සීනි මෙට්‍රික් ටොන් අසූඅටදහස් හත්සිය හතළිස් අටක් (88748) ආනයනය කර තිබිණි. පසුගිය වසරේ ඔක්තෝබර් 14 වැනිදා සිට එතෙක් රුපියල් 50කට තිබූ බදු මුදල සත 25 දක්වා අඩු කිරීමෙන් පසු සීනි ආනයනය තහනම් කළ පසුගිය ජූනි 21 වැනිදා තෙක් මෙට්‍රික් ටොන් පන්ලක්ෂ අසූ හතර දහසක් (584000) ආනයනය කර ඇත.

02 වැනි පිටුවට ››

## කළු කඩ වටලන නිවුන්හැල්ල කවුද



10 පිටුව

# කොරෝනාවට ගොදුරු වූ ව්‍යාපාර නංවන්න ණය සහන දෙසැම්බර් 31 දක්වා

■ නයන තරංග ගමගේ

කොවිඩ් -19 වසංගතයත් සමගම අර්බුදයට පත්වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබාදී ඇති ණය අත්හිටුවීමේ සහනය 2021 දෙසැම්බර් 31 දක්වා තවත් මාස තුනකින් දීර්ඝ කර තිබේ. කොවිඩ් -19 වසංගතයේ නව ව්‍යාප්තිය සහ අදාළ බොහෝ පාර්ශ්වයන්ගේ ඉල්ලීම් සලකා බැලීමෙන් පසු මෙම දීර්ඝ කිරීම සිදු කළ බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.

02 වැනි පිටුවට ››

## පාඨකයන්ට දැනුම් දීමයි

මෙවර ඔබ අතට පත් වන 'වරුණ' අතිරේකයත් දිනය ලෙස සඳහන්ව ඇත්තේ 2021 අගෝස්තු 22 ලෙසය. ඊට හේතුව රට පුරා නිරෝධායන ඇඳිරි නීතිය පැනවීමට පෙර වරුණ අතිරේකය මුද්‍රණය කර තිබීමය.

තවද 'කිරණ' හා 'අරණ' අතිරේක මෙවර සතිඅග 'අරුණ' සමග බෙදා නොහරින බව කාරුණිකව දැනුම් දෙමු. නිරෝධායන ඇඳිරි නීතිය ඉවත් කළ පසුව සුපුරුදු පරිදි එම අතිරේක දෙක පුවත්පත සමග යළි ඔබ අතට පත් කෙරෙනු ඇත.






# කොවිඩ් මර්දනයට සමගාමීව අභ්‍යන්තර ආරක්ෂාව ගැන පොලිසිය සීරුවෙන්

■ ඉන්දික ශ්‍රී අරවින්ද

කොවිඩ් වසංගතය මර්දන කටයුතු මෙන්ම සියලුම ක්‍රියාකාරකම් සිදු කරන අතරතුර අභ්‍යන්තර ආරක්ෂාව සඳහා ද වැඩි අවධානයක් යොමු කරන ලෙස පොලිස්පති චන්දන වික්‍රමරත්න සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු සහ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට මහජන ආරක්ෂක අමාත්‍ය රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර දැනුම් දී ඇත.

එල්ටීටීඊ සංවිධානය යනු ත්‍රස්තවාදී සංවිධානයක් වන නිසා එය පහසුවෙන් හඳුනා ගැනීමට හැකියාව තිබූ නමුත් අයි.එස්.අයි.එස්. යනු සංවිධානයක් නොව මතවාදයක් වන බැවින් එය හඳුනාගැනීම පහසු කරුණක් නොවන බව අමාත්‍යවරයා මෙහි දී ඉහළ නිලධාරීන්ට දන්වා තිබේ.

02 වැනි පිටුවට ››

හසන්ත විජේනායකගේ හුරේරා




ෆයිසර් එන්නත ලබාදීම හමුදාවට පවරපු එකට පිළුම්බි එක විරුද්ධයිලු

ඇයි, හමුදාවෙ හත්මුතු පරම්පරාවලටත් ෆයිසර් විදලි කියල දොස්තර මහත්තුරු බයවෙලාද සර්

# කොවිඩ් නිසා රටට එන්න ඉල්ලූ ලාංකිකයන් සියල්ලම ගෙනැවිත්

■ නයන තරංග ගමගේ

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විදේශ අමාත්‍යාංශය හරහා මෙරටට යළි පැමිණීමට ඉල්ලුම් කර තිබූ විදේශගත ශ්‍රී ලාංකිකයන් සියලුදෙනාම මේ වන විට ගෙන්වාගෙන අවසන් බව කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය ඇමැති තාරක බාලසූරිය පවසයි.



02 වැනි පිටුවට ››






# මෙරට ශාකවලින් බාගයක්ම තර්ජනයකට ලක් වෙලා

## ශාක 128ක් දකින්නවත් නෑ

## ආවේනික මිරිදිය මත්ස්‍ය 61න් 51ක්ම වඳවීමේ තර්ජනයට

■ සාලිය කුමාර ගුණසේකර

මෙරට ශාක විශේෂ 3087ක් අතුරින් 1496ක් තර්ජනයට ලක්ව ඇතැයි 2021 ජාතික රතු දත්ත ලැයිස්තුව මගින් අනාවරණය කර ඇත.

02 වැනි පිටුවට ››

# එළවළු හා පලතුරු ප්‍රවාහනයට ප්ලාස්ටික් කාඩ්බෝඩ් කූඩ ලක්ෂ එකහමාරක් දීලා ඒත් භාවිත කරන්නේ ගොනි

■ චමින්ද සේනාරත්න

එළවළු හා පලතුරු ප්‍රවාහනය කිරීම සඳහා ගොවීන්ට 2018 වර්ෂය වන විට ප්ලාස්ටික් හා කාඩ්බෝඩ් කූඩ එක්ලක්ෂ පනස්හයදහස් හත්සියපනස් දෙකක් (156752) ලබා දී ඇති අතර ඉන් එක්ලක්ෂ පහළොස් දහස් හත්සිය පනස් දෙකක් (115752) ප්ලාස්ටික් කූඩ වේ.

02 වැනි පිටුවට ››

# ආණ්ඩුවේ ඉස්පිරිතාලවලට දේශීය සේලයින්

## මාස 3කට එකවර ගනියි

■ උදයජීව ඒකනායක

විදේශයන්ගෙන් රටවලින් 'සේලයින්' ගෙන්වීම නතර කර ප්‍රථමවරට දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද 'සේලයින්' සෞඛ්‍ය අමාත්‍යාංශය මාස තුනක කාලයක් සඳහා මූලිකව ලබා ගැනීමට තීරණය කර ඇත.

මාසිකව 'සේලයින්' බෝතල මිලියන හත බැගින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය ලබා ගැනීමට නියමිතය. දිවයින පුරා පිහිටි රෝහල් සඳහා දෛනිකව 'සේලයින්' බෝතල් 48,000ක් අවශ්‍ය වෙයි. මහනුවර පල්ලෙකැලේ පිහිටි කෙලුන් සයන්ස් පෞද්ගලික සමාගම මෙම සේලයින් නිෂ්පාදනය සිදු කරයි.

නිෂ්පාදනය කරන ලද සේලයින්වල තත්ත්ව පරීක්ෂාව මාස දෙකක පමණ කාලයක් සිදු කිරීමෙන් පසු සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දීම සිදු කරන බව නිෂ්පාදන සමාගම ප්‍රකාශ කරයි. මෙතෙක් කල් සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය සේලයින් ගෙන්වූයේ විදේශීය රටවලිනි. ඒත් සේලයින් බෝතලයක් රුපියල් 73ක් වැනි මුදලකට ආනයනය කළ අතර ඊට වඩා අඩු මුදලකට දේශීය නිෂ්පාදිත සේලයින් වෛද්‍ය සැපයුම් අංශය ලබා ගැනීමට සාකච්ඡා කර තිබේ. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ සමග ගිවිසුම් ගතව මෙම පෞද්ගලික සමාගම සේලයින් නිෂ්පාදනය ආරම්භ කර තිබේ.

# අත්‍යවශ්‍ය ආහාර ගැසට්ටුවට

# සජබ - ජජාප - ටීඑන්ඒ විරුද්ධව ඡන්දය

■ අජිත් අලහකෝන්

අත්‍යවශ්‍ය ආහාර සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් රටපුරා පනවන ලද හදිසි නීතියට හෙට (06 වැනිද) පාර්ලිමේන්තුවේ දී විරෝධය දැක්වීමට විපක්ෂයේ සියලු පක්ෂ තීරණය කර ඇත.

හදිසි නීතිය සම්මත කිරීම සඳහා හෙට පෙරවරු 10.00 සිට පස්වරු 4.00 දක්වා පාර්ලිමේන්තුවේ දී විවාද කර ඡන්දය විමසීමක් සිදු කිරීමට නියමිතය.

මෙම ඡන්ද විමසීමේ දී තම පක්ෂය හදිසි නීතියට විරුද්දව ඡන්දය ප්‍රකාශ කරන බව කී විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදාහැරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට පාරිභෝගික කටයුතු අධිකාරිය සහ වෙනත් නීති තිබියදී ජනාධිපතිවරයා හදිසි නීතිය පැනවූයේ ඉදිරියේ දී මතුවන ජනතා විරෝධය මර්දනය කිරීමට බව පැවසුවේය.

හදිසි නීතියට විරුද්ධව ඡන්දය දීමට දෙමළ ජාතික සන්ධානයද මේ වන විට තීරණය කර ඇත. ජවිපෙ ප්‍රමුඛ ජාතික ජන බලවේගයද හදිසි නීතියට විරෝධය දක්වා ඇත. විරුද්ධව ඡන්දය දෙනවාද නැතිනම් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිනවාද යන්න සම්බන්ධයෙන් පක්ෂය විසින් සාකච්ඡා කර තීරණයක් ගන්නා බව ජ.වි.පෙ නායක අනුර කුමාර දිසානායක පැවැසීය.

එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී රනිල් වික්‍රමසිංහද හදිසි නීතියට විරුද්ධ වනු ඇතැයි එම පක්ෂයේ ප්‍රකාශකයෙක් පැවැසීය. හදිසි නීතිය සම්බන්ධ ඡන්ද විමසීම හෙට සවස 4.30ට සිදු කිරීමට නියමිතය.




1 පිටුවෙන්....

## පාලන මිලට...

ඒ අනුව එම මෝල්වල සහල් නිෂ්පාදනය කරනු ලබන යන්ත්‍ර අක්‍රිය වී ඇති බවට හැඟවීමට ක්‍රියාවිරහිත කිරීමටද තීරණය කර ඇත. ඊට අමතරව එම යන්ත්‍රවල සේවය කරනු ලබන සේවකයන්ට කොවිඩ් වැලැඳී ඇති බව හඟවා නිවාඩු ලබාදී නිවෙස්වලට යවා තිබේ. ඊට අමතරව දෛනික සහල් තොග බෙදාහැරීමද සියයට දහයත් තිහත් දක්වා අඩු කිරීමට තීරණය කර ඇත. ඒ අනුව සහල් ප්‍රවාහනය කරනු ලබන ලොරි රථ ගරාජ්වලට යොමු කර අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කිරීමට තීරණය කර තිබේ.

කෙසේ වෙතත් මෙම සහල් මෝල් හිමියන්ගේ ඉල්ලීම වී ඇත්තේ දැනට රුපියල් 98කට අලෙවි කළ යුතු බවට ගැසට් නිවේදනය කළ නාඩු සහල් කිලෝග්‍රෑමයකට රුපියල් 110ක් ලෙස ඉහළ දමන ලෙසටය.

පොළොන්නරුවේ පමණක් පිහිටි ප්‍රධාන සහල් මෝල් හතක වී කිලෝ ලක්ෂ තිහක් දෛනිකව අඹරිය හැකිය. ඉන් ප්‍රධාන මෝලක පමණක් වී කිලෝ ලක්ෂ 12ක්ද, තවත් දෙකක ලක්ෂ හය බැගින් නිෂ්පාදනය කළ හැකි බවද සඳහන් වේ.

## කොරෝනාවට ගොදුරු...

මෙම ණය අත්හිටුවීමේ සහනය 2021 අගෝස්තු 31 දිනෙන් අවසන් වීමට නියමිතව තිබිණි.

දැනට පවතින කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ව්‍යාපාර සහ පුද්ගලයන් මුහුණ දෙන අභියෝගයන්ට පහසුකම් සැලසීමේ අරමුණින්, මහා බැංකුව පසුගිය බදාදා (01 වැනිදා) නව චක්‍ර ලේඛනයක් මගින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට මෙලෙස ණය වාරික දීර්ඝ කරන ලෙස ඉල්ලා දැනුම්දී ඇත. කෙසේවෙතත් සංචාරක ක්ෂේත්‍රය සඳහා ණය ලබා ගෙන ඇති ව්‍යාපාර සහ පුද්ගලයන් වෙනුවෙන් වෙනම ලබාදී ඇති සහනවලට මෙම දීර්ඝ කිරීම අදාළ නොවේ. සංචාරක අංශයේ ණය අත්හිටුවීමේ සහනය 2021 සැප්තැම්බර් 30 දයින් අවසන් වීමට නියමිතය.

## කොවිඩ් නිසා...

ඔහු මේ බව අනාවරණය කළේ පසුගියද පාර්ලිමේන්තුවේ දී සජබ පාර්ලිමේන්තු මන්ත්‍රී ඉම්තියාස් බාකිර් මාකර් විමසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

මෙහිදී හෙළි කෙරුණු ආකාරයට මෙරට කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තවීම ආරම්භ වීමෙන් පසු 2020 මාර්තු 26 වැනිද සිට 2021 ජූලි 21වැනිද දක්වා විදේශ කටයුතු අමාත්‍යාංශයේ 'Contact Sri Lanka' වැඩසටහන යටතේ මෙරටට පැමිණීමට ලියාපදිංචිවී ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව 61,603කි. මෙම පිරිස අතුරින් 52,348ක් විදේශගත ශ්‍රමිකයන් සහ ඔවුන්ගෙන් යැපෙන්නන් වන අතර 5902 දෙනකු කෙටිකාලීන වීසා බලපත්‍ර යටතේ විදේශගත වූවන්ය. ඉතිරි 3352ක් වූ පිරිස අධ්‍යාපන කටයුතු සඳහා විදේශගතවූවෝ වෙති. රාජ්‍ය ඇමැතිවරයා හෙළිකළ ආකාරයට රජය විසින් මෙම සියලුම ඉල්ලුම්කරුවන් පසුගිය ජූලි 31වැනිද වනවිට මෙරටට ගෙන්වාගෙන ඇත.

මේ අතර පසුගිය ජූලි 15වැනිද සිට පවතින කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියේ සීඝ්‍රතාව සැලකිල්ලට ගනිමින් ඉන්දියාව, දකුණු අප්‍රිකාව සහ දකුණු ඇමෙරිකානු රටවල රැඳී සිටින ශ්‍රී ලාංකිකයන්ට සහ වෙනත් පුද්ගලයන්ට මෙරටට පැමිණීම සීමා කර ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශය, සිවිල් ගුවන් සේවා අධිකාරිය සහ විදේශ අමාත්‍යාංශය වැඩිදුරටත් සාකච්ඡා කොට ඉදිරියේදී එම රටවල සිට මෙරටට පැමිණෙන්නන්ට පහසුකම් සැපයීමට සූදනමින් සිටින බව රාජ්‍ය ඇමැතිවරයා වැඩිදුරටත් පාර්ලිමේන්තුවට දැනුම්දී ඇත.

## 18000ක්...

මෙලෙස සක්‍රිය සේවය සඳහා නිදහස් කර ඇති ගුරුවරුන් 18,000ටම මේ වනවිටත් වැටුප් ගෙවනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යංශයේ සහ පළාත් අධ්‍යාපන අමාත්‍යංශ වැය ශීර්ෂය යටතේ වන අතර මේ සඳහා මසකට සියලුම දීමනා සහිතව රුපියල් බිලියනයකට වැඩි මුදලක් අධ්‍යාපන අමාත්‍යංශය වැය කරයි.

එම ගුරුවරුන් මේ වනවිට වෘත්තීය සමිති සංගම්හි ක්‍රියාකාරී සාමාජිකයන් ලෙසත්,වෙනත් දේශපාලන පක්ෂයන්හි ක්‍රියාකාරී සාමාජිකයන් ලෙසත්,අමාත්‍යවරුන්ගේ මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මහජන සහ පෞද්ගලීක සම්බන්ධීකරණ කාර්ය මණ්ඩල නිලධාරීන් ලෙසත්,ශිෂ්‍ය භට පුහුණුකරුවන් ලෙසත්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලත් සේවය සඳහා නිදහස් කර තිබේ.

මේ නිසා ජාතික පාසල් මෙන්ම පළාත් පාසල්හි දැඩි ගුරු හිඟයක් පවතින අතර රජය විසින් පසුගිය කාලයේ දී බඳවාගත් ලැබූ උපාධිධාරීන් 50,000න් 20,000ක්ම ගුරුවරුන් ලෙස අනුයුක්ත කිරීමට යෝජනා වී තිබුණි.

ඒ සඳහා දැනටමත් අවශ්‍ය අනුමැතිය ලැබී ඇති බව අධ්‍යාපන අමාත්‍යංශයේ උසස් නිලධාරියකු ප්‍රකාශ කළේ.

මෙලෙස ගුරුවරු සක්‍රිය සේවය සඳහා නිදහස් කිරීම සම්බන්ධව එවකට හිටපු අධ්‍යාපන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම විසින් සිදු කළ සමීක්ෂණයකදී අනාවරණය වී තිබුණේ නියත වශයෙන්ම පූර්ණකාලීනව ගුරුවරු 16,000ක පිරිසක් සක්‍රිය සේවය සඳහා නිදහස් කර ඇති බවයි.

මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යංශ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා ප්‍රකාශ කළේ යම්කිසි වෘත්තීය සමිතියක ක්‍රියාකාරී සාමාජිකයන් දහසකට (1000) වඩා සිටිනම් ඒ සඳහා ගුරුවරු නිදහස් කළ යුතුව ඇති බවයි.

කෙසේ වෙතත් මෙලෙස ගුරුවරු සක්‍රිය සේවය සඳහා නිදහස් කිරීම සම්බන්ධව පසු විපරමක් කිරීමට සූදානම් බව ද ඔහු පැවසීය.

## ඉදිරි මාස...

මේ අනුව මෙරට මාසික සීනි පරිභෝජනය මෙට්‍රික් ටොන් තිස්පන්දහසක් (35000) පමණ පසුගිය වසරේ ඔක්තෝබර් සිට ආනයනය කර ඇති මුළු සීනි තොගය මෙට්‍රික් ටොන් හයලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය හතළිස් අටක් (672748) වන අතර එම ප්‍රමාණය මාස දහනවයකට ආසන්න වේ. එය මෙරට සීනි සමාගම් හතරක් නිෂ්පාදනය කරනු ලබන තොග ප්‍රමාණය නොමැතිවයි.

## කොවිඩ් මර්දනයට...

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජෙනරාල ජගත් අල්විස්, පොලිස්පති චන්දන වික්‍රමරත්න සහ ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු සහ නියෝජ්‍ය පොලිස්පතිවරු සමග සූම් තාක්ෂණය ඔස්සේ රැස්වීමකට සහභාගි වෙමින් මහජන ආරක්ෂක අමාත්‍යවරයා මේ බව දැනුම් දී ඇත.

මෙහිදී අමාත්‍යවරයා විසින් සඳහන් කර ඇත්තේ මෙවැනි ක්‍රියාකාරකම්වල යෙදෙන පුද්ගලයන් පළමුව හුදෙකලා වන අතර ඉන්පසු අන්තවාදයට ත්‍රස්තවාදයට ගමන් කළ හැකි බවයි. එසේම ඒ පිළිබඳ නිරන්තර අවධානයෙන් සිටිය යුතු බවද ඇමැතිවරයා මෙහි දී අවධාරණය කර ඇත.

අපරාධ භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා යටතේ විශේෂ විමර්ශන කණ්ඩායම් දෙකක් පිහිට වන අතර ඉන් එක් කණ්ඩායමක් කප්පම් සහ පාතාලය සම්බන්ධව ද අනෙක් කණ්ඩායම කුඩු ජාවාරම සම්බන්ධ මෙහෙයුම් සඳහා ද පත් කරන බවද මෙහි දී දැනුම් දී තිබේ.

## එළවළු හා පලතුරු...

ඒ අතරින් 2012 හා 2018 වර්ෂ දෙකේ දී කෙසෙල්, ගස්ලබු හා පේර ගොවීන්ට කාඩ්බෝඩ් පෙට්ටි හතළිස් එක්දහසක් (41000) ලබා දී ඇත.

ප්ලාස්ටික් කූඩ සඳහා පමණක් රුපියල් කෝටි දහතුනක් වැයකර ඇති අතර එහෙත් ගොවීන් ඒවා පාවිච්චි නොකර එළවළු පලතුරු ප්‍රවාහනයට යොදා ගැනීම නිසා පසු අස්වනු හානිය ඉහළ ගොස් ඇති බව ඒ සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණයේ දී හෙළි වී ඇත. එය සියයට 30% සිට සියයට 70% දක්වා ඉහළ ගොස් තිබේ.

## මෙරට ශාකවලින්...

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය සිරිල් විජේසුන්දර කියා සිටියේ එය ප්‍රතිශතයක් ලෙස සියට 48.4ක් බවය.

මෙරටට ආවේණික ශාක 863ක් අතුරින් 625ක් තර්ජනයට ලක්ව ඇත. එය ප්‍රතිශතයක් ලෙස සියයට 72.4කි.

ශාක විශේෂ 128ක් (ආවේණික ශාක 54ක්ද ඇතුළුව) මෙම සියවසේ දී මෙරට තුළ නිරීක්ෂණයට ලක්ව නොමැති බව පර්යේෂණවලදී අනාවරණය වී ඇත.

වගා කටයුතු ඇතුළු විවිධ කටයුතු සඳහා පරිසරය එළි පෙහෙළි කිරීම ශාක තර්ජනයට දැඩි ලෙස බලපා ඇත.

පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් පසුගියද ජාතික රතු දත්ත ලැයිස්තුව එළි දක්වනු ලැබීය.

මේ අතර මිරිදිය මත්ස්‍යයින් පිළිබඳ රතු දත්ත ඇගයීමට අනුව මෙරටට ආවේණික මත්ස්‍ය විශේෂ 61 ක් අතුරින් 51 ක් වඳවී යෑමේ තර්ජනයට ලක්වී ඇතැයි අනාවරණය වී ඇතැයි පරිසර අමාත්‍යාංශය සඳහන් කරයි. වඳවී යෑමේ තර්ජනයට ලක්ව සිටින මත්ස්‍යයින් අතරින් දැඩි තර්ජනයට ලක්ව සිටිති.

2019 වසර වන විටදී ගෝලීය රතු දත්ත ලැයිස්තුවේ අන්තර්ගත වූයේ මෙරටට ආවේණික මිරිදිය මත්ස්‍ය විශේෂ 18 ක් පමණක් බවත්, රතු දත්ත ලැයිස්තුව යාවත්කාලීන කිරීම මගින් ශ්‍රී ලංකාවට ආවේණික මත්ස්‍ය විශේෂ 59 ක් ලෝක රතු දත්ත ලැයිස්තුවට ඇතුළත් කිරීමට හැකිවීම විශේෂත්වයක් බවද පරිසර අමාත්‍යාංශය පවසයි.

මෙරට මිරිදිය මත්ස්‍යයින් කාණ්ඩ තුනක් සිටින බව මහාචාර්ය දේවක වීරකෝන් සඳහන් කරයි. දේශීය මත්ස්‍ය විශේෂ 47 ක්ද, ආවේණික විශේෂ 61 ක්ද, හඳුන්වාදෙන ලද විශේෂ 30 ක්ද සිටින බව මහාචාර්යවරයා පවසයි.

# ලංකාවේ ලක්ෂ 10 ට විකිණෙන ඖෂධය මොකක්ද?




වැඩි වැඩියෙන් කතා නොවුණ සුළු පිරිසක් පමණක් මොනවාදැයි දැනසිටි ටොසිලිසුමැබ් (Tocillizumab) නමැති ඖෂධය ගැන පසුගිය දවස්වල දේශපාලන ක්ෂේත්‍රයේත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේත් වැඩි වැඩියෙන් කතාබහක් මතුවූයේය. පසුගිය දිනවල රටේම හිඟ යැයි කියූ මෙකී ඖෂධය රුපියල් ලක්ෂ අටකට මිලදී ගත් අයෙක් ගැනත් මාධ්‍ය ඔස්සේ අසන්නට දකින්නට ලැබුණි. ඔහු හලාවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ජපානයේ සිට මෙරටට පැමිණි ඔහුට කොවිඩ් වයිරසය ආසාදනය වීම නිසා කොළඹ පෞද්ගලික රෝහලකට ඇතුළත් කෙරුණි. එහිදී දැඩි සේ රෝගී වූ ඔහුට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා නිර්දේශ කර තිබුණේ 'ටොසිලිසුමැබ් ඖෂධය' ය. නමුත් ලංකාවේම හිඟ මේ ඖෂධය සොයා ගැනීමට ඔහුගේ ඥතීන් දැඩි වෙහෙසක් ගත්තත් සොයා ගැනීමට නොහැකි විය. කෙසේ හෝ අවසානයේදී ඔවුන්ට දෙමටගොඩ ප්‍රදේශයේ ඔසුසලක තිබී මෙම ඖෂධය හමුවිය. ඖෂධයෙහි සාමාන්‍ය මිල රුපියල් ලක්ෂයක් පමණ වුවත් ඒ මොහොතේ දෙමටගොඩ ෆාමසිය ඖෂධයට
ලංසුව තැබුවේ රුපියල් ලක්ෂ අටකටය. සාධාරණ අසාධාරණකම ගැන නොසිතූ ඥතීහු රුපියල් ලක්ෂ අටකට ඖෂධය මිලදී ගත්තේ රෝගියාගේ ජීවිතය ඊට වඩා වටිනා නිසාය. ඒ ටොසිලිසුමැබ් ගැන එක කතාවක් පමණි.

ඇතැම් ඔසුසල් මෙම එන්නත හොර රහසේම රුපියල් ලක්ෂ දහයක් වැනි මුදලකට අලෙවි කරන බවටත් සෞඛ්‍ය අමාත්‍යාංශයට පැමිණිලි ලැබෙමින් තිබේ. කෙසේ වෙතත් මෙම ටොසිලිසුමැබ් ඖෂධය කොවිඩ් 19 වයිරසයට එරෙහිව සටන් කිරීම සඳහා නිපදවූ ඖෂධ්‍යක් නම් නොවේ. එය රූමටයිඩ් ආතරයිටිස් නම් රෝගය සඳහා නිපදවූ ඖෂධයකි. මෙම රූමටයිඩ් ආතරයිටිස් රෝගය බහුලව ඇතිවන්නේ තරුණ වියේ සහ මැදිවියේ අයටය.

එහිදී, හන්දි ආශ්‍රිතව ඇතිවන ඉදිමීම් තත්ත්වය මෙහි මූලික ලක්ෂණයයි. එමෙන්ම, ප්‍රතිශක්තිකරණ පද්ධතියේ ඇතිවන අනිසි ක්‍රියාකාරිත්වය මෙම රෝගය වැලඳීමට හේතුවන්නේය. එමනිසා, එහි ක්‍රියාකාරිත්වය අඩු කිරීමට 1980 දශකයේදී තඩාමිට්සු කිෂිමොටෝ විසින් ජපානයේ ඔසාකා විශ්ව විද්‍යාලයේදී ටොසිලිසුමැබ් නම් ඖෂධයේ අණු පිටපතක් නිර්මාණය කළේය.

පසුව එම අණු පිටපත 1997 වසරේදී ලෝකප්‍රසිද්ධ ඖෂධ නිෂ්පාදන සමාගමක් වන චුගෙයි ඖෂධ නිෂ්පාදන සමාගම විසින් එහි සායනික පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණි. එහි දී වැඩිදුර පරේයිෂණ කටයුතු සඳහා ස්විට්සර්ලන්තයේ බාසල් හි පිහිටි එෆ්. හොෆ්මන්-ලා රොචේ ඖෂධ සමාගම විසින් මෙම ඖෂධයට හිමි බලපත්‍රය මිලදී ගත්තේය.

ඉන්පසුව, යුරෝපයේ විවිධ රටවල් මෙම ඖෂධය පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කර 2007 වසරේ සිට රූමටයිඩ් ආතරයිටිස් රෝගයෙන් පෙලෙන රෝගීන් සඳහා ලබාදීමට තීරණය කෙරිණි. පසුව, 2020 වසරේ සිට ලෝකයම ගිලගනිමින් සිටින 'කොවිඩ් 19' වයිරසය ආසාදනය වී නියුමෝනියා තත්ත්වයට පත්වන රෝගීන් සඳහා ටොසිලිසුමැබ් ලබාදීම පිළිබඳව සොයාබැලීම් කෙරිණි. ඒ රූමටයිඩ් ආතරයිටිස් රෝගයට හේතුවන 'ඉන්ටර්ලියුකින් 6' නම් ජෛවී අණුවේ ශ්‍රාවයන් 'කොවිඩ් 19' වයිරසය ආසාදනය වී අසාධ්‍ය තත්ත්වයට පත්වන රෝගීන්ගේ ද ශරීරය තුළින් හමුවීම නිසාය.

ඒ අනුව ඉන්ටර්ලියුකින්වලට එරෙහිව තිබෙන ඖෂධය වන ටොසිලිසුමැබ් එන්නත කොවිඩ් රෝගීන්ට ලබා දිය හැකිදැයි කියා පර්යේෂණ ආරම්භ කෙරිණි. එහිදී ඖෂධය ලබාදුන් කොවිඩ් රෝගීන්ගෙන් සුවවූ ප්‍රතිශතය සුවනොවූ ප්‍රතිශතයට වඩා වැඩි බැවින් ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් මේ ඖෂධය කොවිඩ් නියුමෝනියා තත්ත්වයට පත්ව අසාධ්‍ය වන රෝගීන්ට ලබාදියයුතු යැයි නිර්දේශ කළ බව කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ඖෂධ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කායික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය ප්‍රියදර්ශනී ගලප්පත්ති කියන්නීය.

එසේ වුවද මෙම ඖෂධයට කිසිසේත්ම කොවිඩ් වයිරසය විනාශ කළ හැකි ඖෂධයක් නොවන බව ඇ කියන්නීය. "මේ ඖෂධය 'ඉන්ටර්ලියුකින් 6' කියන ජෛවී අණුවට එරෙහිව සටන් කිරීමට නිපදවූ ප්‍රතිදේහයක්. ඒ වගේම කොවිඩ් වයිරසය වැලඳී අසාධ්‍ය තත්ත්වයට පත්වෙන රෝගීන් සඳහාත් වර්තමානයේදී මෙය භාවිත කරනවා. එමෙන්ම, කොවිඩ් රෝගය වැනි වයිරසයක් ආසාදනය වූ විට කොවිඩ් වයිරසයට
එරෙහිව අපගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ක්‍රියාකාරී වෙනවා. මේ විදිහට අපේ ප්‍රතිශක්තිකරණ පද්ධතියේ තියෙන නොයෙකුත් සෛල මගින් ජෛවී අණු ද්‍රව්‍යයක් වන 'ඉන්ටර්ලියුකින් 6' ශ්‍රාවය කරනවා. ඒ අණු මගින් කොරෝනා වයිරසය විනාශ කිරීමේ හැකියාව තියෙනවා. නමුත්, කුණාටුවක් වගේ පැමිණෙන ජෛවී අණු නිසා අපේ ශරීරයේ තිබෙන අනෙක් සාමාන්‍ය සෛල වලටත් එයින් හානි සිදුවෙන්න පුළුවන්. ඒ වගේම කොවිඩ් වයිරසය ආසාදනය වී අසාධ්‍ය වන රෝගීන් බහුතරයක් මිය යන්නටත් මෙන්න මේ කියන හේතුව ප්‍රධාන වී තිබෙනවා."

එම නිසා ටොසිලිසුමැබ් කියන ඖෂධය මගින් සිදුවෙන්නේ 'ඉන්ටර්ලියුකින් 6' මගින් සාමාන්‍ය සෛලවලට සිදුකරන බලපෑම නවතා දැමීමය. එබැවින් මේ ඖෂධය සටන් කරන්නේ කොවිඩ් වයිරසයට එරෙහිව නොව එයින් නිපදවන ජෛවීය අණුක මගින් සාමාන්‍ය සෛල වලට වන හානිය වැලැක්වීමට බවද විශේෂඥ වෛද්‍ය ප්‍රියදර්ශනී ගලප්පත්ති කියන්නීය.

කෙසේ වෙතත් මෙම ඖෂධය කොවිඩ් වයිරසය නිසා අසාධ්‍ය වන සෑම රෝගියකුටම ලබාදිය නොහැක. එහිදී, කොවිඩ් වයිරසය මගින් ඇති කරන කොවිඩ් නියුමෝනියා තත්ත්වය නිසා



**විශේෂඥ වෛද්‍ය ප්‍රියදර්ශනී ගලප්පත්ති**

සාමාන්‍යයෙන් පුද්ගලයන්ගේ පෙනහළු දුර්වල වන්නේය. එවිට වයිරසයට අමතරව විවිධ බැක්ටීරියා වර්ගත් පෙනහළු තුළට ආසාදනය වීමේ හැකියාවක් ඇත්තේය. එවැනි මොහොතක ටොසිලිසුමැබ් ඖෂධය ලබා දීම ඉතාමත් අවදානම් ය. ඊට හේතුව මෙම ඖෂධය මඟින් මූලිකවම අපේ ප්‍රතිශක්තිකරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය අඩාළ කිරීමයි. එවිට විශාල ලෙස ශරීරයේ විෂබීජ සහිත රෝගියාට මෙම ඖෂධය ලබා දීම මඟින් සිදුවන්නේ රෝගියාගේ තත්ත්වය තවත් අසාධ්‍ය වීමය. ඒ නිසා සෑම අසාධ්‍ය රෝගියකුටම මෙම ඖෂධය ලබාදීමට හැකියාවක් නොමැති බවද වෛද්‍ය ප්‍රියදර්ශනී ගලප්පත්ති කියන්නීය.

"අපි මුලින්ම කරන්නේ රෝගියාගේ රුධිර සාම්පලයක් අරගෙන මේ ඖෂධය ඔහුට ලබා දෙන්නට පුළුවන්ද කියලා බලනවා. ඒ විතරක් නෙමෙයි මේ කොවිඩ් රෝගියාට බැක්ටීරියා ආසාදනයක් වී ඇත්දැයි කියාත් පරික්ෂා කරනවා. එවිට විශාල ලෙස බැක්ටීරියා ආසාදනයක් නැතිනම් වගේම වෙනත් ආසාදන තත්ත්වයන්ට ඔහු මුහුණ පා නැත්නම් තමයි මේ ඖෂධය රෝගියාට ලබාදීමට හැකියාවක් තියෙන්නේ. අනික වෛද්‍යවරු මේ ඖෂධය රෝගියාට ලබාදෙන්නට හැකියැයි පැවසුවත් පසුව රෝගියාගේ රුධිර පර්යේෂණයේදී බැහැ කියා සනාථ වූ අවස්ථා තියෙනවා. ඒ වගේ අවස්ථා ගොඩකටත් අපි මුහුණ දීලත් තියෙනවා."

එමෙන්ම, ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් කොවිඩ් නියුමෝනියාව වැළඳුනු රෝගීන්ට මුල් අවස්ථාවේදී ලබාදෙන ඖෂධයක් ලෙස ටොසිලිසුමැබ් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින්ද නිර්දේශ කර තිබේ. එපමණක් නොව, තවත් ප්‍රතිශක්තිකරණ පද්ධතිය බාල කිරීමට ලබාදෙන ස්ටිරෝයිඩර් කාණ්ඩයේ ඩෙක්සාමෙතසෝන් නම් ඖෂධය ලබාදීමටත් අනුමැතිය ලැබුණි. එහිදී, වෛද්‍ය නිර්දේශය වන්නේ ටොසිලිසුමැබ් ඖෂධය ලබාදෙන්නේ නම් ඒ සමගම ඩෙක්සාමෙතසෝන් නම් ඖෂධයත් ලබාදිය යුතුබවයි.

කෙසේනමුත්, මේ ඖෂධ දෙකම ලබාදිය යුත්තේ දැඩි සුපරීක්ෂාකාරිව යැයි ඇ කියන්නීය. එයට හේතුව වන්නේ කොවිඩ් අසාධ්‍ය රෝගීන්ට එම ඖෂධ ලබාදීමෙන් පවා වෙනත් අතුරු ආබාධ ඇතිවීමේ සම්භාවිතාවක් දක්නට ලැබෙන බැවිණි. "ඒ නිසා මේ ඖෂධවලින් තියන වාසිය අවාසියට වඩා වැඩි යැයි සැලකුවහොත් තමයි මෙම ඖෂධය අපි රෝගීන්ට ලබාදෙන්නේ." කියා ඇ කියන්නීය.

කෙසේවෙතත්, කොවිඩ් ආසාදනය වී පසුව බැක්ටීරියා ආසාදනය වන රෝගීන්ට අද ලබාදෙන්නේ ප්‍රතිජීවක ඖෂධය. එමගින් බැක්ටීරියා ආසාදනය පාලනය කර ගැනීමටත් හැකියාව ලැබෙන්නේය.

**හර්ෂණී දිසානායක**


## පළාත් පාලනය වැඩිදියුණු කිරීමේදී මුහුණදීමට සිදුවන අභියෝග

ප්‍රාදේශීයව පොදු සේවා සම්පාදනයේදී පළාත් පාලන පද්ධතිය වැදගත් හා අත්‍යවශ්‍ය භූමිකාවක් ඉටුකරයි. මෙම ආයතනවල ධාරිතාවන් අවබෝධ කරගැනීම සඳහා පළාත් පාලන ආයතනවල ධාරිතා සංවර්ධනය කිරීමේ (CDLG) ව්‍යාපෘතිය විසින් නැගෙනහිර, උතුර, උතුරුමැද හා ඌව පළාත්වල ආයතනික පුද්ගල ධාරිතාවන් පිළිබඳ පරිපූර්ණ තක්සේරුවක් සිදුකරන ලදී. ඒ සඳහා ආසියා පදනම විසින් සහාය පිරිනමන ලදී.

පහත දැක්වෙන්නේ එම තක්සේරුවේ ප්‍රධාන සොයාගැනීම්ය:

සියලු පළාත් පාලන ආයතනයන්හි ව්‍යවස්ථාපිත කමිටුවල ඉහළ මට්ටමේ කාන්තා නියෝජනයක් තිබේ. නමුත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමාජ විවිධත්වය ප්‍රධාන ධාරාව තුළට ඇතුළත් කරගැනීම සඳහා තිබෙන හැකියාව පළාත් හතර තුළදීම අවමය.

එදිනෙදා පරිපාලනයේ මෙන්ම නව සේවා සැපයීමේදී නව්‍යකරණයේ අල්ප භාවිතයක් දැකහැකි අතර එකිනෙක සමග සම්බන්ධ කරන ලද ඩිජිටල් විසඳුම් භාවිතා කරමින් දත්ත පරිපූර්ණත්වය හා නව නිර්මාණාත්මක සේවා සම්පාදනය සඳහා පුළුල් අවශ්‍යතාවක් තිබේ.

පළාත් පාලන මට්ටමේ පුරවැසි මැදිහත්වීමෙහි වැඩි අවධානයක් යොමුවන්නේ දුක්ගැනවිලිවලට විසඳුම් ලබා ගැනීම කෙරෙහිය. පුරවැසි මැදිහත්වීම පුළුල් පරාසයක විහිදෙන්නේ නැත.

පළාත් පාලන නියෝජිතයින් අතර, ප්‍රජා සහභාගීත්වය, සේවා සැපයීම සහ සැලසුම් කිරීම යන ක්ෂේත්‍රවල ධාරිතාවයන් අඩුය.

වැඩිදුර විස්තර සඳහා www.lk.undp.org වෙබ් අඩවියට පිවිසෙන්න.

Funded by European Union | UNDP | STRIDE | CDLG Capacity Development of Local Governments

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ පළාත් පාලන ආයතනවල ධාරිතා සංවර්ධනය කිරීමේ (CDLG) ව්‍යාපෘතිය ශ්‍රී ලාංකික ජනතාවට වඩා හොඳින් සේවය කිරීම සඳහා පළාත්පාලන ආයතනවල හැකියාවන් වර්ධනය කිරීම පිණිස (#DeliverBetter) නැගෙනහිර, උතුර, උතුරුමැද හා ඌව පළාත්වල පළාත් පාලන ආයතන 134ක් සමග කටයුතු කරයි.

**මහාචාර්ය තිස්ස විතාරණ යනුවෙන් කී විට අපට මතක්වන්නේ දේශපාලනඥයෙකි. ලංකාවේ පැරණිම දේශපාලන පක්ෂය වන ලංකා සම සමාජ පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වන ඔහු හිටපු විද්‍යා හා තාක්ෂණ ඇමැතිවරයාය. මෙකල ඔහු ශ්‍රී ලංකා පොදුජන පක්ෂ ලැයිස්තුවෙන් පත් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. එනමුත් මේ දේශපාලන තනතුරුවලට වඩා එහා ගිය වෘත්තීය සුදුසුකමක් ඔහුට ඇත්තේය. සෙසු මැති ඇමැතිවරුන් මෙන් නොව මහාචාර්ය තිස්ස විතාරණ ලෝකයම පිළිගත් විද්‍යාඥයෙකි. වයිරසවේදය පිළිබඳ දැනට ශ්‍රී ලංකාවේ සිටින ජ්‍යෙෂ්ඨතම මහාචාර්යවරයා වන ඔහු සිය වෘත්තීය දිවියේ බොහෝ කලක් කැප කර ඇත්තේ ඩෙංගු ඇතුළු වයිරස් රෝගවලට ප්‍රතිකාර කිරීමට නායකත්වය දෙමිනි. මේසා සුදුසුකම් සපුරා තිබුණද කොරෝනා මැඬලීමේ යුතුවලදී ඔහුගේ නම ඇසෙන්නේ නැති තරම්ය. මේ ඔහු ඒ ගැන 'සතිඅග අරුණ'ට දැක්වූ අදහස්ය.**



# පවිත්‍රාට කීවා ඇහුවේ නෑ කෙහෙළියගෙන් තවම ප්‍රතිචාර නෑ

## වයිරස්වේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස විතාරණ



## මන්ත්‍රීලා කොරෝනා බළකායේ මහාචාර්ය මම එළියේ

## සුදර්ශිනීට වැඩ කරන්න දෙනවාදැයි ප්‍රශ්නයක්

## කොරෝනා එන්නත මාස නවයෙන් නවයට දෙන්න වේවි

## මාලදිවයිනේ ඩෙංගු මැඬලුවේ මමයි

**පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස විතාරණට වඩා මහාචාර්ය තිස්ස විතාරණ ගැන අපි දැනගන්න කැමතියි. ඔබ වයිරසවේදය පිළිබඳ විශේෂඥයෙක් වෙන්නේ කොහොමද?**

මම 1960 දී විතර වෛද්‍යවරයෙක් විදියට පත්වුණා. ඉන් පසුව වෛද්‍ය පර්යේෂණ ආයතනය සමග එකතුවෙලා වයිරස් රෝග පිළිබඳ වැඩ කළා. මම ශිෂ්‍යත්වයක් යටතේ වැඩිදුර පුහුණුවක් ලැබීමට බ්‍රිතාන්‍යයට ගියා. ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ඩිප්ලෝමාවක් කරලා පී.එච්.ඩී. එකක් කළා. පී.එච්.ඩී. එක එසේ නැතිනම් ආචාර්ය උපාධියටත් කළේ වයිරස් සම්බන්ධයෙන්.

**ඔබට බ්‍රිතාන්‍යයේ රැඳී සිටින්න කියලා ආරාධනා ලැබුණේ නැද්ද?**

මට විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙක් වෙන්න කියලා ආරාධනා ලැබුණා. ඒත් මට වෛද්‍ය පර්යේෂණ ආයතනය සමග වැඩ කරන්න ඕන නිසා මම ලංකාවට ආවා. 1994 දක්වා මම බොරැල්ලේ වෛද්‍ය පර්යේෂණායතනයේ කටයුතු කළා. වයිරස අංශයේ ප්‍රධානියා ලෙසත්, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ ප්‍රධානියා ලෙසත් මම රාජකාරි කර තිබෙනවා.

මට විශේෂඥ වෛද්‍යවරයෙක් විදියට ඕනෑතරම් සල්ලි හම්බ කිරීමට තිබුණා. ඒත් මම ඒවා අතරහැරලා වයිරස්වලින් බෝවන ලෙඩ සම්බන්ධයෙන් වැඩ කළා. මම වෛද්‍ය පර්යේෂණ ආයතනයට එන විටත් දිවා රෑ දෙකේ වසූරිය මර්දනය කිරීමට කැපවෙලා වැඩ කළා. ඒ වගේම හැමෝටම පෝලියෝ එන්නත දීලා අපි ඒක රටින් තුරන් කළා. ජපන් එන්සපලයිටිස් රෝගයත් ඒ විදියට රටින් තුරන් කළා.

**ඔබ ලෝක සෞඛ්‍ය සංවිධානය සමගත් සමීපව වැඩ කර තිබුණා නේද?**

ඔව්, ලෝක සෞඛ්‍ය සංවිධානයට උපදෙස් දෙන කමිටුවක් තියෙනවා. මම ඒකට පත් කරලා තිබුණා. හැම අවුරුද්දකම ජිනීවාවල සම්මන්ත්‍රණයක් තියනවා. ඒ වගේම වෙන වෙන රටවල තියෙන සෞඛ්‍ය ප්‍රශ්නවලටත් උදව් කළා. ඒ නිසා මට තිබෙන අත්දැකීම් ඒ රටවල් සමග බෙදා ගැනීමට හැකි වුණා.

**ඔබ එසේ සාර්ථක වූ අවස්ථාවන් මොනවාද?**

මට මතකයි, මාලදිවයිනේ ඩෙංගු වසංගතය මර්දනය කිරීමට නොහැකිව සිටින විට මට එහේට යන්න කියලා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් කිව්වා. ඒ අනුව මම මාලදිවයිනට ගොස් එහි ඩෙංගු ව්‍යාප්තිය නතර කිරීමට කටයුතු කළා.

**ඔච්චර සුදුසුකම් තිබිලත් ඇයි ඔබ ලෝක සෞඛ්‍ය සංවිධානයේ තනතුර ප්‍රතික්ෂේප කළේ?**

මට ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙල්බර්න් නුවර තියෙන පර්යේෂණාගාරයේ ප්‍රධානී තනතුර දුන්නා. ඇත්තටම මට එම තනතුර දෙමින් පත්වීමත් දුන්නා. ඒත් මට ලංකාවෙන් නිවාඩු තියෙන්නේ වසර දෙකක් විතරයි, ඒ නිසා නැවත ලංකාවට යන්න ඕන කියලා මම ලංකාවට ආවා.

**ඔබ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කටයුතු කළේ මොන කාලයේද?**

වෛද්‍ය පර්යේෂණ ආයතනයෙන් විශ්‍රාම ගියාට පස්සේ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වයිරසවේදය පිළිබඳ මහාචාර්යවරයෙක් ලෙස කටයුතු කළා. ඒ කාලේ මගේ දෙවැනියා විදියට වැඩ කළේ මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු. ඇය තවමත් ඉන්නවා. ඒත් ඇයගෙන් දැන් කිසිම වැඩක් ගන්නේ නෑ.

**ඔබේ හොඳම ගෝලයා වන සිරිමලී ප්‍රනාන්දුගෙන් ඇයි වැඩක් ගත්තේ නැත්තෙ?**

දැන් ඉන්න නිලීකා මලවිගේ වයිරසය පිළිබඳව කටයුතු කරන්න නෙමෙයි ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ආවේ. ඇය ආවේ ප්‍රතිශක්තිය වැඩි කිරීම ගැන අවධානය යොමු කිරීමටයි. දැන් ලංකාවෙ ඉන්න හොඳම වයිරස විශේෂඥවරිය වන්නේ මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දුයි. ඇය වත්මන් කොරෝනා මර්දන කමිටුවට කැඳවලා නැහැ.

**මේ වන විට කොරෝනා ව්‍යාප්තිය මොන වගේ තත්ත්වයකද තියෙන්නේ? ඉදිරියට ව්‍යාප්තවීම පිළිබඳ ඔබට මොන ආකාරයේ තක්සේරුවක්ද තියෙන්නේ?**

දැනට පවතින්නේ දරුණු තත්ත්වයක්. මේ වන විට මරණ සංඛ්‍යාව වැඩි වෙලා තියෙනවා. අපිට ඉදිරිපත් වෙන සංඛ්‍යාලේඛනවල දැක්වෙන මරණ සංඛ්‍යාවට වඩා සැබෑ සංඛ්‍යාව ඉහළ බව තමයි මම විශ්වාස කරන්නේ. ඒ වගේම තමයි රෝගීන් සංඛ්‍යාවත්.

කොරෝනා රෝගීන් ප්‍රතිකාර ලබන රෝහල්වල දැඩිසත්කාගාර ඒකක පිරිලා. ඇඳවල් පිරිලා. ඇඳන් යටත් පැදුරු දාලා නිදගන්න රෝගීන්ට සිදුවෙලා තියෙනවා. වසංගතය වැඩිවෙමින් යන බව අපිට පිළිගන්න වෙනවා. මේ සැබෑ තත්ත්වය තේරුම්ගෙන කොරෝනා පාලනයට අපි කටයුතු කළ යුතු වෙනවා.

**ඒක පාලනය කරන්නද රට ලොක්ඩවුන් කරන්න කියලා ඔබලා ඉල්ලුවේ?**

ඔව්. රට ලොක්ඩවුන් කිරීමෙන් මිනිසුන් තමන්ගේ නිවසට සීමාවෙනවා. කොරෝනා වයිරසය බෝවෙන්න පුළුවන් ආශ්වාස ප්‍රශ්වාස මාර්ගයේ වර්ධනය වෙලා තවත් අයෙක්ට යාම මගිනුයි. ඒ නිසා තමයි අවම වශයෙන් සති දෙකක්වත් ලොක් ඩවුන් කරන්න කියලා ඉල්ලුවේ.

**දැන් රට ලොක්ඩවුන් කරල තියෙනවා. දැන් වයිරසය පාලනය වෙයිද?**

රට ලොක්ඩවුන් කරන බව දවස් තුනකටවත් කලින් කියන්න තිබුණා. එහෙම වුණානම් ජනතාව තමන්ට අවශ්‍ය ආහාර එකතු කරලා තියාගන්නවානේ. දැන් මොකක්ද කළේ, එකපාරම රට වහනවා කියලා කිව්වා. මිනිස්සු කලබල වෙලා, එක්රොක් වෙන්න ගත්තා. ඒකෙන් තවත් ශීඝ්‍රයෙන් වයිරසය පැතිර යන්න ගත්තා. දරුණු ඩෙල්ටා ප්‍රභේදය ලංකාවේ තියෙනවා කියලා හිතලා කටයුතු නොකිරීම වැරදියි. ලොක්ඩවුන් එකේ අදහස වෙන්නේ මිනිස්සු ගෙදර ඉඳලා වෙන කොහේවත් යන්නේ නැතිව ඉන්නවා කියන එකයි.

**වයිරස් පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක් ආණ්ඩුව ඇතුළේ ඉන්නවා කියලා අමතක කරලා ඉන්නේ ඇයි?**

මම මේ මොන කමිටුවකවත් නෑ. වෙන මන්ත්‍රීවරු නම් ඉන්නවා. ඒ අය වයිරස් ගැන අවබෝධයක් තියෙන අයද? මම මේකට කැඳවන්නේ නැහැ කියලා මම මොනවා කරන්නද?

**දැන් අලුතින් සෞඛ්‍ය ඇමැතිවරයෙක් පත් වෙලා ඉන්නවා. ඔහුවත් කොරෝනා මර්දනය ගැන ඔබෙන් උපදෙස් ගත්තේ නැද්ද?**

එතුමාට අලුත් ඇමැතිකම ලැබුණම මම සුබ පැතුවා. ඒ වෙලාවේ එතුමා මා දෙසට හැරිලා මට සහාය දෙන්න වෙයි කියලා කිව්වා. එච්චරයි. එතැනින් එහාට මොනම දෙයක් වෙලා නැහැ. කලින් සෞඛ්‍ය ඇමැතිවරියට එක් වරක් පමණක් මගේ අදහස් ඉදිරිපත් කළා.

**මොනවාද ඔබ ඇයට කිව්වේ?**

මම එදා කිව්ව දේ එවකට සිටි සෞඛ්‍ය ඇමැතිවරිය පිළිගත්තේ නෑ. කොරෝනා පොකුරු ගැන අවධානය යොමු කරන ගමන් සමාජය ඇතුළේ කොරෝනා ව්‍යාප්ත වෙමින් තිබෙන බව මම පෙන්වා දුන්නා. පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන්ගේ සහභාගීත්වයෙන් කොවිඩ් කමිටුවක් පත් කිරීමට මම යෝජනා කළා. එවිට ඇමැතිවරියට කමිටුවේ අදහස් ගැනීමට කටයුතු කරන්න කියලා කිව්වා.

එතැන සිට ගම් මට්ටම දක්වා කොවිඩ් කමිටු පිහිටුවන්න කියලා මම යෝජනා කළා. එතකොට එක ගමක කොරෝනා මර්දනය කිරීමට හතර පස් දෙනෙක්ගෙන් යුත් කමිටුවක් පත් කරන්න පුළුවන්නේ.

ඒත් මේවා හිටපු ඇමැතිවරිය පිළිගත්තේ නෑ. ඒකට මම මොනවා කරන්නද? වයිරසය සමාජගතවෙලා තියෙනවා, සමාජය පදනම් කරගෙන විසඳුම් ගේන්න ඕන කියලා කිව්වත් ඒ අවස්ථාවේ වයිරසය සමාජ ගතවෙලා නැහැ කියන ස්ථාවරයේ තමයි ඇමැතිතුමිය සිටියේ.

**මේ ආණ්ඩුවේ සිටින ප්‍රජා වෛද්‍ය විශේෂඥවරියක් තමයි රාජ්‍ය ඇමැතිනි සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ. ඇය සමග සාකච්ඡා කළේ නැද්ද?**

ඇයට රාජ්‍ය ඇමැති ධුරය ලැබුණු අවස්ථාවේදී මට කතා කරලා මා හමුවීමට අවශ්‍ය බව කිව්වා. ඒ අවස්ථාවේදී මම එන්නම් කියලා එතුමියගේ කාර්යාලයටම ගියා. පැය එකහමාරක් විතර මම ඇයත් එක්ක සාකච්ඡා කරලා ආවා. ඇයට අවශ්‍ය ආකාරයට වැඩ කටයුතු කරන්න දෙනවාද කියන එක මට ප්‍රශ්නයක්.

**දැන් කොරෝනා මර්දන කමිටුවේ ප්‍රධානියා වන්නේ යුද හමුදාපතිවරයා. ඒ ගැන ඔබගේ අදහස කුමක්ද?**

හමුදාවට හොඳ විනයක් තියෙනවා. දෙයක් කරන්න අවශ්‍ය වුණාම හොඳට ක්‍රියා කරනවා. පළමු වටයේදී ඔවුන් හොඳට වැඩ කළා. නමුත් ඔවුන්ට වෛද්‍ය පසුබිමක් නෑ. හමුදාපති වුණාට එතුමාට වයිරසය ගැන පුහුණුවක් ලැබිලා නෑනේ. ඒත් මේ ගැන දැනුම තියෙන අය ඉන්නවා.

**ආණ්ඩුව එන්නත්තරණය කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරන බව පේනවා. ඒ අතරේම ඔබ තුන්වැනි මාත්‍රාවක් දෙන්න ඕන කියලා කියනවා. ඇත්තටම අපිට තුන්වැනි මාත්‍රාවක් දෙන්න වෙනවාද?**

වැඩිහිටි අයට, හදවත් රෝග, වෙනත් නිදන්ගත රෝග තියෙන අයට තමයි වැඩි අවදානමක් තිබෙන කාණ්ඩය වන්නේ. ලෝක සෞඛ්‍ය සංවිධානය ජනතාවගෙන් සියයට විස්සකට එන්නත නොමිලේ දෙනවා කියලා කිව්වා. ඒ වෙලාවේ අවුරුදු හැටට වැඩි අයගේ නම් ලැයිස්තුවක් සූදානම් කරන්න කියලා මම කිව්වා. මුල් අදියරේදී ඒ අයට තමයි එන්නත දෙන්න තිබුණේ. එහෙම ඒ අයට මුලින්ම එන්නත දුන්නා නම් ඔවුන්ගේ ජීවිත ආරක්ෂා වෙනවා.

සමහර රටවල් තුන්වැනි මාත්‍රාව දීමට අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා. එන්නතෙන් අවුරුද්දක් ආරක්ෂාව ලැබෙතැයි අපේක්ෂා කළා. ඒත් ඇමරිකාවෙන් එන වාර්තාවල සඳහන් වෙන්නේ එන්නතෙන් මාස හයක කාලයකට ආරක්ෂාවක් තියෙනවා කියලයි කියන්නේ. එහෙම වුණොත් තවත් මාත්‍රාවක් දෙන්න වෙනවා. ඒ අනුව අඩුම තරමේ මාස නමයෙන් නමයටවත් එන්නත් දීමට සිදුවෙනවා.

**සාර්ස් වයිරසය සොයා ගැනීමේ ප්‍රධානියාව සිටි මහාචාර්ය මලික් පීරිස් ලංකාවේ බලධාරීන් සමග සාකච්ඡා කරමින් කටයුතු කළා. එහි වැදගත්කමක් තියෙනවාද?**

මලික් පීරිස් හොංකොං විශ්වවිද්‍යාලයේ වැඩකරන ගමන් සාර්ස් වයිරස සොයා ගැනීමේ කටයුතුවල සම්බන්ධ වුණා. කොරෝනා වයිරසයට කලින් ආපු එක තමයි සාර්ස්. වූහාන්වලින් සාර්ස් මතුවන විට පර්යේෂණ කිරීමට මුල් තැන ගත් කෙනෙක් තමයි මලික් පීරිස්. අපි දෙන්නම වයිරස් විශේෂඥයන් වුණා, මම ඩෙංගු කාර්ය සාධක බලකායේ වැඩ කළා. එතුමාට කොවිඩ් වයිරසය ගැන වැඩිම දැනුමක් තියෙන පුද්ගලයෙක්.

අපේ රටේ වෙන දේ දකිනවිට අපි වගේ අයට බරපතළ කනගාටුවක් ඇතිවෙනවා.

**ඔබ මුලින් කී පරිදි පෝලියෝ ලංකාවෙන් තුරන් කළා වගේ කොරෝනා වයිරසය කවදා වන විට තුරන් කිරීමට හැකියාව ලැබේවිද?**

ඒක එහෙම කියන්න බෑ. මේක වයිරස් එකක් නේ. මේකේ ජාන මොන විදියට වෙනස් වේවිද කියලා කියන්න බෑ. ඒ නිසා කවදා මේක නතරවේද කියන්න බෑ. උදාහරණයක් විදියට ඉන්ෆ්ලුවන්සා වයිරසය 1918 -20 කාලයේදි වසංගතයක් ලෙසින් මේක පැතිර ගියා. ලෝකයේ ජනගහනයෙන් තුනෙන් එකකට මේ වයිරසය බෝවුණා. මරණ සංඛ්‍යාව මිලියන 30ක් විතර සිදුවුණා කියලා විශ්වාස කරනවා. ඒ කියන්නේ ලෝකයේ මිලියන 30ක් මැරුණා. දැන් ඒ වයිරසය අපේ සමාජයේ තියෙනවා.

මේ වයිරසයට එරෙහිව හොඳ එන්නතක් දියුණු කරලා තියෙනවා. තවම සීතල රටවල අවුරුදු පතා එන්නත ලබාදෙනවා. ඉන්ෆ්ලුවන්සා වයිරසයේ අලුත් ප්‍රභේද මතුවෙනවාද කියලා බලන්න මාස් පතා ඉන්ෆ්ලුවෙන්සා වයිරසය හැදුණ අයගේ සාම්පල් එකතු කරලා, ශීත කරලා තියාගෙන අවුරුද්ද අවසානයේදී ලන්ඩන්වලට ඒවා යවනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉන්ෆ්ලුවන්සා මධ්‍යස්ථානයට ඒවා යවනවා. එතැනදී පර්යේෂණ කරලා අලුත් ප්‍රභේද මතුවෙලා තියෙනවාද කියලා බලනවා. ලෝකයේ හැමතැනින්ම සාම්පල් ලැබෙනවානේ. ඒවා බලලා, එන්නත වෙනස් කරන්න ඕනද? අලුත් ප්‍රභේද මතුවෙලා තියෙනවානම් ඒවට ආරක්ෂාව ලබාගැනීම වෙනුවෙන් කටයුතු කරනවා.

ඒ නිසා කොරෝනා වයිරසයට මොනවා වේද කියන්න බෑ. ඒ නිසා අපි නිවැරදිව කටයුතු කළ යුතුයි. වයිරසයේ තත්ත්වය අනුව අපි පර්යේෂණ කරමින්, වයිරසයේ හැසිරීම් පදනම් කරගෙන ඕන විසඳුම්වලට එන්න ඕන. සමහර ඒවාට ඉක්මනින් විසඳුම් සොයන්න පුළුවන්. තවත් සමහර ඒවාට විසඳුම් දෙන්න කාලයක් යාවි. කොරෝනා වයිරසය අවසන් වෙන්නේ කවදා, කොහොමද කියලා කියන්න මම සාත්තරකාරයෙක්වත්, නක්ෂත්‍රකරුවෙක්වත් නෙමෙයි.

**මේ වන විට කොරෝනා මරණ අටදහසේ සීමාව පසුකරගෙන ගිහින් තියෙනවා. ලංකාවේ කොරෝනා මරණ කීයක් විය හැකි බවට තක්සේරුවක් තියෙනවාද?**

එහෙම තක්සේරු කරන්න බෑ. මේ වයිරසයේ තවත් ජාන වෙනස්විය හැකියි. අලුත් ප්‍රභේද මතුවිය හැකියි. මේවා අපි දන්නේ නෑ. මේක වර්ධනය වන ආකාරයට අපි කටයුතු කළ යුතුයි. ඒ අනුව අපි පියවර ගත යුතුයි. ඒකට නම්‍යශීලීව කටයුතු කළ යුතුයි. එක මතයකට හිරවෙලා ඉඳලා හරියන්නේ නෑ.

**සංජය නල්ලපෙරුම**

# නෝනා නොඉන්න පදක්කමකුත් නැහැ

## ගිනි අවියෙන් රට මුදාගෙන හෙල්ලයෙන් ලොවම දිනූ දිනේෂ්ගේ කතාව





දිනේෂ්ගේ බිරිය

### දිනය 2008 දෙසැම්බර් 16 වැනිදාය

එල්.ටී.ටී.ඊයේ හදවත බඳු කිලිනොච්චියයි. අවසන් සටනේ විරෝදර හමුදාවෝ පෙරට ඇදෙති. ඉදිරියේ සතුරාගේ ආරක්ෂිත බැම්මකි. හමුදාවෝ හිතුවාට වඩා පහසුවෙන් ඒ පෙදෙස තමන්ගේ ග්‍රහණයට ගත්හ. එතැන් පටන් කිලෝමීටරයක් පමණ දුරක් ඔව්හු එතරම් ප්‍රතිරෝධයකට හසු නොවී පෙරට ගියහ. නමුත් එල්.ටී.ටී.ඊය මගරැක සිටියහ. සිය සිහින ඊළාම් රාජ්‍යයේ මර්මස්ථානය රැකගැනීම පිණිස ඔව්හු සිය සියලු වැර යොදන සෙයකි. මුහුණට මුහුණ දැවැන්ත සටනක් ඇරඹුණි. එල්.ටී.ටී.ඊ පාර්ශ්වයෙන් කාලතුවක්කු ප්‍රහාරයන් ද ඉදිරියට ඇදෙන හමුදාව ඉලක්ක කර එල්ල කරයි. මේ අතර කොටින් සමග මුහුණට මුහුණ සටනේ යෙදෙන හමුදාවේ 3 වන ගජබා රෙජිමේන්තුවේ තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායමකි. ජීවිතය පිළිබඳ ආදරය අබිබැවූ මවුබිම පිළිබඳ ආදරය විසින් ඔවුන්ව මෙහෙයවනු ලබයි. තිස් වසරක යුද්ධයෙන් බැට කෑ මවුබිම ඉන් මුදාගැනීමේ උච්ඡතම අවස්ථාවක් උදාවී තිබේ. මේ තිදෙනාගේ කණ්ඩායමේ හිසට ඉහළින් කාලතුවක්කු වෙඩිද, ඇගේ ගෑවී නොගෑවී ටී-56 උණ්ඩද ඇදෙයි. එහෙත් බිය යනු කුමක්දැයි නොදත් මොවුහු සටනේය. එය තීරණාත්මක නිමේෂයයි. ඒ වන විටත් වසර 11කට වැඩි කලක් යුද හමුදා සක්‍රිය සේවයේ යෙදී සිටි, අවසන් සටනේ කලක පටන් කොටි බළමුළු බිඳිමින් සටන් වැදුණු, ඒ තිදෙනා අතර සිටි ජ්‍යෙෂ්ඨයා වූ අප කථානායකයාට සිය වම් අත තමන්ගේ අනුදැනුමකින් තොරව සැනින් පස්සට ඇදීගිය අයුරක් දැනුණි. එසැනින් අත හිරි වැටී ගියේය. ඔහු එදෙස බැලීය. අත වසාගනිමින් ලේ දහරාවෝ ගලා යති. වම් උරපත්ත මතද, වැලමිටට මඳක් ඉහළින් ද, වැලමිටට පහළින් බාහුවේද ලෙසින් වම් අතේ උඩ, මැද, යට වශයෙන් තුන් තැනක් පසාරු කරමින් ටී- 56 උණ්ඩ කාවැදී ඇත. නමුත් අප කථානායකයානෝ හොඳ සිහියෙන් කටයුතු කරති.

'මල්ලි මගෙ අත වෙලපන් ලේ නතරවෙන විදිහට'

ඔහු අසල සිටි සගයා තුවලකරු කී ලෙසින් වෙළුම් යෙදීය. ලේ ගලායෑම තරමක් පාලනය විය. හතර අතින් හෙණ පුපුරන හඬ සමග ටී-56 'වෙඩි දහරා' ගලා යයි. කාලතුවක්කු උණ්ඩ පතිත වී දසත මරණය විසින් වෙලාගනියි. ගත සවි අඩපණ වුණද වෙනදත් නොවූ තරම් දැඩි ආත්ම ශක්තියකින් ගත වෙලී යන තුවලකරු 'මාව අරගෙන යන්න කව්රුත් ඕනි නැහැ. මල්ලී උඹලා දිගටම ෆයර් එක අල්ලගෙන යමල්ලා. මම සෙකන්ඩ් ලයින් එකට යනවා' යැයි කියූ මේ මහා ධෛර්යයකින් හෙබි රණකාමියා, දහසතින් හමන මරණයේ මාරුතය මැදින් ආරක්ෂිත ස්ථානයක් කරා සේන්දු විය.

ඉකුත් අගෝස්තු 30 ද, මෙරට ඉතිහාසයේ අලුත් පරිච්ඡේදයක් සටහන් කරමින් ජපානයේ ටෝකියෝ නුවරින් ශ්‍රී ලංකාවේ ජාතික ගීය අහසට නැගී දසත රැව් පිළිරැව් දුන්නේ එදා කිලිනොච්චිය අත්කරගැනීමේ සටනේදී සිය වම් අතේ සවිය ලක් මාතාව වෙනුවෙන් දන් දුන් දිනේෂ් ප්‍රියන්ත හේරත් නම් ඒ රණකාමියාගේ නාමයෙනි. කිලිනොච්චි බිහිසුනු යුද බිම මත මරණය මරා නැගී සිටි මේ අභීත ශ්‍රී ලාංකේය පුත්‍රයා එදා තමන් අතින් ගිලිහුණු ගිනි අවිය වෙනුවට මෙදා හෙල්ල අතට ගෙන ජාතිය දිනවීම පිණිස සටන් කළේය. ටෝකියෝ පැරාලිම්පික් බිමේදී, ලෝක වාර්තා ලාභියා මෙන්ම දෙවරක් පැරාලිම්පික් රන් පදක්කම්ලාභියා වන, ෆින්ලන්තයේ සිට පුහුණුවී පැමිණි ඉන්දියාවේ දේවේන්ද්‍ර ජාජාරියා දෙවැනි තැනට පත්කරමින් ඔහුගේ ලෝක වාර්තාව ද සියතට ගත් දිනේෂ්, ඉතිහාසයේ පළමු වරට සමස්ත ලෝකවාසීන්ම නියෝජනය වන ක්‍රීඩා උළෙලකදී රන් පදක්කමකින් ලක්මාතාව සරසවන්නට පමණක් නොව, ඉතිහාසයේ පළමු වරට මලල ක්‍රීඩා ඉසව්වකදී ලෝක වාර්තාවක් ශ්‍රී ලංකාවේ නාමයෙන් ලියාදීමට ද සමත් වුණි.

මොහුගේ ජයග්‍රහණය ජාත්‍යන්තර පැරාලිම්පික් කමිටු නිල වෙබ් අඩවිය විසින් වාර්තා කරනු ලැබුවේ 'යුද විරු දිනේෂ් ප්‍රියන්ත හේරත් ශ්‍රී ලංකාවට ඉතිහාසයේ සනිටුහන් වෙයි' යනුවෙනි.

ඒ සියල්ලට තීරණාත්මක හේතුව බවට පත්වූයේ එදා කිලිනොච්චි යුද බිමේදී සිදුවූ ඒ සිදුවීමයි.

දැන් නැවතත් ඒ කිලිනොච්චි යුද බිමට යමු.

පෙනෙන මානයේ සතුරු කාලතුවක්කු උණ්ඩ පතිත වෙද්දී වෙඩි වරුසා මධ්‍යයේ තමන්ව වත්තම් කරගෙන ආරක්ෂිත ස්ථානයක් වෙත ගෙන යෑම පිණිස තම සගයෙක්ව හෝ අවදානමේ නොහෙලා, අප්‍රාණික අතත් දරාගනිමින් දෙවැනි ආරක්ෂිත වල්ලල වෙත සේන්දු වූ දිනේෂ්ව වහාම ගුවන් මගින් අනුරාධපුර යුද හමුදා රෝහල වෙත ගෙන එන ලදී. දිනේෂගේ අත වෙඩි උණ්ඩ වැදීමෙන් අස්ථි බිඳීගොස් තිබුණි. ඔහුගේ අතේ ස්නායුවලට දැඩි ලෙස හානි සිදුව තිබුණි. තමන්ගේ වම් අත තවදුරටත් ශරීරය හා එක්වේද නැතිනම් එය කපාදමයිද යන සැකය දිනේෂ්ගේ සිතෙහි මතුවිය.

'අපි මූලික ප්‍රතිකාර කරලා ඔයාව කොළඹට යවනවා. ඔයාගෙ අත කපන්න වෙන එකක් නෑ. ඒ වුණාට අතේ ස්නායුවලට හානි වෙලා තියෙන නිසා අත වෙනද වගේම ක්‍රියා කරයිද කියලා නම් කියන්න බැහැ' වෛද්‍යවරයෙක් දිනේෂ්ගේ සැකයට පිළිතුරු දුන්නේය.

අනුරාධපුරයේ සති දෙකක ප්‍රතිකාර ලැබීමෙන් අනතුරුව දිනේෂ්ව කොළඹ යුද හමුදා රෝහල වෙත එවිණි.

'මම අත හොඳ කරගෙන ආපහු යුද්දෙට යන්න ආසාවෙන් හිටියේ. කාලයක්ම ප්‍රතිකාර කරලා අතේ සියයට පනහක විතර ක්‍රියාකාරීත්වයක් ගත්තා. ඒත් මැණික් කටුව එහෙම වැඩ කරන්නේ නෑ. ඒ නිසා ආයෙත් යුද්ධයට යන්න බැරිවුණා' යි ටෝකියෝ සිට 'සති අග අරුණ' සමග පිළිසඳරකට එක්වෙමින් පැවසුවේ ඒ විරුවාය.

මේ අයුරින් වසර 4ක පමණ කාලයක් දිනේෂ් පුනරුත්ථාපනය විය.

දිනේෂ්ගේ ජීවිතයේ තීරණාත්මක දෙවැනි පරිච්ඡේදය ඇරඹෙන්නේ එතැන් සිටය.


දිනේෂ්ගේ මව, බිරිය හා දරුවන්

ඒ 2012 වසරයි. ඔහු එවක රැඳී සිටියේ සේනපුර කඳවුරේය. යුද හමුදා අන්තර් රෙජිමේන්තු පැරා ක්‍රීඩා උළෙලට සේනපුර කඳවුරෙන් ද පිරිසක් සහභාගී කරවීමට යෙදුණි. ඒ කාර්යය පැවරුණේ සැරයන් දසනායකටය.

'දිනේෂ්, උඹේ ඇඟේ හැටියට උඹට හෙල්ල විසිකරන්න පුළුවන් කියලා ෂුවර්. අපි ඒ ඉවෙන්ට් එකට ලෑහැස්ති වෙමු.'

එය දෛවෝපගත උපදෙසක්ම විය. සේනපුර, කාගම, ධාතුසේන විදුහලෙන් අධ්‍යාපනය ලැබූ දිනේෂ්ට, එවැනි ක්‍රීඩා පසුබිමක් පාසල තුළ නොවීය. හමුදාවට බැඳුණු ඔහු වසර 11කට අධික කාලයක් රට බේරා ගැනීමේ සක්‍රිය සේවයේ යෙදී සිටියා මිස යුද හමුදාව වෙනුවෙන් ක්‍රීඩාවක නිරත වීමේ අවස්ථාවක් නොගත්තේය. නමුත් කිසිදු ක්‍රීඩාකර නොතිබූ මේ ආබාධිත රණකාමියාගේ දේහ ලක්ෂණවල සුපිරි හෙල්ල විසිකරන්නෙක් සිටින බව හඳුනාගත් ඔහු සැරයන් දසනායකය. සැබැවින්ම ඉකුත්ද ටෝකියෝ නුවරදී ඒ ඉතිහාසගත ජයග්‍රහණයට යන මග මංගල පියවර තැබීමට ආරාධනා කරන්නේ, අද යුද හමුදාවෙන් විශ්‍රාම ගොස් සිටින සැරයන් දසනායක නම් ආබාධිත රණ විරුවාය. මේ ලියැවෙන ජයග්‍රාහී කතාව පසුපස සැඟවුණු විරුවෙක් ලෙසින් දිනේෂ් විසින් ඔහුව සිහිපත් කරනු ලබයි.

එදා සැරයන් දසනායකගේ 'අනාගත වාක්‍යය' සහමුලින්ම ඔප්පු කරමින් ඉතා කෙටි පුහුණුවකින් අනතුරුව 2012 වසරේ පැවැති යුද හමුදා අන්තර් රෙජිමේන්තු පැරා ක්‍රීඩා උළෙලේදී හෙවත් තම මංගල ක්‍රීඩා ඉසව්වේදීම රන් පදක්කම දිනාගැනීමට දිනේෂ්ට හැකිවිය. එම ජයග්‍රහණය හේතුවෙන් ඔහුට 2012 වසරේදීම මැලේසියාවේ පැරා තරගාවලියකට සහභාගීවීමට අවස්ථාව ලැබුණි. සිය පළමු ජාත්‍යන්තර ජයග්‍රහණය එහිදී වාර්තා කරගත් දිනේෂ් එහිදී රන් පදක්කම් ලාභියා විය. 2014 ඉන්චියොන් ආසියානු පැරා ක්‍රීඩා උළෙලේදී ඔහුට හිමිවූයේ 6 වැනි තැනයි. නමුත් දිනේෂ් නොසැලුණි. අදිටන පෙරට ගෙන පුහුණුවේ යෙදුණි. 2015 වසරේදී කටාර් හී පැවැති ලෝක ශූරතාවට ගිය දිනේෂ් එහිදී 6 වැනි තැනට පත්වෙමින් වැඩි කල් නොගොස්ම ලොවටම අභියෝග කරන බවට ඉඟි පළ කළේය. 2016 දී ජර්මනියේ පැවැති පැරාලිම්පික් සුදුසුකම් ලැබීමේ තරගාවලියකට සහභාගී වූ දිනේෂ් එහිදී පැරාලිම්පික් වෙනුවෙන් සිය සුදුසුකම් ඔප්පු කර සිටියේය. අනතුරුව රියෝ පැරාලිම්පික් උළෙලට ගිය දිනේෂ්, එහිදී ලෝකඩ පදක්කම දිනාගනුයේ, ප්‍රදීප් සංජයගෙන් අනතුරුව මෙරට ඉතිහාසයේ පැරාලිම්පික් පදක්කමක් දිනාගත් ක්‍රීඩකයා බවට පත්වෙමිනි.

2017 වසර දිනේෂ්ගේ හැකියාවන්ට සුවිශේෂී වසරකි. ඔහුට සිය වත්මන් පුහුණුකරු ප්‍රදීප් නිශාන්තව හමුවන්නේ එම වසරේදීය. මෙරට සිටින අතිදක්ෂම විසිකිරීම් පුහුණුකරුවෙක් වන මෙන්ම ඔලිම්පික් වරම් ලැබූ සුමේධ රණසිංහ ක්‍රීඩකයාගේද පුහුණුකරු වන ප්‍රදීප් නිශාන්තගේ ගුරුහරුකම් හමුවේ තියුණු ලෙස සිය හැකියාව ඔප්නංවා ගැනීමට දිනේෂ් සමත්වන්නේය.

2017 ලන්ඩන් ලෝක පැරා මලල ක්‍රීඩා ශූරතාවේදී රිදී පදක්කමක් දිනාගන්නා දිනේෂ් මෙරට ඉතිහාසයේ පළමු වරට ලෝක පැරා මලල ක්‍රීඩා ශූරතාවේදී පදක්කමක් දිනාගැනීම සටහන් කරන්නේය. 2018 වසරේදී ආසියානු පැරා ක්‍රීඩා උළෙලේ ශ්‍රී ලංකා කණ්ඩායම් නායකයා ලෙසින් සහභාගී වෙමින් තරගාවලි වාර්තාවක් සමගින් ඔහු රන් පදක්කම දිනාගන්නේය. 2019 ඩුබායි ලෝක පැරා මලල ක්‍රීඩා ශූරතාවේදී නැවතත් රිදී පදක්කමක් දිනමින් හෙතෙම ලෝක මට්ටමේ සිය හැකියාව දිනෙන් දිනම පෙරට රැගෙන ගියේය. ඉකුත්ද ටෝකියෝ පැරාලිම්පික් බිමේදී මස්තකප්‍රාප්ත වන්නේ එම හැකියාවයි.

ලෝක ශූරයකු බිහිවන්නේ අහම්බයකින් නොවේ. ඔහු ක්‍රීඩාව වෙනුවෙන් අප්‍රමාණ වෙහෙසක් මහන්සියක් වෙයි. එසේම ශරීර ශක්තියට හෙතෙම ආධ්‍යාත්මික ශක්තිය ද මුසු කරයි. මේ, මේ බිමෙන් මතුවූ ලෝක ශූරයකුගේ දවස ගෙවෙන හැටිය.

'මම පාන්දරින් ඇහැරෙනවා. ඇහැරිලා බුදු පහන තියලා වඳිනවා. උදේ 6.30ට පුහුණුවීම් අරඹනවා. පැය 5ක් විතර එක දිගටම පුහුණුවීම් කරනවා. මොන දේ තිබුණත් රෑට බුදු පහන තියල වන්දනා කරලයි නින්දට යන්නේ'

දිනේෂ් ටොරින්ටන් හී ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ නේවාසිකව සිටිය ද මේ වත්පිළිවෙත් ඒ ආකාරයට කරගෙනු යනු ලබන්නේ, ආදර්ශවත් හැකියාවක් සමග ආදර්ශවත් ආධ්‍යාත්මයක් ද සමබරව පත්වාගනිමිනි.

මේ ජයග්‍රහණය පිටුපස ඔහුට ශක්තියක් වූයේ කව්රුන්ද?

'මේ ජයග්‍රහණය පිටුපස යුද හමුදාව දුන්නු ශක්තිය අපමණයි. ඒ වගේම විශේෂයෙන් මතක් කරන්න ඕනේ වත්මන් ක්‍රීඩා ඇමතිතුමා, ජාතික ක්‍රීඩා සභාව අපි වෙනුවෙන් ඉහළ කාර්යසාධන සංචිතය හදලා අපිට මාසිකව රුපියල් ලක්ෂයක් වගේම, පෝෂණ දීමනාවක් පවා දුන්නා. ඒ කියන්නේ කෑම බීම, ඉඳුම් හිටුම්, මාසික දීමනා හැම දෙයක්ම දුන්නා. මේ ජයග්‍රහණය පිටුපස ඉන්න තව විශේෂ චරිතයක් ඉන්නවා. ඒ මගෙ බිරිඳ නිශංකා. එයා දරුවො තුන්දෙනාගෙ වැඩ හැම දෙයක්ම තනියෙම කරගෙන මට සම්පූර්ණයෙන්ම මගෙ ක්‍රීඩාවත් එක්ක යෙදෙන්න අවස්ථාව දෙනවා. එදා මම තුවාල ලබපු වෙලාවේ ඉඳලම අද දක්වා මට අඩුපාඩුවක්, බරක් නොදැනෙන්න මට හැමදෙයටම උපකාර කරන්නේ එයා. එයා තමයි මගෙ හීරෝ (වීරයා)'

ඇවැස්ස නෑනා ඉරණම්කාරිය බවට පත්ව ඔහුගේ ලෝකයේ වීර චරිතය බවට එසේ පත්වද්දී ඔහු හෘදයාංගමව මේ ජයග්‍රහණය පිටුපස සිටින සියල්ලන්ම සිහිපත් කරයි. මේ ජයග්‍රහණයට ඔබ්බෙන් ලබාගත් පන්නරයක් ද හේ මෙසේ සිහිපත් කරයි.

'මට අවුරුදු 12දි මගෙ තාත්තා නැතිවෙන්නේ වකුගඩු රෝගයෙන්. දරුවො තුන්දෙනෙක් එක්ක මගෙ අම්මට පවුල නඩත්තු කරන එක ලෙහෙසි වුණේ නැහැ. අම්මට පවුල ඇදගෙන යන්න මට පුළුවන් හැම විදිහකටම මමත් උදව් කළා. මම අවුරුදු 15 වෙනකොට තනියෙම කුඹුරු කළා. ඒ ගත්තු ගැම්ම තමයි යුද්ධයේදිත් මගෙ හිතට ධෛර්යය දුන්නේ. එදා පුංචිකාලෙ පටන්ම කරපු ඒ කැපකිරීම් වගේම සොල්දාදුවෙක් හැටියට ලබාගත්තු පන්නරයත් මේ ජයග්‍රහණය පිටුපස්සේ තිබෙනවා'

හෙට රට දිනන ක්‍රීඩකයෙක් වෙනුවෙන් සිය අත්දැකීම් ඇසුරෙන් ලබාදෙන පණිවුඩය කුමක්දැයි අවසන් වශයෙන් අපි සුමේධගෙන් ඇසුවෙමු.

'මගෙ තුන්වැනි පුතා උපදින්නේ මේ අවුරුද්දේ අප්‍රේල් 13 වැනිදා. මම පුතාවයි නෝනවයි ඉස්පිරිතාලෙන් ගෙදර එක්කරගෙන ඇවිත් පහුවෙනිදාම පුහුණුවීම්වලට කොළඹ ආවා. එදා ඉඳලා අද වෙනකම් මම පොඩි පුතාගෙ මූණ දැකලා තියෙන්නේ තුන් වතාවයි. මම ඒක කිව්වේ කැපකිරීම කියන්නේ මොන වගේ දෙයක්ද කියන එක අනෙක් ක්‍රීඩකයන්ට තේරුම් ගන්න.'

ඔහු හුදෙක් ක්‍රීඩකයෙක් නොවේ. දිනේෂ් ප්‍රියන්තව ක්‍රීඩකයෙකුගේ තැනට ලඝු කිරීම එම චරිතයේ සැබෑ වටිනාකමට සිදුකරන අසාධාරණයකි. අවතක්සේරුවකි. කොළු ගැටයෙකුගේ සිට අනේකවිධ ජීවන දුක්ඛ දෝමනස්සයන්ට මුහුණදෙමින්, යන්තම් දහ අට විය ඉක්මවද්දී රට රැකුමට එක්ව, සිය ගත සවිය ද රට වෙනුවෙන් කැපකර ඉන් නොනැවතී සකලවිධ කැපකිරීම් කර ඔහු ක්‍රීඩාපිටියේ ජයග්‍රහණයන් ඉක්මවූ ජයග්‍රාහකයෙකි. ජාතියට උත්තේජකයකි. උත්ප්‍රේරකයකි. උදාහරණයකි.

ඉන්ද්‍රජිත් සුබසිංහ
ඡායාරූප - ප්‍රදීප් රණතුංග, කැකිරාව

## අපිට ණයක් ගෙවන්න ඕනෑ වුණා

### දිනේෂ්ගේ පුහුණුකරු ප්‍රදීප්

මේ සටහන වෙනුවෙන් කරුණු සොයා යද්දී ටෝකියෝ පැරාලිම්පික් රන් පදක්කම්ලාභී දිනේෂ් ප්‍රියන්ත මෙන්ම, එම උළෙලේදීම ලෝකඩ පදක්කමක් දිනාගත් සමිත දුලාන් යන දෙදෙනාගේම පුහුණුකරු වන ප්‍රදීප් නිශාන්ත අපූරු ප්‍රකාශයක් කළේය. කලක් ක්‍රීඩකයෙක් ලෙසින් යුද හමුදාව හා සම්බන්ධව සිටි සහ වර්තමානයේ රාජගිරිය ගේට්වේ ජාත්‍යන්තර පාසලේ සහය ක්‍රීඩා ප්‍රධානී තනතුර දරන ඔහුට මේ ආකාරයෙන් පැරාලිම්පික් පදක්කම්ලාභීන් දෙදෙනෙක් එකවර බිහිකිරීමට හැකිවූයේ කෙසේද? මෙම පැරාලිම්පික් උළෙලේදී ශ්‍රී ලංකාවට ප්‍රබලම අභියෝගය වූ ඉන්දියානු ක්‍රීඩකයන් ෆින්ලන්තයේ සිට පුහුණුව ලබා පැමිණෙද්දී ප්‍රදීප් ලංකාවේ සිට සිය ගෝලයන්ට එයට වඩා දක්ෂතා කැවීමට සමත් වූයේ කෙසේද? සැබැවින්ම මේ පදක්කම් පිටුපස ඇති රහස කුමක්දැයි අපි ඇසුවෙමු. **මේ ඔහු එයට දුන් පිළිතුරයි,**

'මම ඔලිම්පික් වගේම පැරාලිම්පික් නියෝජනයට ක්‍රීඩකයන් හැදුව පුහුණකරුවෙක්. ඒ පුහුණුකිරීමෙන් එහා ගියපු, මේ ජයග්‍රහණයට හේතුවුණු වෙනත් කාරණාවක් ගැන කියන්න ඕනේ. මගේ ක්‍රීඩකයන් දෙන්නට වගේම මටත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ඉහළ කාර්යසාධන සංචිතය යටතේ


ප්‍රදීප් දිනේෂ් සමග

මාසික දීමනා ලැබුණා. අපිට ඒ දීමනාව අතට ගන්නකොට හිතුනා 'දෙයියනේ මේ රටේ සල්ලි නේද' කියලා. රටේ මිනිස්සුන්ගේ සල්ලි අපි අතට අරගෙන රටට යමක් නොදුන්නොත් ඒක අපි රටේම මිනිස්සුන්ට කරන අවැඩක්, අපතේ දැමීමක්ය කියලා අපි කතාවුණා. අපි පුදුම උනන්දුවක් ගත්තා, අධිෂ්ඨානයක් ගත්තා ඒ ලැබෙන මුදලට උපරිම සාධාරණය කරන්න' ප්‍රදීප්ගේ ඒ පිළිතුර රටේ ඉහළ මට්ටමේ ක්‍රීඩකයන් හා පුහුණුකරුවන්ට මෙන්ම ජනතා මුදලින් නඩත්තු වෙමින් තමන්ටම නොදැනී රටට ණය කාරයන් වන සියල්ලන්ටම තමන්ගේ හදවතට තට්ටු කර බැලීමට මෙන්ම හදවතට ශක්තියක් එන්නත් කරගැනීමට හේතුවනු ඇත.

කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk

කතෘමණ්ඩල : 0115 978985
දැන්වීම් : 0112 672601, 0112 672603
බෙදාහැරීම්: 0115 978987, 0115 886186
වෙබ් : www.aruna.lk

ෆැක්ස් :0112 673451
ෆැක්ස් :0112 672648
ෆැක්ස් :0112 673440

Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

# අමාරුකාරයෝ

රජයේ සේවකයන්ගේද පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේද වැටුප් කපා මේ ආර්ථික අභේනියට යම් සහනයක් ලබා දිය යුතු යයි පසුගිය දිනවල ජනමතයක් ගොඩනැගෙමින් තිබිණ. වෘත්තීය සංගම් නායකයන් කීවේ රජයේ සේවකයන්ගේ වැටුප් කප්පාදු කරන්නට කලින් පාර්ලිමේන්තු මැති ඇමැතිවරුන්ගේ වැටුප පරිත්‍යාග කළ යුතු බවය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වුණ මන්ත්‍රිවරු වහ වහා තම වැටුප පරිත්‍යාග කරමින් ඒ බව ප්‍රවෘත්ති සාකච්ඡා තබමින් ප්‍රකාශයට පත් කළේය. මහින්ද අමරවීර අමාත්‍යවරයා කොරෝනා තිබෙන තෙක් තම වැටුප රජයට පරිත්‍යාග කරන ලියවිල්ලක්ද භාර දුන්නේය.

ඩියුටි ෆ්‍රී වාහන බලපත්‍රය පිටට විකුණන විට එයට ප්‍රචාරය නොකළ මන්ත්‍රිවරු පාර්ලිමේන්තු වැටුප පරිත්‍යාග කරන මොහොතේ එය ප්‍රචාරය කිරීම පසුගිය සතියේ මානිගෙ තීරුවෙන් උපහාසයට ලක් කර තිබිණ. එහෙත් පියල් නිශාන්ත රාජ්‍ය අමාත්‍යවරයා තමන්ගේ වැටුප නම් පරිත්‍යාග කළ නොහැකි බව ප්‍රකාශ කළේය. ඒ එතුමා ඒ වැටුපෙන් ණය අරගෙන තිබෙන නිසාය. ඩිලාන් පෙරේරා මන්ත්‍රිවරයාද එස්. බී. දිසානායක මන්ත්‍රිවරයාද තමන්ට මුළු වැටුපම පරිත්‍යාග කළ නොහැකි බව කියමින් වැටුප පරිත්‍යාග කිරීම ප්‍රතික්ෂේප කළේය.

මේ අනුව දැන් පාර්ලිමේන්තුවේ ඉන්නේ අපට වඩා අමාරුකාරයන් බව පෙනේ.

අද පමණක් නොව ආර්ථික අර්බුදයක් සහිත ජාතික ව්‍යසනයකදී මැති ඇමැතිවරු පළමුව වැටුප් කප්පාදු කරගෙන දෙවනුව ජනතාවට එබඳු පරිත්‍යාගයකට ආරාධනා කිරීම අපේක්ෂිත සිරිතකි. එක්දස් නවසිය විස්ස අවසාන භාගයේ එනම් මීට වසර 100කට පෙර ලෝක ආර්ථික අවපාතය ලංකාවට තදින් දැනෙන්නට විය. පහළොස් දහසක් පමණ මරණයට පත් කළ මැලේරියා වසංගතයද දරුණුවට සතර කෝරළේ පැතිරුණේ එකලය.

එද පැවැති ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ සාමාජිකයකුට වැටුප රුපියල් පන්සියයක්ද නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් ද හිමි විය. පවතින ජාතික ආර්ථික අර්බුදය හමුවේ මන්ත්‍රී වැටුපෙන් රුපියල් සියයක් කැපිය යුතු යැයි එද ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රිවරු යෝජනා කළහ. එවිට ව්‍යවස්ථාදායක සභාවේ සිටි ඒ. ඊ. ගුණසිංහ ව්‍යවස්ථාදායක සභාවේ ඉන්නා මන්ත්‍රීන් 49 දෙනාගෙන් රුපියල් සියය බැගින් කැපීම විහිළුවක් බවත් ඔවුන්ගේ මුළු පඩියම පරිත්‍යාග කළ යුතු බවටත් කියමින් විවේචනය කළේය. එද ව්‍යවස්ථාදායක සභාවේ සිටි 49දෙනා රේන්දකරුවෝ, වතුහිමියෝ, මිනිරන් පතල් හිමියෝ වූහ. එහෙත් මැලේරියා වසංගතය සහ ආර්ථික අවපාතය නිසාවත් මුළු පඩියම කැපූ බවක් හෝ පඩියම පරිත්‍යාග කිරීමට එගඟ වූ බවක් වාර්තා වන්නේ නැත.

ඔවුන් පඩිය මුළුමනින්ම රජයට දුන්නේ නැතත් ඇතැමුන් රටේ උන්නතියට පුද්ගලික ධනයෙන් විශාල පරිත්‍යාග කළ පරිත්‍යාගශීලීන් බවද අමතක නොකළ යුතුය.

කෙසේ වෙතත් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් පඩිය පරිත්‍යාග කළ යුතු යයි ජනතාව සිතන්නේ එයින් රටේ ආර්ථිකයට විශාල ගැම්මක් ලැබේ යැයි සිතා නොවේ. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකුගේ මාසික වැටුප රුපියල් 54285කි. පාර්ලිමේන්තුවට වරක් පැමිණීමේදී රුපියල් 2500ක දීමනාවක් ලැබේ. කාර්යාලයක් සඳහා රුපියල් 100000ක් ලැබේ. මේ අතරින් වැටුප් කපා මුදල් ඉතිරි කර ගත්තත් රජයට වාර්ෂිකව ඉතුරු වන්නේ රුපියල් දහතර කෝටි පනස් අට ලක්ෂයකි. ඒ මුදල මන්ත්‍රිවරයකුගෙන් කපා ගැනීමෙන් උන්ටත් පඩි නෑ කියන ඊර්ෂ්‍යාකාර සතුට විනා ජනතාවට ලැබෙන දෙයක් නැත. එහෙත් ජනතාව එසේ කියන්නේ ජනතාවට රජයේ සේවකයන්ට යම් කැප කිරීමක් කිරීම සඳහා ධෛර්යයක් ලබා දීමටය.

එසේ නැතිව පාර්ලිමේන්තුවේ 225 පමණක් එකතුව පරිත්‍යාග කර මේ අර්බුදයෙන් ගොඩ එන්නට ඉඩක් ලැබෙන්නේ නැත.

මෙරට රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව ලක්ෂ පහළොවකි. ඔවුන්ගේ වැටුප් බිල රුපියල් බිලියන 1200කි. මේ වැටුප් බිල ගෙවීම රජයට තිබෙන විශාල අභියෝගයකි. මීට පෙර වතාවක් පී.බී. ජයසුන්දර ජනාධිපති ලේකම් හෙවත් රටේ ප්‍රධාන රාජ්‍ය නිලධාරියා ලෙස හැම රජයේ සේවකයකුම දවසක වැටුප පරිත්‍යාග කළ යුතු බව කීවේය. එසේ කිරීමෙන්ද ජාතියට ඉතිරිවන මුදල බිලියන දෙකකට වැඩි නොවේ.

දැනටමත් රජයේ අමතර වියදම් කර තිබේ නම් බඳවා ගැනීම්, පත්වීම් ලබාදීම් මතු නොව වැඩට නොඑන දිනවල වැටුප් නතර කිරීමටද රැස්වීම් ආදියට නිලධාරීන්ට පැමිණීම වෙනුවෙන් ගෙවන ඉන්ධන හා දීමනාවද පැමිණෙන දිනට පමණක් ගෙවීමටද තීන්දු කර ඇත. එහෙත් තවත් අමාරුකාරයින් පිරිසක් රටේ වෙති. රුපියල් 50ක්ව තිබූ සීනි සඳහා රේගු බද්ද ශත 25ට අඩු කර දුන්නේ මෙරට සීනි මිල අඩු කිරීමටය. එහෙත් ඒ රේගු බදු සහනය ගත් සීනි ව්‍යාපාරිකයෝ සීනි විකිණුවේ කිලෝව රුපියල් 200ටය. ඔවුන් කීවේ ඩොලරයේ අගය ඉහළ යන නිසා තමන්ට අමාරු බවය. මහ පරිමාණ සහල් ව්‍යාපාරිකයෝද වී තොග හංගාගෙන සහල් මිල නැංවීමට කටයුතු කළේ තමන් වී වැඩි මිලට ගත් නිසා අමාරු බව කියමිනි. මේ ජාවාරම්කාරයන්ද මන්ත්‍රිවරුන්ද අමාරුවෙන් ඉන්නා මේ කාලයේ

දෛනික ආදායම් මාර්ග අහිමි වීම නිසා රජයෙන් ගෙවමින් සිටි රුපියල් 2000 දීමනාව යළි රජයට පරිත්‍යාග කළ පිරිසක් පිළිබඳ පුවතක් පසුගිය සතියේ වාර්තා විණ. රූපවාහිනී කැමරා නැතිවම තමන්ට පුළුවන් හැටියට පරිත්‍යාග කරන තැනට ජනතාව පත්ව සිටිති. කිරිබත්ගොඩ නගරයේ රුපියල් කෝටි දෙකක් බෙදූ බෙවන් නම් කුප්‍රකට ව්‍යාපාරිකයාගේ පුතාගේ පටන් බොහෝ දෙනෙක් දැන් කැප කිරීම පටන් ගෙන ඇත. ස්වේච්ඡාවෙන් ලොක් ඩවුන් වෙමු යයි තීන්දු කළ අයටද දැන් ස්වේච්ඡාවෙන්ම කැප කිරීම් කළ යුතු කාලය පැමිණ ඇත.

එහෙත් ජනතාවට වඩා අමාරුකාරයින් ඉන්නා තාක් එසේ කරන්නට බැරි වනු ඇත.

# දැන් ඉතින් ඇෆ්ගනිස්තානය ලෝකයට කුමක් සපයනු ඇතිද?

පසුගිය අගෝස්තු 31 වැනි ද ඇෆ්ගනිස්තානයට හිරු උදා වූයේ ලෝක භූ දේශපාලනික තීන්දු සම්බන්ධයෙන් බලවත් විවේචනයක් සහ සංකීර්ණත්වයක් එක්කරමිනි.

ඇෆ්ගනිස්තානයේ රැඳී සිටි ඇමරිකා හමුදා භටයන්, පුරවැසියන් මෙන් ම වෙනත් මිත්‍ර රටවල හමුදාවන් සහ පුරවැසියන්ද ඔවුන්ට සහාය වූ ඇෆ්ගන් වැසියන්ද පසුගිය 31 වැනිදා වන විට ඇෆ්ගනිස්තානයෙන් සම්පූර්ණයෙන් ඉවත් කරගෙන තිබිණ. ඒ ඉවත් කර ගැනීම සමග සනිටුහන් වූයේ දීර්ඝ කලක් තිස්සේ ත්‍රස්තවාදී සංවිධානයක් ලෙසින් නම් කර තිබූ සංවිධානයක් වෙත එරට සාමාන්‍ය මිනිසුන්ගේ ඉරණම භාර කරමිනි. එසේත් නොමැති නම් බිලි දෙමිනි. මහා බ්‍රිතාන්‍යය විසින් හොං කොං දේශය චීනයට භාර දීම හෝ එවැනි රාජ්‍ය තාන්ත්‍රික හුවමාරුවක් වශයෙන් මෙම සංසිද්ධිය කිසි ලෙසකවත් පැහැදිලි කිරීමට නොහැකිය.

පසුගිය අගෝස්තු මස 15 වැනිදා තලෙයිබාන් සංවිධානය කාබුල් නුවර වටලමින් සමස්ත ඇෆ්ගනිස්තානයේ බලය ආපසු තමන් වෙත නතුකර ගැනීමත් සමග නිදහස ප්‍රිය කළ ඇෆ්ගන් පරම්පරාවක මහා ඛේදවාචකය ආරම්භ විය. තලෙයිබාන් සංවිධානය යනු කාන්තාවන් පාසල් නොයා යුතු බවත් රැකියා නොකළ යුතු බවත් සංගීත ප්‍රසංග ආදී ප්‍රසිද්ධ බහුරූ කෝලම් නොකළ යුතු බවටත් නීති පනවමින් දැඩි ආගමික අන්තවාදයක් මත ඇෆ්ගනිස්තානය කලක් පාලනය කළ සංවිධානයකි. ඔවුන් මෙවර ප්‍රකාශ කර ඇත්තේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ඇතුළු මිනිසුන්ගේ නිදහස සම්බන්ධ කරුණුවලදී ෂරියා නීතියට අනුව කටයුතු කරන බවත් කාන්තාවන්ට ඉගෙන ගැනීමට සහ රැකියා කිරීමට ෂරියා නීතියට අනුව ඉඩ සලසන බවත්ය. කෙසේවෙතත්, ඔවුන් ෂරියා නීතිය අර්ථ දක්වන ආකාරයත් මිනිසුන්ගේ නිදහස සම්බන්ධ කරුණුවල දී ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙනුත් තීරණය කිරීමට හැකි වන්නේ ඔවුන්ගේ භාවිතය තුළිනි.

තලෙයිබාන් සංවිධානයට ඉදිරියට ඒමට අවකාශ සලසමින් ඇමරිකා හමුදා කණ්ඩායම් ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් මේ වන විට ජෝ බයිඩන් පාලනයට දැඩි විවේචනයක් එල්ල වී තිබේ. එක් අතකින් එය ප්‍රජාතන්ත්‍රවාදය සහ නිදහස ප්‍රිය කළ ඇෆ්ගන් ජනතාව පාවා දීමකි. පසුගිය අවුරුදු විස්සක පමණ කාලය තුළදී තලෙයිබාන් පාලනය පෙරළා දමා ඇමරිකාවේ සහයෝගීත්වයෙන් ආරම්භ කළ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමය යටතේ හැදී වැඩුණු පරම්පරාව සම්පූර්ණයෙන් අනාථ කර දැමීමක් මේ ඔස්සේ සිදු වී ඇත. ඇමරිකා එක්සත් ජනපදය තම හමුදාවන් ඉවත් කර ගත්තේ තලෙයිබානු දුෂ්ටත්වය නොදැන නොවේ.

කෙසේවෙතත්, ඇමරිකාවේ ඉවත් වීම සමගින් කලාපීය භූදේශපාලනය සඳහා අලුත් පර්යාවලෝකයක් නිර්මාණය වී තිබේ. රුසියාව සහ චීනය තමන්ගේ අඩුව පිරවීම සම්බන්ධයෙන් ඇමරිකා එක්සත් ජනපදයටද බටහිර රටවලද දැඩි තැති ගැන්මක් ඇති වී තිබේ. ඇෆ්ගනිස්තානය යනු දුර්ලභ ගණයේ ඛනිජ සංචිත ඇති භූමියක් වන අතර ඒවා නිස්සාරණය කර ගැනීම සඳහා අත තබා හෝ නොමැත. තම අසල්වැසි රටක් වන ඇෆ්ගනිස්තානයේ මෙම මහා ඛනිජ නිධි චීනයට විශාල ආශීර්වාදයක් වන අතර ඇෆ්ගනිස්තානයට රාජ්‍ය තාන්ත්‍රික සුජාතභාවය ලබා දෙන මුල් ම රටවල් අතරට චීනය බොහෝ විට පත් වනු ඇත. තලෙයිබාන් සංවිධානය ඇෆ්ගනිස්තානයේ බලය අල්ලා ගැනීමටත් පෙර සිට ම චීනය සමගින් සම්බන්ධතා පවත්වමින් සිටි අතර තලෙයිබාන් නායකයන් සාම සාකච්ඡා ඇතුළු විවිධ මැදිහත් වීම් සඳහා 2010 වසරේ සිට චීනයේ විටින් විට සංචාරය කර ඇත.


තලෙයිබාන් පාලනයක් යටතේ චීනය විශාල වශයෙන් ඇෆ්ගනිස්තානය තුළ ආයෝජන සිදු කිරීමේ අවස්ථාවක් තිබෙන අතර ඇෆ්ගනිස්තානයේ ප්‍රධානතම වෙළෙඳ හවුල්කරුවා බවට චීනය පත් වීමේ හැකියාවක්ද ඇත. දැනටමත් පාකිස්තානය සමගින් පවත්වා ගෙන යන සබඳතා ඉන්දීය විරෝධී ආස්ථානය ද නිසා මෙම චීන ප්‍රතිපත්තිය නිසැක වශයෙන් ඉදිරියට යනු ඇත.

ඇෆ්ගනිස්තානය භූ දේශපාලනික වශයෙන් ඉතා වැදගත් ස්ථානය පිහිටා ඇති අතර යුරෝපය, මැදපෙරදිග සහ ආසියාව යා කරන පාලම වැටී ඇත්තේ ඇෆ්ගනිස්තානය හරහායි. ඇෆ්ගනිස්තානයේ ඇති උපායමාර්ගික වැදගත්කම නිසා එය ආක්‍රමණයට ලක් වූයේ අද ඊයේ නොවේ. මහා බ්‍රිතාන්‍යය ඉතිහාසයේ අවස්ථා තුනකදී ඇෆ්ගනිස්තානය යටත් කර ගැනීමට උත්සාහ දරා තිබේ. සෝවියට් සමූහාණ්ඩුව ඇෆ්ගනිස්තානය යටත් කර තබා ගැනීමට උත්සාහ ගත්තේය. ටැං රාජ වංශය පැවති අවදියේ දී චීනයේ පාලනයට අද ඇෆ්ගනිස්තානය නතු වූයේය. එද සේද මාවත පවත්වා ගෙන යෑම සහ ගෝලීය වෙළෙඳම සකස් කර ගැනීම සඳහා චීනයට ඇෆ්ගනිස්තානය යම් සේ වැදගත් වීද අදද එහි භූ දේශපාලනික වටිනාකම අඩුවක් වී නොමැත.

තලස් යුද්ධයේදී ටැං පාලනය පසුබෑමකට ලක් වූ අතර ඇෆ්ගනිස්තානයේ පාලනය ඔවුන් අතින් අබ්බාසිද් කිලාෆතය වෙත මාරු විය. ඉන්පසු නැවතත්, චීනයට මධ්‍යම ආසියාවේ බලය පැතිරවීමට නොහැකි වූ අතර එය චීනය ලැබූ මහා පරාජයක් වූයේ පසුකාලීන ව බටහිර බලවේග චීන මුල් බිම් වෙත ද අභියෝගයක් එල්ල කළ බැවිනි.

කෙසේවෙතත්, යම් ආකාරයකින් තලස් යුද්ධයෙන් චීනය දිනුවා නම් චීනය යුරෝපයේ දේශපාලනය වෙත විශාල බලපෑමක් එල්ල කරන අතර උදාහරණයක් ලෙස ඔටෝමන් අධිරාජ්‍යය යුරෝපයේ ඇතැම් ප්‍රදේශ පාලනය කළ අයුරින් චීනය ද යුරෝපය පාලනය කරනු ඇත. අදද එම භූ දේශපාලනික වැදගත්කම, එනම් යුරෝපයට බලපෑම් කිරීමේ පදනම ඇෆ්ගනිස්තානය ඔස්සේ චීනයට නොලැබී යන්නේ නැත.

එබැවින්, ඇෆ්ගනිස්තානය එහි ඇති ඛනිජ සම්පත්, පොපිමල්, අබිං සහ හෙරොයින්වලට අමතරව භූ දේශපාලනයේ වැදගත් භූමියක් බව පෙනී යයි. ටැං රාජ වංශය ඇෆ්ගනිස්තානයේදී එද ලැබූ පරාජයෙන් පසු චීනය අවුරුදු දහස් ගණනකින් ලෝක දේශපාලනයේ පසු පසට විසිවී ගිය අතර දුර්වල සහ පැවැත්ම වෙනුවෙන් සටන් කරන රාජ්‍යයක් බවට පත් විය. ඇෆ්ගනිස්තානයේ මෙම භූ දේශපාලනික වැදගත්කම හඳුනා ගන්නා නූතන චීන පාලනය වර්තමානයේ උදා වී ඇති අවස්ථාව ස්වර්ණමය තත්ත්වයක් වශයෙන් ගනු ඇත.




චීනය මේ වන විට ගෝලීය දේශපාලනික හෙජමොනිය කෙරෙහි බලපෑම් කරමින් සිටින්නේ ආර්ථික මාදිලියකින් වන නිසා චීනයේ තීරයක් සහ මාවතක් වැඩසටහන ඉදිරියට ගෙන යෑමේදී ඇෆ්ගනිස්තානය අනිවාර්ය මර්මස්ථානයක් බවටද පත් වේ. චීනය ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගන්නා රටක් වශයෙන් ගෝලීය ආධිපත්‍යය තමන් වෙත නතු කර ගැනීමේ ව්‍යාපෘතියේදී ඇෆ්ගනිස්තානය පිළිබඳ ගණන් සැදීම සිදු කර ඇත්තේ තීරයක් මාවතක් වැඩසටහන ආරම්භ වීමටත් බොහෝ කලකට පෙරය.

ඇමරිකා එක්සත් ජනපදය ඇෆ්ගනිස්තානයෙන් ඉවත් වීම එක්තරා අතකින් 8 වැනි සියවසේදී ටැං රාජ වංශයේ බලය ඇෆ්ගනිස්තානයෙන් ඉවත් කර ගැනීමට සමාන කිරීමටද හැකිවේ. ඇෆ්ගනිස්තානයෙන් ඉවත් වූ ටැං රාජ වංශයට ඇති වූ පසුබෑම ඇමරිකා එක්සත් ජනපදයටද ඇති වන්නක් විය හැකි යැයි පෙනෙන්නේ බයිඩන් පාලනය යටතේ ඇමරිකා එක්සත් ජනපදය ආසියාව තුළ පවත්වා ගෙන යනු ලබන දුර්වල රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාවලීන්ය. දශක කිහිපයකට උඩදී ඇමරිකාව ඉතා බලහත්කාරී ලෙසින් ආසියාතික දේශපාලනයට මැදිහත් වෙමින් තිබුණද මේ වන විට තෝරා බේරා ගත් ආසියානු යහළුවන් කිහිප දෙනෙකු සමගින් පමණක් ඉතා ආරක්ෂිත දේශපාලනයකට ඇමරිකා එක්සත් ජනපදය යොමු වී ඇති ආකාරයෙන් එය පැහැදිලි වේ.

ඇමරිකා එක්සත් ජනපදයට වඩා සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ දේශපාලනයක නිරත වන චීනය ඇමරිකාව මෙන් තමන්ගේ රතු හමුදාව ඇෆ්ගනිස්තානයට එවන්නේ නැත. එසේත් නොමැති නම් ඇමරිකාවෙන් හිස් වූ අධිරාජ්‍යමය බලය වෙත චීනය පිවිසෙන්නේ නැත. චීනය මෙහිදී ඉතා සූක්ෂ්ම දේශපාලන උපායමාර්ගයක් අනුගමනය කරන අතර බොහෝ විට තලෙයිබාන් සංවිධානයේ පැවැත්ම චීනයේ ආර්ථික සහ දේශපාලන හයිය මත පාදක වන තත්ත්වයට පත් කෙරෙනු ඇත. එහෙත්, චීනයට පවතින ප්‍රබලතම ගැටලුව වන්නේ ඇෆ්ගනිස්තානය පාදක කර ගනිමින් බිහි වන අන්තවාදී සටන්කාමී සංවිධානයි. ඇෆ්ගනිස්තානය එහි භූගෝලීය වැදගත්කම නිසාම ඉතිහාසය මුළුල්ලේ ලේ හැළුණු රාජ්‍යයක් වන අතර ඉදිරියේ දී එය එසේ නොවනු ඇතැයි කීමට සාක්ෂියක් නොමැත.

විශේෂයෙන් මේ වන විටත් අයිසිස් සංවිධානය ඇෆ්ගනිස්තානය තුළ ක්‍රියාත්මක වීමත් ඇතැම් ගෝත්‍ර අතරින් තලෙයිබාන් විරෝධී කුඩා සන්නද්ධ කණ්ඩායම් ඇති වී තිබීමත් නිසා ඇෆ්ගනිස්තානයේ අන්තවාදය අනාගතයේදී තවදුරටත් වර්ධනය වීමේ ඉඩක් ඇති අතර සැතැපුම් 50ක පමණ පොදු දේශසීමාවක් ඇති චීනයටද මෙම අන්තවාදය රිංගීමේ අවදානමෙන් ගැලවීමට නොහැකිය. චීනයට පමණක් නොව රුසියාවද මේ වන විට විශාල අවධානයක් යොමු කර ඇත්තේ ඇෆ්ගනිස්තානයේ අලුතින් නිර්මාණය වෙමින් පවතින ඉස්ලාම් මූලධර්මවාදී සටන් ව්‍යාපාරයන් කෙරෙහිය.

**දර්ශන අශෝක කුමාර**

# ලොක්ඩවුන් අසාර්ථක විසඳුමක්



සමාජ විචාරක කුසල් පෙරේරා

කොරෝනා වසංගතය ව්‍යාප්තවීමත් සමග ඉදිරිපත්වූ විවිධ විසඳුම් අතරින් ඇතැම් ඒවායින් ප්‍රයෝජනයක් ගැනීමට හැකිවූයේ නැත. එහෙත් ඒ විසඳුම් කෙරෙහිම නැවත, නැවතත් අවධානය යොමු කරමින් සිටී.

මේ ආකාරයට අසාර්ථකවූ, එහෙත් දිගින් දිගටම අත්හදබලමින් සිටින විසඳුමක් වන්නේ ''ලොක්ඩවුන්'' කිරීමයි.

**මේ ලොක් ඩවුන් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්නේ කොළඹ සිටින මැද පංතියයි. නාගරික මැද පංතියට සහ මුදල් ඇති අයට ලොක්ඩවුන් කිරීම හොඳ විය හැකිය. තමන්ගේ ක්‍රෙඩිට් කාඩ් එකෙන් මුදල් ගෙවා, ඔන්ලයින් ඩිලිවරි ක්‍රමයට අවශ්‍ය බඩු නිවසටම ගෙන්වා ගන්නා අයට මේ ලොක්ඩවුන්වීම හොඳය. එහෙත් එදිනෙද තමන්ගේ ජීවනෝපාය සරිකරගන්නා දුප්පතුන්ට නම් ලොක්ඩවුන් වීම හොඳ දෙයක් නොවේ.**

ලෝක සෞඛ්‍ය සංවිධානයේ කොළඹ කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවකට අනුව පවා රට වැසීම ගැන ගණන් හද ඇත්තේ අන්තිම මෝඩ ආකාරයටය. එම වාර්තාව අනුව සැප්තැම්බර් 20 වැනිද දක්වා රට වසා තැබුවහොත් ජීවිත 7500ක් ආරක්ෂා කරගත හැකි බව සඳහන් කර තිබුණි. එසේම ඔක්තෝබර් පළමු වැනි සතිය දක්වා රට වසා තැබුවහොත් ජීවිත 10,000ක් බේරා ගැනීමට හැකි බවත් දක්වා තිබේ.

ඒ අතරම ඔක්තෝබර් මුල දක්වා රට වසා තැබීම නිසා ඩොලර් බිලියන 1.59 ක් ආර්ථිකයට අහිමිවන බවත් දක්වා ඇත. ඒ අතරම රට විවෘත කළ පසුව ඉතා වේගවත් ආර්ථික වර්ධනයකට යා හැකි බවත් පවසා තිබේ. අපේ රටේ ආර්ථිකය සීඝ්‍ර වර්ධනයකට යාමට පවා දෙපයින් සිට ගැනීමටවත් හැකියාවක් නැත. ඒ නිසා මේ කියන කතාව ප්‍රායෝගික එකක් නම් නොවේ.

අපිට නංවාගැනීමට දේශීය ආර්ථිකයක් නැත. කෘෂි කර්මාන්තය මෙන්ම ධීවර කර්මාන්තයද පවතින්නේ සහනාධාර මතය. විදේශ ආයෝජකයන් ගෙන්වා ගැනීමට බදු විරාම දුන්නත්, ආයෝජකයන්ගෙන් කිසිවක් ලැබුණේ නැත. සිදුවූයේ සෞඛ්‍ය ඇතුළු සියලුම ක්ෂේත්‍ර වාණිජකරණය වීම පමණි.

අතීතයේ අපේ රටේ හොඳ සෞඛ්‍ය ක්ෂේත්‍රයක් තිබුණේය. 1933 මැලේරියා වසංගතයේ සිට සියලුම වංසගත රෝග මර්දනය සඳහා රෝග නිවාරණ ප්‍රජා සෞඛ්‍ය සේවාවක් අපට තිබුණේය. මැලේරියාව, වසූරිය වැනි වසංගත පමණක් නොව කොකු පණු රෝගය වැළැක්වීමට අවශ්‍ය ජනතාවගේ දින චරියාව පවා දියුණු කළේය.

විවෘත ආර්ථිකය පැමිණීමත් සමග සෞඛ්‍ය ක්ෂේත්‍රය වාණිජකරණය කරන විට, රෝග නිවාරණ ප්‍රජා සෞඛ්‍ය සේවාව අතහැර දමා ප්‍රතිකාරක සේවාව වාණිජකරණය කළේය. වෛද්‍ය ක්ෂේත්‍රය කාලකණ්ණි, ආත්මාර්ථකාමී සේවාවක් බවට පත්විය.

කොවිඩ් වසංගතය පැමිණි විට අතහැර දමා තිබූ ප්‍රජා සෞඛ්‍ය සේවයට මෙය දරාගත නොහැකි විය. ඒ රජයේ සෞඛ්‍ය සේවයට වඩා පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවයට වර්ධනය වීමට අවස්ථාව ලබාදී තිබීම නිසාය. මෙවැනි වංසගතයක් පැමිණි විට එහි වගකීම් පුද්ගලික අංශය භාරගන්නේ නැත.

ඒ තත්ත්වය තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයට පසුගිය වසර හතළිහක කාලයක් තිස්සේ ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම නිසා රෝගීන් සංඛ්‍යාව අඩු කිරීමට නොහැකිය. රට ලොක්ඩවුන් කිරීමකින් මේ ප්‍රශ්නයට විසඳුම් සෙවීමට දැන් උත්සාහ ගනී.

රට ලොක්ඩවුන් කිරීමෙන් වසංගතය තවත් සති ගණනාවකින් ඉදිරියට තල්ලු කරනවා හැරෙන්නට වෙනත් කිසිවක් සිදුවන්නෙ නැත. සෑම රැල්ලක්ම එකිනෙකට වඩා දරුණු වෙමින් වර්ධනය වීම පමණක් සිදුවෙයි. ලොක්ඩවුන් කිරීමෙන් පසුව රෝගීන් වාර්තාවීම යම් තරමකට අඩුවුවත්, රෝග ලක්ෂණ නොපෙන්වමින් ආසාදිතයන් වී සිටින පිරිස් යළිත් සමාජයට නිරාවරණවීමත් සමග පැමිණෙන මීළඟ රැල්ල අපට දරාගැනීමට නොහැකිවනු ඇත.

දැනට පවතින ලොක්ඩවුන්වීම තවත් සති දෙකක් පවත්වාගෙන යා යුතු යැයි සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ ඇමැතිවරිය පවසා තිබේ. ජනතාවගේ බදු මුදල්වලින් දේශපාලඥයන් නඩත්තු කරන නිසා ඔවුන්ට එවැන්නක් පැවසිය හැකිය. එහෙත් ලංකාවේ ආර්ථිකයේ සියයට 70ක් පමණ යැපෙන්නේ අවිධිමත් අංශවලිනි. නිශ්චිත නොවන දෛනික ආදයම් ලබන පිරිසක් සිටින බව අමතක කර තිබේ.

රට වසා තබා මේ ජනතාව බඩගින්නේ තැබීම නිසා ඔවුන් බඩගින්නේ මිය යා හැකිය. එවැනි ලොක් ඩවුන් කිරීමක කිසිදු ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැත. ඒ නිසා සියල්ල ගැන අවධානය යොමු කළ යුතු වන්නේ සමස්ත චිත්‍රය තුළය.

මෙම සමාජ ආර්ථික ගැටලුව ගැන අවධානය යොමු කරමින් වසංගතය පාලනය කිරීම ගැන සිතා බැලිය යුතුය. එවැන්නක් ගැන සිතා බැලීමට අකැමැති කම්මැළි, විශේෂඥයෝ ලොක් ඩවුන් කිරීමට යෝජනා ඉදිරිපත් කරති. මෙයට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති නායකයෝද සහාය දක්වති.

මොවුන් යෝජනා කරන විද්‍යාත්මක ලොක්ඩවුන් කිරීම කුමක්ද යන්න ගැන කිසිදු අර්ථකථනයක් නැත. කිසිදු නිර්ණායකයක් නැත. මෙය කාලයක් විද්‍යාත්මක සමාජවාදයක්, විද්‍යාත්මක ඇමැති මණ්ඩලයක් ගොඩ නැගීම වැනි කතාවකි.

මේ නිසා කළ යුතු දේ වන්නේ මෙය නොවේ. ආර්ථිකය යම් ප්‍රමාණයකට අධීක්ෂණයක් යටතේ, නියාමනය කරමින් ගෙන යාමට ඉඩ තිබිය යුතුය. එහිදී ලොක්ඩවුන් යන වචනයවත් භාවිත නොකළ යුතුය.

ඒ අතරම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාට තමන්ගේ බල ප්‍රදේශය තුළ වසංගතය පාලනයට බලතල දිය යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා තීරණය කරන ආකාරයට එය කළ යුතුය. ඒ සඳහා ප්‍රජා සෞඛ්‍ය පිළිබඳ පුහුණුව ලැබූ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පවුල් සෞඛ්‍ය නිලධාරීන් සිටිති. මොවුන් සමග එක්ව තමන්ගේ ප්‍රදේශයේ රෝග නිවාරණයට, වසංගත පාලනයට කටයුතු කළ හැකිය.

මේ වන විට වසංගතය සමග සෞඛ්‍ය ක්ෂේත්‍රය හෙම්බත්ව සිටී. ඒ නිසා ඔවුන් තවත් ටික දවසකින් මේ සියල්ල අතහැර දමනු ඇත. වෙහෙස වන ප්‍රමාණය වැඩි වත්ම රෝගයට නිරාවරණය වීමේ සම්භාවිතාවද වැඩිය. මේ නිසා රෝගයට තමුන්ද ගොදුරුවිය හැකි යැයි යන බියට බොහෝ දෙනා සිය වගකීම් අතහරිමින් සිටී.

මේ නිසා අලුත් ආකෘතියක් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දුසිම් ගණනින් රාජ්‍ය සේවකයෝ සිටිති. ඒ අතරින් බහුතරය කාන්තාවන්ය. මෙහිදී මෙම කාන්තා නිලධාරීන්ගේ සේවයද වැදගත් වෙයි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින සියලුම සංවර්ධන නිලධාරීන් සම්බන්ධ කරගෙන දින තුනක කොවිඩ් මර්දනය ගැන පුහුණුවක් ලබාදිය යුතුය. එය දිස්ත්‍රික් මට්ටමින් කළ හැකි දෙයකි. කුඩා කණ්ඩායම් හරහා මෙම පුහුණුව ලබාදිය හැකිය. ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරීන්ට හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට පුහුණුකරුවන් විය හැකිය. මෙසේ පුහුණුව ලබන නිලධාරීන් ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමට සම්බන්ධ කළ හැකිය. ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරී කාර්යාලය තුළ ඇති තොරතුරු නිවැරදිව පරිගණක ගත කිරීමට, රෝගීන් පිළිබඳ සොයා බැලීමට, ඔවුන්ගේ සහාය ලබාගත හැකිය.

ලංකාවේ තිබෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස තුන්සියයට මෙම බලය ලබාදිය යුතුය. එවිට තමන්ගේ බල ප්‍රදේශය තුළ කොරෝනා පාලනය කිරීම සඳහා අනෙකුත් සෞඛ්‍ය නිලධාරීන්ටද වගකීම් පවරා, ග්‍රාම සේවා කොට්ඨාස මට්ටමින් සියලුම නිවාස අධීක්ෂණය කළ හැකිය. ආසාදිතයන් හඳුනාගෙන ඔවුන් මෙන්ම ආශ්‍රිතයන් නිරෝධායනය සඳහා නිවැරදි ක්‍රමවේදනයන් අනුගමනය කළ හැකිය.

ආසාදිතයන් හා ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් හුදකලා නිරෝධායනයට ලක් කර, අනෙක් අයට සමාජ, ආර්ථික ක්‍රියාකාරීත්වයට සම්බන්ධ විය හැකිය. රෝගීන් නිවෙස්වලම තබමින් අධීක්ෂණයට ලක් කළ හැකිය. අත්‍යවශ්‍ය අය පමණක් රෝහල්වලට ඇතුළත් කිරීමේ අවස්ථාවද එමගින් උදවේ. එවිට අද මෙන් රෝහල්වල රෝගීන් ගොඩ ගැසෙන්නේ නැත.

සෞඛ්‍ය නිලධාරී කොට්ඨාස 370ට මේ බලය ලබාදුන් විට පහසුවෙන් පාලනය කිරීමට හැකි අතර සමාජ ආර්ථික ක්‍රමයට ඉඩ ලබාදීම හැරෙන්නට වෙනත් විකල්පයක් නැත.

ඒ වෙනුවට හමුදාව යොදාගෙන මෙය පාලනය කිරීමට හැකියැයි සිතුවත් එය අසාර්ථක බව දැන් පෙනෙන්නට තිබේ. එසේ ඔවුන්ට සාර්ථකව සියල්ල පාලනය කළේ නම් කොරෝනා දෙවැනි රැල්ලක්, තුන්වැනි රැල්ලක් මතුවූයේ කෙසේද?

ඔවුන් නිවැරදිව මෙම කටයුතු කළේ නම්, පළමුව එන්නත් ගත යුතු කණ්ඩායම, දෙවැනි, තුන්වැනිව එන්නත් ගත යුතු කණ්ඩායම වශයෙන් සකස් කළ ලැයිස්තුවලට සිදුවූයේ කුමක්ද? තමන්ගේ බලයත් සමග පවුල්පිටින් එන්නත් කරගත්තේ කෙසේද? හමුදාවට භාරදුන් විට කාර්යක්ෂම සිදුවී ඇත්තේ කොතැනද?

විවෘත වෙළෙඳපොළ ආර්ථිකය තුළ එක්සත් ජාතීන්ගේ සියලුම ආයතන අතිශය දූෂිත ආයතන බවට පත්ව තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානයත් එවැනි දූෂිත ආයතනයකි. ලෝක සෞඛ්‍ය සංවිධානය සියලුම නිර්දේශ සකස් කර ඇත්තේ මධ්‍යම පාන්තිකයන්ට හා පොහොසතුන්ට පමණි. ආර්ථික වශයෙන් අතහැරී ඇති පිරිස්, දුප්පත් ජනතාවට ලෝක සෞඛ්‍ය සංවිධානය ඉදිරිපත් කර ඇති කිසිවක් අදාළ වන්නේ නැත. ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන ආකාරයට ප්‍රමිතියෙන් යුත් සැනිටයිසර්, මුහුණු ආවරණ ලබාගත හැකි පිරිස් නොවේ. දැනට මිය ගොස් ඇති බහුතරය එසේ දුප්පත් පිරිස් බව ලෝකයේ රටවල් රැසක කළ අධ්‍යයනවලින් පැහැදිලිවී තිබේ.

අවුරුදු හත අටකින් සෑදිය යුතු වැක්සින් මාස හත අටකින් නිපදවා ලෝකයේ විශාල වෙළෙඳපොළක් නිර්මාණය කරගෙන තිබෙන්නේ විශාල ආදයම් උපයමිනි. කොරෝනා සමගින් සමාජයේ ඉහළ සිට පහළට යන තුරු අතිශය දූෂිත සමාජ, ආර්ථික පැවැත්මක් නිර්මාණය කර ඇත.

මේ සියල්ල හමුවේ අපි අලුත් විසඳුමකට යා යුතුය. මේ විසඳුම ප්‍රජා මූල විසඳුමකි. එයට බොහෝ අය අකැමැති වන්නේ ඒ තුළ ව්‍යාපාර නොමැති නිසාය. මුදල් ඉපැයිය නොහැකි නිසාය. ජාවාරම් කිරීමට නොහැකි නිසාය. ඒ නිසාම තීන්දු ගන්නා පුද්ගලයන් ප්‍රජා මූල විසඳුමක් කෙරෙහි අවධානයක් යොමු කරන්නේද නැත.

හදිසි සෞඛ්‍ය තත්ත්වයන් සඳහා සුමන්දිරන් මන්ත්‍රීවරයා ඉදිරිපත් කර ඇති පනත සම්මත නොකරන්නේ මේ නිසාය. සිවිල් පාලනයක් යටතේ, පාර්ලිමේන්තුවට වග කියන, ජනාධිපතිවරයා මූලාසනය ගන්නා, අගමැති, කථානායක, විපක්ෂ නායක, සෞඛ්‍ය ඇමැති, රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන්, අනෙක් අමාත්‍යාංශවල ලේකම්වරුන් හවුල්වන, යාන්ත්‍රණයක් මෙමගින් යෝජනා කර ඇත.

ඒ පනත් කෙටුම්පත සම්මත වුවහොත් එකිනෙකාට කැමති ආකාරයට රට වසා දැමිය නොහැකිය. සෞඛ්‍ය කමිටුව විසින් යෝජනාවක් සකස්කර, එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් රට වසා දැමිය හැකිය. එකිනෙකාගේ හිතු මනාපයට අනුව රට වැසිය හැකි නොවේ. එවැනි විසඳුම්වලට යාමට කිසිවෙක් කැමැති නැත.

විකල්ප විසඳුම් හා විකල්ප පියවර ගැන කතාවක් නැති, විද්‍යාත්මක ලොක් ඩවුන් වෙනුවෙන් සියලු දෙනාම කෑ ගසමින් සිටිති. මේ තත්ත්වය තුළ ආසාදනය වන අය ආසාදනය වෙති. මිය යන අය මියයති. හම්බකරගන්නා අය හම්බකරගනිති.




සංජය නල්ලපෙරුම

# 2050දී කොරෝනා මතක

*දැන් (2021දී) මගේ මුනුබුරාගේ වයස අවුරුදු අටකි. 2050දී අපේ පුතාටද දැන් අපේ මුනුබුරාගේ වයසේ මුනුබුරෙක් ඉන්නට බැරි නැත. මේ අපේ පුතා හා ඔහුගේ මුනුබුරා අතර 2050දී ඇතිවිය හැකි යැයි මා සිතූ කතාබහකි.*

*මුනුබුරා සිය ටැබ්බෙක ඔබමින් සීයාගේ පරණ පින්තූර නරඹමින් සිටින්නේ හයියෙන් හිනාවෙන්නට පටන් ගනී.*

*"සීයෙ ඔයා ඉස්සර මාර ස්ටයිල්කාරයා කියල කයිය ගැහුවට කරල තියෙන්නෙ හරි ගොන් ෆැෂන්නෙ" ඔහු සිනාව අතරින්ම කියයි ."මාස්ක් දෙකකුයි,ෆේස්ෂීල්ඩ්ඩෙකකුයි දල ඉන්න කොට ලස්සනයි කියලද ඔයා හිතන් හිටියෙ. මට නම් පේන්නෙ ඔයා ඒ කාලෙ ඒලියන් කෙනෙක් වගේ කියල "*



මානිගෙ තීරුව

*සිය මුනුබුරාගේ කතාව අසා පුතාද හිනාවෙන්නට පටන් ගනී.*

*"ඕක මෝස්තරේකට කරපු වැඩක් නෙවෙයි කොල්ලො"පුතා කියයි. "2020දි කොවිඩ් 19 කියල මාරාන්තික වසංගතයක් ඇවිත් අවුරුදු ගාණක් තිබුණා. ඒ කාලෙ ලෝකෙම අනුගමනය කරපු ආරක්ෂණ ක්‍රමයක් ඕක. බොට දැන් සීයෙක් ඉන්නෙ මං ඒ කාලෙ ඔහොම පරිස්සම් වෙලා හිටපු නිසා තමයි"*

*පුතාගේ මුනුබුරා බර කල්පනාවකට වැටෙයි .*

*"ඒ වුණාට මාස්ක් දගෙන හිටියම මිනිස්සුන්ට අනිත් මිනිස්සු අඳුරගන්න අමාරුයිනෙ සීයෙ"ටික වේලාවකින් ඔහු කියයි.*

*"මාස්ක් දන්නෙ නැති කාලෙත් අපිට මූණ බලල මිනිස්සුන්ව අඳුරගන්න බැරි වුණා පුතේ" අපේ පුතා සිය මුනුබුරාට කියයි ."අපියි රටයි දෙකම අගාදෙට යද්දිවත් අපිට ඒකට වැරැදිකාරයො අඳුරගන්න බැරි වුණෙත් ඒකනෙ"*

*"ඒ කියන්නෙ ඒ කාලෙ තිබුණු ලොකුම ප්‍රශ්නෙ ඔය වසංගතේ නෙවෙයිද සීයෙ"*

*"නෑ පුතේ ලොකුම ප්‍රශ්නෙ කොරෝනා නෙවෙයි,ගොන්කම. ආණ්ඩුව මුල ඉඳන්ම එක්කො ගොන් තීරණ ගත්තා. නැත්නම් හරි තීරණේ ගන්න පරක්කු කරා"පුතා කියා සිටී. "ඒ වගේම අපි ආණ්ඩුවට සෙකන්ඩ් වෙන්නෙ නෑ කියන්න වගේ රට්ටුත් පට්ට ගොන් විදිහට හැසිරුණා "*

*පුතාගේ මුනුබුරා දිගටම ටැබ්බෙක ඔබමින් කොරෝනා කාලේ තොරතුරු සොයයි.*

*"මේ එක තැනක කියල තියෙන්නෙ සීයෙ මිනිස්සු බොරුවට බය වුණාට කොරෝනා කියන්නෙ හෙම්බිරිස්සා උණක් කියල "පොඩ්ඩා අසා සිටී. "ඔයත් අතිපණ්ඩිත වුණාට සුළුදේකටනෙ බයවෙලා දඟලල තියෙන්නෙ "*

*"හැබැයි පුතේ ඒ හෙම්බිරිස්සා උණෙන් ලෝකෙ පුරා ලක්ෂ පනහකට වැඩිය මළා "පුතා සිය මුනුබුරාට කියා සිටී."ඒ කාලෙ ටෙලිවිෂන්නෙකේ තිබුණා පිස්සෙක් ඔබ අමතයි කියල වැඩ සටහනක්. ඒකට ආපු තරගකාරයෙක් තමයි ඔය කතාව කිව්වෙ "*

*පුතාගේ මුනුබුරා සිය ඊළඟ ප්‍රශ්නයද යොමු කළේය.*

*"හැබැයි සීයෙ ලොකු පොඩි බේදයක් නැතුව හැමෝටම ලෙඩේ හැදුණු නිසා කොරෝනාවෙන් සමාජ සමානාත්මතාවය නම් ඇතිවෙන්න ඇති නේද ?"*

*"එන්නත් දෙනකොට නම් එහෙම වුණේ නෑ පුතේ"පුතා සිය මුනුබුරාට කියයි. "අඩුකුලේ කට්ටියට පැයගණන් පෝලිම්වල කට්ට කාල රැස්පොට් බලල ගහගන්න වුණා. වංශවත් ඇත්තො පිටිපස්ස දෙරෙන් ගිහින් රැස්පොට් පිට ගහගත්ත "*

*මේ වන විට සිය මුනුබුරාගේ ප්‍රශ්නවලින් හෙම්බත් වී සිටි අපේ පුතා එතැනින් යන්නට තනයි. මුනුබුරා ඔහු නවතාගෙන අන්තිම ප්‍රශ්නයද අසයි.*

*"සීයෙ අන්තිමේ කොරෝනා යුද්දෙ ඉවරවෙච්ච සන්තෝසෙට දෙවෙනි ලෝක යුද්දෙ ඉවරවෙච්ච වෙලාවෙ වගේ මිනිස්සු පාරවල්වල නටන්න ඇති නේද ?"*

*"මට නම් එහෙම දෙයක් මතක නෑ පුතේ" පුතා කියයි. "හැබැයි කොරෝනා තදේටම තිබ්බ්ච කාලෙත් මිනිස්සු පාරවල් පුරාම ඩේගා නැටුව නම් මට මතකයි "*

සුන්දර නිහතමානි ද මැල්





මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක. මේජර් ජෙනරාල් සෙනරත් නිවුන්හැල්ල සීනි තොග පරීක්ෂා කරමින්

# ඇල්ලූ සීනි කාගේද?

මේ දිනවල සීනි ගැන කතා බොහෝය. ඒ දිනවලත් සීනි ගැන කතා එමටය. ඒ අතරින් ලොකු කුඩා ඕනෑ කෙනෙක් දන්නා සීනි කතාව අන්දරේ සීනි කෑ කතාවයි.

අන්දරේ අන්දරේගේ පුතත් රජ මාලිගාවේ මිදුලේ එලූ පැදුරේ දමා තිබූ සීනි පෙරළි පෙරළී කෑවේ අනේ පුතේ උඹේ කටෙත් පස් මගේ කටෙත් පස් කියමිනි. එදා අන්දරේලගේ කාලයේ නම් පෙරළි පෙරළී කන්නට තරම් සීනි තිබුණේ එදා සීනි මාෆියාවක් නොතිබුණ නිසාය. ඒත් අද නම් රජ සිටු මැදුරකවත් එහෙම කෑමක් කන්නට තරම් සීනි ඇතැයි සිතීම පවා විහිළුවකි. රටටම සෙත කෙසේ වෙතත් විහිළු සපයනවා යැයි මිනිස්සු කියන එක්තරා දේශපාලනඥයෙක් මීට පෙර වතාවක පිටි මිල ඉහළ ගිය වෙලාවක කියා තිබුණේ පිටිත් සීනිත් මිල ඉහළ යාම හොඳ බවය. ඒ දෙක අඩු මිලට තිබුණොත් වැඩිපුර ගෙන හොඳට කා දියවැඩියාව හදා ගන්නවා යැයිද එදා ඒ දේශපාලනඥයා කියා තිබුණා අපට මතකය.

ඒ කෙසේ වෙතත් මේ දවස්වල ආණ්ඩු පක්ෂයේ දේශපාලනඥයගේ මුහුණු සඟවාගන්නා විපක්ෂයේ දේශපාලනඥයන් තලුමරණ, පාරිභෝගිකයන් කඩවල් ගාණේ රස්තියාදු කරවන ප්‍රශ්නය වී ඇත්තේ සීනිය.

වෙළෙඳපොළේ සීනි කිලෝවක මිල රුපියල් දෙසිය තිහ දක්වා ඉහළ ගියේය. රුපියල් එකසිය විස්සට අඩුවෙන් තිබූ සීනි කිලෝව දෙසිය තිහ තරමට එකවර උඩ ගියේ රුපියල් පනහට තිබූ ආනයන බද්ද සත විසිපහටත් අඩු කර තිබියදීය.

'මේ නම් සීනි මාෆියාවයි' බොහෝ දෙනාගේ චෝදනාව විය.

ආනයනික සීනි කිලෝවක් සඳහා රජය පනවා තිබූ රුපියල් පණහේ බද්ද සත විසි පහ දක්වා අඩු කළේ පසුගිය 2020 වසරේ ඔක්තෝබරයේදීය.

ඒ අවසරයෙන් ප්‍රයෝජනගත් සීනි ආනයනකරුවෝ සති කිහිපයක් තුළ සීනි මෙට්‍රික් ටොන් තුන් ලක්ෂ අසූදහසක් ආනයනය කළෝය. සත විසිපහක බද්ද පැනවීමට පෙර ඔක්තෝබර් මාසයේ පළමු දෙසතිය තුළ සීනි මෙට්‍රික් ටොන් 88748ක්ද ආනයනය කර තිබුණි. ඔක්තෝබර් මාසයේ ආනයනය කළ සීනි තොග වරායට ලැබෙන විට අනායනකරුවන්ට කිලෝවක් සඳහා වියදම් වී තිබුණේ රුපියල් 98ක් වැනි මුදලකි.

කෙසේ වෙතත් ඔක්තෝබර් මාසයේ සිට ආනයනය කර ඇති සීනි තොගය මාස නවයකට වඩා ප්‍රමාණවත් වෙයි. **සත 25 බදු සහනය යටතේ ආනයනය කර ඇති සීනි තොගයෙන් සීනි මෙට්‍රික් ටොන් එක් ලක්ෂ හතළිස් දහසකටම හිමිකම් කියන්නේ පිරමිඩ් විල්මාර් ආයතනය බවද රේගු වාර්තා සනාථ කරයි.** ව්‍යාපාරිකයින් තිස් හත් දෙනකු විසින් සීනි ආනයනය කර ගබඩා තුළ රඳවා තිබුණේ මිල වැඩි වන තුරුය. ආනයන බද්ද සත 25ක් කළද ආනයනික සමාගම් විදේශීය රටවලට මුදල් ගෙවිය යුතු වූයේ දින 180කට පසුවය. නමුත් 2021 ජනවාරි මස 21 වැනි දින සිට ඩොලර් ගෙවීම සීමා කිරීමට ආණ්ඩුව තීරණය කළේ රටේ පැවැති ආර්ථික අර්බුදය හේතුවෙනි.

ඩොලර් ගෙවීම නතර කිරීම නිසා සීනි තොග වරායේද සිර විය. මෙලෙස ආනයනකරුවන් රැගෙන ආ සීනි අඩංගු කන්ටේනර් දෙසීයකට අධික සංඛ්‍යාවක් තවමත් වරායේ ඇත. සීනි මිල ඉහළ යාම හමුවේ වරාය හා නාවික අමාත්‍යාංශය සීනි කන්ටේනර් 81ක් වරාය ගාස්තුද නොමැතිව නිදහස් කළේය. ඒ සතොස හා සමුපකාර දෙපාර්තමේන්තුවටය. එම කන්ටේනර්වල තිබූ සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2187කි. ආනයනකරුවන් හතර දෙනකුගේ සීනි මෙලෙස නිදහස් කළ අතර ඒවා සතොසට ලබා ගත්තේ රුපියල් 104 වැනි මුදලකටය.

ලෝකයේ වෙනත් රටවල එක් පුද්ගලයකුගේ වාර්ෂික සීනි පරිභෝජනය කිලෝග්‍රෑම් 16කි. නමුත් ශ්‍රී ලාංකිකයෙක් වාර්ෂිකව සීනි පරිභෝජනය කිලෝග්‍රෑම් 36කි. දුඹුරු සීනි බහුල වශයෙන් භාවිත කරන්නේ අනවසර මත්පැන් නිෂ්පාදනය සඳහාය. ඒ බව සුරාබදු දෙපාර්තමේන්තුවද හොඳින් දනී. මුදල් අමාත්‍යාංශ වාර්තාවලට අනුව ශ්‍රී ලංකාවේ මාසික සීනි පරිභෝජනය මෙට්‍රික් ටොන් පනස් දහසකි. වසරකට මෙට්‍රික් ටොන් හයලක්ෂයක් අවශ්‍ය වෙයි. සීනි ආනයනය සඳහා රුපියල් බිලියන තිස් අටක් වැය කරන බව මුදල් අමාත්‍යාංශය සඳහන් කරයි. වසරකට ආනයනය කරන සීනිවලින් සියයට හතළිහක්ම මිලදී ගන්නේ රස කැවිලි නිෂ්පාදකයෝය.

සීනි සඳහා පනවා තිබූ බද්ද අඩු කිරීමෙන් පසු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය 2020 නොවැම්බර් 10 වැනි දින සීනි සඳහා පාලන මිලක් පැනවීය. එහි සඳහන් වූයේ පැකට් කළ සීනි කිලෝග්‍රෑම්යක උපරිම සිල්ලර මිල රුපියල් අනූවක් බවයි. පැකට් නොකළ රුපියල් 85ක් ලෙසද ආනයනකරු විකිණිය යුතු මිල රුපියල් 80ක් ලෙසද දක්වා පාලන මිලක් පැනවිණි. මෙම පාලන මිල නොතකා ජනවාරි මාසයේ සිට මේ දක්වා සීනි අලෙවි කිරීමට වෙළෙඳ ව්‍යාපාරිකයින් එඩිතර වී සිටිති. විවිධ මිල ගණන්වලට අලෙවි වූ සීනි කිලෝවක් එකවරම රුපියල් 200 ඉක්මවා අලෙවි කිරීමත් සමග සීනි ආනයන මාෆියාවේ තොරතුරු එළියට ගලා ගෙන ආවේය.

වත්තල ප්‍රදේශයේ පිහිටි සීනි ගබඩාවක ටොන් 4800 තොගයක් අල්ලා ගැනීමෙන් පසු සීනි මාෆියාවේ තොරතුරු පොලිසියට හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ගලා ගෙන ආවේය. එම ස්ථානයෙන් නොනැවතුණු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විමර්ශන නිලධාරීන් දෙදිනක් තුළ කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවල සීනි ගබඩා පරීක්ෂා කළෝය. අධිකාරියේ ලියාපදිංචි නොකර සීනි ගබඩා කර ඇති ස්ථාන සියල්ලට මුද්‍රා තැබූහ. සීනි තොග ඇල්ලීමත් සමග ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් ලෙස මේජර් ජෙනරාල් සෙනරත් නිවුන්හැල්ල පත් කළේය. වී, සහල්, සීනි ඇතුළු අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය බෙදා හැරීම සම්බන්ධීකරණය කිරීම ඔහුට ඇති වගකීම වෙයි. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්වරයා සැප්තැම්බර් පළමුවැනිදාම වැඩට බැස්සේය. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුද්‍රා තැබූ සීනි තොග සිය භාරයට ගත්තේය. මේ වන විට සීනි මෙට්‍රික් ටොන් 33000ක් භාරයට ගෙන ඇත. **පිරමිඩ් විල්මාර් සමාගමේ මුතුරාජවෙල ගබඩාවෙන් සීනි මෙට්‍රික් ටොන් 6200ක් ගත්තේය. විල්සන් ට්‍රේඩින් සමාගමෙන් මෙට්‍රික් ටොන් 14000ක්ද, ග්ලෝබල් ට්‍රේඩින් සමාගමේ ගබඩා දෙකකින් 8900ක්ද ආර්.ජී. ස්ටෝර්ස් හි කිරිබත්ගොඩ ගබඩාවෙන් සීනි මෙට්‍රික් ටොන් 800ක්ද අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් යටතට ගෙන ඇත.** කෘත්‍රිම සීනි හිඟයක් රටේ ඇති කර පාරිභෝගිකයා දැඩි අපහසුතාවට ලක් කරමින් ඉහළ මිලකට සීනි අලෙවි කිරීමේ ජාවාරම යම්තාක් දුරට නතර වූයේ එලෙසිනි.

වෙළෙඳපොළේ සීනි මිල ඉහළ යාමත් සමග ලංකා සීනි සමාගමද සිය තොග මිල ඉහළ දැමුවේය. රුපියල් 110 බැගින් සතොස හා සමුපකාර සමිතිවලට සීනි අලෙවි කළ ලංකා සීනි සමාගම එම මිල රුපියල් 125 දක්වා ඉහළ නැංවූයේ මීට සතියකට පෙරය. ඒ අනුව ලංකා සතොස මෙට්‍රික් ටොන් 1800ක සීනි මිලදී ගෙන තිබේ. එම සීනි කිලෝවක් රුපියල් 130 බැගින් අලෙවි කිරීමට ලංකා සතොස කටයුතු කරන විට සීනි පෝලිම්ද ඇති විය. ලංකා සීනි සමාගම පසුගිය දෙසතිය තුළ මෙරට ලියාපදිංචි ටෙන්ඩර් ගැනුම්කරුවන්ටද සීනි අලෙවි කර ඇත්තේ ඉහළ මිලකටය. රුපියල් 140-181 දක්වා වූ මිල පරාසයක් යටතේ සීනි මෙට්‍රික් ටොන් 7300ක් පමණ ලංකා සීනි සමාගම නිකුත් කර තිබේ.

**සීනි මිල තවදුරටත් පාලනය කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ආනයනික හා දේශීය සීනි සඳහා පාලන මිලක් සැප්තැම්බර් 02 ද පැනවූයේ අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගිනි. එහි ආනයනික සුදු සීනි කිලෝග්‍රෑමයක් රුපියල් 116කට අලෙවි කළ යුතුය. ආනයනික පැකට් නොකළ සුදු සීනි කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 122කි. දේශීය දුඹුරු සීනි රුපියල් 125කි. පැකට් කළ සුදු සීනි කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 125කි. දේශීය දුඹුරු සීනි රුපියල් 128කි.**

මෙම ගැසට්ටුවට අනුව තවත් ප්‍රශ්නයක් මතුව ඇත. ලංකා සතොසට සහ දේශීය ව්‍යාපාරිකයන්ද කබලෙන් ළිපට වැටී ඇත. ඔවුන් මිලදී ගත් සීනි තොග පාඩු පිට වෙළෙඳපොළට නිකුත් කිරීමට සිදුවීමය. ඔවුන් සීනි මිලදී ගත්තේ රාජ්‍ය ආයතනයක් වන ලංකා සීනි සමාගමෙනි. නමුත් සීනි මිල ඉහළ නැංවූයේ ආනයනික සීනි මුදලාලිලාය. එම නිසා උපරිම සිල්ලර මිල ඔවුන්ට පමණක් පැනවිය යුතු බව දේශීය ගැනුම්කරුවන් දස දෙනාගේ ඉල්ලීම වෙයි. දේශීය සීනි සඳහා සහන ලබා දෙමින් දේශීය කර්මාන්ත නගා සිටුවීමටද රජය බැඳී සිටිති. කෙසේ වෙතත් සීනි සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීමෙන් පසු පසුගිය සිකුරාදා පිටකොටුවෙන්ද නිකුත් කර ඇත්තේ සීනි මිටි පහ බැගිනි. නමුත් ඇඹිලිපිටියේ තොග වෙළෙඳ ව්‍යාපාරිකයකු පමණක් ඉල්ලන ඕනෑම ප්‍රමාණයක් නිකුත් කළ බව වෙළෙඳ අමාත්‍යාංශය කළ සොයා බැලීමකදී අනාවරණය විය.

කෙසේ වෙතත් සීනි ආනයනකරුවන් ඊයේ (04) අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා හමුවීමටද නියමිතව තිබුණි. ඒ තම දුක කීමටය. කෙසේ වෙතත් පාරිභෝගිකයාට අද වන විට සාධාරණ මිලට සීනි ලැබෙන්නේය. නීති පැනවීම මෙන්ම පනවන ලද නීතිරීති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම යුගයේ අවශ්‍යතාවකි. මිල පාලන ගැසට්ටු නිසි අයුරින් ක්‍රියාත්මක නොවූ බව බහුතර පාරිභෝගික මතයයි. මෙවර රජය උපරිම බරක් යොදා සීනි මිල පහත හෙළීම සඳහා තෝරු මෝරු ඇල්ලීම නිසි පරිදි සිදු කළ බව මහජන විශ්වාසයයි. එහෙත් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල සීනි මෙට්‍රික් ටොන් 80000ක් පමණ සඟවා ඇති බව අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් කාර්යාලයම අනාවරණය කර ගෙන ඇත. සීනි පාරිභෝගිකයා දැන් බලා ගෙන සිටින්නේ යුද බිමේ විරුවන් වූ මේජර් ජනරාල් සෙනරත් නිවුන්හැල්ලත් අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ලෙසත් විශ්‍රාමික මේජර් ජෙනරාල් ශාන්ත දිසානායකත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපතිවරයා ලෙසත් සීනි මාෆියාව නතර කිරීමට ආරම්භ කර ඇති සංග්‍රාමය කෙසේ නිම කරාවිද යන්න ගැනය.

**උදයජීව ඒකනායක**

# ලංකාවේ තනි වෘකයා නවසීලන්තයේ




# 6කට පිහියෙන් අනී

නවසීලන්තයේ ඕක්ලන්ඩ් හි සුපිරි වෙළෙඳ සංකීර්ණයකට පසුගිය සිකුරාදා සවස 2.40ට පමණ කඩා වැදුන පුද්ගලයෙක් එහි වෙළෙඳසලක වීදුරු අල්මාරියක ප්‍රදර්ශනයට තබා තිබූ දිගු පිහියක් රැගෙන එහි සිටි පුද්ගලයන් කීප දෙනකුටම ඇන තිබේ.මෙම ප්‍රහාරයෙන් හය දෙනකු තුවාල ලැබූ අතර තිදෙනකුගේ තත්ත්වය තරමක් බරපතළ බව නවසීලන්ත පොලිසිය පවසා තිබුණි.

මෙම ප්‍රහාරය පිළිබඳව එරට කොතරම් කම්පනයට පත් වූවේදැයි කියන්නේ නම් නවසීලන්ත අගමැතිනි ජසින්ඩා ආර්ඩන් ජාත්‍යන්තර මාධ්‍ය ඇමතුවාය. ඇය මාධ්‍යයට කියා තිබුණේ ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයා ශ්‍රී ලාංකික සම්බවයක් සහිත අයෙකු බවයි. කෙසේ වෙතත් ප්‍රහාරයෙන් විනාඩියක් ඇතුළත එම පුද්ගලයා පොලිස් වෙඩි පහරින් මියගොස් තිබුණි.

මෙම පුද්ගලයා 2011 වසරේ දී නවසීලන්තයට සංක්‍රමණය වූ අයෙක් බවත් ඔහුගේ අයි.එස්.අයි.එස්. සබඳතා නිසා 2016 වසරේ සිටම නවසීලන්ත පොලිසිය ඔහු ගැන නිරන්තර සෝදිසියෙන් සිටි බවත් අගමැතිනි ජසින්ඩා අර්ඩන් කියා තිබුණි.

ප්‍රහාරයෙන් විනාඩියක් ඇතුළත ඔහු මෙල්ල කර ගැනීමට හැකි වූයේ පොලිසිය නිරතුරුවම ඔහු ගැන ඇස ගසාගෙන සිටි නිසා බවද නවසීලන්ත අගමැතිනිය කියා තිබුණාය. සිද්ධිය වූ පසුගිය සිකුරාදා ද ඔහු මෙම සාප්පු සංකීර්ණයට යන බව පොලිසිය දැක තිබේ. එහෙත් උසස් පොලිස් නිලධාරියකු කියා තිබුණේ ඔහු තමන්ට අවශ්‍ය බඩු ගැනීම සඳහා ඔහු එම සාප්පු සංකීර්ණයට යන බව පොලිසිය සිතූ බවයි.



## ඔහු අයි.එස්.ලාට සම්බන්ධයි

එසේම අයි.එස්.අයි.එස්. මතවාද තිබුණත් මෙම ප්‍රහාරකයා තනිව ක්‍රියාකරන්නෙකු වශයෙන් හඳුනාගෙන සිටි නිසා ඔහුගෙන් එකවරම මෙවැනි තර්ජනයක් නොවනු ඇති බවට පොලිසියේ හැඟීමක් තිබුණ බවද ඕක්ලන්ඩ් පොලිස් කොමසාරිස් ඇන්ඩෲ කෝස්ටර් මාධ්‍යයට ප්‍රකාශයක් කරමින් කියා තිබුණි.



## අගමැතිනි ජසින්ඩා මාධ්‍යයට කියයි



## පොලිස් වෙඩි පහරින් ශ්‍රී ලාංකිකයා මරුට

"ප්‍රචණ්ඩ අන්තවාදියකු අහිංසක නවසීලන්ත වැසියන්ට ප්‍රහාරයක් එල්ල කළා. පැහැදිලිවම ඔහු අයි.එස්.අයි.එස්. මතවාදයේ ආධාරකරුවෙක්" අගමැතිනි ජසින්ඩා අර්ඩන් කියන්නීය.

නවසීලන්තය මෙම ප්‍රහාරය හඳුන්වා දී තිබුණේ තනි වෘක්කයාගේ ප්‍රහාරය හැටියටය. මීට පෙර 2019 මාර්තු 15 වැනිදා නවසීලන්තයේ ක්‍රයිස්ට්චර්ච් හිදි මුස්ලිම් පල්ලි දෙකට කඩා වැදුන බ්‍රෙන්ටස් ටැරන්ට් නම් සුදු ජාතිකයකු එම පල්ලිවල යාඥා කරමින් සිටි පනස් එක් දෙනෙක් වෙඩි තබා මරා දැමුවේය. ඉන්පසුව නවසීලන්ත පොලිසිය මෙවැනි ප්‍රහාර ගැන දැඩි සෝදිසියකින් යුතුව සිටි බවද එරට පොලිස් ප්‍රකාශකයකු කියා තිබුණි.

කෙසේ වෙතත් සැප්තැම්බර් 03 වැනිදා 2019 මාර්තු 15 ප්‍රහාරයට පළිගැනීමක් වශයෙන් කළ එකක් දැයි මාධ්‍යවේදීන් අගමැතිනි ජනිස්ඩාගෙන් විමසා සිටියෙන් ඇය කියා තිබුණේ තවමත් එය හරිහැටි පැහැදිලි නැති බවයි.

එසේම ප්‍රචණ්ඩත්වයට වගකිවයුත්තේ මිනිසා මිස ඇදහිල්ලක් නොවන බවද ඇය කියන්නීය. ප්‍රහාරයට පෙර සිටම මෙම පුද්ගලයා ගැන දැන සිටියත්, ආරක්ෂක නිලධාරින් ඔහු ගැන ඇස ගසාගෙන සිටියත් ඔහු සිරගත කිරීමට තරම් කරුණක් නොතිබූ බවද පොලිස් ප්‍රකාශකයකු සඳහන් කර තිබුණි. කෙසේ වෙතත් මෙම ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයා අයි.එස්.අයි.එස්. ත්‍රස්තවාදයේ හස්තයක් බවත් ඔහු ශ්‍රී ලාංකිකයකු බවත් ලොව පුරා මාධ්‍යවල සිකුරාදා සවස් වන විටත් ප්‍රචාරය වී තිබුණි. ඒ කෙසේ වෙතත් පුවත්පත් මුද්‍රණයට යන විටත් ඔහුගේ අනන්‍යතාවය හෙළිකර නොතිබුණි.

**අනුපමා ගල්කඩවල**



# සුදුම සුදු සුරූපී ජැකොලයින් කළුම කළු කතාවක පැටළෙයි

## ලංකාවේ රූ රැජින කළු සල්ලි ජාවාරම්කරුවෙකුට අහුවෙයි!

බොලිවුඩයේ ප්‍රකට තාරකාවක් වන පර්ඩිනැන්ඩස් ශ්‍රී ලාංකික කාන්තාවකි. දැන් ඇය ඉන්දියාවේ වාසය කළද 2006 වසරේ ලංකාවේ රූ රැජන ලෙස කිරුළ පැලැන්දුවේ ඇයය. පසුව හින්දි සිනමාවට එකතු වූවාය. දැන් ජැකොලයින් ලෝකයේ ප්‍රකට නමකි. ඇගේ සමාජ සත්කාර වැඩ ගැන ද ඉහළින් කියැවෙයි. එහෙත් අවාසනාවකට ඇයගේ නම කළු සල්ලි චෝදනාවකට සම්බන්ධ කර තිබේ. ඉන්දියන් මාධ්‍ය එම සිද්ධිය ලොකු අකුරින් හෙළිදරව් කර තිබුණි. සිද්ධියට අනුව ඉන්දීය රුපියල් කෝටි දෙකක සිද්ධියකි. ඉන්දීය මාධ්‍ය අනාවරණය කරන වැදගත් කරුණක් තිබේ. ජැකොලයින් මෙකී කළු සල්ලි ජාවාරමට කෙළින්ම සම්බන්ධ නැත. අනෙකෙකුගේ බහට හසුවී ඇති බව සැක කෙරේ. කෙසේ වෙතත් ඉකුත් සඳුද එනම් අගෝස්තු 30 වැනි ද ඉන්දීය අපරාධ විමර්ශන විශේෂ ඒකකයක නිලධාරීහු ජැකොලයින්ගෙන් ප්‍රශ්න කර ඇති බව එරට මාධ්‍ය වාර්තා කර තිබේ. 'හින්දුස්ථාන් ටයිම්ස්' පුවත් පත දක්වන ලද පරිදි පැය පහක් තිස්සේ විමර්ශන නිලධාරීහු ඇයගෙන් කරුණු විමසූහ. තවත් සමහර ඉන්දීය වෙබ් අඩවි ප්‍රශ්න කළ පැය ගණන හතරක් බව දක්වා ඇත. පැය ගණන කෙසේ වෙතත් ඇය කෙරෙහි විමර්ශකයන්ගේ තියුණු අවධානය යොමු වී තිබෙන බව පැහැදිලිය. පුවත් පත් කළු සල්ලි ජාවාරමක් ගැන සඳහන් කරන නමුත් අවසානයේ දී ජැකොලයින් සටකපට පුද්ගලයකු ගේ ජාවාරමකට හසු වී ඇති බව දැනට ඒත්තු ගොස් ඇත. මේ චෝදනා එල්ල වූ මුල්ම සුරූපිනිය ඇය නොවේ. අවසාන නිළියද ඇය නොවනු ඇත.



කිසිවකු නොමළ ගෙදරකින් අබ ඇටයක් රැගෙන එන නිධාන කතාව ගැන නොදන්නා බෞද්ධයෝ නොවෙති. එපමණකටම කළ නොහැකි දෙයකි. කිසිවකු නොමැරුණ නිවෙසක් නැත. කළු සල්ලි කතාවට ද එවැනි අර්ථයක් තිබේ. මුදල් විශුද්ධිකරණය නොවන තැනෙක් නැත. එය බරපතළ වරදකි. නීත්‍යනුකූල මුදල් සංසරණයට එපිටින් තවත් ව්‍යාජ රාමුවක් තිබේ. නීති පනවන සහ බදු එකතුකරන ආණ්ඩු, සාධාරණත්වයක් ඇති කරන්නට අප්‍රමාණ වැර දරති. ඇතුළාන්තයෙහි දැවැන්ත කළු සල්ලි කන්දරාවක් එහා මෙහා වෙමින් තිබේ.

ජැකොලයින් උපත ලැබුවේ බහු විධ සම්භවයක් සහිතවය. කැනේඩියන් හා මලයාසියාවේ දෙපාර්ශ්වයක දියණියක වන ඇය උපත ලබා හැදී වැඩෙන්නේ බහරේනයේය. ශ්‍රී ලාංකිකයකු වන ඇගේ පියා එල්රෝයි ඩැකොලයින් සංගීත ශිල්පියෙකි. මව ගුවන් සේවිකාවක වූවාය. දරුවන් හතරදෙනකුගෙන් සමන්විත පවුලක බාල දියණිය වන ජැකොලයින් ජනසන්නිවේදන විෂයය හදාරන්නේ ඔස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලයෙන්ය. ජපානයේ භාෂා අධ්‍යයන අංශයකට බැඳුණු ඇය පසුව ප්‍රංශ සහ ස්පාඤ්ඤ භාෂා හදාරන්නීය. ලංකාවට පැමිණි කාලයක රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කරන්නියක සේ කෙටි කලක් සේවය කළාය. 1980දී ඇයගේ දෙමාපියන් ශ්‍රී ලංකාව හැර යන හැබෑ හේතුව එවකට පැතිරෙමින් තිබුණ ත්‍රස්තවාදය බව දැනගෙන සිටි නමුත් ජැකොලයින් සිය පියාගේ ජන්ම භූමියට ඇලුම් කරන ලද බව සැකයක් නැත.

ඉන්දියාවේ නළු නිළියන්ට විශාල ආදායමක් ලැබේ. අති විශාල ජනගහනයක ආකර්ෂණය සමග එන සිනමාව දැන්වීම්කරණයට ද එකතුවෙයි. 2013 දී රේස් -2 චිත්‍රපටයෙන් ජැකොලයින් අයිෆා සම්මාන උළෙල සඳහා සහභාගිවන්නී හොඳම සහාය නිළිය සඳහා නම්කරන ලද කිහිපදෙනා අතරින් අනාගතයක් සහිත ශිල්පිනියක වශයෙන්ය.

ජනප්‍රියත්වයේ හිණි පෙත්තේ සිටින ජැකොලයින්ගේ මාර්ගයෙන් තවත් කණ්ඩායම් අල්ලා ගන්නට ජාවාරම්කරු උත්සාහ කර ඇත. එන්ඩීටීවී නාලිකාව දක්වන ලද පරිදි ඉන්දීය රුපියල් කෝටි දෙකක මුදල් විශුද්ධිකරණ සිද්ධියකට ජැකොලයින් සම්බන්ධ නැත. ඇය සාක්ෂිකාරියක පමණකි. කුප්‍රකට ජාවාරම්කරුවකු සහ තවත් කිහිපදෙනකු සමග ඇය ගේ නම ගෑවී තිබේ. සුකේෂ් චන්ද්‍රසේකර් නමැති විත්තිකරුවකු හා සම්බන්ධ සාක්ෂියක් පමණක් ඇයගෙන් සටහන් කරගෙන ඇති බව ඉන්දීය මූල්‍ය අපරාධ අංශය මාධ්‍යවලට ප්‍රකාශ කර ඇත. ඇයගේ ප්‍රකාශය අතරතුර ඉතා වැදගත් තොරතුරු ගණනාවක් අනාවරණය කරගන්නට පරීක්ෂණ මෙහෙයවන අංශ එහි තිබී ඇති සුඛෝපභෝගී වාහන දෙළහකට වැඩි ප්‍රමාණයක් හා ඉන්දියානු රුපියල් ලක්ෂ අසූ දෙකකට වැඩි මුදලක් අත්අඩංගුවට ගෙන ඇත. එයට සම්බන්ධ වී සිටි මුකේෂ් තවත් කෝටි ගණන් ජාවාරම්වල නියැළී ඇති බව දිල්ලි පොලිසියේ මූල්‍ය අපරාධ අංශය නිරීක්ෂණය කළේය. ඔහු මෙම අංශයෙහි තීක්ෂණයකු සහ අපූරු මෙහෙයවන්නකු බව සොයා ගෙන තිබේ. සිනමාවේ දී පමණක් නොව දේශපාලන අයථා කටයුතුවලට ද මෙම ජාවාරම්කරු සම්බන්ධ බව කියැවේ. ඕල් ඉන්දියා අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කළගම් - අම්මා පාර්ශ්වයේ ලාංඡනයක් සම්බන්ධයෙන් ක්‍රියා කරන්නට මැතිවරණ කොමසාරිස්වරයාට අල්ලස් දෙන බව කියා දේශපාලනඥයකුගෙන් ද මුදල් ගෙන ඇත. මෙසේ බලන විට ජැකොලයින් පර්ඩිනැන්ඩස් අහුවෙන්නේ එසේ මෙසේ ජාවාරම් කාරයකුට නොවේ.

මෙම සිද්ධියට මාසයකට කලින් දිල්ලියේ ව්‍යාපාරිකයකුගෙන් ඉන්දීය රුපියල් කෝටි දෙකක වංචාවක් සම්බන්ධ පැමිණිල්ලකට අනුව මෙකී වංචාකරු දිල්ලි යේ රෝහිණී බන්ධනාගාරයේ රඳවා සිටි බව මාධ්‍ය අනාවරණය කරගෙන තිබේ. **එහි සිට අංක හඳුනාගත නොහැකි දුරකථනයකින් කෙළින්ම ජැකොලයින්ට කතා කරන මෙම ජාවාරම්කාර මුකේෂ් හෙතෙම සුපිරි ධනවතකු බව අඟවා ඇත. දුරකතනයෙන් කතා කිරීමෙන් පමණක් නතර නොවන ඔහු ඉතා වටිනා මල් කළඹ හා මිල අධික චොකලට් ජැකොලයින්ට ලැබෙන්නට සලස්වයි. දිල්ලි පොලිසිය දක්වන පරිදි මෙම විත්තිකරුට එරෙහිව නඩු විස්සක් පමණ තිබේ. සටකපටකම් හෙයින් ඔහු ගැන පොලිසිය විශේෂ අවධානයක සිටි බව ඉන්දියා ටුඩේ පුවත්පත වාර්තා කර ඇත.**

නවදිල්ලි නගරයේ පමණක් බන්ධනාගාර දහයක් තිබේ. රට පුරා ඇති බන්ධනාගාර 1,350 ක ලක්ෂ හතරකට අධික ප්‍රමාණයක් රැඳවිය හැකිය. මේවායේ සිදුවන අකටයුතුකම් ගැන වෙනම පරීක්ෂා කිරීම පහසු නැත. පසුගිය කාලයේ සමහර බන්ධනාගාරවල කොවිඩ්-19 ව්‍යාප්තව තිබුණ අතර බන්ධනාගාර පරීක්ෂකවරු පවා රාජකාරි කරන්නේ අතේ දුරින් බව හෙළිවී ඇති තවත් කරුණකි. මෙම පසුබිම සූක්ෂම අපරාධකරුවන්ට වාසිදායක අවස්ථාවකි.

ඉන්දියාවේ ආදායම් බදු අංශ ඉතාම ක්‍රියාශීලීය. බදු වංචා ගැන තද අවධානයක සිටී. මුදල් අමාත්‍යාංශයේ කොටසකි. ආදායම් බදු නිලධාරීන්, ඉන්දියන් පොලිසියේ හා පරිපාලන සේවයේ නිලධාරීහු එහි සේවයේ පිරිස් සමත් විය. බොලිවුඩ් හි ඉතාම ජනප්‍රිය නළුවකු මෙම කළු සල්ලි ජාවාරමට එකතු කරගන්නට සුකේෂ් ප්‍රයත්න දරන ලද බව එක ආරංචියකි. අගෝස්තු විසි හතරවැනි ද චෙන්නයි හි නිවෙසක් වටලන ලද ආරක්ෂක නිරතය. පරීක්ෂණ බලගන්වන විශේෂ ඒකකයක් ඉන්දියාවේ ස්ථාපිතය. එය කෙළින්ම විදේශ විනිමය වංචා සහ උපයාගත් ආකාරය ප්‍රකාශ කළ නොහැකි එනම් කළු සල්ලි ගැන 1956 වසරේ අවධානයකය. මුම්බායි, චෙන්නයි, චන්දිගාර් හා කොල්කටාහි උප කාර්යාල හතරකි. එවැනි තදබල පියවර ඇති නමුත් ජාවාරම්කාර සමාජයක් ද සිටී. ඒවාට ගොදුරුවෙන්නෝ නොඅඩුය. ඉන්දියාවේ කළු සල්ලි ගැවසෙන තරම කොතෙක්ද යත් එය කිසිසේත් පාලනය කරගත හැකි වී නැත.

මත්ද්‍රව්‍ය ජාවාරම කළු සල්ලි හැදෙන ප්‍රධාන තැනෙකි. ගණිකා වෘත්තිය, පරිගණක මෘදුකාංග සොරකම්, වංචනික සිනමාව, කැසිනෝ, ආයුද වෙළෙඳම යනාදිය කළු සල්ලි මවන තැන් වශයෙන් වෙන් කර තිබේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ කමිටුවක් 1998 වසරේ දී මුදල් විශුද්ධිකරණය සහ ලෝකයේ රටවල් මුහුණ දී ඇති අනතුර ගැන හෙළිදරව්වක් කළේය. දළ වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 600 ක් හෝ 1,500 අතර කළු ධනයක් අවුරුදු පතා විශුද්ධිකරණය වන බව අනාවරණය කළේය. කළු සල්ලි කුමන හෝ ක්‍රමයකින් සංසරණයට එකතු කරන බව එයින් පැහැදිලිය. ජැකොලයින් වැනි ප්‍රකට චරිත සතු මුදල් හෝ ඔවුන්ගේ සබැඳි පුද්ගලයන්ගේ ධනය විශුද්ධිකරණයට ලක්නොවන බවක් සඳහන් කරන්නට හැකියාවක් නැත. එම වාර්තාවේ තොරතුරු පෙන්වන ආකාරයට මෙකී වංචනික බව පාලනය කරන්නට හැකියාවක් නැත. මුදල් විශුද්ධිකරණය දැනට ලෝකයේ ව්‍යවසාය අතරින් තුන්වැනි තැනට මූල්‍ය වටිනාකම ගන්නා ව්‍යාපාරය බවට පත්ව ඇත.

මුදල් විශුද්ධිකරණය එනම් කළු සල්ලි සුදු කරන ජාවාරම් පාලනය කරගැනීම අරමුණු කරගෙන 2016 නොවැම්බර් 08 වැනිද ඉන්දීය අගමැතිවරයා අලුත් නීතියක් ගෙන එන්නේය. එයට අනුව එවකට භාවිත වෙමින් තිබුණ රු. පන්සියයේ හා දහේ නෝට්ටු භාවිතය අවලංගු කරයි. බදුවලින් ගැලවෙන්නට මුදල් මිටි පිටින් තබාගෙන සිටි ඉන්දියානුවෝ ඒවා ගෙනැවිත් බැංකුවලින් මාරු කරගත් අතර ඒවාට සති ගණනක් දිග පොලිම් තිබුණ බව එවකට වාර්තා වූ කරුණකි.

හින්දුස්ථාන් ටයිම්ස්, ඉන්ඩියන් එක්ස්ප්‍රස් ඇතුළු තවත් පුවත් පත්, සඟරා, වෙබ් අඩවි හා විශේෂයෙන් ඉන්දීය රූපවාහිනී නාලිකා ජැකොලයින් ගේ මෙම සිද්ධිය ප්‍රධාන තැනකට ගෙන තිබුණි. වෙබ් අඩවි ඇයගේ පරණ කතාන්දර සියල්ලම හෙළිදරව් කරන ලද අතර ඇතැම් මාධ්‍ය සාකච්ඡාවල දී ජැකොලයින් අපහසුතාවයට පත්වන ප්‍රශ්න පවා මතු කර තිබීම විශේෂත්වයකි.

ඉන්දීය මාධ්‍ය දක්වන පරිදි ඇය එක චිත්‍රපටයකදී උපයන ආදායම ඉන්දීය රුපියල් කෝටි තුන හතර අතර ගණනකි. බොඩි ෂොප්, ස්නැප්ඩීල්, වේගා, ඇතුළු එකිනෙකට වෙනස් සන්නාම වෙනුවෙන් පෙනී සිට උපයන ධනය අති මහත්ය. ඇයගේ වාහන හා නිවාස එකතුව අනුව සලකනවිට පිටස්තර සටකපටියකුගෙන් මිල අධික චොකලට් තෑගි ගැනීම පවා සැකකටයුතු බවක් අඟවයි. තවත් වාර්තා අනුව ඇය සිය චිත්‍රපට ජීවිතයෙන් හරි හම්බකරගෙන ඇති ධනය ඉන්දීය රුපියල් මිලියන 688 ක් පමණ බව සඳහන්ය. මේවා වටා ගොතන විචිත්‍ර ඕපාදූප අපමණය. ඒවා කියවන්නටම සැදී පැහැදී ඇති රසිකයන් ප්‍රමාණය අති විශාලය. අවසානයේ දී සාක්ෂියක් පමණක් වූ සිද්ධියක් බලවත් කැළඹීමක් කර තිබේ. එහෙත් ඉන්දීය විශේෂ විමර්ශන ඒකක දක්වා ඇති පරිදි සොයාබැලීම තවමත් අවසානයක නැත.

ජී. කේ. ජී. සරත්



# ඔස්ටින් ප්‍රනාන්දු ඔරුගොඩවත්තේ ගබඩා කඩයි බඩු බෙදයි



## ලංකාවේ මුල්ම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ඔහුය

## ජනතාවට බඩු බෙදන්න ඕනෑ නිසා ජනපති නියෝග නොතකා හැරියා

## ඇඳිරිය ඉවත් කරන කොට මම මුළු රටේම කඩ පුරවලා ඉවරයි

## අත්‍යවශ්‍ය වැඩට මුලින්ම පත්වූයේ සර් ඔලිවර්

කොරෝනා වසංගතයක් වී ඇත්තේ රටේ පොදු මහත් ජනතාවටය. වෙළෙන්දන්ට නම් එය කොරොනා වසන්තයක් වැනිය. පාලන මිල ක්‍රමයක් ඇති රටක පාලන මිලට දැන් ගත හැකි දෙයක් වේ නම් ඒ ආණ්ඩුවේ ගැසට් පත්‍රය පමණි. වී, සහල්, සීනි ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සැඟවීම් හා අධික මිලට අලෙවි කිරීම් තහනම් කරමින් ඒ ගැන ක්‍රියා කිරීමට ජනාධිපතිවරයා මහජන ආරක්ෂණ පනත යටතේ අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයකු පත් කරන්නේ මේ මාෆියාවට විසඳුමක් අපේක්ෂාවෙන්ය. දැන් මේ මෙහෙයුම පැවැරී ඇත්තේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් ධුරයට පත් මේජර් ජෙනරාල් ඒම්. ඩී. එස්. පී. නිවුන්හැල්ලටය. කොමසාරිස් ජනරාල් වන්නට දෙතුන් වසරකට පෙර ඔහු තරු දෙකේ ජෙනරාල්වරයෙක් ලෙසද පත්වූවේය. හමුදාවේ බසින් තරු දෙකේ ජෙනරාල්වරයෙක් කියන්නේ මේජර් ජෙනරාල්වරයකුටය.

අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් නමින් නොවුණද ඒකී කාර්ය භාරය වෙනුවෙන් ලංකා ඉතිහාසයේ රජයෙන් පත් කළ පළමු වැන්නා වූයේ පසුකලෙක ශ්‍රී ලාංකේය ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා වූ සර් ඔලිවර් ගුණතිලකය. දෙවන ලෝක මහා සංග්‍රාමය සමයේ සුදු පාලනය යටතේ මෙරට ඇතිවීමට ගිය මහා සාගතයෙන් ජනතාව බේරා ගෙන යම් සලාක ක්‍රමයක් යටතේ ආහාර ද්‍රව්‍ය නිකුත් කිරීමට ඔලිවර් ගුණතිලකට ඒද රාජකාරි පැවරිණි. හාල් පොත මුද්‍රණය වූයේ ඒ අනුවය.

ඉන් අනතුරුව අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් ධුරයක් ස්ථාපිත වන්නේ 1983 දී කළු ජූලියේ ආනිශංස සමනය කිරීමටය. 1983 ජූලි කලබලවලින් පසුව විශාල ජනතාවක් අවතැන් වූහ. ඔවුන් බොහෝ දෙනෙක් සිටියේ කෝවිල්, පන්සල්, පාසල්වලය. මෙවැනි අවස්ථාවක ඔවුන් රැක බලා ගැනීමේ වගකීම රජයට පැවරී තිබූ නිසා ජනාධිපති බලතල අනුව පළමු වරට අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් තනතුරක් විධිමත් පරිදි ස්ථාපිත කෙරිණි. ඒ අනුව, ලංකාවේ මහජන ආරක්ෂණ පනතේ විධිවිධාන මත, හදිසි නීති රෙගුලාසි මත පත් කළ පළමු කොමසාරිස් ජනරාල්වරයා වූයේ ඔස්ටින් ප්‍රනාන්දුය.

කොරෝනා තත්ත්වය තුළ රටේ වෙළෙන්දන් මහජනතාව සූරා කමින් අසාධාරණ ලෙස ලාභ ඉපැයීම වැළැක්වීමටත්, කෘත්‍රිමව නිර්මාණය කර ඇති භාණ්ඩ හිඟයට පිළියමක් ලෙසත් ඉකුත් 30 ද අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයකු පත් කළද, එද ඔස්ටින් ප්‍රනාන්දු පත්වීම් ලබන විට රටේ තිබුණේ මීට මඳක් වෙනස් තත්වයකි. ඒ කතාව දැනගැනීමට මත්තෙන් ඔස්ටින් ප්‍රනාන්දු කවුදැයි දැන ගැනීම වටී. මක්නිසාද යත් ඔහු ලංකා පරිපාලන වංශ කතාවේ අපූර්ව චරිතයක් බැවිනි.

හික්කඩුවේ උපන් ඔස්ටින් ප්‍රනාන්දු, ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ ආදි සිසුවෙකි. ඔහු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ පේරාදෙණිය මණ්ඩපයේ උපාධිධාරියෙකි. 1963 දී ගුරු වෘත්තියෙන් සිය රාජ්‍ය සේවය ඇරඹි ඔස්ටින් ප්‍රනාන්දු, සිය මුල් ගුරු පත්වීම ලද්දේ, ගාල්ල, නාගොඩ මහ විදුහලටය. ඔහු එවකට එම විදුහලේ භූගෝලය, ආර්ථික විද්‍යාව හා ඉතිහාස ගුරුවරයාය. අනතුරුව 1967 දී පරිපාලන සේවයට එක්වීමෙන් පසු මඩකලපුව දිසාපති වශයෙන් සේවය ඇරඹී ඔහු, මැතිවරණ දෙපාර්තමේන්තු නිලධාරියකු වශයෙන්ද, පොළොන්නරුව හා නුවරඑළිය මහ දිසාපති ලෙසද කටයුතු කර පසුව සමුපකාර කොමසාරිස් ලෙස පත්වීම් ලැබිය. කලක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේද, පුද්ගලික අංශයේද, ජයිකා ආයතනයේද කටයුතු කර ඇති හෙතෙම පුනරුත්ථාපන අමාත්‍යාංශ ලේකම් ලෙසද, පළාත් සභා සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් ලෙසද, මැණික් සංස්ථාවේ සභාපති, නැගෙනහිර ආණ්ඩුකාරවරයා ලෙසද, ජනාධිපති උපදේශකයෙක් ලෙසද, ජනාධිපති ලේකම් ලෙසද මෙන්ම ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ලෙසද කටයුතු කර තිබේ.

1986 පෙබරවාරි 20 ද එවකට ජනාධිපති ලේකම්, ඩබ්ලිව්. එම්. පී. බී. මැණික්දිවෙල විසින් පළකරන ලද අංක 389/50 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස්වරයා ලෙස පත්වීම් කරන්නේ ඔස්ටින් ප්‍රනාන්දුය.

**"ඔය නමින් නොවුණත් 83 ජූලි කලබල කාලෙ මේ වගකීම මුලින් භාරදුන්නෙ බ්‍රැඩ්මන් වීරකෝන් මහත්තයාට. ඊට පස්සෙ ආණ්ඩුවට තේරුණා මේක කිසියම් විධිමත් භාවයකින් කරන්න අවශ්‍යයි කියලා. ඒ අනුව, ජේ.ආර්. ජයවර්ධන මහත්තයා පුනරුත්ථාපන කියලා අමාත්‍යාංශයක් ඇති කළා. ඒක එතුමා යටතේ තියාගත්තා. එහි ලේකම් ලෙස පත් කළේ, අද්මිරාල් ඇල්ෆ්‍රඩ් පෙරේරා කියන නාවික හමුදාවේ මහත්තයෙක්. පසුව එතුමා කෙන්යාවෙ තානාපති වුණ නිසා ඒ තනතුරට මාව පත්කළා. ඒ 1986 ජනවාරි 15 වෙනිද. ඒ අමාත්‍යාංශයට රාජ්‍ය ඇමැති කෙනෙකුත් පත් කළා. ඒ ලයනල් ජයතිලක මහත්තයා. ඊට පස්සෙ ජනවාරි 27 දතමින් තවත් තනතුරකට පත් කළා. ඒකෙ තිබුණෙ මුළු ශ්‍රී ලංකාද්වීපයටම අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් ලෙස මාව පත්කළා කියලා.''**

එසේ ලැබූ පත්වීමෙන් ඔස්ටින් ප්‍රනාන්දු 1986 සිට 1988 මුල් කාලය දක්වා වසර දෙකක් මෙරට අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස්වරයා ලෙස සේවය කළේය.

**"එද මට අදාළ තනතුරින් රජය බලාපොරොත්තුව වුණු අරමුණු ගණනාවක් තිබුණා. ඒත් පත්වීම් ලිපියෙ ඒ සියල්ලම තිබුණෙ නැති වුණත්, අවතැන්වූවන් රැක බලා ගැනීම, ඔවුන් ප්‍රවාහනය, ඔවුන්ගේ නිවෙස් හදදීලා නැවත පදිංචි කරවීම සහ යුද්ධය නිසා අපහසුතාවට පත්වූ ජනතාවට සහන සැලසීම රජය මගෙන් බලාපොරොත්තු වුණා."**

එපමණක් නොව, ත්‍රස්තවාදී ක්‍රියා නිසා පීඩාවට පත්වූ සිංහල අයටත්, හමුද ක්‍රියාන්විත නිසා යම් සිදුවීම්වලට මුහුණ දුන් දෙමළ ජනතාවටත්, ජාතිවාදී ප්‍රශ්න නිසා අවතැන්ව සිටි ජනතාවටත් එක ලෙස එද අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ලෙස පමණක් නොව, පුනරුත්ථාපන ලේකම් හැටියටත් සහන දීමට එද ඔස්ටින් ප්‍රනාන්දුට සිදු විය. මේ ජනතාවගේ ආරක්ෂාව පමණක් නොව, ඔවුන්ට කෑම බීමද, බෙහෙත් හේත්ද, වෛද්‍ය පහසුකම් පමණක් නොව, නැවත පදිංචි කිරීමේදී නිවාස අලුත් වැඩියා කරගැනීමට පොල්අතු හා ටකරංද, උයා පිහා ගැනීමට හැළි වළං හා බෙදගෙන කෑමට පිඟන් කෝප්පද සැපයීම සොයා බැලීමටද ඔස්ටින්ට සිදුවිය.

**"ඒ ප්‍රදේශවල දිසාපතිවරු එක්කාසු කරගෙන තමයි මම හැම දෙයක්ම කළේ. උදාහරණයක් විධියට සමුපකාර කොමසාරිස්, මිල පාලන කොමසාරිස්, මහ දිසාපතිවරු, උප දිසාපතිවරු එක්වයි හැමවිටම රාජකාරිය කළේ. මම පරිපාලන සේවයේ නිලධාරියෙක් හැටියට හිටිය නිසා මෙම තනතුරේ වැඩ කරන්න මට පහසුවක් වුණා"** ඔහු පවසයි.

පසුගියද සඟවා තිබූ සීනි තොග නව අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස්, මේජර් ජෙනරාල් සෙනරත් නිවුන්හැල්ල අත්කර ගත්තා මෙන් ගබඩාවල ගොඩගසා තිබූ ද්‍රව්‍ය අත්කරගැනීමටත් එද තමාටත් සිදුවූ බව ඔස්ටින් ප්‍රනාන්දු කියන්නේය.

**"ඒ වෙලාවෙ ලොකුම ප්‍රශ්නෙ තිබුණේ පාන් පිටි නැතිකම. මමයි සමුපකාර අමාත්‍යාංශ ලේකම් ධර්මසිරි පීරිස් මහත්තයායි එද ඔරුගොඩවත්තෙ පිටි ගබඩාවට ගිහින් ඒකෙ තිබ්බ පාන්පිටි තොග අරගන්න උත්සාහ කළා. අපි යනකොට එතන කවුරුවත් නෑ. ඒ නිසා හමුද කට්ටියකුත් අරන් ගිහින් මේ ගබඩාවල ඉබි යතුරු කඩලා අපි ඇති තරම් පාන් පිටි සමුපකාර සමිතිවලට නිකුත් කළා."**

1983 ජූලි කලබල ඇරඹෙද්දී ඔස්ටින් රාජකාරි කළේ සමුපකාර කොමසාරිස් හැටියටය. ඒවකට අමාත්‍යාංශ ලේකම් වූයේ ධර්මසිරි පීරිස්ය. ඇමැතිවරයා වූයේ ගාමිණී ජයසූරියය. **"කළු ජූලිය වෙලාවෙ මටත්, ධර්මසිරි පීරිස් සහ ග්‍රැහැම් දිසානායක කියන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයාටත්, ආහාර කොමසාරිස් විධියට හිටිය පුලේන්ද්‍රන් මහත්තයාටත් එන්න කියල ඇමැතිතුමා පණිවුඩයක් ඒවලා තිබුණා. ඒ වෙනකොට පුලේන්ද්‍රන් මහත්තයාගෙ ගේත් ජාතිවාදීන් ගිනි තියලා තිබුණෙ. එතුමා හිටියෙ හැංගිලා. කලබල පටන් ගන්නකොට අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් තනතුරක් තිබුණෙ නෑ. ඒ නිසා ඇමැතිතුමා අපට භාරදුන්නා මේ ආපද වෙලාවෙ මිනිස්සුන්ට සහන සලසන්න කියලා."**

ජාතිවාදී කලබලවලින් අවතැන්ව හින්දු විද්‍යාලයේ හා කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ සිටි දෙමළ ජනතාව ඔවුන්ගේ ඉල්ලීම පරිදි නැව් මගින් යාපනයට ආරක්ෂිතව රැගෙන ගියේද ඔස්ටින් ප්‍රනාන්දු ඇතුළු පෙර කී නිලධාරීන්ගේ මැදිහත් වීමෙනි. ඒ සඳහා අවශ්‍ය නැව් දුන්නේ වෙළඳ හා නාවුක ඇමැති ලලිත් ඇතුළත්මුදලිගේ උපදෙස් මත අමාත්‍යාංශ ලේකම් ලක්ෂ්මන් ද මෙල්ගේ සහායෙනි.

**"ගාමිණී ජයසූරිය ඇමැතිතුමා අපිට එද කිව්වෙ, මේ වැඩේ නීත්‍යානුකූල සීමාවල ඉඳගෙන හරි විධියට කරන්න කියලා. ඕනම දේකදි මම ඔයාලා ආරක්ෂා කරනවා කියල ජයසූරිය ඇමැතිතුමා කිව්වා. ඒක නිසා කිසිම බයක් නැතුව අපි රාජකාරිය ඉටු කළා."**

හදිසි නීතිය යටතේ ඇඳිරි නීතිය පනවා තිබූ එකල ඔස්ටින් ප්‍රනාන්දු ක්‍රියා කළේ, සමුපකාර සමිතිවල ලොරි යොද ගනිමින්, ආහාර දෙපාර්තමේන්තු ගබඩා තිබූ හාල්, පිටි, සීනි, ලූණු, අල වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය රට පුරා ප්‍රාදේශිකවලට ප්‍රවාහනය කිරීමටය. ඇඳිරි නීති අවසන් වූ සැණින් ජනතාව ආහාර ද්‍රව්‍ය මිලට ගැනීමට වෙළෙඳ සැල්වලට පැමිණීමේදී අවශ්‍ය තරම් තොග බෙද හැරීම ඔහුගේ ඉලක්කය විය.

**"මෙහෙම කරද්දී, අමාත්‍යාංශ ලේකම් ධර්මසිරි පීරිස් මහත්තයා මට කිව්වා, ඔස්ටින්, ජනාධිපතිතුමා මට නියෝග කරලා තියනවා මේ ප්‍රවාහනය කරන වැඩේ නතර කරන්න කියලා. ඒකට හේතු වෙලා තිබුණෙ, හමුදවෙ අය ජනාධිපතිතුමාට කියල තිබුණලු, ලොරිවලින් රට පුරා බඩු මුට්ටු ප්‍රවාහනය කරන නිසා ඇඳිරි නීතිය හරි විධියට කරන්න එයාලට බාධාවක්ය කියල."**

අමාත්‍යාංශ ලේකම්වරයා හරහා රටේ විධායක ජනාධිපතිවරයා දුන් නියෝගය පිළිපැදීමට වුවද ඒ මොහොතේ ඔස්ටින් ප්‍රනාන්දුගේ හිත කිව්වේ නැත. "මේ මොන පිස්සු නියෝගයක්ද ? ඔය නියෝගෙ වැරදියි නේ. ඇඳිරි නීතිය ඉවර වුණාම මිනිස්සු කඩවලට ගියාම බඩු නැත්නම් ලොකු කෝලහාලයක් වෙන්න පුළුවන්නේ."

ඔහු ලේකම්වරයා සමග තර්ක කරන්නට විය. ඒහෙත් ලේකම්වරයාගේ අසරණ කම දුටු ඔහු ජනපති නියෝගයෙන් බේරීමේ උපදෙසද දුන්නේ කෙක්කෙන් බැරි නම් කොක්කෙන් හෝ ජනතාව වෙනුවෙන් අවශ්‍ය දේ කිරීමටය.

**"ඔබතුමා ජනාධිපතිතුමාට කියන්න ඔස්ටින් මේ දවස්වල ෆීල්ඩ් එකේ ඉන්නෙ. ඒ නිසා ඔබතුමාගේ නියෝගය ඔස්ටින්ට දැනුම් දෙන්න විධියක් නැහැ කියල. හමුවූ වහාම උපදෙස් දීලා වැඩේ නතර කරන්නම් කියලත් කියන්න."**

ඊ-මේල්, වට්සැප්, වයිබර් පමණක් නොව, ජංගම දුරකථනද නොමැති එකල, ඒවැනි බොරුවකින් ජාමය බේරා ගැනීමට ලේකම්වරයාට අවස්ථාව තිබෙන්නට ඇත. ඒ අනුව රටේ විධායක ජනාධිපතිගේ නියෝග පවා නොසලකමින් සිය තනතුරේ වගකීම් ඔහු කළේ සීමාවද ඉක්මවමින් විය යුතුය. ඒනයින් බලන කල, චක්‍රලේඛවල වගන්ති සොයමින් මහජන සේවය නොකෙරෙන තැනට වැඩ සිද්ධ කරන රාජ්‍ය නිලධාරීන්ට ඔස්ටින් ප්‍රනාන්දුලා අත්පොත් වැනි යැයි අපට සිතේ.

**"අපේ හයියෙන් අපි එද ජනතාවට අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කළා. රට පුරා ගබඩා පනස් ගණනක් එවකට තිබුණා. දින ගණනක් ඇතුළත අපි මේ ගබඩා සියල්ල පිරෙව්වා"** තැතිගත් මිනිසුන්ගේ කුස් පිරවීමට ඔස්ටින්ලා අත්‍යාවශ්‍ය සේවා මෙහෙයුම් කළ සතුට ඔහු අපට කිව්වේ එලෙසය.

**''ඉතිං ඊට පස්සෙ ප්‍රශ්නයක් වුණේ නැද්ද... ?''** ඒ අපේ අතුරු පැනයකි.

**"ගබඩා පිරෙව්වට පස්සේ මම ලේකම්තුමාට කිව්වා, බඩු බෙදිල්ල නතර කළා කියලා දැන් ජනාධිපතිතුමාට කියන්න කියලා. ඇත්තටම එද ඇඳිරි නීතිය ඉවරවෙලා කඩවලට ගියපු මිනිස්සු කඩවල බඩු ඕනතරම් තියනව දැකපු නිසා තොග රැස්කරගන්න, ගොඩ ගහගන්න උනන්දු වුණේ නෑ. හැම මිහිහම ගත්තෙ තමන්ගෙ අවශ්‍යතාවට පමණයි."**

ඔස්ටින් ප්‍රනාන්දු කියන්නේ, මේ තනතුරේ කටයුතු කිරීමේදී පත්වීම් ලිපිවල කුමක් තිබුණද, රටේ ජනතාගෙ අවශ්‍යතාව අනුව සිතා ක්‍රියාත්මක වීමට ශක්තිය තිබිය යුතු බවය. යහපත් චේතනාවෙන් තවත් බොහෝ කටයුතු වුණත් කරන්න මේ අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස්වරයකුට හැකියාවක් තියෙන බවත් ඔහු පෙන්වා දේ.

මෙවැනි පුළුල් වගකීම් සඳහා හමුද නිලධාරීන් පත් කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගත හැකිදැයි වන ඇතැමුන්ගේ පැනය අප යොමු කළේ රාජ්‍ය සේවයේ සෑම තනතුරක්ම දරා ඇති මේ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියාටමය.

**"ඒ කාලෙත් හමුද නිලධාරීන් තනතුරුවලට පත් කළා. ජේ.ආර්.ගෙ කාලෙ ආරක්ෂක ලේකම්කම කළේ, ජෙනරාල් සේපාල ආටිගල මහත්තයා. අද්මිරාල් ඇල්ෆ්‍රඩ් පෙරේරා මහත්තයා තමයි පුනරුත්තාපන අමාත්‍යාංශ ලේකම් විධියට වැඩ කළේ. දැන් වැඩියෙන් ඉන්නවා කියන එකනේ චෝදනාව. ඒත් මෙවැනි තනතුර වලට පත්කිරීම් කිරීම සඳහා ජනාධිපතිවරයාගේ අභිමතානුසාරී බලය අනුව ලේකම් වරයෙක් හෝ ඉහළ නිලයකට ඕනෑම පුද්ගලයෙක් පත් කරන්න පුළුවන්. පරිපාලන සේවයේ පළපුරුද්ද ඇති කෙනෙක්ට කිසියම් විශේෂ වාසියක් තිබෙනවා වෙන්න පුළුවන්."**

හදිසි නීතියක් නොමැති අවස්ථාවක හදිසි නීති රෙගුලාසි මත පත්වීමක් කළ හැකිද? මෙවැනි තනතුරක් ඇති කිරීමට තරම් වාතාවරණයක් රටේ පවතීද? යන්නද ඔස්ටින්ගෙන්ම අප විමසුවේ ඔහු ජනාධිපති ලේකම් පදවියක් දරා ඉසිඹු ලැබූ අයකු බැවිනි.

**"ඇත්තටම දැන් ඇතිවෙලා තියෙන්නෙත් යම් හදිසි ආපද තත්වයක් තමයි. එවැනි වෙලාවක ඒකට ක්‍රියාත්මක විය හැකි තනතුරකට ඔහුට හැඟෙන යම් බලයක් පැවරීමට ජනාධිපතිවරයකුට බලය තියෙනවා. කොවිඩ් වගේ වසංගත තත්ත්වයක් රටේ තියනවා. ඒ නිසා ආහාර හිඟයක් ඇතිවෙමින් තිබෙනවා. මේවා පාලනය කරන්න රජයට වගකීමක් තියෙනවනේ. අනික තමයි, මෙහි ඇති නීතිමය තත්වය තමයි ගැසට් එක ගහද්දි හදිසි නීතිය රටේ ක්‍රියාත්මක නොවුණත්, එය මුද්‍රණයෙන් පසු පාර්ලිමේන්තුව දින ගණනක් තුළ දැනුවත් කරන්න අවසර තිබෙනවා. ඒ ගැන සාකච්ඡා කර පසුව පාර්ලිමේන්තුවේ අවසරය ගන්න පුළුවන්."**

දේශපාලනය, ආර්ථිකය, සමාජ වාතාවරණය මේ ඔක්කොම වෙනස්ය. එහෙත් නොවෙනස්ව ඇත්තේ ජනතාව වෙත පැමිණෙන පීඩාවන්ය. බොහෝ දෙනා උත්සුක වන්නේ පීඩාව තම වාසියට හරහා ගැනීමටය. දේශපාලනයද එසේය.

1978 දී මම පොළොන්නරුවෙ මහ දිසාපති වෙලා ඉන්න කාලෙ එහෙට මහා සුළි සුළඟක් ආවා. එද විපක්ෂේ හිටපු කොල්වින් ආර්. සිල්වායි, අතාවුද සෙනෙවිරත්නයි පොළොන්නරුවට ආවා. ඔවුන් මාව හමුවෙලා ඇහුවෙ "මොනවද සහෝදරයා ඔබට අපෙන් කෙරෙන්න ඕනේ?" කියල.

එදත්, අදත් වෙනස එයයි.

උපුල් ගලප්පත්ති

## කළු කඩ වටලන නිවුන්හැල්ල කවුද



අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ලෙස නව පත්වීමක් ලද මේජර් ජෙනරාල් සෙනරත් නිවුන්හැල්ල ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට ආරක්ෂාව සලසන ජනාධිපති ආරක්ෂක සේනාවේ අධ්‍යක්ෂවරයාය. ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම් ධුරය දැරූ කාලයේ 2009 සිට 2015 දක්වා ඔහුගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා ලෙස රාජකාරි කළේ එකල කර්නල්වරයෙක් වූ සෙනරත් නිවුන්හැල්ලය.

එක්දහස් නවසිය හැට හයේ ජනවාරි 22 දින උපත ලැබූ සෙනරත් නිවුන්හැල්ල පොල්ගහවෙල මධ්‍ය මහා විදුහලේ ආදි සිසුවෙකි.

නිලධාරීන් බඳවා ගැනීමේ පාඨමාලා අංක 25 යටතේ ඔහු ශ්‍රී ලංකා යුද හමුදාවේ ගජබා රෙජිමේන්තුවේ දෙවැනි ලුතිනන්වරයකු ලෙස අධිකාරිය ලැබුවේ 1988 අප්‍රේල් 4 වැනිදය.

1991 දී එල්ටීටීඊ සංවිධානයේ නැගෙනහිර බළකොටුව වූ තොප්පිගල මුදගැනීමේ සටනේදී හතරවන ගජබා රෙජිමේන්තුවේ 'එකෝ' කණ්ඩායම භාරව සෙනරත් නිවුන්හැල්ල මෙහෙයුමට නායකත්වය දුන්නේය. එම මෙහෙයුමේදී හමුදාව එල්ටීටීඊය නොමග යැවීමට උපක්‍රමයක් පාවිච්චි කළේය. ඒ හාල්, පරිප්පු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ පැටවූ ගොන් කරත්ත හැටක ගැල් පෙළක් දක්කාගෙන පිරිසක් තොප්පිගල දෙසට ගමන් කරවීමයි. එල්ටීටීඊය ඒ දෙස අවධානය යොමු කරමින් සිටියදී වනගත ප්‍රදේශ ඔස්සේ ඉදිරියට ඇදුණු හතරවන ගජබා හට කණ්ඩායම් කොටින්ට පහර දී තොප්පිගල මුද ගත්හ. මේ හේතුවෙන් නැගෙනහිර එවකට කොටි නායක කරුණා අම්මාන් ඇතුළු කොටි 1991 දෙසැම්බර් 31 දින තොප්පිගල අතහැර පසුබැස්සහ.

අලිමංකඩ කඳවුර බේරා ගැනීමට ක්‍රියාත්මක වූ බලවේගය මෙහෙයුම මෙන්ම යාපනය කිරමලේ මුදගැනීමට යුද හමුද ඉතිහාසයේ මුල්වරට වාහනවලින් සතුරු අඩවියට කඩා පැන එල්ල කළ ක්‍රියාන්විතයට සෙනරත් නිවුන්හැල්ල ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය. 1990 ජූලියේ යාපනය කොටුවේ සිරවූ සෙබළුන් මුද ගැනීමට ඇරඹුණු තීරණාත්මක මෙහෙයුමට එක්වූ නිලධාරීන් අතරේ සෙනරත් නිවුන්හැල්ලද සිටියේය.

ඉලක්කයට වෙඩි තැබීමේ ශූරයකු වන ඔහු ඒ වෙනුවෙන් ජාතික හා ජාත්‍යන්තර සම්මාන රැසක්ද හිමිකරගෙන තිබේ. යුද හමුද ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ මේජර්වරයකු ලෙස මාධ්‍ය සමග සමීපව කටයුතු කළ සෙනරත් නිවුන්හැල්ල පසුකලක නෙළුම්පොකුණ රඟහල භාරව මෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොළඹ නගරය අලංකරණය කරන ව්‍යාපෘතියේදීත් කැපවී කටයුතු කළේය.


මඩකලපුව 232 බළ සේනාධිපති, මාදුරුඔය සටන් පුහුණු පාසලේ සේනා විධායක, යුද හමුද පිරිස් පරිපාලන අධ්‍යක්ෂ ඔහු යුද හමුදවේ දැරූ තනතුරු අතර වේ.

තිස්ස රවීන්ද්‍ර පෙරේරා

**එක්සත් ජාතික පක්ෂයේ හැත්තෑ පස්වැනි සමරුව යෙදී ඇත්තේ හෙටය (6) ගත වූ හැත්තෑ පස් අවුරුද්දේ එජාප මූලස්ථානය තැන් දෙකක තිබුණේය. නායකයෝ හත් දෙනෙක් එජාප පාලනය කළෝය. එනමුත් මේ කාලයේ එජාප මූලස්ථානයේ නොවෙනස් වූ අයෙක් සිටියේය. ඔහු ධනපාලය. මේ ඔහු ගැන මාධ්‍යකින් කරන මුල්ම අනාවරණයය.**



# අවුරුදු පනහක් සිරිකොත රකින ධනපාල



සිරිකොතේ ධනපාල යනුවෙන් කී විට ඔහුගේ රූපකාය හෝ වගතුග ගැන රටුන්ට නිච්චියක් නැති බව සහතිකය. එනමුත් කැපුවත් කොළ යනුවෙන් කියන යූඇන්පී කාරයන්ට නම් සිරිකොතේ ධනපාල ගැන කියමින් ගහේ කටු උල් කරන්නට ඕනෑ නැති බව අපට සිතේ. සිරිකොතට යනෙන එජාප නායකයාගේ සිට බිම් මට්ටමේ එක්සත් ජාතික පාක්ෂිකයා දක්වාම ඔහු ගැන දනිති. නොදන්නවානම් ඔහු ඔර්ජිනල් යූඇන්පීකාරයෙක් නොවේ. ගහට පොත්ත නම් සිරිකොතට ධනපාලය.

එක්සත් ජාතික පක්ෂය ආරම්භ වූයේ හරියටම මීට හැත්තෑ පස් වසරකට ඉහතදීය. දිනය කියනවා නම් 1946 සැප්තැම්බර් 06 වැනිදය. පක්ෂය පිහිටුවූයේ අනගාරික ධර්මපාල තුමාගේ සහෝදර එඩ්මන් හේවාවිතාරණගේ පුතෙකු වූ රාජා හේවාවිතාරණගේ කොළඹ හතේ ෆාම් කෝට් මන්දිරයේය. ඉක්බිතිව සර් ජෝන් කොතලාවල පක්ෂයට කොල්ලුපිටියේ මූලස්ථානයක් අරගෙන දුන්නේය.

එයට සිරිකොත යනුවෙන් නම තැබුවේ ශ්‍රීමත් කොතලාවල යන නම එහා මෙහා කරය. ඒ අසූව දශකයේ මුල සිරිකොත කොල්ලුපිටිය හැරපියා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අලුත් බිමකට ගෙවැදුණේය. සිරිකොතේ බිම මාරු වුණත් සිරිකොතෙන් මාරු නොවුණු එකම පුද්ගලයා ධනපාලය. කොතලාවලගේ සිට සේනානායක, ජයවර්ධන, ප්‍රේමදාස, විජේතුංග, වික්‍රමසිංහ යන නායකයන් වෙනස් වුවත් සිරිකොතේ වෙනස් නොවූ යූඇන්පීකාරයා ධනපාලය.

සිංහල ජාතික ඇඳුමෙන් නිතරම සැරසී සිටින ධනපාලගේ හරි රස්සාව ආරක්ෂක නිලධාරිය. ඔහු කා අතරත් ජනප්‍රියයි. ඔහු විටෙක චණ්ඩියෙකි. තවත්වෙරෙක ජොලි මිනිහෙකි. එජාපය ගැන ඔහුගේ දැනුම කාටත් නොදෙවැනිය.

දෙහෙනගමගේ ධනපාල උපන්නේ ගාල්ලේ අහංගමය. ඒත් ගම වැලිගමය. 1939 ජුලි මස 12 වන දින උපන්නේය. එජාපය උපදින විට ඔහුට වයස අවුරුදු හතකි. ඒ නිසා එජාපයේ බාල කාලය ගැන ඔහුට මතකයක් නැත. අහංගම හොරලුගොඩ මහා විදුහලට ඉස්කෝලේ ගිය ඔහු අධ්‍යාපනය හැදෑරුවේ හයවන ශ්‍රේණිය දක්වාය. දෙහෙනගමගේ මෙන්ඩිස් අප්පුහාමි ඔහුගේ පියාය. හොරලුගොඩ ගමගේ කරුණාවතී මවය. දේශපාලනයේදී දකුණ තිබුණේ වමට බරවය. එකල ධනපාලලාගේ ගම් පළාත අයත්ව තිබුණේ අකුරැස්ස ආසනයටය. පාසල් යන කාලේ තමයි 47 මහ ඡන්දය තිබුණේ. අකුරැස්ස ආසනයට ස්වාධීනව තරග කළේ විල්සන් වික්‍රමසිංහ මහතාය. එජාපයෙන් ඩී. වනිගසේකර මහත්තයාත් ඉදිරිපත්වුණා.

''කරත්තයක් අරගනිමු
වික්‍රමසිංහ බැඳ ගනිමු
හාමු මහත්තයා නග්ගමු
අකුරැස්සට දක්කමු''

නාඹර වියේදී ගමට ආයුබෝවන් කියූ ධනපාල සෙංකඩගල පුරවරයට පැමිණියේ මිතුරෙකුගේ මාර්ගයෙනි.

ඔහු දේශපාලනයට අත්පොත් තැබුවේ සෙංකඩගලදීය. සිය මිතුරා මහනුවර පොදු වෙළෙඳපොළේ ව්‍යාපාරිකයෙකි. ඔහුගේ ව්‍යාපාරවලට සහයෝගය දෙමින් සිටි ධනපාල එකල මහනුවර එජාප බලවතා වූ ඊ.එල්. සේනානායකගේ රැස්වීමක් බලන්න ගියේය.

**සේනානායක මහත්තයා කුඩයක් ඔසවාගෙන කුඩා කණ්ඩායම්වලට රැස්වීම් තියන හැටි බලන්න මම ගියා. මම එතකොට කොල්ලා කාලේ. කොළ පාටට මම හරිම කැමැතියි. 1952 මැතිවරණයේදී මහනුවර ආසනය ඊ.එල්. සේනානායක මහත්තයා දිනුවා. නමුත් ඡන්ද පෙත්සමක් ආවා. ඔහුගේ ප්‍රතිවාදියා මහනුවර ජෝර්ජ් ඊ.ද. සිල්වාගේ පුතා ප්‍රෙඩ් ඊ.ද සිල්වා ඡන්ද පෙත්සමින් දිනලා මන්ත්‍රී වුණා. පසුව මහනුවර මහ නගර සභා ඡන්දෙට මගේ මිතුරාත් ඉල්ලුවා. ධනපාල තමන් එජාපයට බෞතිස්ම කළ හැටි මතකයට නැගුවේය.**

ධනපාලගේ සිරිකොත ප්‍රේමයට අත්තිවාරම් වැටෙන්නේ 1956දීය. ඒ ඔහු ඉස්සෙල්ලාම සිරිකොතට පැමිණ එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වය ගත් දවසේය. එදවස එජාප සම ලේකම්වරුන් වූ උක්වත්ත ජයසුන්දර හා ඇම්.ඩී.එන්. ජයවර්ධනගේ අත්සනින් ඔහු සාමාජිකත්වය ගත්තේය. ඒ වන විට පක්ෂ මූලස්ථානය පිහිටා තිබුණේ 532 ගාලුපාර කොල්ලුපිටිය යන ස්ථානයේය.

අපි ඒ කාලේ සිරිකොත රැස්වීම්වලට එනවා. මම නායකයන්ගේ කතා අහන්න හරි කැමැතියි. ප්‍රේමදාස මහත්තයා තමයි හොඳට කතාව කරන්නේ. 1956 ඡන්දයෙන් පසු කොතලාවල මහත්තයා දේශපාලනයෙන් පැත්තට වුණා. ඒ වෙලාවේ ඩඩ්ලි මහත්තයාත් පැත්තට වෙලා හිටියේ. මම කඳවල වලව්වට ගිහින් කොතලාවල මහත්තයා හමුවෙලා පක්ෂයේ වැඩට එන්න කියලා ආරාධනා කළා. නමුත් එතුමා කීවා බණ්ඩා (බණ්ඩාරනායක) ආණ්ඩුව කරනවානේ. ඔහේ ඉන්න කියලා. දේශපාලනයෙන් ඉවත්ව සිටි ඩඩ්ලි සේනානායක 1960 දැදිගම ආසනයට යළි තරග කළේය. ඔහුගේ මැතිවරණ ව්‍යාපාරයට දැදිගම ආසනයේදී දායකත්වය දැක්වීමට ද ධනපාල අමතක කළේ නැත. සේනානායකවරු තරම් වටිනා සම්පතක් ධනපාල උන්නැහේට එජාපයේ නැත. ඩඩ්ලි 73 දී හෘදයාබාධයකට ලක්ව ඇතුළත් කළේ කොළඹ ඩර්ඩන්ස් ඉස්පිරිතාලෙටය.

**''මම ඉස්පිරිතාලෙට ගියා අගමැතිතුමා බලන්න. පුතා මම ජීවත් වෙන්නෙ නැහැ. ඔයගොල්ලො යන්න'' කියලා එතුමා මට කීවා. ඒ කතාව ඇසූ ධනපාලගේ දෑස කඳුළින් තෙත් වූයේය.**

ධනපාල කියන හැටියට මහවැලි ව්‍යාපාරය බණ්ඩාරනායකගේ අදහසක් නොව ඩී.එස්. සේනානායක අගමැතිවරයාගේ වැඩකි. අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, ගොවිජනපද ඇති කරමින් ඩී.ඇස්. ආරම්භ කළ වැඩපිළිවෙළ එකල හරි ජනප්‍රියය. ''මැලේරියා හදන්න මිනිස්සු ගිහින් දනවා'' වාමාංශිකයෝ ඔහුට කීය. කෙසේ වෙතත් ඩී.එස්. සේනානායක ගොවිජනපද ව්‍යාපාර නිර්මාණය කිරීමට යන විට පත්තරකාරයන් ද රැගෙන යාමට අමතක කළේ නැත. ''සිංහලේ'' පුවත්පතේ කර්තෘ පියදාස සිරිසේන ඩී.එස්. සමග ගොවිජනපද ව්‍යාපාර ආරම්භ කරන්න ගිය හොඳ පත්තරකාරයෙකි. ඔහු ලියූ ''මහේෂ්වරී'' කෘතියේ පිටු අංක 133-137 දක්වා මහවැලි ව්‍යාපාරය ආරම්භ කිරීමට ඩී.එස්. සේනානායක කළ දායකත්වය ඇති බව ධනපාල කියන්නේය. **''ඩී.එස්. අගමැතිතුමා අඹන්පිටිය පාලම ළඟට ඇවිල්ලා සී.පී. ද සිල්වා මහත්තයම කීවා මහවැලි ගඟ හා අඹන්ගඟ එකතු වන ස්ථානයේ සිට වියළි කලාපයට වතුර දෙන වැඩපිළිවෙළ ආරම්භ කරන්න කියලා'' ධනපාල මහවැලි ව්‍යාපාරය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ව්‍යාපෘතියක් නොව එක්සත් ජාතික පක්ෂයේ යෝජනාවක් බව සිහිපත් කළේ එලෙසිනි.**

1970 දශකයේදී සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිවරියගේ කාලයේ පෝලිම් යුගය ගැන ඔහුට හොඳ හැටි මතකය. කෙසේ වෙතත් ධනපාල මේ කාලය වනවිට පදිංචිව සිටියේ මරදාන මාලිගාකන්දේය. තරුණ වියේ පසු වූ ධනපාල සිය හාල්පොත පවා පක්ෂයට පරිත්‍යාග කළේය. ඒ දුප්පත් පක්ෂ සාමාජිකයන්ට හාල් ලබා දීම සඳහාය. **''මම යහළුවෝ ටිකක් එක්ක ඩඩ්ලි සේනානායක අගමැතිතුමා සිහිපත් කරමින් රාජගිරියේ වැඩිහිටි නිවාසයට දනයක් දුන්නා. එද මැයි දිනය දවසේ මැයි පෙළපාලිත් කොළඹ තිබුණා. ශ්‍රීලනිපයේ තිස්සමහාරාමයේ මන්ත්‍රී ටෙනිසන් එදිරිසූරියගේ රියැදුරා ඩඩ්ලි සේනානායකගේ පින්තූරයට ගැහුවා. එතුමාගේ පින්තූරයට ගහනවාට වඩා හොඳයි අපි මැරුවා නම්. මගෙත් එක්ක හිටියා සොයිසා කියලා යහළුවෙක්. මේ වැඩේට ඔහු මාරාවේශ වුණා. ඔහු රියැදුරාට පිහියෙන් ඇන්නා. රියැදුරත් මැරෙන්න පෙර දුණු කොළයකින් අපටත් ගැහුවා. අපට මේ ඝාතනයට නඩු වැටුණා. මම මේ ගැන පක්ෂ නායක ජේ.ආර්. ජයවර්ධනට කීවා. එතුමා අපට පක්ෂයෙන් නීතිඥ සහාය දුන්නා. නඩුවට කතා කළේ දයා පෙරේරා නීතිඥ තුමා. නඩුව අපි දිනුම්'' ධනපාල මෙම කතාව කියමින් ජේ.ආර්. ජයවර්ධන වැනි නායකයන් තමන් රැක බලාගත් හැටි සිහිපත් කළේය.** මේ අතරේ මැතිනියගේ ආණ්ඩුව විපක්ෂ නායක ජේ.ආර්. අත්අඩංගුවට ගන්න බවට ආරංචියක් පැතිර ගියේය. ජේ.ආර්. ගෙන යන්න වෙන්නේ අපේ මළ කඳන් උඩින් කියමින් එජාප පාක්ෂිකයෝ ජේ.ආර්ට රැකවරණය දෙන්න දිවි හිමියෙන් ආවෝය. ඒ අතරේ ධනපාල ද කැපී පෙනුණේය.

ධනපාල සිරිකොතේ ආරක්ෂකයා බවට පත්වූයේ මේ කැප කිරීම නිසාය. මරාගෙන මැරී හෝ සිරිකොත ආරක්ෂා කරන බව ඔහු අවසන් කැමැත්ත ලීවේය. කොල්ලුපිටියේ තිබූ සිරිකොත පිටකෝට්ටේ ස්ථාපිත කළේ 1977 මැතිවරණයෙන් පසුවය. පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර ස්ථාපිත කිරීමෙන් පසු පක්ෂ නායක ජේ.ආර්. ජයවර්ධනට සිරිකොත පාර්ලිමේන්තුව ආසන්නයේ ස්ථාපිත කිරීමට අවශ්‍ය විය. ඒ යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ ද කෝට්ටේ මන්ත්‍රී ආනන්ද තිස්ස ද අල්විස්ය. **1985 තමයි දැන් තියෙන සිරිකොත විවෘත කළේ. 1977 ජයග්‍රහණයෙන් පසු මම ළඟින්ම ඇසුරු කළේ බොරැල්ල ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.එච්. මොහොමඩ් මහත්තයා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාටත් මම හරිම කැමැතියි. අපෙත් එක්ක හැප්පෙන්න කවුරුත් ආවේ නැහැ. සිරිල් මැතිව් මහත්තයා අපට පක්ෂයට හා සිරිකොතට හොඳ ආරක්ෂාවක් දුන්නා. 1977 මැතිවරණ ජයෙන් පසු මට ඕනෑම රැකියාවක් ඉල්ලන්න කීවා. ඛනිජ තෙල්, සිමෙන්ති සංස්ථාවල රැකියා දෙන්න හැදුවා. මම සියලු රැකියා ප්‍රතික්ෂේප කළා. මම ජනාධිපතිතුමාට කීවේ මම මැරෙනකම් සිරිකොත ආරක්ෂා කරනවා කියලයි'' ධනපාල තමන් ලැබූ වරප්‍රසාද අහිමි කරගත් අයුරු සිහිපත් කළේය.**

පිටකෝට්ටේ සිරිකොතේ ආරක්ෂාව ප්‍රමාණවත් නැති බව ධනපාලට වරෙක හැඟී ගියේය. ඒ සඳහා සුදුසුම යෝජනාව වූයේ උස් තාප්පයක් ඉදි කිරීමය. ඔහු ජනාධිපතිවරයාට පණිවුඩය ඉදිරිපත් කළේ ලංකාදීප පුවත්පතේ කතුවරයා මාර්ගයෙනි. ඉන්පසු සිරිකොතට පොලිසිය මෙන්ම ත්‍රිවිධ හමුදාවේම අරක්ෂාව හිමි වූ බව ධනපාල සිහිපත් කරන්නේය. සිරිකොතේ තාප්පය ද උස් වූයේය.

ඩී.බී. විජේතුංග, රණසිංහ ප්‍රේමදාස, ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක, රනිල් වික්‍රමසිංහ එක්සත් ජාතික පක්ෂ නායකයන් එකල ඇසුරු කිරීමට ද ධනපාලට හැකි වූයේය. ''මම රුක්මන් සේනානායකත් හොඳින් ඇසුරු කළා. වලව්වටත් යනවා. ඩී.එස්. සේනානායකගේ සැමරුම්වලටත් මම මීරිගමට යනවා'' ධනපාල පැවසුවේය.

1977 න් පසු අද දක්වා තම නිවහන වූ සිරිකොත ජීවිතයේ ධනපාලට අමතක නොවන සිදු වීම් රැසක් ඇත්තේය. ඉන් 1988-1989 භීෂණ කාලය ඉතාම බිහිසුණුය. එකල ඔහු ජීවත් වූයේ මරදාන මවුලානා වත්තේය. මරදානේ සිට සිරිකොතට දෛනිකව පයින් පැමිණෙන යකාට බය නැති ධනපාල ජනතා විමුක්ති පෙරමුණට බිය නොවීය. ජවිපෙන් සිරිකොත ආරක්ෂා කිරීමට සමත් වූයේය. ''දවසක් මම සිරිකොත ඉස්සරහා බංකුවේ වාඩි වෙලා හිටියා. ගේට්ටුවේ හිටපු කෙනා කීවා බෝම්බයක් ගැහුවා දුවන්න කියලා. ආරක්ෂාවට හිටි පොලිසියත් දිව්වා. මම ඉදිරියට ගිහිල්ලා බෝම්බේ අහුලලා පාරට දැම්මා. රන්ජන් විජේරත්න ආරක්ෂක ඇමැතිතුමාගේ රියැදුරාත් අපිත් එක්ක හිටියා. ඔහු ඇමැතිතුමාට පණිවුඩය දුන්නම ඇමැතිතුමා කිව්වා බොම්බ නිෂ්ක්‍රීය අංශයෙන් එවනවා ධනපාල අයින් වෙලා ඉන්න කියලා. මම කීවා සර් මම බෝම්බය අතින් අරන් සිරිකොතෙන් එළියට විසි කළා කියලා.'' ධනපාල කීවේ සිනාසෙමිනි.

එකල ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් සිරිකොත බැම්මේ ද සටන් පාඨ ලියා තිබුණි. ''ඉන්දියන් බඩු ගන්න එපා. ජේ.ආර්. මරමු'' එවැනි ලියා තිබූ සටන් පාඨ කිහිපයකි. **''දවසක් ජනාධිපතිතුමා සිරිකොතට එනවා කීවා. සටන් පාඨ කළු අකුරෙන් ලොකුවට ලියලා තිබුණා. ජවිපෙට බයේ කවුරුවත් මේක මකන්න ආවේ නෑ. මට ජනතා විමුක්ති පෙරමුණේ යහළුවොත් හිටියා. මම ඔවුන්ට කතා කරලා කීවා අද ජනාධිපතිතුමා එනවා මම සටන්පාඨ මකනවා කියලා. මම යහළුවො දෙන්නෙක් එක්ක තීන්තයි, ලාම්පුතෙලුයි දලා සටන් පනාඨ මැකුවා. හර්ෂ අබේවික්‍රම සභාපතිතුමා තමයි බඩු ගන්න සල්ලි දුන්නේ'' ධනපාල එම කතාව ඉවර කළේ ජනතා විමුක්ති පෙරමුණත් ''මට ආදරෙයි'' කියමිනි.**

රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරණයට පළමුව ඉදිරිපත් වූයේ ද ජවිපෙ භීෂණය මැදය. සමහරු හිතුවේ ජනපතිවරණයෙන් මැතිනිය ජය ගනු ඇති බවය. එසේ වුවොත් සිරිකොතට නිසැකවම ශ්‍රීලනිපය පහර දෙනු ඇති බව සිතූ සිරිකොතේ ඉතිරිව සිටියේ ධනපාල සහ තිස්ස අත්තනායක පමණි.

එජාප පාක්ෂිකයෝ රෑ බෝවෙන්නට පෙර සිරිකොතෙන් ඉවත් විය. අන්තිමේදී මහ රෑ ජාමේ ජනපතිවරණ ප්‍රතිඵල නිකුත් වීම ආරම්භ විය. ප්‍රේමදාස පරාද වන ලකුණු මුලින් පෙනුණි. ආරක්ෂාවට සිටි හමුදාවේ සහ පොලිසියේ නිලධාරීන් ධනපාලට කීවේ ''ප්‍රේමදාස මහත්තයා පරාදයි. ඔයාලත් යන්න'' යනුවෙනි.

**''ඉස්සර වෙලා අල්ලන මාළු කුණු වෙනවා. පස්සේ තමයි හොඳ මාළු ඉතිරි වන්නේ. ඒ නිසා කට පරිස්සම් කර ගත්තොත් හොඳයි කියමින් ධනපාල ආරක්ෂක අංශ සාමාජිකයන් සමග හැප්පුණේය. අවසානයේ ධනපාලගේ කී කතාව ජය ගත්තේය. දිනුවේ රණසිංහ ප්‍රේමදාසය.**

එම ජනාධිපතිවරණ සමයේ ප්‍රේමදාසගේ පෝස්ටර් දකුණට ගෙන යාමට එජාප පාක්ෂිකයන් බිය වූයේ ජවිපෙ තර්ජන නිසාය. අන්තිමේදී සිරිකොතේ සිට පෝස්ටර් දකුණට රැගෙන ගියේ ද ධනපාලය. මම පෝස්ටර් අරන් හම්බන්තොට ගියා. ඒක දෙන්න තිබුණේ සිරිල් මහත්තයාටය. මම ළඟ ගෙදරකට ගිහින් ඇහුවා මට බඩේ අමාරුවක් හැදිලා බෙහෙත් දෙන දොස්තර සිරිල් මහත්තයා ඉන්නේ කොහේද කියලා. ඒ මනුස්සයා මට පාර කීවාම මම වහාම සිරිල් මන්ත්‍රීතුමාගේ ගෙදරට ගිහින් පෝස්ටර් දීලා කොළඹ ආවා ජවිපෙට අහුවෙන්නෙ නැතිව.''

ප්‍රේමදාස ජනාධිපතිවරයාගෙන් පසු රනිල් වික්‍රමසිංහ පක්ෂ නායකත්වයට පත් වූයේය. ''මට ගොඩක් උදව් කළා. මම ආරක්ෂක නිලධාරියෙක් ලෙස ඉදිරියට යන්න උදව් කළේ රනිල් අගමැතිතුමා. සිරිකොතෙන් මට පඩියක් ලබා දෙනවා. දැන් වගේ වැඩි පඩි ඉල්ලලා සටන් කළේ නැහැ. දුන්න මුදල ගත්තා. හැබැයි නායකයන් සමග ළං වුණත් කරදරයි දුරස් වුණත් කරදරයි'' ඔහු සිය අත්දැකීම් ඇසුරෙන් ප්‍රකාශ කළේ දේශපාලන නවකයන්ට ද ආදර්ශයක් ලබා දෙමිනි.

පක්ෂයෙන් කියා ඔහුට ලැබී ඇත්තේ මහවැලි ව්‍යාපාරයේ ඉඩම් කැබැල්ලක් පමණි. ඒ ගාමිණී දිසානායක හිටපු ඇමතිවරයා අතිනි. රැකියා හතක් ද ලැබුණි. සිය හිතවතුන්ට ඥාතීන්ට එම රැකියා ලබා දීමට ඔහු අමතක කළේ නැත.

යහපාලන කාලයේදී රනිල් වික්‍රමසිංහ අගමැතිධුරයෙන් ඉවත් කර මහින්ද රාජපක්ෂ පත් කිරීමට මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිවරයා කටයුතු කළේය. ඒ දවස්වල ධනපාල රකින්න ගියේ රනිල් සිටි අරලියගහ මන්දිරයටය. **''මම රාත්‍රිය වෙනකම් අරලියගහ මන්දිරයේ ඉඳලා පයින් ඇවිල්ලා සිරිකොතේ නිදා ගත්තා. දින පනස් දෙකක් ඔය රාජකාරියත් කළා''** ධනපාල පැවසුවේය.

සිරිකොත ජීවිතයේ ඔහු දුක්බර වූ අවස්ථාව ලෙස 2019 මැතිවරණ පරාජය සහ පක්ෂය දෙකඩ වීම බව ධනපාල කියන්නේය. ''සියලු දෙනා එකතු වුණොත් පක්ෂය ජය ගන්න පුළුවන්'' ධනපාල පසක් කළේය.

පක්ෂයේ, නායකයන්ගේ, සිරිකොතේ සැඟවුණු රහස් කතා ගහමරා ගැනීම් කොතෙක් තිබුණත් ඒවා ධනපාලගෙන් ලබා ගැනීමට වඩා ගලෙන් පට්ටයක් ගැනීමට ලේසිය. සිරිකොතට එජාපයට ඒ තරමටම ඔහු ආදරේය.

ධනපාල මංගල වරම් හිමි කර ගත්තේ 1999 වර්ෂයේය. ඔහු හා අතිනත ගත්තේ මහනුවර ප්‍රදේශයේ කාන්තාවකි. **''මට අම්මා ඉන්න කොට බඳින්න කීවා. නමුත් අම්මා මැරුණාම තමයි මම බැන්දේ. නමුත් මම ගෙදර ඉන්නෙ නැහැ. මගේ ගෙදර තමයි සිරිකොත. රෑටත් ඉන්නේ සිරිකොතේ.** මම වැලිගම ගමේ ගෙදරකුත් හැදුවා. ඒ සියලු දේපොළ ලියලා දීලා තියෙන්නේ. මැරෙන්න ඕනේ මට දැන් ඕන දෙයක් දලා ඊළඟ ගමන යන්න ලෑස්ති වෙලා ඉන්නේ. ඒත් සිරිකොත දලා යන්න දුකයි. නා රජකු මැණිකක් රකිනා සේ සිරිකොත රකින 82 වියැති ධනපාල කියන්නේ හැඟුම්බරවය.

**උදයජීව ඒකනායක**
**ඡායාරූප - ලලිත් පෙරේරා**

# නිල නිවාස වැටුප් දීලා කන්නත් දෙන්නෙ මොකටද



## පොදුජන පක්ෂයේ අනුරාධපුර මන්ත්‍රී කේ.එච්. නන්දසේන

**පාර්ලිමේන්තුවේදී මැති ඇමැතිවරුන්ට දෙන කෑම බීම ගැන රට්ටුන්ගෙන් කවදාවත් හොඳක් ඇසුවේ නැත. නිල නිවාස, වැටුප්, මුද්දර ගාස්තු, ඉන්ධන ගාස්තු මදිවාට මන්ත්‍රිවරුන්ට කෑම බීමත් දීමත් වැරදි බව මුල් වරට දැන් මන්ත්‍රිවරයෙක්ම ප්‍රසිද්ධියේම කියන්නේය. පාර්ලිමේන්තුවේ වියදම් අඩු කිරීමට ක්‍රමවේදයක් යෝජනා කරමින් මේ මන්ත්‍රිවරයා කථානායකවරයාට ගිය සතියේ ලිපියක්ද යැව්වේය. මේ ඒ ගැන ශ්‍රී ලංකා පොදුජන පක්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.එච්. නන්දසේන 'සති අග අරුණ'ට කී කතාවය.**

**පාර්ලිමේන්තුවෙන් කෑම කාලා ඔබට ඇති වෙලා වගේ?**

පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ කෑම, ලිපි ද්‍රව්‍ය සම්බන්ධයෙන් සමාජයේ කතාබහක් ඇති වෙලා තියෙනවා. මන්ත්‍රිවරු අතරත් එහෙමයි. විශාල වියදමක් දැරීමට සිදුවීම ඊට හේතුවයි. හැබැයි මන්ත්‍රිවරු වියදම ගැන කතා කරන්නේ එළියේ විතරයි. පාර්ලිමේන්තුව ඇතුළේ කතා කරන්නේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ වැඩමුළුවලදීද නිලධාරීන් මේ බව ප්‍රකාශ කර තිබෙනවා. ඒ නිසා තමයි මම මේ යෝජනාව කළේ.

**පාර්ලිමේන්තුවේ කෑම බිල අඩු කරන්න ඔබගේ යෝජනාව කුමක්ද?**

ස්ථාවර නියෝග 8 (2) වගන්තිය අනුව පාර්ලිමේන්තු රැස්වීම ආරම්භ කළ යුත්තේ දහවල් එකට. ඒ වෙලාවට පාර්ලිමේන්තුව ආරම්භ කළා නම් උදෑසන, දිවා ආහාර සැපයීම සම්පූර්ණයෙන්ම නවත්වන්න පුළුවන්. හැබැයි කාර්ය මණ්ඩල උදෑසන සිට වැඩ ඔවුන්ට ආහාර ලබාදිය යුතුයි

එතකොට ඔබ කියන්නෙ මන්ත්‍රිවරු ගෙදරින් උදේට දහවල්ට කාලා පාර්ලිමේන්තුවට එන්න ඕනේ කියලද?

ඔව්. උදේ නවය හමාරට පාර්ලිමේන්තුව පටන් ගත්තත් පැය දෙක හමාරකින් දිවා ආහාරයට නතර කරනවා. සියලු මන්ත්‍රිවරුන්ට පාර්ලිමේන්තුව අතේ දුරින් තියෙන මාදිවෙල නිවාස සංකීර්ණයෙන් නිවාස දී තිබෙනවා. ඒ නිසා ඔවුන්ට ගෙදරින් හොඳට කාලා එන්න පුළුවන්. පාර්ලිමේන්තුව හවස හය දක්වා පැවැත්වෙනවානේ. ඒ නිසා මන්ත්‍රීන්ට තේ විතරයි දෙන්න ඕන. සමහර මන්ත්‍රිවරු උදේට දහවල්ට දෙකම කන්නේ පාර්ලිමේන්තු භෝජනාගාරයෙන්.

**සමහර මන්ත්‍රිවරු ගමේ ඉදලනේ එන්නේ. එතකොට කෑම නැති වෙනවනේ.**

නෑ. සියලු මන්ත්‍රිවරුන්ට මාදිවෙලින් නිල නිවාස දීලා තියෙන්නේ. කිසියම් මන්ත්‍රිවරයෙක් ගමේ ඉඳලා එනවා නම් ඇතැම් විට නිල නිවාසය කාට හරි දීලා ඇති. ඇමැතිවරුන්ටත් කොළඹ නගරය හා ඒ අවටින් නිල නිවාස දී තිබෙනවා.

**එකින් පස්සෙ රැස්වීම් පටන් ගත්තා නම්**

**උදේ දවල්ට කන්න දෙන්න ඕනේ නෑ**

**උදේ පාර්ලිමේන්තුව පටන් ගෙන පැය 2 1/2කින් කන්න නතර කරනවා**

**මන්ත්‍රීලා මෙහෙම කන එක සදාචාර සම්පන්නද**

**ඇයි මන්ත්‍රිලාට ගෙදරින් බඩ පිරෙන්න කාලා එන්න බැරි**

**එතකොට ඔබ පාර්ලිමේන්තුවෙන් කන්නෙ නැද්ද?**

පාර්ලිමේන්තුව තියෙන දවස්වලට පෙර දින කොළඹ ඇවිත් මාදිවෙල නතර වෙනවා. මම පාර්ලිමේන්තුවට එන්නේ මාදිවෙල ගෙදර උයලා හොඳට කාලා.

**මන්ත්‍රිවරුන්ට දෙන ලිපි ද්‍රව්‍ය අඩු කරන්නෙ කොහොමද?**

ලිපි ද්‍රව්‍ය භාෂා තුනෙන්ම දෙනවා. නමුත් සිංහල බස හසුරන අපි ඉංග්‍රීසි, දෙමළ භාෂාවෙන් දෙන ලිපි කියවන්නේ නැහැ. මව් භාෂාවෙන් තමයි පළමුවෙන්ම ලිපි කියවන්නේ. ප්‍රශ්නයක් තියෙනවා නම් විතරයි ඉංග්‍රීසි කියවන්නේ. ජාතික මට්ටමේ ලිපි ලේඛන සියලු දෙනාටම අවශ්‍යයි. නමුත් දිස්ත්‍රික් මට්ටමේ ලිපි අවශ්‍ය වන්නේ ඒ දිස්ත්‍රික්කයේ මන්ත්‍රිවරයාට විතරයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තොරතුරු මට අවශ්‍යයි. නමුත් මට වෙනත් දිස්ත්‍රික්කයක තොරතුරු අවශ්‍ය වන්නේ අල්ප වශයෙන්.

**ඔබතුමා කියන්නෙ දෙන ලිපි ලේඛන මන්ත්‍රිවරු අධ්‍යයනය කරන්නෙ නෑ කියලද?**

අධ්‍යයනය කරනවා. නමුත් මගේ යෝජනාවෙත් සත්‍යතාවක් තියෙනවා. එම නිසා මෙ ලිපි ලේඛන සී.ඩී. තැටියක හෝ පෙන්ඩ්‍රයිව් එකක දලා දුන්නා නම් ඇති. මන්ත්‍රිවරු නවීන තාක්ෂණයෙන් වැඩ කරන්න පුරුදු වෙනවනේ.

**මේ යෝජනාවලිය ඔබ කථානායකවරයාට භාර දුන් විට ලැබුණු ප්‍රතිචාර කොහොමද?**

කථානායකවරයාට පමණක් නොවේ. මේ යෝජනාව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, සභානායකටත් දී තිබෙනවා. මේ අයගෙන් මට තවම උත්තරයක් ලැබුණේ නැහැ. මම පිළිතුරක් බලාපොරොත්තුවෙන් ඉන්නේ.

**ඔබගේ යෝජනාව හොඳයි. නමුත් අනෙක් මන්ත්‍රිවරුන්ගෙන් මේකට විරෝධයක් එයිද?**

කවුරුත් විරුද්ධ වෙන්නේ නැහැ. කවුරුත් දන්නවා ලොකු ප්‍රශ්නයක් තියෙනවා කියලා. මෙය පොදු කාරණාවක්. වර්තමානයේ රටේ පවතින ආර්ථික ප්‍රශ්නයටත් යම්තාක් විසඳුමක් මෙමගින් ලැබෙනවා.

**ඉතින් මන්ත්‍රිවරු කියනවානේ තම මාසික වැටුප කොවිඩ් අරමුදලටවත් දෙන්න බැහැ කියලා.**

මන්ත්‍රිවරු එහෙම කියන බව නම් ඇත්ත. නමුත් නිසි වේල කන්න බැරි බඩගින්නේ ඉන්න මිනිසුන් ලංකාවේ ඉන්නවනේ. අපිට ගෙදරක් දීලා, නිවසක් දීලා, වැටුපකුත් දීලා පාර්ලිමේන්තුවට කන්නත් එනවා නම් සදචාර සම්පන්නද? මන්ත්‍රීවරුන්ගේ වැටුප ඔවුන්ගේ බලාපොරොත්තුවලට සෑසඳුවොත් මදි තමයි. ඊට පෙර අපි රට සහ ජනතාව ගැන සිතිය යුතුයි.

**ඔබගේ යෝජනාව හොඳයි. ඇයි ඊට ප්‍රචාරයක් ලබා නොදුන්නේ.**

මට අවශ්‍ය වූයේ වියදම් අඩු කිරීමේ යෝජනාව දීමටයි. එය ක්‍රියාත්මක වෙනවා දැකීමටයි. එහෙම නැතිව මාධ්‍ය ප්‍රචාරයක් මම බලාපොරොත්තු වුණේ නැහැ

**උදයජීව ඒකනායක**

---

# පොට්ට නවුෆර්ට කළකම් පලදෙයි

පොට්ට නවුෆර් කාලයාගේ වැලි තලාවෙන් වැසී ගිය ඒ නම අන්තිමේදී මඩකලපුවේ ඔට්ටමාවඩි බිමේ අඩි හයක් පොළෝ කුහරයක සදකාලිකව වැළලී ගියේ ගිය සතියේය.

තුවක්කු, බෝම්බ, කඩු කිනිසිවලටත් පරාජය කිරීමට නොහැකි වූ පොට්ට නවුෆර් අන්තිමේදී අවසන් ගමන් ගියේ කොරෝනාවට පරාජය විමෙනි. කලක් කොළඹ පාතාලේ ගෝඩ් ෆාදර් ලෙස කිරුළු පලන් ඔහුගේ හරි නම මොහොමඩ් නියාස් නවුෆර්ය. එනමුත් රටම ඔහු දන්නේ පොට්ට නවුෆර් නමිනි. නවුෆර්ට පොට්ට නවුෆර් නාමය බැඳුණේ ප්‍රතිවිරුද්ධ පාතාල කල්ලියක් නිසාය. නඩරාජා විජේපාලන් කල්ලිය නවුෆර්ට එරෙහිව සිටි පාතාල කල්ලියකි. දෙමළ පාතාල කල්ලි පරයා මුස්ලිම් පාතාලය හිස ඔසවන්නට ගත්තේද නවුෆර් ඇතුළු කිහිප දෙනකු මාලිගාවත්තේ කළඑළි බැස්සට පස්සේය.

දෙමළ, මුස්ලිම් පාතාල කල්ලිවල ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස නවුෆර්ට එක් ඇසක් අහිමි විය. විජේපාලන් කල්ලිය එල්ල කළ අත් බෝම්බ ප්‍රහාරයකින් නවුෆර්ගේ එක් ඇසක් අන්ධ විය. එතැන් සිට ඔහු පොට්ට නවුෆර් ලෙස බෞතීස්ම ලැබීය.

නැතිවූ ඇස වෙනුවට බොරු ඇසක් යොදගත් නවුෆර් එතැනින් නැවැතුණේ නැත. තම ප්‍රතිවිරුද්ධ කල්ලි ඝාතනයට අමතරව කොන්ත්‍රාත් මිනීමැරුම් පවා පොට්ට නවුෆර් භාර ගත්තේය. මිනිස් ඝාතනවලට අමතරව මහා පරිමාණයෙන් හොර සිගරට් හා හෙරොයින් ජාවාරම් ද කරගෙන ගියේය. ව්‍යාපාරිකයන් බිය ගන්වා කොළඹ කේන්ද්‍ර කරගෙන කප්පම් ගැනීමට ද නවුෆර් යටතේ වූ කණ්ඩායම් යොදවා තිබිණි. කොළඹ බායිලා සියල්ල සිටියේ නවුෆර්ගේ අණසක යටතේය. වරායේදී අල්ලා වෙන්දේසි කරන සියලු දේ මෙන්ම යකඩ වෙළෙඳම්වලට ද නවුෆර් මැදිහත් විය.

කොළඹ අලුත්කඩේ උසාවිය ආසන්නයේ නවුෆර්ගේ නවාතැන් පොළ පිහිටා තිබුණේය. ලොගේට් ලේන්, බායි වත්ත, බණ්ඩාරනායක මාවත ඇතුළුව කොළඹ සිට මරදාන දක්වා බලය තිබුණේ නවුෆර්ගේ කල්ලි වෙතය. පිච්චේ ෆාරුක්, ඩිස්කෝ රාජා ඇතුළු ගෝල බාලයන් රැසක්ම නවුෆර්ගේ පාතාල කල්ලියට එක්ව සිටියහ.

බොරැල්ලේ ඕල්කට්, කිඹුලාඇලේ ගුණා ඇතුළු මත්ද්‍රව්‍ය ජාවාරමේ නමගිය පාතාල නායකයන් පොට්ට නවුෆර් සමග එක්ව කටයුතු කළ කණ්ඩායම් විය. පොට්ට නවුෆර් ජාවාරම්වලින් උපයා ගත් මුදලින් අලුත්කඩේ උසාවිය ළඟ නිවාස සංකීර්ණයක් මෙන්ම කොළඹ නගර මධ්‍යයේ වෙළෙඳ සංකීර්ණයක් ද ඉදි කළේය.

මත්ද්‍රව්‍ය ජාවාරම් ඉහළින්ම කරගෙන ගියත් පොට්ට නවුෆර්ට එරෙහිව කිසිදු නඩුවක් නොවීය. එසේ වූයේ තම ඇඟේ නොගාගෙනම ගෝල බාලයන් යොදවා ජාවාරම් කරගෙන ගිය නිසාය.එවකට



පොලිස් ලොක්කන් බොහොමයක්ම සිටියේ ද පොට්ට නවුෆර්ගේ සාක්කුවේය. නවුෆර් විවිධ වරදන දී ඉහළ නිලධාරීන් තම අණසකට ගෙන තිබුණේය. මේ නිසා නවුෆර්ට අත තියන්නට පොලිසියේ කනිෂ්ඨ නිලධාරීන් ද දෙවරක් කල්පනා කළේය.

නවුෆර්ගේ මුදල් බලයට යට නොවුණු නිලධාරීහු පොලිසියේ සිටියහ. ඔවුන් නොබියව ගොස් නවුෆර්ගේ ගෙවල්වලට කඩා පැන පීරන්නට ද වූහ.

පොට්ට නවුෆර් මුල්වරට නඩුවකට පැටලුණේ මාලිගාවත්ත මැල් වත්තේ කළ මිනීමරුමකටය. එම මිනීමැරුමට නවුෆර් කොටුවන්නේ ඇසින් දුටු සාක්ෂිකරුවකු පොලිසියට හමුවූ නිසාය.

ඇසින් දුටු සාක්ෂිකරුට තර්ජනයක් වන බැවින් පොට්ට නවුෆර්ට නඩුව අවසන් වනතුරු ඇප දීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු විරෝධය දැක්වූහ. නමුදු දැඩි ඇප කොන්දේසි මත නවුෆර්ට ඇප ලැබුණි. කෝටි ගණනක් මුදල් වැය කර කෙස් පැළෙන තර්ක ඉදිරිපත් කරන දක්ෂ නීතිඥවරු ගන්නට ඔහුට හැකියාව තිබුණි.

ඇප ලබා පිටව ගොස් මාස දෙකක් යද්දී ඇසින් දුටු එකම සාක්ෂිකරු හමුවූයේ කුණු බක්කියකිනි. දරුණු ලෙස වධ දී කපා කොටා ඝාතනය කර එම සාක්ෂිකරු කුණු බක්කියක දමා ගොස් තිබුණේය. නවුෆර්ට එරෙහි වන්නන්ට දෙන දඬුවම එය බව නවුෆර් කල්ලිය සමාජයටම අනතුරු හැඟවීමක් කළහ. එහෙත් නීති වල්වදින්නට ඉඩ දී බලා සිටින්නට පොලිසියේ ද කොන්ද පණ ඇති නිලධාරීහු කැමැති නොවූහ. පොට්ට නවුෆර් හා ගෝලයකු එම ඝාතනයට යළි කොටුකර ගැනීමට පොලිසියට හැකිවිය.

මෙම නඩු විභාගයේ විනිසුරුවරයා වූ සරත් අඹේපිටිය නවුෆර්ට ඇප ලබාදීම ප්‍රතික්ෂේප කළේය. නමුත් ඉහළ අධිකරණයෙන් පොට්ට නවුෆර්ට ඇප ලබාදී එය ක්‍රියාත්මක කිරීමට පහළ උසාවියට එව්වේය. නවුෆර්ට ඇප දෙන්නේ නම් ගෝලයාටත් ඇප දෙන්නට සරත් අඹේපිටිය තීන්දු කළේය.

මහාධිකරණ විනිසුරු ලෙස සරත් අඹේපිටිය උසස්වීම් ලබද්දී පොට්ට නවුෆර්ගේ නඩු ගොනුව ද රැගෙන ගියේය.

සරත් අඹේපිටිය නිසා තමාට එල්ලුම් ගහට යන්නට වන බව පොට්ට නවුෆර් සක්සුදක් සේ දැන සිටියේය. සරත් අඹේපිටිය යනු දැඩි තීන්දු දෙමින් නීතියට වැඩ කරන අයකු බව රටම දැන සිටියේය.

කොටි නායක වේළුපිල්ලේ ප්‍රභාකරන්නට වසර දෙසීයක සිර දඬුවමක් නියම කරමින් රටම හෙල්ලෙන තීන්දුව දුන්නේද සරත් අඹේපිටියය.

සරත් අඹේපිටිය ඝාතනය කරන්නට පොට්ට නවුෆර් සැලසුම් කළේ ඒ අනුවය. තම ගෝල බාලයන් වෙනුවට වෙනත් කණ්ඩායමක් යොද ගත්තේ නවුෆර් ගැන සැක නොහිතෙන්නටය.

පොට්ට නවුෆර් ඝාතනය සඳහා සැලසුම යොද ගත් දිනයද තවත් නඩු තීන්දුවක් දෙන දිනයකි. කුඩු ජාවාරමේ නිරත වූ මාරි තෙරේසාගේ නඩුවේ තීන්දුව දෙන්නට තිබුණේ 2004 නොවැම්බර් 19 දය. මාරි තෙරේසා එල්ලුම් ගහට නියම වන බව නීතිඥයන් පවා දැන සිටියහ.

එදින මාරි තෙරේසාට මරණ දණ්ඩනය නියම කර ඒ නඩු තීන්දුව ලියූ පැන කඩා වීසි කළ ඔහු පස්වරු 3 ට පමණ අධිකරණ කටයුතු අවසන් කර ආරක්ෂාවට සිටි පොලිස් පරීක්ෂක උපාලි බණ්ඩාර සමග කොළඹ හතේ සරණ මාවතේ නිවස බලා පිටත් වූයේය. ඔහු නිවසට ළඟා වන පාරේ 253-0882 දරන සුදු පැහැති මැස්ඩා රථයක් නිවස අසලම නවතා තිබූ අතර එක් අයකු තාප්පයක් අයිනේ වමනය දමමින් සිටියේය.

සරත් අඹේපිටිය වාහනය පෝටිකෝවේ නතර කර බැස්සා පමණි. පොලිස් පරීක්ෂක බණ්ඩාරට වාහනයෙන් බහින්නටවත් කාලයක් නොවීය. වෙඩි වරුසාවකින් දෙදෙනාම ඝාතනය කෙරුණි. එම සිද්ධිය ලංකා ඉතිහාසයට එක්වූයේ විනිසුරුවරයකු ඝාතනය කළ මුල්ම සිද්ධිය ලෙසය. එවැනි ඝාතන මින් පෙර දැක තිබුණේ ඉඩි අමීන් පාලනය කළ උගන්ඩාවේය.

ඝාතනයත් සමග එහි පැමිණි කොළඹ අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සරත් ලූගොඩ ඇතුළු කණ්ඩායමට සාක්ෂි ලෙස ඉතිරිව තිබුණේ වැටී තිබූ පතොරොම් කොපු පමණි. ඝාතනය වූ නිවස ආසන්නයේ බිම වැටී තිබූ වමනය ගොඩක් දැක එය බොරැල්ල ජින්ටෙක් ආයතනයට ගෙන ගොස් ඩී.එන්.ඒ. සාක්ෂියක් ගන්නට විමර්ශකයෝ කටයුතු කළහ.

එවකට සී.සී.ටී.වී. තබා දියුණු තාක්ෂණය පොලිසියට සොයා ගන්නට නොවුණ ද කොළඹ පීරද්දී නාරාහේන්පිට ඇල්විටිගල මාවතේ දමා ගිය මැස්ඩා වෑන් රථය සොයා ගත්තේය.

## විනිසුරු අඹේපිටිය මරා දැම්මේ නවුෆර්

## ඝාතනයේ සුලමුල හෙළිවූයේ වමනෙ පිඩකින්

එහි හිමිකරු පොලිසිය සොයා යද්දී රියැදුරා පොලිසියට ගොස් තිබුණේ ආයුධ පෙන්වා වෑන් රථය කොල්ලකෑම ගැන පැමිණිලි කිරීමටය.

කුලී ගමනක් යන මුවාවෙන් වෑන් රථයට ගොඩවූ සිවුදෙනකු ඩී. එස්. හන්දියේ ස්ටීම් බෝට් චයිනීස් එකට ගොස් කා බී බෝතල් ද රැගෙන පැමිණි බවත්, සරණ පාරේ නවත්වා තව බොද්දී එක් අයකු වමනය කළ බවත් රියැදුරාගේ සාක්ෂියේ විය. වමනය සාම්පලයේ ඝාතකයා කොටුකර ගත හැකි බවට පොලිස් කණ්ඩායම අනුමාන කළේ එතැන් පටන්ය. අපරාධ කොට්ඨාසය ඝාතනයට පැමිණි බවට සැක කළ හතර දෙනකු ටික දිනකින්ම කැලණියේදී කොටු කරගත්තේ මේ අතරේය. වමනය කොටසින් හමුවූ ඩී.එන්.ඒ. සාම්පලය හා මෙම සැකකරුවන් සිවුදෙනාගෙන් තුන්වැනි සැකකරුගේ ඩී.එන්.ඒ. සාම්පල සමග සැසඳෙන්නේය.

සරත් අඹේපිටිය අධිකරණයෙන් පිටවන මොහොත දැනුම් දීමට යොදගත් දුරකථන අංකයක් සොයා ගන්නට දුරකථන අංක ලක්ෂ ගණනක් විශ්ලේෂණය කළ විමර්ශකයෝ සමත් වූහ.

එම දුරකථන සිම්පත තත්පර ගණනකට යොද සිම්පත දමා කතා කළේ පොට්ට නවුෆර් බවට දුරකථනය හිමිකරු වූ ව්‍යාපාරිකයා පොලිසියට කදිම සාක්ෂියක් දුන්නේය.



විනිසුරු සරත් අඹේපිටිය

මේ ඝාතන සැලසුමට කොටු නොවන්නට අඹේපිටිය ඝාතනයේ සැකය දිගු කර තිබුණේ තෙරේසාගේ නඩු තීන්දුව හෝ ප්‍රභාකරන්ට එරෙහි නඩු තීන්දුව දීමට පළිගැනීමක් ලෙසය.

විනිසුරුවරයකු ඝාතනය කළ චෝදනාවට පොට්ට නවුෆර්ට එරෙහිව නඩු විභාගය වෙද්දී ඔහු වෙනුවෙන් නීතිතඥවරු පෙනී සිටීම ප්‍රතික්ෂේප කළහ. අන්තිමේදී නවුෆර් වෙනුවෙන් කතා කළේ ජනපති නීතිඥ ටිරන්ත වරලියද්දය. එනමුත් ඔහු එල්ලුම් ගහට යාම වලකා ගැනීමට කිසිම ජගතෙකුට නොහැකි විය. එතැන් සිට පොට්ට නවුෆර් හිරේ සිටියේ දැඩි ආරක්ෂා සහිතවය. බෝගම්බර හිර ගෙදරදී ප්‍රතිවාදියකු විසින් උල් කටුවකින් ඇන නවුෆර් මරා දමන්නට උත්සාහ කළ ද එහිදීත් ඔහු මරණයෙන් ගැලවුණේය. යළිත් ඔහුට වැලිකඩට එන්නට ඉඩ ලැබෙන්නේ ඉන් පසුවය.


හිරගෙදර නිලධාරීන්ට වියදම් කරමින් සියලු පහසුකම් විඳිමින් කොළඹ දේශපාලනඥයන්ගේ ඡන්ද සටන් මෙහෙයවීම ද නවුෆර්ගේ තවත් කාර්යභාරයක් විය. ඔවුන්ගේ ඡන්ද ව්‍යාපාරවලට කෝටි ගණන් වියදම් කර වාහන පවා දුන්නේ යම් දිනක තමාට ජීවිතාන්ත සිර දඬුවම දක්වා ලබාගෙන එළියට යාමේ සැලසුම ඇතිවය.

වකුගඩු ආසාදනයට ලක්ව රෝහලේ ප්‍රතිකාර ගන්නට නවුෆර්ට සිදුවන්නේ මේ අතරේය. 2017 දී ඔහුව මහනුවර රෝහලේ වකුගඩු ප්‍රතිකාර ඒකකයට ඇතුළත් කරන්නේය.

අවසන් කාලසීමාවේ කරාපිටිය රෝහලේ ප්‍රතිකාර ලද නවුෆර් වැලිකඩ සිට හෝමාගම රෝහලේ වකුගඩු රෝගයට ප්‍රතිකාර සඳහා යොමු කරන්නේ කොවිඩ් වැළඳීම හේතුවෙනි.

හෝමාගම රෝහලේ ප්‍රතිකාර ලබා යළි බන්ධනාගාර රෝහල වෙත රැගෙන ආ පොට්ට නවුෆර් සෙනසුරාද රාත්‍රියේ අවසන් ගමන් ගියේ කළ පව් මෙලොවදීම පල දෙමිනි.

**තිස්ස රවීන්ද්‍ර පෙරේරා**




# සුදර්ශිනී බන්දුලගෙන් බේරුණු හැටි



වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන කොවිඩ් ආසාදනය වීමත් සමග ආණ්ඩුවේ මැති ඇමැතිවරු රැසක් නිවෙස්වලට කොටු වූහ. ඊට හේතුව වූයේ මැති ඇමැතිවරුන් රැසකට ඔහු නිතර හමුවීම නිසාය. මේ හේතුවෙන් ඇමැතිවරු නිවසට වී සූම් ඇප් එක හරහා අමාත්‍යාංශ වැඩකටයුතු ද මෙහෙය වූහ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ඇතුළු මැති ඇමැතිවරු රැසකටම නිරෝධායන නීති පිළිපැදීමට වූයේ ඇමැති බන්දුල ගුණවර්ධන කොවිඩ් ආසාදිතයකු වීම නිසාය. ජනාධිපතිවරයා සහභාගි වූ රැස්වීම් පවා පැවැතියේ සූම් තාක්ෂණයෙනි. මේ නිසා ජනාධිපතිවරයා සහභාගි වූ දේශපාලන ක්‍රියාකාරකම් කිසිවක් මෙම සතියේ නොපැවැත් විණි.

## බන්දුල නිසා ඇමැතිවරු බිය වෙති

ඇමැති බන්දුල කොවිඩ් මර්දන පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකා රැස්වීමට පැමිණි දින රාත්‍රියෝ කොවිඩ් ආසාදිතයකු බව හඳුනා ගන්නා ලදි. මෙම රැස්වීමට අගමැති මහින්ද රාජපක්ෂ, මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ ඇතුළු මැති ඇමැතිවරු මෙන්ම ත්‍රිවිද හමුද ප්‍රධානීහු සෞඛ්‍ය ප්‍රධානීන්ද එක්ව සිටියහ. රැස්වීම පෙරවරු 11.00ට පැවැත්වීමට නියමිතව තිබුණත් ජනාධිපතිවරයාට විදේශ අමුත්තෙකු හමුවීමට තිබූ නිසා රැස්වීමේ ආරම්භය මඳක් ප්‍රමාද වූහ. එම නිසා මැති ඇමැතිවරු ජනාධිපති කාර්යාලයේ පහළ මාලයේ තේ පානය කරමින් සිටියහ. ඇමැති බන්දුල ගුණවර්ධන, කෙහෙළිය රඹුක්වැල්ල, ඩලස් අලහප්පෙරුම තවත් කිහිපදෙනකු සමග අග්ගලාද අල බොන්ඩා කමින් තේ පාලනය කරමින් සිටියහ. එම ස්ථානයට රාජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේද පැමිණියාය. ‘‘ඇමැතිතුමිය එන්න තේ බොන්න’’ ඇමැති බන්දුල ආරාධනා කළේය. ‘‘මම සුළු වේලාවකට හෝ මුවවැස්ම ඉවත් කරන්නේ නැහැ’’ රාජ්‍ය ඇමැතිවරිය තේ පානය ප්‍රතික්ෂප කළාය. ඇය නිසි සෞඛ්‍ය පුරුදු අනුගමනය කරමින් පසෙකට වී සිටියාය. ඒ අතර ජනාධිපති උපදේශක ලලිත් වීරතුංග ද එම ස්ථානයට පැමිණ කතාබහ කරමින් සිටියේය. රැස්වීමෙන් පසු ඇමැති බන්දුලට රෝග ලක්ෂණ පහළ වූ බැවින් ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණයක් කර ගත්තේය. ඔහු කොවිඩ් ආසාදිතයකු බව හඳුනා ගැනීමත් සමග සියලුදෙනාම බියට පත්ව ඔවුන්ද කොවිඩ් පරීක්ෂණවලට ලක්වූහ.

## පවුලට කොරෝනා

ඇමැති බන්දුල ගුණවර්ධන කොළඹ පෞද්ගලික රෝහලකට ඇතුළත් කළේ ඇමැතිවරයාගේ කැමැත්තට නොවේ. ඔහු නිවසේ සිට සූම් ඇප්එක ඔස්සේ රැස්වීම්ද පැවැත්වූයේය. පසුව පවුලේ අයගේ බල කිරීම මත ඔහු රෝහල් ගත වූයේය. මේ වනවිට ඇමැතිවරයාගේ බිරිඳට, දියණියන් දෙදෙනාටද කොවිඩ් ආසාදනය වී තිබේ. ඔවුන් නිවෙස් ගතව ප්‍රතිකාර ලබති

## දයාගෙන් බන්දුලට කැඳ

කෙසේ වෙතත් රෝහල් ගතවූ අමාත්‍යවරයාගේ ජංගම දුරකථනයට නම් නිවනක් නොවිණි. ආණ්ඩුවේ මෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ද කතාබහ කර සුවදුක් විමසීමට අමතක කළේ නැත. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබලයකු වන හිටපු අමාත්‍ය දයා ගමගේ හා ආනෝමා ගමගේත් ආයුර්වේද කැඳ පවා සකස් කරමින් ඇමැති බන්දුලට එවා තිබුණි. ඒ දේශපාලන මිතුරුකමටය.

## මන්ත්‍රීන් 24කට කොරෝනා

කෙසේ වෙතත් මේ වනවිට පාර්ලිමේන්තු නියෝජිතයන් විසිහතර දෙනකුට පමණ කොවිඩ් ආසාදනය වී ඇත. ඒ වරින් වරය. මේ නිසා ඇමැතිවරයාට අවස්ථා තුනකදී, ඩලස් අලහප්පෙරුම අමාත්‍යවරයාට අවස්ථා හතරකදී, විමල් වීරවංශ හා මහින්දානන්ද අලුත්ගමගේ යන ඇමැතිවරුන්ට අවස්ථා තුනකදී, උදය ගම්මන්පිල අමාත්‍යවරයාට අවස්ථා දෙකකදී නිරෝධායනය වීමට සිදුව ඇත.

## ශ්‍රීලනිපයේ සූම් සැමරුම

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙවර සූම් සංවත්සරයක් පැවැත්වූයේ කොවිඩ් වසංගතය හේතුවෙනි.හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේනගේ උපන් දිනය යෙදී ඇති සැප්තැම්බර් තුන්වනදට පෙර දින සංවත්සරය පැවැත්විණි. හිටපු ජනාධිපතිවරයා කොළඹ නිල නිවසේ සිට සංවත්සරයට එක්වූයේ නිල්පාටට හුරු කමිසයක් හැඳගෙනය. මහ ලේකම් දයාසිරි ජයසේකර, ඇමැතිවරුන් වන මහින්ද අමරවීර. නිමල් සිරිපාල ද සිල්වා, දුමින්ද දිසානායක ද සූම් ඇප් එක ඔස්සේ සංවත්සරයට එක්වූයේ තම නිවාස තුළ සිටිමිනි. මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස, දයාසිරි ජයසේකර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ධම්ම දිසානායක, මහින්ද අමරවීර සංවත්සරයේදී අදහස් පළ කළේ පක්ෂයේ දියුණුවට මෙන්ම 2024දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් බිහි කිරීමේ අරමුණිනි. පක්ෂයේ ආසන සංවිධායකත්ව 100ක්ද ප්‍රාදේශීය වශයෙන් සූම් ඇප් ඔස්සේ සංවත්සරයට එක්ව සිටියහ. සංවත්සරය පිළිබඳ පෙර පැවැති සාකච්ඡාවලට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්ම දිසානායකට දේශනයක් දීම ගැන විරෝධයක් මතු විය. ඔහු බැසිල් රාජපක්ෂ ආර්ථික සංවර්ධන අමාත්‍ය ධුරයේ සිටි සමයේ උපදේශකයකු විය. නමුත් හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන ඔහුට ආණ්ඩුකාර ධුරයක්ද දුන්නේය. ධම්ම දිසානායකට දේශනයක් දීමට විරුද්ධ වූයේද මහාචාර්යවරයෙක් වීමද විශේෂත්වයකි.

## ආණ්ඩු බලය ගන්න ශ්‍රීලනිපයේ සැලසුම් මෛත්‍රීගේ උපන්දිනය

සූම් ඇප් එක ඔස්සේ රැස්වීම ආරම්භ වූ පසු දේශන යන අතරවාරයේ ඇතැම් අය ආණ්ඩු බලය ගැනීම ගැනද හොර රහසේ කතා කළහ. හිටපු ජනාධිපතිවරයා සිය කතාවේදී පක්ෂයේ නව ගමන ගැන ඉඟියක්ද කළේය. මෙම අවස්ථාව වනවිට මුහුණු පොත ඔස්සේ 12000කට ආසන්න සංඛ්‍යාවක් රැස්වීම නරඹමින් සිටි බවද මහලේකම් දයාසිරි ජයසේකර මෙම තීරුවට කීවේය.

හිටපු ජනාධිපතිවරයාගේ උපන්දිනය වෙනුවෙන් ආසන සංවිධායකවරු සුබ පැතුවේද සූම් ඇප්එක මගිනි.

මේ නිසා සිය කතාව අවසන් කර තිබූ හිටපු ජනාධිපතිවරයාට යළි කතාවක් කිරීමට වූයේය. ඒ සිය උපන්දිනයට සුබ පැතූවන්ට ස්තුතිය පුද කිරීම සඳහාය.

හිටපු ජනාධිපතිවරයාගේ උපන් දිනය යෙදී තිබූ සිකුරාද උදෑසන සිටම දේශපාලනඥයෝ රැසක් ඔහුට සුබ පැතූහ. රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර සුබ පැතූ අවස්ථාවේදී පෙර දින සූම් ඇප් එක ඔස්සේ පැවැති සංවත්සරයේ සාර්ථකත්වය පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කළහ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු නායිකා හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක මෙම සංවත්සරයට විරුද්ධව මාධ්‍යයට ප්‍රකාශයක් කර තිබුණි. පක්ෂයේ වත්මන් නිලධාරී මණ්ඩලය දැඩි විවේචනය කළ ඇය පක්ෂය යළි ගොඩනගන බවටද සපථ කළාය.

## එජාප සමරුව

එක්සත් ජාතික පක්ෂයේ 75 වැනි සංවත්සරයද මෙවර සූම් ඇප් එක ඔස්සේ පැවැත්වීමට සූදනම් වෙයි. සංවත්සරය හෙට (06 වැනිදා) යෙදී ඇතත් අද (05 වැනිදා) පැවැත්වීමට අඟවරුවාද පැවැති පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී තීන්දු කළහ. පක්ෂ නායක රනිල් වික්‍රමසිංහගේ ප්‍රධානත්වයෙන් නව තාක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් සංවත්සරය පැවැත්වීමට කටයුතු යොද ඇත.

‘‘රට වහලා තිබුණට බොහෝ දෙනෙක් ඉරිදට ගෙදර ඉන්නවා. ඒ නිසා ඉරිද සවස පහේ සිට පැයක කාලයක් සංවත්සරය පවත්වමු’’ කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන කීවේය. ඊට සියලුදෙනාගේම එකඟත්වය හිමි වූහ. සංවත්සර රැස්වීමේදී ප්‍රදර්ශනය කෙරෙන වාර්තා වැඩසටහන් පිළිබඳව දැනුවත් කළේ පක්ෂයේ උප සභාපති සාගල රත්නායකය.

## හදිසි නීතිය මැති සබයට

පාර්ලිමේන්තුව හෙට (6 වැනිදා) රැස්වීමට නියමිතය. ඊට අදාළ පක්ෂ නායකයන්ගේ රැස්වීම කථානායක මහින්ද යාපා අබේවර්ධනගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී පැවැත් විණි. ආණ්ඩු පක්ෂය දින හතරම පාර්ලිමේන්තුව පැවැත්වීමට සූදනම් වුවත් විපක්ෂය ඊට එරෙහි විය. කොවිඩ් වසංගතය ප්‍රධාන හේතුව විය. සඳුද දිනයේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ ප්‍රශ්න පනහකට පිළිතුරු දීමට මීට පෙර සැලසුම් කර තිබුණි. එහෙත් හදිසි නීතිය යටතේ සීනි, සහල් ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟයකින් තොරව වෙළෙඳපොළට නිකුත් කිරීම සඳහා පත් කළ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයාට අදාළ ගැසට් නිවේදන තුනකට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට පක්ෂ නායකයෝ එකඟ වූහ. කෙසේ වෙතත් එදින පාර්ලිමේන්තු පැමිණෙන සියලු මන්ත්‍රීවරුන්ට රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණ කිරීමටද මෙහිදී තීන්දු කළහ.

මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව පක්ෂ නායක රැස්වීමෙන් පසු රැස්වූයේ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධනගේ ප්‍රධානත්වයෙනි. පළාත් පාලන ආයතන මැතිවරණ ක්‍රමය සමාලෝචනය කිරීමේ කමිටු වාර්තාව පිළිබඳව පළමුව සාකච්ඡා කෙරුණි. පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ මෙහිදී ප්‍රකාශ කළේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු සංඛ්‍යාව පන්දහස දක්වා අඩු කළ යුතු බවයි. දැනට සිටින මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව අටදහස ඉක්මවයි. පළාත් පාලන ආයතනවල වියදම අඩු කිරීම එහි ප්‍රධාන අරමුණ වෙයි.

මෙවර අමාත්‍ය මණ්ඩල රැස්වීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රධානත්වයෙන් සූම් ඇප් එක යොද ගනිමින් පැවැත්විණි. වැඩිම අවධානය යොමු වූයේ ගුරු - විදුහල්පති වැටුප් විෂමතා විසඳීම සඳහා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ වාර්තාව කෙරෙහිය. ‘‘මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙයි කියලා ගුරුවරු මෙන්ම දෙමාපියන්ද අද බලාපොරොත්තුව සිටිනවා’’ කමිටු සාමාජික අමාත්‍ය ප්‍රසන්න රණතුංග කීවේය. අධ්‍යාපන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන විශේෂ ලිපියක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. අමාත්‍ය අනු කමිටුවේ නිර්දේශ ගැන තම ස්ථාවරය පැහැදිළි කරමින් එම ලිපිය ලියා තිබුණි. ‘‘මේ අනුකමිටු වාර්තාව පිළිගෙන නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයි.’’ අධ්‍යාපන අමාත්‍යවරයා කීවේය. අමාත්‍ය විමල් වීරවංශ, සරත් වීරසේකරද මේ සම්බන්ධයෙන් අදහස් පළ කළහ. කෙසේ වෙතත් මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ කියා සිටියේ ඉදිරි අයවැයේදී විසඳුම් දෙනතුරු මාසිකව රුපියල් 5000 බැගින් දීමනාවක් දීම සුදුසු බවයි. ඊට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය.

‘‘රට තිබෙන්නේ ආර්ථික වශයෙන් අසීරු අවස්ථාවක. නමුත් ගුරුවරුන්ගේ ප්‍රශ්නය විසඳන්න අවශ්‍යයි. මෙම ගැටලුව අනාගතයට ඉතිරි කරන්න හොඳ නැහැ’’ අගමැති මහින්ද රාජපක්ෂ පෙන්වා දුන්නේය.

## හදිසි නීතියට සමගියේ විරෝධය

සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම හා කළමනාකරණ කමිටුවද මෙවර පැවැත් වුණේ සූම් ඇප්එක ඔස්සේය. අත්‍යවශ්‍ය සේවා ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපතිවරයා හදිසි නීතිය ක්‍රියාත්මක කිරීම, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ලෙස හමුද නිලධාරියකු පත් කිරීම මන්ත්‍රී කණ්ඩායමේ අවධානය යොමු විය. ‘‘ආණ්ඩුවට ජීවන වියදම පාලනය කර ගැනීමට නොහැකි වෙලා. තමන්ගේ නොහැකියාව වහගන්න බැරිකමට තමයි මේ ගැසට් ගහන්නේ’’ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස චෝදනා කළේය. ‘‘යුද්ධය තිබුණ කාලේවත් අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ලෙස හමුද නිලධාරියෙක් පත් කළේ නැහැ. මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක් වූ එස්. දිවාරත්න තමයි පත්කළේ. යාපනයට ආහාර යැව්වෙත් ඔහුගේ මැදිහත්වීමෙන්. දැන් හමුද නිලධාරීන් දාගෙන මොකක්ද මේ කරන්න යන්නේ’’ රාජිත සේනාරත්න මන්ත්‍රීවරයා ප්‍රශ්න කළේය. ‘‘මේ විදිහට ගිහිල්ලා හමුදවත් ෆේල් කරනවා.’’ පාර්ලිමේන්තු මන්ත්‍රී මනූෂ නානායක්කාර කීවේය. ‘‘අපි කොරෝනාවලින් මියගිය අය සිහිපත් කරමු. ඒ අයගේ පවුල්වලට සහනයක් වෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමු. ආණ්ඩුවට මියගිය අය ගැන ගාණක් නැහැ’’ එස්.එම්. මරික්කාර් මන්ත්‍රීවරයා කළ යෝජනාවට සියලුදෙනාගේම එකඟත්වය හිමිවූහ. ‘‘ලංකාවෙ වටේම සිකුරාද හවස හයට පහන් ලක්ෂයක්වත් පත්තු කරමු. ප්‍රධාන ආගම්වලට අයත් පූජනීය ස්ථානවලද පහන් පත්තු කරමු. ආගමික වැඩසටහනක් ක්‍රියාත්මක කරමු.’’ පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න කීවේය. ඒ අනුව පහන් පත්තු කිරීම සිකුරාද පස්වරුවේ සිදුවිය.

## රාජිතගෙන් මෛත්‍රීට සුබ පැතුම්

මේ අතර සිකුරාද දිනට යෙදී තිබූ හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේනගේ උපන්දිනයට සුබපැතූ රාජිත සේනාරත්න අමාත්‍යවරයා තොරතුරු විමසුවේය. ‘‘මම මේ අනුරාධපුර ජයශ්‍රී මහා බෝධියට යන ගමන්’’ හිටපු ජනාධිපතිවරයා කීවේය. ‘‘අපි අද හවස කොවිඩ්වලින් මියගිය අය සිහිපත් කරන්න පහන් පත්තු කරනවා. ඔබතුමාත් අනුරාධපුරයේ සිට එක්වන්න’’ රාජිත සේනාරත්න මන්ත්‍රීවරයා ආරාධනා කළේය. ‘‘හරි මමත් අනුරාධපුරයේ සිට පහන් පත්තු කරන්නම්’’ ඔහු කීවේය.

රූපවාහිනී විවාද සඳහා සහභාගි වන රාජ්‍ය අමාත්‍යවරුන් මුහුණදෙන ගැටලු හඳුනා ගැනීමේ රැස්වීමක් නාමල් රාජපක්ෂ ඇමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පැවැත්විණි. එහිදී වැඩි වශයෙන් අවධානය යොමු වූයේ සහල්, සීනි ප්‍රශ්නය නිසා මහජන නියෝජිතයන් මුහුණදී ඇති ගැටලු මෙහිදී රාජ්‍ය අමාත්‍යවරුන් පෙන්වා දුන්හ. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු විවාදවලට එක් නොවීම ගැනද මෙහිදී අවධානය යොමු විය.

## ජවිපෙන් ඔන්ලයින්

රටේ පවතින අර්බුද සම්බන්ධයෙන් ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ රැලි දෙකක් පැවැත්වීමට ජනතා විමුක්ති පෙරමුණ සූදනම් වෙයි. කාබනික ගොවිතැන නිසා මතුව ඇති ගැටලු පිළිබඳව කෘෂි නායකයන් සමග පළමු රැලිය පැවැත් වෙයි. පක්ෂ නායක අනුර කුමාර දිසානායකගේ ප්‍රධානත්වයෙන් එය පැවැත්වීමට සැලසුම් කර තිබේ. අනෙක් රැලිය වත්මන් ආර්ථික අර්බුදය පිළිබඳව පැවත්වීමට තීරණය කර ඇත.

දෙමළ ජාතික සන්ධානයේ දේශපාලන කමිටුවද මෙවර රැස්වූයේ සූම් ඇප් එක මගිනි. සාමාජිකයන් අටදෙනකුත් එම කමිටුවට ඇතුළත් වෙති. උතුරු නැගෙනහිර කොවිඩ් තත්ත්වය, මානව හිමිකම් උල්ලංඝනය වීම හා ආර්ථික කඩා වැටීම ගැන වැඩි අවධානය යොමු කෙරුණි.

## ඇමැතිවරුන්ගෙන් මධුරට ලකුණු

සෞඛ්‍ය අමාත්‍යාංශයේ රෝහල්වල භාවිතයෙන් පසු ඉවත් කළ ගිලන් රථ හතක් ‘මනුසත් දෙරණ හා මධුර විතානගේ පදනම’ එක්ව අලුත්වැඩිය කර මෙම සතියේදී නැවත අමාත්‍යාංශයට භාරදෙනු ලැබීය. රුපියල් ලක්ෂ 400ක පමණ වෙළෙඳ වටිනාකමක් ඇති මෙම ගිලන් රථ අලුත්වැඩියා කිරීම සඳහා වැය වුණේ රුපියල් ලක්ෂ 70ක් පමණි. ගිලන් රථ ලබාදීම පිළිබඳව මාධ්‍යයේ පළ වීමෙන් පසු ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු, ප්‍රමිත බණ්ඩාර, සමන්ප්‍රිය හේරත්, කුමාරසිරි රත්නායක වැනි මන්ත්‍රීවරුන් මධුර විතානගේ මන්ත්‍රීවරයා අමතා එම කර්තව්‍ය අගය කළහ. මේ පිළිබඳව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රධානත්වයෙන් පැවැති කොවිඩ් කාර්ය සාධක බලකායේදීද සාකච්ඡාවට බඳුන් වූහ. සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෛද්‍ය මේජර් ජෙනරාල් සංජීව මුණසිංහ මේ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළේය. ඒ සමගම ජනාධිපතිවරයා කියා සිටියේ තවත් ෆෝඩ් වර්ගයේ ගිලන් රථ 60ක් දැඩි කොන්දේසි මත ආනයනය කිරීමට තීන්දු කර ඇති බවයි. මෙම රැස්වීමට එක්ව සිටි මධුර විතානගේ මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේ පසුගිය යහපාලන රජය සමයේ ගෙන ආ ෆෝඩ් වර්ගයේ ගිලන් රථ රැසක් අබලන් වී ඇති බවයි. සමහර ගිලන් රථ කාර්මික දෝෂවලට ලක්වී තිබෙන බවද ඔහු කීවේය.

උදයජීව

**ගුරු-විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව ඉදිරි අයවැයකින් නිවැරැදි කරන තෙක් ඔවුන්ට රුපියල් පන්දහසක මාසික දීමනාවක් ගෙවීමට කැබිනට් මණ්ඩලය ගිය සතියේ තිරණය කළේය. නමුත් මේ යෝජනාව ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් ඇතුළු වර්ජනයට එකතු වී සිටින ගුරු-විදුහල්පති වෘත්තිය සමිති ප්‍රතික්ෂේප කළේය. මේ ඒ ගැන ලිපියක් ලියන ඩබ්ලිව්.ඕ. විතාන ලංකා ගුරු සංගමයේ ආරම්භක ලේකම්වරයාය. ඔහු දක්ෂ ගණිත ගුරුවරයකු වශයෙන් කොළඹ නාලන්දා විදුහලේ වසර දහයක් සේවය කළේය. 1980වේ මහා වැඩ වර්ජනයට සහභාගි වූ නාලන්දාවේ එකම ගුරුවරයා වන්නේ ඔහුය. කොළඹ ඩී.ඇස්. සේනානායක විදුහලේ හිටපු නියෝජ්‍ය විදුහල්පතිවරයෙක්ද වූ ඔහු විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකි.**



# ස්ටාලින් !

# අපේ නොවන ඔවුන්ගේ ප්‍රශ්නවලට අපිත් සටන් කළා




ඡායාරූපය - සමන් අබේසිරිවර්ධන

දින කිහිපයක් තිස්සේ නිවසේ දුරකතනය තොර තෝංචියක් නැතිව නාද වේ. එතරම් ඇමතුම් ගණනාවක් මෑත කාලයකදී නොලැබුණු තරම්ය. කොරෝනාව නිසා පැරණි සටන් සගයන් හමුනොවුණත් දින කිහිපයක් පුරා ඔවුන් දුරකතනයෙන් කතා කරමින් මගෙන් විමසන්නේ ''අපේ ගුරු සංගමයට මේ වෙලා තියෙන්නේ කුමක්දැයි'' යනුවෙනි. ඔවුන් සියලු දෙනාම අපේ ගුරු සංගමය යනුවෙන් ගෞරව භක්‍යාදරයෙන් සිහිපත් කරන්නේ ලංකා ගුරු සංගමයයි. ජවිපෙය විසින් බලය ඇල්ලීම හේතුකොට ගෙන මා පසුකලක ලංකා ගුරු සංගමයෙන් ඉවත් වී ශ්‍රී ලංකා එක්සත් ගුරු සංගමයට එක් වුවද ලංකා ගුරු සංගමයේ ආරම්භක ලේකම්වරයා මම වීමි. මේ නිසා අපේ පැරණි සටන් සගයන් කනගාටුවෙන් අපේ ගුරු සංගමය ගැන මා සමග මෙසේ කතා කරන්නේ මා එහි ආරම්භක ලේකම්වරයා නිසා විය යුතුය. එමතු නොව අසූව මහා වැඩවර්ජනය ඇතුළු ගුරු සටන් රැසකට නායකත්වය දුන් මම මීට දෙතුන් සතියකට පෙර 'සති අග අරුණ'ට ගුරු වර්ජනය ගැන ලිපියක් ලියමින් අවධාරණය කළේ වර්ජනය සාධාරණමුත් දෙපාර්ශ්වයම මැද මාවතට පැමිණ ප්‍රශ්නය විසඳ ගත යුතු බවය. මෙහි අප කල්පනා කළ යුත්තේ තම පාර්ශ්වවල දිනුම පැරදුම නොව වසර එකහමාරක් පුරා හරිහමං අධ්‍යාපනයක් නොලබා සිටින දරුවන් ගැනය. දෙස්තර රෝගීන් ප්‍රාණ ඇපයට තබා ගනිමින් වැඩ වර්ජනය කරන විට ඊට දෙස් දෙවොල් තබන අප ඉදිරියේද දැන්නම් සිද්ධ වෙමින් පවතින්නේ දරුවන් ප්‍රාණ ඇපයට ගත් වැඩක් බව අමතක නොකළ යුතුය.

කෙසේනමුත්, මේ වර්ජනයට විසඳුම් සේවීම සඳහා රජය පැත්තෙන් යෝජනාවක් ඉදිරිපත් කර තිබේ. එහෙත් ගුරු සංගම් එය ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේනමුත්, අපිත් ආණ්ඩු සමග හොඳහැටි හැප්පී ගුරුවරුන්ට අයිතිවාසිකම් දීමට නායකත්වය දී ඇත්තෙමු. එයත් මස් රාත්තලම ඉල්ලමින් නොවේ. මක්නිසාදයත් මස් රාත්තලම ඉල්ලීම අසාධාරණ බැවිනි. එහිදී, මගේ මතකය දිව යන්නේ 1975 දෙසැම්බර් 4 වැනිද පැවැත් වූ සමවැටුප අරගලයයි. එය ලංකාව පුරා සිටින ගුරුවරුන් එකට එකතුව පැවැත්වූ පළමු සංකේත වැඩ වර්ජනයයි.

එද එය අප ඇරඹුවේ සුළු පිරිසකගේ සුබ විහරණය උදෙසා නොව සමස්ත ගුරුසේවයේම වැටුප් විෂමතාවන් බිඳ දැමීම වෙනුවෙනි. එකල විවිධ මතවාදයන් හා දේශපාලන දර්ශනයන්වලට බෙඳුණු ගුරු සංගම් තිබුණි. නමුත්, ඔවුන් සියල්ලන්ම එක් අරමුණක් වෙනුවෙන් එකට එකතු වී තමන් ගේ පඩිපත වෙනුවෙන් නොවේ අනුන් වෙනුවෙන් සටන් කළ දීප ව්‍යාප්ත ගුරු උද්ඝෝෂණය වෙන්නෙත් 1976දී අප ආරම්භ කළ ගුරු වැඩ වර්ජනයයි.

මා නියෝජනය කළ ශ්‍රී ලංකා එක්සත් ගුරු සංගමය, ලංකා ගුරු සංගමය, ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමය, ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය, ද්‍රවිඩ ගුරු සංගමය සහ මුස්ලිම් ගුරු සංගම් එකට එකතු වී අපේ නොවන ඔවුන්ගේ ප්‍රශ්නය වෙනුවෙන් පෙනී සිටියමු. මෙහි ඔවුන් යනුවෙන් හඳුන්වන්නේ එකල රුපියල් අසූඅටක වැටුපක් ලබා සිටි ප්‍රාථමික සහ ස්වභාෂා පුහුණු ගුරුවන්ය. අපිට අවශ්‍ය වුයේ ද්විතීයික පුහුණු ගුරුවරුන් වන අපේ වැටුපම ඔවුන්ටත් දෙන්නටය.

මෙම වැඩවර්ජනය ඇරඹීමට නියමිතව තිබුණේ දෙසැම්බර් මස හතරවැනිදය. 'නොබැඳි ජාතීන්ගේ සමුළුව'ත් පැවැත්වීමට දින නියම කර තිබණේ 1976 අගෝස්තු 19 වැනිදටයි. මේ වන විට සමගි පෙරමුණ ආණ්ඩුවෙන් ලංකා සමසමාජ පක්ෂය ඉවත් වී තිබූ අතර රට පුරා ආණ්ඩු විරෝධී රැල්ලක් මතුවෙමින් පැවතුණි. ඒ නිසා මැතිණියට අවශ්‍ය වූයේ කෙසේ හෝ ගුරු වැඩ වර්ජනය නවත්වා නොබැඳි ජාතීන්ගේ සමුළුවේ වැඩ කටයුතුවලට බාධාවක් නොවන ලෙස පැවැත්වීමටයි. ඒ නිසා අගමැතිනි සිරිමාවෝ මැතිනිය ඊට පෙර රාත්‍රියේදී ගුරු සංගම් නායකයන් අරලියගහ මැදුරට ගෙන්වා 'ඔබේ ඉල්ලීම් එළෙඹෙන අය-වැයේදී විසඳනවා' යැයි පොරොන්දු වී වර්ජනය නතර කරන ලෙස ඉල්ලා සිටියාය. එම පොරොන්දුව ලබා දුන්නේ රටේ අගමැතිනියයි. මේ නිසා ඊට එකඟ වී අපි සියලුදෙනාම අරලිය ගහ මැදුරෙන් පිටත් වුණෙමු. එත් පසුකලක රෝහණ විජේවීරගේ මස්සිනා වුද ඒ වන විට ජනතා විමුක්ති පෙරමුණට ලැදිව වැඩ කළ ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් එච්.එම්. ප්‍රනාන්දු ඊට අකමැති විය. ඔහු ඇතුළු ගුරුවරුන් ඉතාමත් සුළු පිරිසක් වැඩ වර්ජනයේ නිරත විය.

ශ්‍රී ලාංකීය සංස්කෘතියේ බුදුන්ට වදින දැතින් දරුවන් වඳින්නේ ගුරුවරුන්ට, දෙමාපියන්ට සහ ආගමික නායකයන්ට පමණි. එසේ වැඳුම් පිදුම් ලබන ගුරුවරුන්ව ගුරු සංගම් විසින් මෙවැනි තත්ත්වයකට පත් කිරීම ඉතාමත් නුසුදුසුය. අද දරුවන් ගැන නොසිතා තමන් ගැනම සිතා ගුරුවරුන් කටයුතු කරන ආකාරයට එද ගුරු සංගම් කටයුතු නොකළේය. අපි අපේ වෘත්තීය අරගලය කරන අතරතුර දරුවන්ගේ අනාගතය වෙනුවෙන්ද පෙනී සිටියෙමු. එවන් අද්දැකීමකට 1968 වසරේදී අපි මුහුණදෙන්නෙමු. එවකට අධ්‍යාපන ඇමැතිව සිටි ඊරියගොල්ල අධ්‍යාපන සියවස සැමරීම සඳහා මහා ප්‍රදර්ශනයක් සූදනම් කළ අතර ඒ සඳහා අරමුදල් සෙවීමට ලොතරැයියක්ද ආරම්භ කොට තිබුණි.

එයට සමගාමීව සමස්ත ගුරුවරුන් විසින් ඉතාමත් නිර්මාණශීලීව ගමේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ඒ දරුවන්ගේ අඩුපාඩු ඉතාමත් කාලාත්මකව රටක් ඉදිරියට ගෙන ආවේය. ඒ 'ගුරු දුක' නම් ප්‍රදර්ශනයක් පවත්වමින්ය. එද දුෂ්කර ගම්වල සේවය කළ ගුරුවරු සිය පාසලේ දුටු අඩුපාඩු සහ නගරයේ පාසල්වල දරුවන්ට ලැබෙන ගමේ පාසලේ දරුවන්ට නොලැබෙන දෑ පිළිබඳව විචාරශීලිව කතා කළෝය. සමහර ගුරුවරු ඔවුන්ගේ දෑතින්ම ඔවුන් දුටු දෑ විදි අද්දැකීම් සිතුවමට නැගූහ. කුඩා ඡායාරූප ලෙස ඉදිරිපත් කළේය. තවත් අය ගමේ පාසලේ ආකෘතියක් සිය දෑතින්ම තැනුවේය. කවි ලීවේය. සටහන් තැබුවේය. හඬක් නැති ඔවුන්ට හඬක් වුවේය. ඒ එද වෘත්තීය සමිති නායකයන් තමන්ගේ දරුවන් සේ සිතා අනුන්ගේ දරුවන්ගේ ඇස් පෑදීමට කටයුතු කළ අයුරුයි. එහි ප්‍රතිඵලයක් ලෙස අපිට 1972 ආචාර්ය ප්‍රේමදස උඩුගමගේ නායකත්වයෙන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් පැමිණියේය. නමුත්, අවාසනාවට 1977 බලයට පැමිණි ආණ්ඩුව ඒ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය කුණු කුඩේට දැමුවේය. නමුත්, එයින් නොසැලුණු අපි දිගින් දිගටම දරුවන්ගේ අනාගතය වෙනුවෙන් නොපැකිළිව පෙනී සිටියෙමු.


එමෙන්ම, ගුරුවරුන්ගේ ගැටලුවලටත් ආණ්ඩු හා හරි හරියට හැප්පෙමින් සටන් කළේය.

එතෙක් ගුරුමාරු කරන ලද්දේ අමාත්‍යාංශ නිලධාරීන්ගේ හිතුමතයටය. නමුත් ගුරුසංගම්වල සහභාගීත්වයෙන් ගුරුමාරු මණ්ඩල ඇති කිරීමට හැකි වීම එද අප ලැබූ විශිෂ්ට ජයග්‍රහණයකි. අද කොවිඩ් වසංගතය රටපුරා ව්‍යාප්ත වෙමින් තිබියදී ගුරුවරු කළ උද්ඝෝෂණ කළද, එද ලංකාවේ දී මැතිනිය සභාපතීත්වය දරමින් පැවැති නොබැඳි ජාතීන්ගේ සමුළුව පැවැත්වෙමින් තිබීම නිසා රටේ නම්බුව ගැන සිතා අපි ගුරු වර්ජනය අඩියක් පස්සට ගත්තෙමු. කෙසේනමුදු අපි මැතිනියගේ පොරොන්දුව පිළිගත් බැවින් ඇගේ රජය විසින් අපගේ ප්‍රශ්නයට ඇහුම්කන් දී වැටුප් විෂමව නොව සමානව දීමට අනුමැතිය දුනි. යම්හෙයකින් රටේ ගෞරවය පැත්තකට දමා අපි එද ගුරු වර්ජය කළේ නම් සමහර විටෙක තවමත් ගුරු වැටුප් විෂමතාවට තිතක් නොවැටෙනු ඇත.

නමුත්, අද රටේ පවතින වසංගත තත්ත්වය පවා නොසිතමින් දහස් ගණනින් ඉකුත් දිනවල ගුරුවරු පාරට බැස උද්ඝෝෂණ කළෝය. අන්තිමේ දී ආණ්ඩුවට ඔවුන්ගේ ප්‍රශ්නයට විසඳුම් දීමට සිදුවිය. ඒ සඳහා කැබිනට් අනුකමිටුවක් පත්කළේය. එමෙන්ම, ඒ කමිටුවෙන් ලැබූ යෝජනාවල යම්කිසි සාධනීය මට්ටමක් ඇති බව මා හට හැඟුනි. එද අපි වැටුප් විෂමතාව ජයගත්තා සේ අද සිටින ගුරු සංගම්ද මේ යෝජනාවන් ඔවුන් ලද ජයග්‍රහණයක් සේ පිළිගන්නේ නම් හොඳය. එයට හේතුව වෙන්නේ යම්කිසි අයුරකින් ආණ්ඩුව මේ මොහොතේ දුන් පොරොන්දු කඩකළහොත් මීටත් වඩා සටන්කාමී ලෙස පියවරක් ඉදිරියට යන්නට ඔවුන්ට හැකි වන නිසාය. එම සටනට මීට වඩා ජන සහයෝගයක්ද ලැබෙනු ඇති බව මාගේ කල්පනාවය. එහෙත් දැන් සිද්ධ වී ඇත්තේ කුමක්ද ගුරු විදුහල්පති සංගම් මේ විසඳුම් පැත්තකට විසි කරමින් මස් රාත්තලම ඉල්ලීමය. එය අසාධාරණය. අවුරුදු එකහමාරකට අධික කාලයක් කොවිඩ් තත්ත්වය නිසා පාසල් වසා දමා තිබුණි. නමුත්, ගුරුවරුන්ට තමන්ගේ වැටුප කිසිදු අඩුවකින් තොරව ලැබුණි. එසේ තිබියදී ලක්ෂ ගණනක දරුවන්ට අද අධ්‍යාපනය නොදෙන තත්ත්වයකට ගුරුවරුන් පත්ව සිටීම කෙතරම් අසාධාරණද? එපමණක් නොව ඔවුන් අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රායෝගික පරීක්ෂණවලින් ඉවත්වන බව ප්‍රකාශ කිරීම තුළින් සාමාන්‍යපෙළ ප්‍රතිඵල නිකුත් කිරීමට බාධාවක් පැමිණේ. එයින් එම දරුවන්ගේ අනාගතයට විශාල බලපෑමක් සිදුවනු ඇත.

මාගේ හැඟීම අනුව ගුරුවරුන්ගේ සටනට මුලින් රටේ ජනතාවගේ සහාය තිබුණි. නමුත් දිගින් දිගටම මස් රාත්තලම ඉල්ලීම හේතුවෙන් ඔවුන් ජනතාවගේ අප්‍රසාදයට ලක් වනු ඇති බව අත්දැකීම් බහුල ගුරු සංගම් නායකයකු හැටියට මට පෙනේ. ඒ නිසා පැරණි ගුරුසංගම් නායකයෙක් විදිහටත් ලංකා ගුරු සංගමයේ ආරම්භක ලේකම් වශයෙනුත් මා සහෝදර ගුරු සංගම් නායකයන්ගෙන් සහෝදරත්වයෙන් ඉල්ලන්නේ මේ මොහොතේ රජයේ ඉල්ලීම පිළිගෙන වැඩ වර්ජන ක්‍රියා මාර්ගය අත්හිටුවන ලෙසයි. යම්කිසි අයුරකින් ආණ්ඩුව පොරොන්දු වූ ආකාරයට අයවැය ලේඛනයෙන් සාධනීය වැඩපිළිවෙළකට නොගියොත් එවිට ගුරුවරුන්ට වඩාත් සංවිධානාත්මකව ඉස්සරහට යෑමේ හැකියාවට ඉඩ ලබා ගන්නා ලෙස මම යෝජනා කරමි. එවිට ඔවුන්ගේ දෑත් ශක්තිමත් කිරීමට ජනතාව පැමිණෙනු ඇත. එසේ නොමැතිව, ජනතාව නොමැතිව ඔවුන්ගේ ඇත් වී වෘත්තීය සටන් කළ නොහැකි බවත් වර්තමානයේ වෘත්තීය සංගම්වල සිටින ගුරුවරුන් අවබෝධ කර ගතයුතුය. අනෙක් අතට කිසිදු රජයක් වෘත්තීය සමිති ඉල්ලන්නාවූ ඉල්ලීම් සියයට සියයක්ම පිළිගන්නේ නැත. එවිට ඔවුන් කරන්නේ ඔවුන්ගේ ඉල්ලීමේ මධ්‍යස්ථ තැනකට පැමිණ එයට විසඳුම් සේවීමට උත්සහ කිරීමය. එමෙන්ම, අද ඔවුන්ගේ උද්ඝෝෂණයට රජය යම්කිසි සාර්ථක පිළිතුරක් දී ඇත්තේය. අද ඔවුන් එය පිළිගත යුතුයි. කිමද එය ඔවුන් ලද විශාල ජයග්‍රහණයක් වන බැවිනි. එසේ නොකොට කටයුතු කරන්නේ නම් ජනතාවද ඔවුන්ගෙන් ඈත්ව යනු ඇත. ඒ නිසා අද මා වර්තමානයේ සිටින ගුරු වෘත්තීය සමිති නායකයන්ගෙන් ඉල්ලා සිටින්නේ තමන් ගැන මෙන්ම අසරණ දරුවන් ගැනත් සිතා අඩියක් පස්සට ගන්නා ලෙසයි. සටනේ දී අඩියක් පස්සට ගැනීම වූ කළ කිසිසේත් පරාජයට හෝ තමන්ගේ අභිමානය නැති වීමට හේතුවක් නොවේ.

**ඩබ්ලිව්.ඕ. විතාන**





# ආනන්දෙට මාක්ස්වාදය ගෙනා එල්මෝ

නාරාහේන්පිට, ඇල්විටිගල නිවාස සංකීර්ණයේ එෆ් 16 නිවෙස මහා පාළුවක ගිලී ඇතුවා නිසැකය. අතීත සැමරුම් මැද ඔහු එහි ගත කළ නිහඬ දිවිය දැන් මතකයක්ම පමණි. මෙරට පුවත්පත් කලාවේ විසල් වෘක්ෂයක් බඳු වූ ඔහු හමුවීමට පුවත්පත් කලාවේදියෝද, විද්‍යාර්ථියෝද එහි ආවෝය, ගියෝය. ඒ සැමට ඔහු සිය අත්දැකීම්ද, දැනුමද නොමසුරුව බෙදා හදා දුන්නේය. ඔහුගේ අභාවය පිළිබඳ ශෝක පණිවුඩයක් නිකුත් කළ අගමැති මහින්ද රාජපක්ෂ සඳහන් කළේ මෙරට මාධ්‍ය ක්ෂේත්‍රයේ නම් දැරුවන් රැසකගේ මුල් ගුරුවරයා ඔහු බවය.

ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදියකු වූ ඔහු එල්මෝ ගුණරත්නය. එල්මෝ දිවි ගමන නිම කළ බව ලියුම්කරු මුලින්ම දැනගත්තේ ඔහුගේ බාල පුතු රජීව තබා තිබූ ෆේස්බුක් සටහනකිනි. අසූනව වසරක වැඩදායක සහ තෘප්තිමත් ජීවිතයක් ගත කළ එල්මෝ සිටියේ 'මරණය' කෙරෙහි සවිඥානිකවය. ''මගේ කාර්යය අවසන්, ජීවිතය ගැන සතුටුයි, දැන් ඕනෑ වේලාවක යන්න ලෑස්තියි''. ඇල්විටිගල නිවසේදී මට අවසන් වරට හමුවූදත් ඔහු කීවේය. එතැන ඔහුගේ වැඩිමහල් පුතු දමිත ගුණරත්නත් සිටියේය. ඒ ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ දිනකය. ඉන්පසු විටින් විට දුරකථනයෙන් කතාබහ කළත් මම ඔහු හමුවන්නට ගියේ නැත. කොරෝනා වසංගතය ඔහු සමග අල්ලාප සල්ලාපයේ යෙදීම වළකමින් මග හරහට සිටියේය. මීට මාස තුන හතරකට කලින් අවසන් වරට දුරකථනයෙන් කතා කළ වේලාවේත් ඔහු කීවේ හමුවන්නට එන ලෙසය. අතීත අත්දැකීම් ගැන සතුටු සාමීචියේ යෙදෙමින් හෝරාවක්, දෙකක් ගත කරන්නට හෙතෙම බෙහෙවින් කැමැතිය. ඔහුගේ අතීත කතා අහන්නට මා ද බොහෝ කැමැතිය. පුවත්පත් කලාවේ දුහුණන් වූ අප වැනි අයට ඔහුගේ අත්දැකීම් බොහෝ පල ප්‍රයෝජනය. නමුත් කොරෝනා වසංගතය හේතුවෙන් ඔහු හමුවීම දවසින් දවස පස්සට ගියේය. අන්තිමේදී දෛවය අපට සරදම් කර එල්මෝ මහත්තයා කොරෝනා මාරයා සමග යන්නට ගියේය.

එල්මෝ කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි සිසුවෙකි. ඔහු ආනන්දයේ ඉගෙන ගන්නා කාලයේ විදුහල්පති වූයේ නූතන සිංහල බෞද්ධ ප්‍රබෝධයේ පුරෝගාමියකු වූ එල්. එච්. මෙත්තානන්දය. ආනන්දයේ එකල 'පෝස්ට් මැට්‍රික් ස්ටුඩන්ට් යූනියන්' නමින් ශිෂ්‍ය සංගමයක් තිබිණි. එහි බලය තිබුණේ ඉහළ පැලැන්තියේ පවුල්වල දරුවන් අතය. එල්මෝ වැනි සාමාන්‍ය පවුල්වලින් ආ දරුවන්ට ශිෂ්‍ය සංගමයේ බලය අල්ලා ගැනීමට අවශ්‍ය විය. ඔවුහු ඒ සඳහා වැඩ කළහ. වැඩිකල් නොගොස් මේ බව මෙත්තානන්ද විදුහල්පතිතුමාට දැනගන්නට ලැබිණි. ඔහු විදුහල්පති කාමරයට කැඳවූයේ එල්මෝය.

''උඹ මාක්ස්වාදියෙක්ද?''

විදුහල්පතිතුමා කෙළින්ම ප්‍රශ්න කළේය.

''ඔව්.''

''ඇයි ඕක මෙහෙට ගෙනාවේ?''

''මාක්ස්වාදය නෙවෙයි, අපිට ඕනි හොඳ කථිකයො ඉස්කෝලෙට ගේන්න.''

''ආ... මම දන්නවා. උඹලට ඕනි ශිෂ්‍ය සංගමයෙ බලය අල්ලන්නයි, ඇන්. ඇම්. ව මෙහෙට ගේන්නයි.''

එසේ කියූ විදුහල්පතිතුමා පුළුවන් නම් එය කරන්නැයිද කීවේය. විදුහල්පතිගේ අභියෝගය භාරගත් එල්මෝ ඇතුළු සිසුහු එය කර පෙන්වූහ. ඔවුන් ශිෂ්‍ය සංගමයේ නිලවරණයෙන් ජයග්‍රහණය කළේ විශාල වැඩි ඡන්ද ගණනකිනි. පසුව මෙත්තානන්ද විදුහල්පතිතුමා අකමැත්තෙන් කැමැති කරවාගෙන ආචාර්ය ඇන්. ඇම්. පෙරේරාව ද දේශනයකට ආනන්දයට කැඳවාගෙන ආවේය.

''ඇන්. ඇම්. එදා හරිම සාරගර්භ කතාවක් කළා. ළමයින්ගෙන් ඒකට සෑහෙන ප්‍රතිචාරයක් ලැබුණා. මෙත්තානන්දටත් තේරුණා ඇන්. ඇම්. නරක මනුස්සයෙක් නෙමෙයි කියලා'' එල්මෝ ඒ ගැන කීවේ එහෙමය.

කතාව අවසන් කර ආපසු යන ඇන්. ඇම්. ට එදා ආනන්දයේ කොල්ලෝ වාහනය පණගන්වන්නට දුන්නේ නැත. ආනන්දයේ සිට ඇන්. ඇම්. එවකට පදිංචිව සිටි පුංචි බොරැල්ලේ නිවෙස දක්වා මොරිස් මයිනර් කාර් රථය තල්ලු කළෝය. එල්මොත් ඒ අතර වූවේය.

පාසල් අධ්‍යාපනයෙන් පසු නීති විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීමට ගිය එල්මෝගේ එක් පුරුද්දක් තිබිණි. එනම් රටේ කතාබහට ලක්වූ නඩු ඇසෙන දිනවල ඒවා බලන්නට උසාවි යෑමය. උසාවියේ නඩු වාර්තා කරන්නට එන පුවත්පත් වාර්තාකරුවන් එල්මෝගේ නෙත ගැටෙන්නේ ඔය ගමනේදීය. පුවත්පත් කලාව කෙරෙහි කැමැත්තක් හා උනන්දුවක් ඔහු තුළ ඇතිවන්නේ ඉන් පසුවය. පුවත්පත් කලාවට උනන්දුවක් දක්වන නීති ශිෂ්‍යයා පුවත්පත් වාර්තාකරුවකුගේද ඇස ගැටුණේය. එකල අලුතෙන් ආරම්භ කළ 'සිංහල ජාතිය' සහ 'ගාර්ඩියන්' යන පුවත්පත් දෙකේ උසාවි වාර්තාකරුවකු ලෙස 1954 දී එල්මෝ පුවත්පත් කලාවට පිවිසියේ ඔහුගේ මැදිහත්වීමෙන්ය.

කෙසේ නමුත් වැඩි කාලයක් එල්මෝ 'සිංහල ජාතිය' සහ 'ගාර්ඩියන්' පුවත්පත්වල සේවය කළේ නැත. ලිඛිත පරීක්ෂණයකින් සමත්ව ඔහු 1955 ජනවාරි 1 වැනිදා ලේක්හවුස් ආයතනයට සම්බන්ධ වූවේය. එකල විජයවර්ධන පවුලේ අයිතිය යටතේ තිබුණු ලේක්හවුස් ආයතනයේ සම්මුඛ පරීක්ෂණයකට එල්මෝ ගියේ රතු ටයි පටියක් පැලඳගෙනය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටියේ ඩී. ආර්. විජයවර්ධනගේ බෑණා වූ ලේක්හවුස් කළමනාකාර අධ්‍යක්ෂ එස්මන්ඩ් වික්‍රමසිංහ (රනිල් වික්‍රමසිංහගේ පියා), සන්ඩේ ඔබ්සර්වර් ප්‍රධාන කර්තෘ ටාසි විට්ටච්චි, සිළුමිණ සහ ජනතා ප්‍රධාන කර්තෘ ඩෙන්සිල් පීරිස් සහ සිළුමිණ නියෝජ්‍ය කර්තෘ මීමන ප්‍රේමතිලකය. එල්මෝගේ රතු ටයි පටිය යූ.ඇන්.පී. කාරයෙක් වූ එස්මන්ඩ්ට එතරම් ඇල්លුවේ නැත. ඔහු මීමන දෙසට හැරී ''මෙයා නම් හරියන්නෙ නැහැ, රතු ටයි එකක් දාගෙන ඉන්නේ'' යැයි කීවේය. ''රතු ටයි එකක් දාගෙන ආවා කියන්නේ මෙයා මොළේ තියෙන කොල්ලෙක්'' මීමන උත්තර දුන්නේය. සම්මුඛ පරීක්ෂණය විනාඩි හතළිහක් දක්වා ඇදී ගියේය. එල්මෝට ලේක්හවුසියේ දොර ඇරිණි.

එල්මෝ මුලින්ම දැම්මේ සන්ඩේ ඔබ්සර්වර් කර්තෘ මණ්ඩලයටය. වැඩි කාලයක් නොගොසින් ඔහුට ජනතා සහ සිළුමිණ පුවත්පත්වලටත් පුවත් හා ලිපි සපයන්නට සිදුවිය. එහෙත් ඒ දිනවල එල්මෝට සිංහල භාෂාවෙන් හොඳින් ලියන්නට බැරිය. එල්මෝ පුහුණු කරන්නට දැම්මේ මීමන ප්‍රේමතිලක ළඟටය. එල්මෝ ලියා දුන් ලිපියක් කියවූ මීමන දිනක් ඇසුවේ ''මොන ඉස්කෝලෙද ඉගෙන ගත්තේ?'' කියාය. ''ආනන්දේ'' යැයි එල්මෝ පිළිතුරු දුන් විට ''ආනන්දේ ඉගෙන ගත්තට උඹට සිංහලත් බෑනේ'' කියූ මීමන ලිපිය වීසි කළේය. එල්මෝගේ දෑස් කඳුළින් පිරුණි.

එදින දහවල් එල්මෝගේ මේසය අසලට ආ මීමන ''මාත් එක්ක එන්නෑ'' යි කීවේය. ''සර්... මං...'' යැයි එල්මෝ කියද්දී ''මේ... මේ... මෙහෙ සර්ලා නෑ, මම මීමන... එච්චරයි'' කියා කීවේය. එල්මෝත් සමග චැතම් වීදියේ අවන්හලකට ගිය මීමන අරක්කු වීදුරු දෙකක් ඇණවුම් කළේය.

''මම බොන්නෙ නැහැ'' යැයි එල්මෝ කී විට ''බොන්නෙ නැති උන්ට පුරුදු කරන්න තමයි මෙතනට ගේන්නේ, බීපන්'' යැයි මීමන කීවේ සැරෙනි. එල්මෝ වීදුරුව කටේ හලා ගත්තේ එක උගුරටය.

පනස් හයේ මහ මැතිවරණය අවස්ථාවේ ශ්‍රීලනිප නායක එස්. ඩබ්ලියු. ආර්. ඩී. බණ්ඩාරනායකගේ පුවත් හා ප්‍රචාරක රැස්වීම් ආවරණය කරන්නට ලේක්හවුසියේ පුවත්පත් කලාවේදියෙක් බෙහෙතකටවත් හොයා ගන්නට නොවීය. එහෙත් සර් ජෝන් කොතලාවල ආවරණය කරන්නට එහි පුවත්පත් කලාවේදීහු පොර කෑහ. ඒ මොහොතේ බණ්ඩාරනායක ආවරණය කරන්නට එස්මන්ඩ්ගේ තේරීම වූයේ එල්මෝය. එල්මෝගේ වාමාංශික නැඹුරුව සහ සිංහල - ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම වැඩ කිරීමේ හැකියාව එයට ප්‍රධාන වශයෙන් බලපෑවේය.

බණ්ඩාරනායකගේ ප්‍රචාරක රැලි ආවරණය කරන්නට එල්මෝ රටපුරා ගියේ බණ්ඩාරනායකගේ වාහනයෙන්මය. එයට හේතුවූයේ ලේක්හවුස් ආයතනයෙන් ප්‍රවාහන පහසුකම් නොදීමය. කුරුණෑගල පැවැති එක් රැස්වීමකට යන අතර බස් ජනසතු කිරීමේ මාතෘකාව කතාබහට ආවේය. එහිදී බණ්ඩාරනායක කීවේ බස් ජනසතු කිරීම අසාර්ථක වනු ඇති බවත් පෞද්ගලික අංශයට මෙන් රාජ්‍ය අංශයට බස් ප්‍රවාහන සේවය හොඳින් කරගෙන යා නොහැකි බවත්ය. එල්මෝ සහ වාහනයේ සිටි බදුර්දීන් මොහොමඩ් ඒ කතා අහගෙන කුරුණෑගල ගියහ. වේදිකාවට ගොඩවූ බණ්ඩාරනායක බස් ජනසතු කිරීමේ අගය පහදා දෙමින් එය අනිවාර්යයෙන්ම කරන බව කියමින් සාරගර්භ කතාවක් කළේය. එල්මෝ උඩබිම බැලුවේය. බණ්ඩාරනායක සමග ගිය ගමන්වලදී ඔහු මෙවන් සිදුවීම් රැසකට මුහුණ දුන්නේය.

මහ මැතිවරණය ජයග්‍රහණයෙන් පසු බණ්ඩාරනායක තමන්ට උදව් කළ එල්මෝ අමතක නොකළේය. අලුත් අගමැතිවරයා එල්මෝටත්, පෙරමුණේ තිලකටත් හොරගොල්ල වලව්වට එන්නැයි පණිවුඩයක් එවා තිබිණි. පෙරමුණේ තිලක ටයිම්ස් ඔෆ් සිලෝන් ආයතනය අච්චු ගැසූ 'ලංකාදීප' පුවත්පතේ බණ්ඩාරනායකගේ රැලි ආවරණය කළ පුවත්පත් කලාවේදියාය.

''මම ඔය දෙන්නට තෑග්ගක් දෙන්න යන්නේ.''

හොරගොල්ල වලව්වේදී බණ්ඩාරනායක කීවේ එල්මෝත්, පෙරමුණේ තිලකත් ඉදිරිපසින් වාඩි කරගෙනය.

''මොකක්ද තෑග්ග?''

එල්මෝත්, පෙරමුණේ තිලකත් ඇසුවේ එකටමය.

''අගමැති විදිහට මම මුලින්ම කතා කරන්නේ ඔය දෙන්නට. මම මගේ වැඩපිළිවෙළ කියන්නම්. ඔය දෙන්නත් ඕනි ප්‍රශ්නයක් මගෙන් අහන්න. ඔය දෙන්නගේ වාර්තා පළ වුණාට පස්සේ තමයි මම අනෙක් මාධ්‍යවලට කතා කරන්නේ.''

තවත් පෞද්ගලික උදව් අවශ්‍ය නම් කියන්නැයි ද බණ්ඩාරනායක එල්මෝට කීවේය. එල්මෝ ඉල්ලුවේ එක උදව්වකි. එනම් ලේක්හවුස් ආයතනයේ වෘත්තීය සමිතියක් පිහිටුවන්නට උදව් කරන ලෙසය. බණ්ඩාරනායක ඒ මොහොතේම එවක කම්කරු කොමසාරිස් වූ සී. බී. කුමාරසිංහට ටෙලිෆෝන් කළේය. ලේක්හවුස් ආයතනයේ වෘත්තීය සමිතියක් පිහිටුවා ගන්නට එල්මෝලාට උදව් කරන්නැයි ඔහුට කීවේය. එල්මෝ ඇතුළු කණ්ඩායම ලේක්හවුසියේ පළමු වෘත්තීය සමිතිය පිහිටුවූවේ ඒ හයියෙනි. එය 'සිලෝන් යූනියන් ඔෆ් ජර්නලිස්ට්' නම් විය.

කෙසේ නමුත් 1973 දී ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමට එරෙහිව ඉන් ඉල්ලා අස්වූ පුවත්පත් කලාවේදීන් කිහිපදෙනා අතර එල්මෝ ද වූවේය. ඉන්පසු කාලයක් ඔහු තායිලන්තයේ බැංකොක් නුවර ප්‍රකාශයට පත් කරන 'මෝර්නිං එක්ස්ප්‍රස්' පුවත්පතේ ප්‍රධාන උප කතුවරයා ලෙස සේවය කළේය.

ඇල්විටිගල නිවසේ දුඹුරු පැහැ සෝෆාවේ වාඩිවී එල්මෝගෙන් ඇසූ මෙවන් අතීත මතක මෙතෙකැයි කියා කිව නොහැකිය. ඒවායින් බොහෝමයක් ගිය අවුරුද්දේ මේ කාලයේම අපි 'සතිඅග අරුණ' පාඨකයන්ට තිළිණ කළෙමු.


එල්මෝ පරිපූර්ණ මතක ගොන්නක් අපට ඉතිරි කර ගොස් තිබේ. 'කොරෝනා' නාවා නම් ඒ මතක ගොන්නට තවත් ඒවා එකතු වන්නට තිබිණි. ඒ මතක සොයා ඇල්විටිගල, එෆ් 16 නිවෙසට ඉදිරි දිනක යන්නට අදහස් කරමි. භෞතිකව නැතත් ඔහු එහි දුඹුරු පැහැ සෝෆාවේ එක් කොනක වාඩිවී එදා මෙන්ම මහත් සෙනෙහසින් එදිනටත් ආශිර්වාද කරන බව හොඳකාරවම දනිමි.

**හසිත කුරුප්පු**

ජයාරූපය - ක්‍රිෂාන් කාරියවසම්
























# පැරා ක්‍රීඩාවට අත්පුඩි ගසන අවසන් වසර කිහිපයද මේ?



දහසකුත් එකක් බැරි අමාරුකම් මැද කෙඩෙත්තු වූ සිත් සමනය කිරීමට ටෝකියෝවේදී වැගිරුණු සතුටු කඳුළු දැනටමත් ආශීර්වාදයක් වී හමාරය.

ඔලිම්පික් උළෙල වෙනුවෙන් අපේ ක්‍රීඩාලෝලියා තුළ තිබූ උනන්දුව පැරාලිම්පික් උළෙල වෙනුවෙන් නොතිබුණු බව කනගාටුවෙන් වුවද පිළිගත යුතුම සත්‍යයකි. නමුත් ඒ හැඟීම උඩුයටිකුරු කරන්නට මේ වනවිට අපේ ක්‍රීඩකයන් සමත්ව සිටී.

'චලනය තුළ වූ ආත්මය' සෙවීමේ උතුම් කර්තව්‍ය පෙරදැරිව ඇරඹෙන පැරාලිම්පික් ක්‍රීඩා උළෙල වර්තමානය වනවිට සමස්ත ලෝකයේ අවධානය දිනා ඇත. සංවේදීත්වය, මහත්මා ක්‍රීඩාව ගැන ඕනෑතරම් උදාහරණ පැරාලිම්පික් ක්‍රීඩා උළෙලින් ගන්නට තිබීම සතුටට කරුණකි. එවන් උළෙලකට සහභාගි වීමම සත්‍ය වශයෙන්ම අභියෝගයකි. ඔලිම්පික් සහ පැරාලිම්පික් ක්‍රීඩාව ඉවුරු දෙකක පිහිටන්නේ වුවද ක්‍රීඩාවේ තීරණාත්මක බව අතින් නම් ඒවා එකම මට්ටමේය. ඔලිම්පික් උළෙල සේම පැරාලිම්පික් උළෙල නියෝජනයටද වරම් හිමිවන්නේ ශ්‍රී ලංකාවෙන්ම 9 දෙනෙකුට පමණි. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩාව ප්‍රධානව රඳා පවතින්නේ ආරක්ෂක අංශය මතය. එය ශ්‍රී ලංකාවේ පැරාලිම්පික් හෝ ඔලිම්පික් කියාද වෙනසක් නැත.

ලෝක පැරා ක්‍රීඩාව සහ ශ්‍රී ලංකාවේ පැරා ක්‍රීඩාව සසඳා බැලීමේදී එය ආරක්ෂක අංශයට විශේෂය. තිස්වසරක කුරිරු යුද්ධයේ අමිහිරි සෙවණැලි මේ විශේෂ අවශ්‍යතා ඇති තාරුණ්‍යයට ප්‍රධාන හේතුවක් වී ඇති බවට නොරහසකි. එය පැරාලිම්පික් රන් පදක්කම් ලාභී දිනේෂ් ප්‍රියන්තටද පොදු ය. ජාත්‍යන්තරය දෙස අවධානයෙන් බැලූවිට ඇමරිකාව හෝ මැදපෙරදිග රටවල් කිහිපයක් හැරුණු විට ඔවුන්ට යුද්ධයක් නොතිබිණි. අපේ බොහෝ තරුණ ක්‍රීඩකයන් විශේෂ අවශ්‍යතා ඇති අය බවට පත්වන්නේ සිය 'ඇට,මස් ලේ නහර' උතුම් මාතෘභූමිය වෙනුවෙන් කැප කිරීමෙනි. මේ කොන්දේසි විරහිත බැඳීම ඔවුන් අදටත් නොනැසී රැකගන්නා බවට මේ පදක්කම් දකින්නෙකුට අමුතුවෙන් පහදන්නට අනවශ්‍යය. ඒ ඔවුන්ගේ සිත්වල ඇති සැබෑ ශ්‍රී ලාංකේයත්වය වේ.

ශ්‍රී ලාංකේය පැරා ක්‍රීඩාවේ අවසන් රජ දැක්ම එළැඹෙන 2024 පැරිස් පැරාලිම්පික් උළෙලින් අවසන් වන්නට බොහෝ සෙයින් ඉඩ ඇති බවටද සැකයක් මතුව පවතී. රණවිරුවන්ට පින් සිදුවන්නට අපේ රටේ වූ යුද්ධය අවසන්ය. එය අවසන් ව අද වනවිට 12 වසරකම ගෙවී තිබේ. එම යුද්ධයෙන් ආබාධයන්ට ලක්වූ තාරුණ්‍යයද දැන් සිය ජීවිතයේ ශක්තිමත්ම වකවානුව ගෙවාදමමින් සිටියි. ලෝක දහමට අනුව හැමදාම ශරීර සවිය ඒ ආකාරයෙන්ම නොපවතින්නේය. මේ යුද විරුවන්ගේ ගත සවි ගිලිහුණු ද පැරා ක්‍රීඩාවේ වත්මන් සොඳුරුබව අපට අත්දැකිය හැකි වේද? එහෙයින් පැරා ක්‍රීඩාවේ හෙට දවස වූ මීළඟ වසර කිහිපය වෙනුවෙන් ක්‍රීඩා බලධාරීන්ට විශාල කාර්යභාරයක් ඉතිරිවී තිබේ.

එදා සිට අද දක්වාම රටේ ඇතිවූ සෑම ව්‍යසනයකදීම සහ තීරණාත්මක අවස්ථාවකදීම ඔවුන් අප වෙනුවෙන් පෙනී සිටිමින් ආරක්ෂක වළල්ලක් විය. ලාංකේය නාමයෙන් ජාත්‍යන්තරයේ දිගින් දිගටම වූ පරාජ රැල්ලටද තිත තබන්නට අද වනවිට ඔවුන් මැදිහත්ව තිබේ. නමුත් ක්‍රීඩාවේ අනාගතයද සැමවිටම ඔවුන් මත යැපීමටදී බලා නොසිට බලධාරීන් නව වැඩපිළිවෙළකට අවතීර්ණ විය යුතුය.

විදෙස් රටවල විවිධ ආකාරයේ විශේෂ අවශ්‍යතා ඇති ක්‍රීඩකයන් පැරාලිම්පික් බිමේ සුලබව



දකින්නට තිබේ. එවන් ක්‍රීඩකයකු හෝ ක්‍රීඩිකාවක විදෙස් රටක ඔලිම්පික් උළෙලක් නියෝජනය දක්වා රැගෙන ඒමම අභියෝගයකි. නමුත් එවන් රටවල එම අභියෝග භාරගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට එම අවස්ථා නිර්මාණය කර දෙන්නටද සාර්ථක වැඩපිළිවෙළවල් ඇති බව අවිවාදයෙන් පිළිගත යුතුය. එසේම එවන් රටවල් ආබාධිත වූවන් වෙනුවෙන් එය අනිවාර්ය සුබසාධනයකි.

යුද ගිනි මැදින් අභියෝග ජය ගන්නවුන් සිය ජාත්‍යාලය නිසා මෙලෙස ක්‍රීඩාව වෙනුවෙන් ඉදිරියට පැමිණියද සෙසු විශේෂ අවශ්‍යතා ඇතිවුවන්ටද එම මාර්ගය සලසාදීමට කල්තියාම වැඩපිළිවෙළක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව පැන නැගී තිබේ.

මව් කුසින් ඉපදුණු ද සිට මෙවන් විශේෂ ආබාධ ඇත්තන් පූරුවේ කරුමය නිදහසට කරුණක් කර ගනිමින් අභියෝග අත් හරින්නට පුරුදු කරන සහ සමාජයේ හැල්ලුවට වෙනසකට ලඝු කරන අනුවණයන්ට අද දිනේෂ් ප්‍රියන්ත ඇතුළු පිරිවර කදිම පිළිතුරක් දී අවසානය. විශේෂ අවශ්‍යතා ඇති අය 'අවවශේෂ' ලෙස නොසලකා සෙසු පිරිස හා සමලෙස සලකන්නට සාර්ථක ක්‍රමවේදයක් හෝ නිර්මාණය කිරීමට ජාතික ක්‍රීඩා සභාවටද විශාල වගකීමක් තිබේ.

දෑස නොපෙනී, දෙපා වාරු නොමැත්තන් රටේ ධජය ඉහළ අහසේ රඳවන්නට වන වෙහෙස වෙනුවෙන් ඔවුන් සිය දයකත්වය දැක්විය යුතුමය. මෙවන් අවශ්‍යතා ඇති කුඩා දරුවන්, කාන්තාවන්ට සමාජයේ විඳින්නට වන දුක් ගැහැට, අපහාස සේම අපහරණද අපට ඇසෙන්නට තිබේ. එවන් දේ වැලකි යෑමට නම් ඔවුන්ගේ 'ක්‍රීඩා සාක්ෂරතාව" වෙනුවෙන් වැඩපිළිවෙළක් ද ඇරඹිය යුතුය.

2012 වසරේ වූ දත්ත වලට අනුව ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 5ට වැඩි පුද්ගලයන්ගෙන් 8.7%ක පමණ සංඛ්‍යාවක් කුමන හෝ ආබාධයකින් පෙළෙන බවට වාර්තා වේ. ඉන් වයස අවුරුදු 18-60ත් අතර එම සංඛ්‍යාව ලක්ෂ 3කට ආසන්නය. මෙය නිසැකවම 2021 වසර වනවිට වර්ධනය වී ඇතැයි සඳහන් වේ. ඒ පුද්ගලයන් අතර ක්‍රීඩාවට දස්කම් ඇති පුද්ගලයන් 1000ක් වත් සොයාගත හොත් එය රටේ සමාජයටත්, ඔවුන්ගේ ජීවිතයේ ඉදිරි ගමනටත් මනා ශක්තියකි. මෙම පුද්ගලයන් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් වන්නේ නම් දේශපාලකයා මොවුන්ව නිසැකවම මැතිවරණය වන තුරු හෝ බලා ගන්නට සැදී පැහැදී සිටින්නේය. නමුත් එතැනින් එහාට නැවත ඔවුන් වෙනුවෙන් සිටින්නේ බල නොලත් යම් යම් සංවිධාන පමණි. ඇතැම් සංවිධාන මේ වෙනුවෙන් සත් භාවයෙන් කැප වුණද ඇතැමෙක් වාසිය තකා පමණක් ඒ වෙනුවෙන් පෙනී සිටින්නේය.

ශ්‍රවණාබාධිත ක්‍රිකට් ක්‍රීඩකයන් මේ වනවිටද ශ්‍රී ලංකාවට ලෝක කුසලානයක්(2018 ලෝක ශ්‍රවණාබාධිත විස්සයි විස්ස ලෝක කුසලානය) රැගෙන විත් තිබේ. දෘශ්‍යාබාධිත ක්‍රිකට් ක්‍රීඩකයන්ද දස්කම් අතර පැමිණ සිටී. ඒ අතරට දැන් පැරා මලල ක්‍රීඩාව, රෝද පුටු ටෙනිස් සහ දුනුවිදීම ඇතුළත් ව සිටී.

2016 වසරේදී ද දිනේෂ් ප්‍රියන්ත පැරාලිම්පික් ලෝකඩ පදක්කමක් ශ්‍රී ලංකාවට දිනා දෙන්නට සමත්වූයේය. නමුත් එය එතරම් ම ගණනකට ගන්නට එවක සිටි ඇත්තන් විශේෂයෙන් වෙහෙසුණු බවක් දක්නට නොවීය. නමුත් මෙවර නම් අඩුපාඩු මග හරවා ගන්නා බවක් පෙනෙන්නට තිබේ. එය දිනේෂ්ලාගේ පමණක් නොව පැරා ක්‍රීඩාවේ සහ විශේෂ අවශ්‍යතා ඇති 8.7%කගේම ජයග්‍රහණයකි. නුදුරු අනාගතයේදීම විශේෂ අවශ්‍යතා ඇති සාමාන්‍ය වැසියන් සොයා ඔවුන් ගැන වෙහෙසෙන්නට සාර්ථක වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. සය මසකට වරක් හෝ ඔවුන්ගේ තත්ත්වය, හැකියාවන් සොයා බලා එයට විදෙස් පැරා ක්‍රීඩාවේ දියුණු උපක්‍රමද අත්හද හෝ විමසා බැලිය යුතුය. අකර්මණ්‍ය වූ සංගම්, සම්මේලන නැවත අළු ගසා අවදිවන්නට කාලය එළැඹ තිබේ.

එය ඉදිරියට ගන්නට වෙහෙස වීමම පැරීසියෙන් ඔබ්බට පැරාලිම්පික් සිහින හැබෑ කරන්නට හේතුවනු ඇත.

**චතුර රණසිංහ**

# ක්‍රීඩාව සුන්දරද මෙතරම්...

රටේ කොවිඩ් අසාදිතයන් කීයද? කී දෙනෙක් මැරිලාද? ආයෙත් රට විවෘත කරන්නේ කවදද? බඩුවල මිලනම් ගිනි ගණන් නේද? අපේ රටට ආර්ථිකය අතින් ගොඩ එන්න බැරි වෙයිද?.... මේ යමක් කමක් තේරෙන ඕනෑම අයෙකුගේ මුවින් මේ දිනවල නිතර පිට වෙන වදන්ය.



දිනේෂ් ප්‍රියන්ත



සමිත දුලාන්



අවිශ්ක ප්‍රනාන්දු

ලංකාවේ ජනතාවට සාමාන්‍ය ජන ජීවිතයේ කටයුතු හිතේ නිදහසකින් කර ගැනීමට නොහැකිව දැන් වසර එකහමාරකටත් කිට්ටුය. නිරන්තරයෙන් ඇසෙන මේ වදන් දෙස බලනකල පෙනී යන්නේ ශ්‍රී ලංකා වාසීන් සිටිනුයේ යම් තැති ගැන්මක බවය. ආතතියක බවය. අවිනිශ්චිතතාවක බවය.

සෞඛ්‍ය අංශ වයිරසය මර්දනය කිරීම වෙනුවෙන් කළ හැකි උපරිමය කරමින් සිටී. රටේ තත්ත්වය යහපත් අතට ගැනීම වෙනුවෙන් සෑම අයෙක්ම අපහසුකම් විඳදරාගෙන සිය දයකත්වය ලබා දේ. සමහරෙක් නිවෙස්වල සිට රාජකාරියේය. තවත් සමහරෙක් කොවිඩ් මාරයා කොහේ සිටීදෝ යන බියෙන් කළ හැකි දෙයක් නොමැති තැන සිය රාජකාරි බලා පිටත් වන්නෝය.

ඉකුත් 2020 වසරේ මාර්තු මාසයේ සිට මෙරට දරුවන්ට පාසල් අධ්‍යාපනය හැදෑරීමට කොවිඩ් මාරයා තහංචි දමා ඇත. සෑම ක්ෂේත්‍රයකම ඇත්තේ දුක්ඛ දෝමනස්සයන්ය. කොටින්ම ශ්‍රී ලංකා ජනතාවගේ සතුට කොවිඩ් මාරයා හොරාගෙනය. එබැවින් මුළු ශ්‍රී ලංකාවම සිටිනුයේ කොවිඩ් මාරයා හමුවේ පරාජිත මානසිකත්වයකය.

අවුරුදු එකහමාරක් තිස්සේ දරා සිටි එකී පරාජිත මානසිකත්වය මොහොතකට අමතක කළ හැකි අයුරේ ජයග්‍රහණ කිහිපයක් ශ්‍රී ලංකා ක්‍රීඩා විරුවන් විසින් රැගෙන ආවේ එකී මානසිකත්වයට යම් අස්වැසිල්ලක් ගෙන දෙමිණි.



ඔෂිණි දේවිනයා

ඉන් එක් ජයග්‍රහණයක් වූයේ දිනේෂ් ප්‍රියන්ත සහ සමිත දුලාන් හෙල්ලයෙන් එල්ලය ගෙන පැරාලිම්පික් උළෙලේදී ශ්‍රී ලංකාව රණින් සහ ලෝකඩින් සැරසීමය. කොතෙකුත් දුෂ්කරතා හමුවේ වුවද, ශ්‍රී ලංකා වාසීන් එකම අරමුණක හිඳිමින් ඒ වෙනුවෙන් එකාමෙන් හුරේ දැමුවේ උද්ගත තත්ත්වය ද මඳකට අමතක කරමිනි.

මේ සතියේම ශ්‍රී ලංකාව වෙනුවෙන් ලද තවත් සුවිශේෂී ජයග්‍රහණයක් වූයේ ලෝක යොවුන් චෙස් ශූරතාවලියේදී ඔෂිණි දේවිනාය ශූරිය වීමය. පසුගිය ද පැවැති ෆිඩේ ලෝක යොවුන් චෙස් ශූරතාවලියේ වයස අවුරුදු 10න් පහළ බාලිකා අංශයේ තරග වදිමින් ඇය ශ්‍රී ලංකාව අංක එක ස්ථානයෙන් ඔසවා තැබුවාය. ලොවක් ඉදිරියේ අංක එකට පැමිණීමට ඇයට ගුරුහරුකම් ලබාදෙන ලද්දේ අකිල කාවින්දය.

මෙම ජයග්‍රහණයන් ජයකෙහෙළි නංවන තත්ත්වයක් දක්වා රැගෙන ආවේ දසුන් ශානක ප්‍රමුඛ ශ්‍රී ලංකා එක්දින ක්‍රිකට් කණ්ඩායමය. ජයග්‍රහණයේ අවාරයකට මුහුණ පා සිටි ශ්‍රී ලංකා කණ්ඩායම දකුණු අප්‍රිකාව සමගින් ආරම්භ වූ එක්දින ක්‍රිකට් තරගාවලියේ පළමු ජය ලැබුවේ කලකට පසුව ලකුණු 300 සීමාවට ද පැමිණෙමිනි.

අනෙකුත් සෑම ක්‍රීඩාවකටම වැඩියෙන් ශ්‍රී ලංකා ප්‍රේක්ෂකයාගේ ලෙයට කා වැදී තිබෙන ක්‍රිකට් ක්‍රීඩාව යොවුන් ක්‍රීඩකයන් සමගින් මේ රැගෙන තියෙන නව ආරම්භය පිළිබඳ සැවොම ගුණ ගී වයන්නේ හිතේ තිබ්බ දුක සංකා මොහොතකට තුරල් කරමිනි.

කොටින්ම මෙම ජයග්‍රහණයන් කොවිඩ් මාරයා හමුවේ බැට කා සිටින ශ්‍රී ලංකා ජනතාවගේ හිතට යම් සුවයක් ගෙන ආවේය. ක්‍රීඩාව යනු ජාතියක් සුවපත් කරන ඔසුවක් බව සතියක කාලයක තුළ තෙවරක්ම ඔප්පු විය. ජාතියක් එකම අරමුණක ඒකාත්මික කිරීමෙහිලා ක්‍රීඩාව හැර අනෙකක් නොමැති බව යළි යළිත් ඔප්පු විය. මෙරට ඉතිහාසයේ අසුන්දරම මොහොතක ඒ අසුන්දර මතකයන් සුන්දර ජයග්‍රහණයක දියකරහැරි මෙරට ඉතිහාසයේ සුන්දරම ක්‍රීඩා සතියක් මෙලෙසින් ගෙවී ගියේය.

**ගයාශාන් විතානආරච්චි**

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

සති අග අරුණ
2021 සැප්තැම්බර් 05
ඉරිදා









සුරංගි සහ පැටවුන් දෙදෙනා

# පින්නවල සුරංගිට අලි බබාලාම දෙන්නයි

අලි ඇත්තු ගැන ඇත්තේ අමුතුම කතාය. ඒ කතා අතරේ පසුගිය අඟහරුවාද එනම් අගෝස්තු 31 වැනිදා පින්නවල අලි අනාථාගාරයෙන්ද අලුත්ම අලි කතාවක් අසන්නට ලැබුණි. ඒ එහි කෙනරක් නිවුන් අලි පැටවුන් දෙදෙනකු බිහිකළ පුවතයි.

**මේ පුවතත් සමගම බොහෝ දෙනා තුළ සැකයක් මතුවූයේ නිවුන් අලි උපත් සිදුවිය හැකිද යන්නයි. මේ ගැන අලි ගැන විශේෂඥ දැනුමැත්තෙක් නම් කියන්නේ ඇතින්නකට හෝ කෙනරකට නිවුන් පැටවුන් බිහිකිරීමට නොහැක්කත් නොමැති බවයි. එහෙත් එවන් උපත් ඉතාම විරලය. පින්නවල අලි අනාථාගාරයේ නිවුන් අලි දරු උපත විශේෂ වන්නේ ඒ නිසාය. එසේම මෙම නිවුන් අලි දරු උපත පින්නවල අලි අනාථාගාරයේ පළමු නිවුන් අලි දරු උපතයි. ඒ පමණක්ද නොව මෙරට සත්වෝද්‍යාන ඉතිහාසයේද ප්‍රථම නිවුන් අලි දරු උපතයි.**

ඒ අනුව මෙකී සුවිශේෂී නිවුන් අලි දරු උපතට මාතෘත්වය දෙන්නී පින්නවල අලි අනාථාගාරයේ හැදී වැඩුණ 'සුරංගි' නමැති කෙනරයි. සුරංගි පින්නවල අලි අනාථාගාරයට එන්නේ මීට අවුරුදු 24



ඡායාරූපය: සාලිය ගමසිංහආරච්චි

කට ඉහතදී එනම් 1997 වසරේ දෙසැම්බර් මස තුන්වැනිදය. ඒ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සුරපොල්ගම නමැති ගම්මානයේ අතරමංව සිටියදීය. පින්නවල අලි අනාථාගාරයේ තොරතුරු කියන හැටියට නම් සුරංගි පින්නවලට රැගෙන එනවිට ඇගේ වයස අවුරුද්දක්වත් නැති තරම්ය.

## තාත්තා පණ්ඩුට දාහතයි

පින්නවල ප්‍රථම නිවුන් අලි දරු උපතට පීතෘත්වය දුන්නේ 'පණ්ඩු' නම් හස්තියාය. පණ්ඩුගේ නිවහනද පින්නවල අලි අනාථාගාරයමයි. මේ වනවිට දහත් වැනි වියේ පසුවන පණ්ඩු පින්නවල අලි අනාථාගාරයට රැගෙන විත් ඇත්තේ 2004 වසරේදීය. වනජීවී නිලධාරීන් පණ්ඩු හමුවී ඇත්තේ වව්නියාව, සෙට්ටිකුලම ප්‍රදේශයේ කැලෑ රොදක අතරමංව සිටියදීය. පින්නවලට එනවිට පණ්ඩුටත් වයස අවුරුද්දක්වත් ඇති නැති තරම්ය.

**පින්නවල අලි අනාථාගාරයේ මතු නොව ජාතික සත්වෝද්‍යාන ඉතිහාසයේද සුවිශේෂී සටහනක් තබමින් පණ්ඩු, සුරංගි සුසංයෝගයෙන් උපන් නිවුන් පැටවුන් දෙදෙනාම පිරිමි පැටවුන් වීමද විශේෂත්වයකි. සුරංගී සිය නිවුන් අලි පැටවුන්ගෙන් පළමුවැන්නා බිහිකළේ පසුගිය අඟහරුවාද එනම් අගෝස්තු 31 වැනිදා පාන්දර 4.30 ට පමණය. දෙවැනි පැටියා බිහිකළේ පෙරවරු 10 ට පමණය. මේ වනවිට පැටවුන් දෙදෙනාම හොඳ සුවයෙන් පසුවන බව සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු බලධාරීහු පවසති.**

පසුගිය 31 වැනිදා නිවුන් දරු උපතක් සිදුකරන විටද සුරංගී එක්දරු මවකි. ඒ ද පිරිමි දරුවෙකි. 2005 වසරේදී ඇය බිහිකළ කණුක නමැති අලි පැටවා මේ වනවිට දහසය වැනි වියේ පසුවන්නේය. එම පැටවාද සිටින්නේ පින්නවලමය.

මුලින් කී පරිදිම අලි ඇතුන් පිළිබඳ විශේෂඥ දැනුමැත්තෝ කියන හැටියට කෙනරක් හෝ ඇතින්නක් නිවුන් දරු උපතක් සිදුකිරීම අමුතු දෙයක් නොවේ. එහෙත් එය ඉතාම විරල දෙයකි. එසේ නිවුන් දරු උපතක් සිදුවුවද බොහෝවිට පැටවුන් ජීවත්වීම සැක සහිතය. ඇතැම් විට බිහිකරන පැටවුන් දෙදෙනාගෙන් එකෙක් මළදරු උපතක් විය හැක්කේය. ඇතැම් විට අනික් පැටවා වුවද වැඩි කලක් ජීවත්වීමට වාසනාව නොලබන්නේය.

ඉතිහාසය පිරික්සන විට ලංකාවේ පළමු වතාවට නිවුන් අලි දරු උපතක් වාර්තා වන්නේ 1941 තරම් ඈත කාලයේදීය. ඒ බලන්ගොඩ බාන්ස් රත්වත්තේ අලි ගාලේ සිටි කෙනරකි. ඒත් ඒ පිළිබඳ වැඩි විස්තරයක් නැත්තේය. ඉන්පසුව නිවුන් අලි දරු උපතක් ලංකාවෙන් ඇසෙන්නේ 2014 වසරේදීය. ඒ හම්බන්තොට ප්‍රදේශයෙනි. එහිදී එක් පැටවකු මව හා රංචුව විසින් අතරමං කර දමා ගොස් සිටියදී ප්‍රදේශවාසීන්ට හමුවී වනජීවී නිලධාරීන් වෙත බාරදී තිබූ බවද තොරතුරුවල සඳහන් වේ. ඉන් අනතුරුව 2018 වසරේදීත් නිවුන් අලි දරු උපතක් ගැන මාදුරුඔය ජාතික



2018 වසරේදී මාදුරුඔය ජාතික වනෝද්‍යානයේ නිවුන් අලි පැටවුන් මියගොස් තිබූ අයුරු

වනෝද්‍යානයෙන් අසන්නට ලැබුණි. එම නිවුන් පැටවුන් බිහිකර තිබුණේ එම වනෝද්‍යානයේ පනිජ්ජාඔය ප්‍රදේශයේ සැරිසැරූ කෙනරක විසින් බව වනජීවී නිලධාරීන් වාර්තා කර තිබිණි. එහෙත් ඒ පැටව් දෙදෙනාම මියගොස් තිබුණු අතර වනජීවී නිලධාරීන්ට හමුවී තිබුණේ එම පැටවුන්ගේ මළ සිරුරුය. එසේ එම පැටවුන් දෙදෙනා මියයාමට හේතුව අඩු වයසෙන් බිහිවීම නිසා විය යුතු බවද පශු වෛද්‍යවරු සඳහන් කර තිබුණි.

ඊයේ පෙරේදා පින්නවල අලි අනාථාගාරයේ නිවුන් අලි දරු උපතට ආසන්නයේම ලංකාවෙන් නිවුන් අලි දරු උපතක් වාර්තා වූයේ පසුගිය වසරේදීය. 2020 ජූලි මස 3 වැනිදා මින්නේරිය ජාතික වනෝද්‍යානයේ සිටි වයස අවුරුදු තිහක් පමණ වන ඇතින්නක් මෙම නිවුන් පැටවුන් බිහිකර තිබුණි. අලි ඇතුන් පිළිබඳ මෙරට සිටින ප්‍රමුඛ පෙළේ පර් යේෂකයෙකු වන ආචාර්ය සුමිත් පිලපිටිය සහ මින්නේරිය ජාතික වනෝද්‍යානයේ නිලධාරීන් විසින් මෙම ඇත් පැටවුන් දෙදෙනා නිරීක්ෂණය කර තිබුණි. එම නිවුන් පැටවුන් දෙදෙනා පිරිමි සහ ගැහැනු සතුන් වූ අතර ආචාර්ය පිලපිටියම පවසා තිබුණේ ඔවුන් දෙදෙනා ඊට මාසයකට පමණ පෙර එනම් 2020 ජූනි මාසයේදී උපත ලබා ඇති බවට අනුමාන කරන බවයි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙසේ මින්නේරිය ජාතික වනෝද්‍යානයෙන් හමුවූ පැටවුන් දෙදෙනා හාතිය හා හාගයා ලෙසින් නමකර තිබුණි. කනගාටුවට කරුණ නම් මෙම පැටවුන් දෙදෙනාගෙන් එක් අයකු දැනට මාස කීපයක සිටම වනජීවී නිලධාරීන්ගේ නිරීක්ෂණයට ලක් නොවීමයි. එමනිසා එම අතුරුදන් අලි පැටවා සෙවීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ත්‍රිපුද්ගල කමිටුවක්ද පත්කර තිබේ. වනජීවී අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරියබණ්ඩාර පවසන්නේ මෙම කමිටුව සඳහා එම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙක්, උද්‍යාන භාරකරුවෙක් හා පශු වෛද්‍යවරයෙක් පත්කර ඇති බවයි.

### ආසියාවේ නිවුන් අලි දරු උපත්

**● 1941 දෙසැම්බර්**

ශ්‍රී ලංකාවේ බලන්ගොඩ මහවලතැන්න වලව්වේ බාන්ස් රත්වත්තේට අයත් ඇතින්නක නිවුන් අලි පැටවුන් බිහිකර තිබේ. එක් පැටවකු උපත ලබන විටම මියගොස් තිබූ අතර ඇනෙක් පැටවා උපතින් විනාඩි 90 කට පසු මියගොස් ඇත.

**● 1971 මැයි**

ඉන්දියාවේ තමිල්නාඩුවේ මුදුමලේ ජාතික වනෝද්‍යානයේ අලි පුහුණු මධ්‍යස්ථානයේදී දේවිකා නමැති ඇතින්න සුජය හා විජය නමින් පිරිමි අලි පැටවුන් දෙදෙනාට උපත දුන්නාය.

**● 2008 නොවැම්බර්**

නේපාලයේ චිත්වාන් ජාතික වනෝද්‍යානයේ අලි අභිජනන මධ්‍යස්ථානයේ වයස අවුරුදු 40 ක් වයසැති දේවි කාලි ඇතින්න නිවුන් අලි පැටවුන් බිහි කළාය. පැටවුන් දෙදෙනා රාම් රාජ් හා ලක්ෂ්මන් රාජ් ලෙස නමකර තිබුණි.

**● 2010 මාර්තු**

තායිලන්තයේ සුරින් පළාතේ කාලැඩ් ප්‍රදේශයෙන් නිවුන් පිරිමි අලි උපතක් සිදුවිය. ඔවුන් දෙදෙනා මැන්ග් මී හා ශ්‍රී සූක් යනුවෙන් නමකර තිබේ. මව් කෙනර තිස්පස් හැවිරිදි පැන් කෝ කැන්ය.

**● 2010 නොවැම්බර්**

තායිලන්තයේ චෙංග්මායිහිදී නිවුන් ගැහැනු අලි දරු උපතක්. දෙදෙනාට තෝං තාං හා තෝං කම් ලෙස නමකර ඇත. මව තිස් හැවිරිදි ඇතින්නකි.

**● 2010 දෙසැම්බර්**

ඉන්දියාවේ ඇසෑම් ප්‍රාන්තයේ ඕරාන් ජාතික වනෝද්‍යානයෙන් නිවුන් අලි දරු උපතක් වාර්තා වූ අතර කෙනර ආලෝකා වූවාය.

## අම්මා සුරංගිට විසිහතරයි



සාමාන්‍යයෙන් ඇතින්නකගේ ගැබිනි සමය වසර දෙකක් ලෙස සැලකේ. ඒත් ඇතින්නක් සාමාන්‍යයෙන් මාස දහඅටක්, විසිතුනක් අතර කාලයකදී පැටවුන් බිහි කරන්නී. ගැහැනු පැටවෙක් නම් මාස 18 ත්, 20 ත් අතර ගැබ් කාලයක්ද, පිරිමි පැටවකු නම් මාස 20 - 21 කාලයකුත්, දළ ඇත් පැටවකු නම් මාස 22 - 23 ත් අතර කාලයකින් බිහිවේ. නිවුන් දරු උපතේදී සිදුවන්නේ බොහෝවිට අඩු වයසෙන් පැටවුන් බිහිවීමයි. හේතුව මව් ඇතින්නට කුස තුළ සිටින පැටවුන්ගේ බර වැඩිවීමයි.

ඇතින්නක් හෝ කෙනරක් නිවුන් අලි පැටවුන් බිහිකළ පසුව එම පැටවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැන විවිධ ගැටලු මතුවන බවද වනජීවියට සම්බන්ධ පශු වෛද්‍යවරුන්ගේ මතයයි. ප්‍රධානම ගැටලුව වන්නේ මව් කිරි පැටවුන් දෙදෙනා අතර බෙදී යාමයි. මෙහිදී පැටවුන්ගේ පෝෂණ ගැටලුව මතුවේ. බොහෝ විට මෙවන් අවස්ථාවලදී අසාධාරණයක් සිදුවන්නේ ගැහැනු පැටවාටය. පෝෂණය මද වීමෙන් එම පැටවා මියයාමට බොහෝ දුරට ඉඩ ඇති බවද ඔවුහු පෙන්වා දෙති.

අද වනවිට මෙරට අලි ගහනය



අලි පැටවුන්ට වෛද්‍ය රැකවරණය

හයදහස ඉක්මවා සිටින බවට වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කරනු ලැබුවත්, අලින්ට අද අත්ව තිබෙන ඉරණම ඉතා ශෝචනීය බව පරිසරවේදීහු සඳහන් කරති.ඊට හේතුව නම්, හක්ක පටස්, වෙඩි තැබීම, අනවසර විදුලි රැහැන් වගා බිම්වලට යෙදීම ආදී විවිධ කාරණා මත දිනෙන් දින ඝාතනයට ලක්වන අලි ප්‍රමාණය ඉහළ අගයක් ගැනීමය.

මේ වසරේ ජනවාරි මස පළමුවැනිද සිට මෙමස (අගෝස්තු) අට වැනිද දක්වා වූ කාලය තුළදී අලි මරණ 219 ක් සහ අලි පහරදීම් නිසා පුද්ගලයන් 88 දෙනකු මියගොස් ඇතැයි වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කරයි. ඉකුත් වසරේ (2020) ජනවාරි මස පළමුවැනිද සිට අගෝස්තු දක්වා වාර්තාවී තිබූ අලි මරණ සංඛ්‍යාව 187 කි. අලි පහරදීම් නිසා මියගිය පුද්ගලයන් සංඛ්‍යාව 63 කි. ඉකුත් වසරේදී වාර්තා වූ සමස්ත අලි මරණ සංඛ්‍යාව 327 කි.

**මේ වසරේ ජනවාරි සිට මේ දක්වා වූ කාලය තුළදී සිදුවී තිබෙන අලි මරණ 219 අතුරින් වැඩිම ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ හක්ක පටස් හේතුවෙනි. මේ වසරේ අලි මරණ අතුරින් 44 ක් අනුරාධපුර වනජීවි කලාපයෙන්ද, 42 ක් පොළොන්නරුව වනජීවි කලාපයෙන්ද, 40 ක් නැගෙනහිර වනජීවි කලාපයෙන්ද, 19 ක් දකුණු වනජීවි කලාපයෙන්ද, 16 ක් වයඹ වනජීවි කලාපයෙන්ද, 14 ක් වව්නියාව වනජීවි කලාපයෙන්ද, 10 බැගින් ත්‍රිකුණාමලය සහ ඌව වනජීවි කලාපයෙන්ද, 06 ක් පුත්තලම වනජීවි කලාපයෙන්ද, 03 ක් කිලිනොච්චිය වනජීවි කලාපයෙන්ද, 02 ක් උඩවලව ඇත් අතුරු සෙවණෙන්ද වාර්තා වේ. තත්ත්වය මෙසේ තිබියදී සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු පාලනය කරන වනජීවී රැකවරණය, අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කර ඇති ගැසට්ටුව මෙරට අලි ගහනයට වින කරන්නක් බවද පරිසරවේදීහු පවසති.**

වසර තිහකට පසුව හීලෑ අලි ඇතුන් ලියාපදිංචි කිරීමේ නියෝග යාවත්කාලීන කිරීම යැයි පවසමින් අලි ඇතුන් ජාවාරමකට එම ගැසට්ටුව මගින් පාර කපා ඇතැයිද ඔව්හු කියති.

සාලිය කුමාර ගුණසේකර

# කොරෝනාවට ලාමාගෙම පිහිටයි

තම රටින් කොරෝනා තුරන් වූවා යැයි සිතූ නවසීලන්ත වැසියෝ මහත් සේ උද්දම් වූවෝය. ඒත් ඔවුනට ඒ සතුට මාස දෙකක්වත් භුක්ති විඳින්නට ලැබුණේ නැත. පසුගිය දවසක යළිත් එරටින් ඩෙල්ටා ප්‍රභේදය ආසාදිතවූවකු හමුවූයේ නවසීලන්තයේ සතුටට යළි තිත තබමිනි.

චීනයත් කොවිඩ් හි දරුණුම ප්‍රභේදය වන ‘ඩෙල්ටා ප්‍රභේදය’ මැඩ පැවැත්වූවාය. ඒත් ගිය සතියේදී චීනයේ සිදුකළ අහඹු ඇන්ටිජන් පරීක්ෂාවකින් එක් ඩෙල්ටා ප්‍රභේදය සහිත ආසාදිතයකු සොයා ගැනුණේ කොවිඩ් වයිරසයෙන් ගැළවීමක් නම් නැතැයි කියන්නාක් මෙනි.

මේ දිනවල ලෝකයේ හැම කොනකම විශ්වවිද්‍යාල වෛද්‍ය පර්යේෂණ ආයතන සහ විද්‍යාඥයන් කොවිඩ් පරාජය කළ හැකි එන්නතක් හෝ ඖෂධයක් සොයමින් දිවා රෑ වෙහෙස වන්නෝය. එහි අලුත්ම බලාපොරොත්තුව පසුගිය දිනෙක බෙල්ජියම, ඇමරිකාව සහ බ්‍රිතාන්‍යයෙන් අසන්නට ලැබුණි.

මෙම අලුත් බලාපොරොත්තුව මුලින්ම ලෝකයට ගෙනෙන්නේ බෙල්ජියමයි. ඔවුන් 2016 වසරේදී සාර්ස් සහ මර්ස් රෝග මර්දනයට අලුත් සොයා ගැනීමක් සිදුකරමින් සිටියහ. ඒ දකුණු ඇමරිකාවට අවේණික සත්ත්ව කාණ්ඩයක් වන ලාමා සත්ත්වයන් යොදා ගනිමිණි. මේ ලාමා සත්ත්වයන් ජීව විද්‍යාත්මකව ඔටුවන්ගේ පවුල අයත් සත්ත්ව කොටසකි.

වසර විස්සකට අධික කාලයක් ජීවත්වන ලාමාගේ ස්වාභාවික වාසභූමිය වන්නේ ලතින් ඇමරිකාවේ ඇන්ඩියන් කඳුකරය, බටහිර බොලීවියාවේ ඇල්ටිප්ලානෝ සහ ගිනිකොනදිග පේරු රාජ්‍යයි. වනාන්තර ආශ්‍රිත ජීවත් වූ ඔවුන් අද වනවිට ගොවි පොළවල්වලට සීමා වී තිබේ.

මේ සතුන්ගෙන් ඇති විශේෂත්වය වන්නේ ඔවුන්ගේ දිගු ලෝම ලණු සහ රෙදි සෑදීම සඳහා බහුලව යොදා ගැනීමයි. අද ඔවුන් ලෝකය දකින්නේ කොරෝනා නම් රාක්ෂයාව පන්නා දැමීමට සිටිනා සුරදූතයන් ලෙසයි. ඒ කොවිඩ් වයිරසය පැරදවීමට ලාමා සත්ත්වයන්ගේ ප්‍රතිදේහ උපකාරී වන බැවිණි.

මේ සඳහා ලාමා සත්ත්වයන් උපයෝගී කරගත යුතුයැයි මුලින්ම අදහස පහළ වන්නේ වෛද්‍ය නිලධාරි ඩොමිනික් ටර්සාගෝටය. ඔහු බෙල්ජියමේ ගෙන්ට් හි VIB-UGent වෛද්‍ය ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයේ ප්‍රධාන වෛද්‍ය පර්යේෂකයාය. ඔහුගේ මඟ පෙන්වීම අනුව එතෙක් ආරම්භ කර තිබූ සාර්ස් සහ මර්ස් රෝග මර්දන වැඩසටහන අදට ගැළපෙන පරිදි කොවිඩ් වයිරසය මර්දනය කිරීම සඳහා හුවමාරු කිරීමට වෛද්‍ය පර්යේෂකයන් තීරණය කළහ.

එහිදී, ඔවුන්ගේ විද්‍යාත්මක පර්යේෂණයේ වැදගත්ම තැනැත්තා වූයේ ‘වින්ටර්’ නම් ලාමා සත්ත්වයාය. එම සත්ත්වයාව සොයාගෙන ඇත්තේ බොලිවියාවේ සත්ත්ව ගොවිපලකින්ය. මාස කිහිපයක කාලයක් ‘වින්ටර්’ ව අධ්‍යනය කළ පර්යේෂකයන් ඌ සෞඛ්‍ය සම්පන්න සත්ත්වයෙක් ලෙස නම් කළේය.



ඉන්පසුව, නවතම පර්යේෂණයේ මූලික වැඩකටයුතු ආරම්භ විය. එහිදී, ඔවුන් මුලින්ම සිදුකළේ නිරෝගී ‘වින්ටර්’ හට සජීවී කොවිඩ් වයිරසය එන්නත් කිරීමයි. ඉන් අනතුරුව ‘වින්ටර්’ගෙන් ලබාගත් රුධිරය නිරීක්ෂණය කර එහි කොවිඩ් වයිරසය වර්ධනය වී ඇත්දැයි සොයා බලන්නේය. ඒ ආකාරයට දින කිහිපයක්ම සජීවී කරන ලද කොවිඩ් එන්නත් ලාමා සත්ත්වයාට ලබාදුන්නත් ඌගෙ ශරීරයෙන් කිසිදු රෝග ලක්ෂණයක් මතුවූයේ නැත.

ඒ නිසා ම ලාමාගේ ශරීරයේ ප්‍රතිදේහ රසායනාගාර පරීක්ෂණයක් සඳහා යොමු කිරීමට වෛද්‍ය නිලධාරි ඩොමිනික් ටර්සාගෝ ඇතුළු පර්යේෂකයන් කණ්ඩායම තීරණය කළහ.

කෙසේවෙතත්, එම පර්යේෂණය සියල්ලන්ටම විස්මය දනවන සුළු ප්‍රතිඵලයක් ගෙන ආවේය. එනම්, ලාමා සත්ත්වයන් ස්භාවිකවම නිර්මාණය වී ඇත්තේ කොරෝනා වයිරසය හා සටන් කළ හැකි ප්‍රතිදේහයක් සමග බව ඔවුන් සොයා ගත්හ. එසේම ඒ ප්‍රතිදේහයට ශරීරයට ඇතුළුවන කොවිඩ් වයිරසය ක්ෂණයකින් බිඳ දැමීමටත් හැකි බවද මේ පරේය්ෂකයන්ට නිරීක්ෂණය විය.

එපමණක් නොව, පර්යේෂණයේදී ලාමා සතුන්ගේ ප්‍රතිදේහ SARS-CoV-2 වයිරසයේ අඩංගු ස්පයික් ප්‍රෝටීන සමග තදින් බන්ධනය වී තිබෙන අයුරු ඔවුන්ට දැකගැනීමට ලැබුණි. ඒ නිසා කොවිඩ් වයිරසය මිනිස් සෛල තුළට යාම වැළැක්වීමට සහ ආසාදනය වීම නැවැත්වීමට මෙම අලුත් සොයා ගැනීම උපකාරී වන බව පර්යේෂකයන් පෙන්වා දෙති.

ඒ අනුව ලාමා සතුන්ගේ ශරීරයේ ඇති විශේෂිත වූ ප්‍රතිදේහ කොවිඩ් 19 වයිරසය වැළඳී ඇති රෝගීන් සඳහා ප්‍රතිකාරයක් ලෙස දියුණු කළ හැකි යැයි ඔවුහු බලාපොරොත්තු වෙති. ඒ කොවිඩ් වැළැක්වීමේ එන්නතක් වශයෙනි. එහි සායනික පර්යේෂණ කටයුතු ළඟදීම



වෛද්‍ය නිලධාරි ඩොමිනික් ටර්සාගෝ

නිරෝගී ස්වේච්ඡා සේවකයන් පිරිසක් යොදා ගනිමින් ආරම්භ කිරීමටත් ඔවුන් සැලසුම් කරමින් සිටිති.

කෙසේ වෙතත්, ඔවුන්ගේ පළමු අදියරේ පර්යේෂණ මගින් අධික ලෙස බෝවන ඩෙල්ටා ප්‍රභේදයට එරෙහිවත් සටන් කිරීමට ලාමා සත්ත්වයන්ගේ ප්‍රතිදේහවලට හැකියාව ලැබී ඇති බව වෛද්‍ය නිලධාරි ඩොමිනික් ටර්සාගෝ කියන්නේ සතුටිනි.

මේ බෙල්ජියම ලාමා සත්ත්වයන් යොදගෙන කළ පර්යේෂණයේ ප්‍රතිඵලය.

මේ අතර මෙවැනිම පර්යේෂණයක් රොසලින්ඩ් ෆ්‍රැන්ක්ලින් ආයතනය, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය සහ එංගලන්තයේ මහජන සෞඛ්‍ය පර්යේෂකයන් විසින් ඒකාබද්ධව සිදුකර තිබුණි. ඔවුන්ද බෙල්ජියමේ සෞඛ්‍ය පර්යේෂකයන් මෙන් සිය පර්යේෂණය සඳහා යොදගෙන තිබුණේ ලාමා සත්ත්වයන්ය. ඔවුන්ගේ පර්යේෂණයත් ඉතාමත් සාර්ථක වී තිබුණි. එහි සායනික පර්යේෂණ මේ සතියේ සිදුකිරීමටත් ඔවුන් බලාපොරොත්තු වන්නේය. එයත් එන්නතක් මාර්ගයෙනි.

මෙම එන්නත නිපදවා ඇත්තේ නිරෝගී ලාමා සත්ත්වයන්ගෙන් ලබාගත් ප්‍රතිදේහ වලිනි. එහිදී, මුලින්ම ලාමා සත්ත්වයාගෙන් රුධිර බින්දුවක් ලබාගන්නේය. ඉන්පසුව, එහි අඩංගු ප්‍රතිදේහවලින් කොවිඩ් වයිරසය හා සටන් කළ හැකි ප්‍රතිදේහය වෙන් කර ගන්නේය. අනතුරුව, නැනෝබොඩි ලෙස හැඳින්වෙන කුඩා ප්‍රතිදේහ යොදගනිමින් මිනිස් ශරීරයට හිතකර එන්නතක් නිපදවන බව ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ව්‍යුහාත්මක ජීවවිද්‍යා මහාචාර්ය ජේම්ස් නයිස්මිත් කියන්නේය.

මීට අමතරව ලාමා සතුන්ගේ පවුලේ සාමාජිකයන් වන ඔටුවන් යොදගෙනත් විවිධ වූ ඖෂධයන් නිපදවා ඇත්තේය. ඒ caplacizumab නම් ඖෂධයයි. එය 1990 දශකයේදී එක්තරා පර්යේෂණ කණ්ඩායමක් විසින් ඔටුවාගේ ප්‍රතිදේහ යොදගනිමින් නිපදවා තිබුණි. ඒ පිළිකා වැනි රෝග ගණනාවකට ප්‍රතිකාර කිරීම සඳහාය. කෙසේවෙතත්, පසුගිය වසරේදී මෙම ඖෂධය ‘රුධිරය කැටි ගැසීම’ නම් රෝගී තත්ත්වයට ප්‍රතිකාර වශයෙන් භාවිත කිරීමට ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතියද හිමිවිය.

කෙසේ හෝ, ඉදිරියේදී කොවිඩ් වයිරසය සමඟ සටන් කර කොවිඩ් වසංගතයේ කෙළවරක් දැකීමට අලුත් ආයුධයක් පැමිණීමට නියමිත බව ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ව්‍යුහාත්මක ජීවවිද්‍යා මහාචාර්ය ජේම්ස් නයිස්මිත් කියන්නේය.

**හර්ෂණී දිසානායක**

# සාංකාවට නොයා ආතතියෙන් නතරවෙන්න

“කියා ගන්න බැරි තරමේ මහා අපහසුවක් හිතට නැගෙනවා.” ඇතැම් අය කනස්සල්ලෙන් යුතුව කියනවා අප අසා ඇත්තෙමු. ගැටලුවනම් විසඳුනා. ඒත් තවමත් හිතට හරි නෑ. හරිම පීඩාවක් ඇඟපතත් රිදෙනවා. ඔවුහු කියති. මෙය මානසික පීඩනයක් මිස ශාරීරික ආබාධයක් නොවේ. හිතට දැනෙන මෙවන් අපහසුවකට, වෙනසකට අප ආතතිය යැයි කියමු.

## කොරෝනාවෙන් මිදෙන්නත් මනස නිරවුල් විය යුතුයි

යම් බාහිර කාරණාවක් සම්බන්ධයෙන් අපේ මනසත් සිරුරත් ක්‍රියා කරන, ප්‍රතිචාර දක්වන අන්දම ආතතියයි. සරල උදාහරණයක් ගතහොත් ඊළඟ දවස වෙද්දී සම්පූර්ණ කළ යුතුව තිබෙන ගෙදර වැඩ ප්‍රමාණය යම් ශිෂ්‍යයකුගේ සිත තුළ මේ ආකාරයේ ආතතියක්, පීඩාවක් ඇති කරන්නට හේතු විය හැකිය. ඇතැම් විට එය එක වරක් පමණක් සිදුවන, කෙටිකාලීන ආතතියක් පමණක් වන්නට ද පුළුවන. ඇතැම් විට දීර්ඝ කාලීන වෙන්නටද පුළුවන. උදාහරණයක් හැටියට පවසතොත් යම් රෝග පීඩාවක් සම්බන්ධයෙන් උපන් ගැටලුවක්, සැකයක් විටින් විටම මේ ආකාරයෙන් පීඩාවක්, ආතතියක් ඇති කරන්නට ඉඩ තිබේ.

එහෙත්, එබඳු පීඩාවක් හෝ ආතතියක් හෝ ඇති වීමට මුල් වූ හේතුව පහව ගිය පසුත් තවදුරටත් එයින් පීඩාවක් විඳින්නට සිදුවන අවස්ථාද තිබේ. එය බොහෝ විට හැඳින්වෙන්නේ සාංකාව (anxiety ) වශයෙනි. ගෙවෙන මොහොතේ හෝ නුදුරු අනාගතයේ අනතුරක සේයාවක් නැතිව වුව හෝ, එකී තර්ජනය පහව ගොස් තිබෙන විටක හෝ තවදුරටත් දැනෙන්නාවූ ආතති තත්ත්වයකට මුහුණ දී සිටීම සාංකාවයි.

ආතතිය යම් යම් එදිනෙදා අභියෝග හමුවේ මතුවීම කවරෙකුටවුව සාමාන්‍ය කාරණාවක් ලෙස හැඳින්විය හැකි අතරම එකී අදාළ අභියෝගය, ගැටලුව හෝ කාරණාව විසඳුණු පසු කෙමෙන් තුනීව යයි. එහෙත් සාංකාව (anxiety )එබන්දක් නො වේ. ඒ විටින් විටම අපේ ජීවිතවල පැටලිලි ඇති කරයි. දීර්ඝකාලීනව මානසික හෝ ශාරීරික සෞඛ්‍ය ගැටලු ඇති කරන්නට හේතු වෙයි. නින්ද, ප්‍රතිශක්තිය, ජීර්ණය, හෘද සෞඛ්‍ය මෙන්ම ප්‍රජනන සෞඛ්‍ය කෙරේද එය අහිතකර ලෙස බලපාන්නට ද එය හේතුවක් විය හැකියි. අනෙක් අතට විශාදය වැනි මානසික රෝගාබාධ ඇතිවීමට ද මේ තත්ත්වය හේතු විය හැකි බව පැවසෙයි.

මේ තත්ත්ව දෙක අතර වෙනස හඳුනා ගැනීම බෙහෙවින් වැදගත් ය. Stress හා anxiety යන දෙ පදය සිංහලයේ දී බෙහෙවින් සමීප ලෙස තේරුම් ගැනීම ඊට හේතුවයි. එහෙත් මේ කාරණා දෙක අතර වෙනස්කම් මෙන්ම ආතතියත් සාංකාවක් එකට එක් වූ තත්ත්වයක් ද හඳුනා ගන්නට ලැබෙයි.

මානසික ආතතියේ දී යමෙකු ප්‍රතිචාර දක්වන්නේ බාහිර සාධකයක් සම්බන්ධවයි. නුදුරු අනාගතයේදී සිදු වන්නට නියමිත යම් සිදුවීමක් හෝ මුහුණ දෙන්නට සිදු වී තිබෙන යම් අභියෝගයක් සම්බන්ධයෙන් හෝ මේ ආකාරයේ පීඩාකාරී හැඟීමක් ඇති වන්නට පිළිවන. එහෙත් එය දිගින් දිගටම පවතින්නක් නො වේ. ඒ සිදුවීම අවසන් වීමෙන් පසු හෝ අභියෝගට මුහුණ දීමෙන් පසු එකී පීඩාකාරී තත්ත්වය පහවී යයි. එහිදී මුහුණ දෙන්නට සිදු වූ අත්දැකීම ධනාත්මක හෝ වේවා සෘණාත්මක හෝ වේවා තවදුරටත් පෙර පරිදි අප වෙහෙස වන්නේ නොවේ.

යම් අවස්ථාවක ආතතිය හා සාංකාව යන තත්ත්ව දෙකම එකවර මනසට හා සිරුරට පීඩා ගෙන එන්නට ඉඩ



තිබේ. එබඳු අවස්ථා අපට වටහා ගත හැකි වන්නේ අපේ මනසේත් සිරුරේත් ඇතිවන යම් වෙනස්කම්, නොහොත් අපහසුතා හරහාය. අධිකතර කනස්සල්ල, නොසන්සුන්බව, අවිනිශ්චිතබව, හිස කැක්කුම හෝ සිරුරේ වේදනා, අධි රුධිර පීඩනය මෙන්ම නින්දට බාධා ඇතිවීම ද මෙහිලා දැකිය හැකි ලක්ෂණ ය.

එහෙත් සාංකාව (Anxiety) අභ්‍යන්තර කාරණාවකි. එනම් එය උපදින්නේ ආතතියට එරෙහිව, ආතතිය සම්බන්ධයෙන් අප දක්වන ප්‍රතිචාර අනුව ය. එම ප්‍රතිචාරවල ප්‍රතිඵලයක් වශයෙනි. එය හැඳින්වෙන්නේ දීර්ඝ කාලීනව පවතින හැඟීමක් වශයෙනි. මේ හැඟීම බොහෝ විට බියමුසු සැකය හෝ තැතිගැන්ම හා සම්බන්ධ ය. මේ හැඟීම් ලෙහෙසියෙන් පහව යන්නේ නොවේ. එය එදිනෙදා ජීවිතයට බාධා කරමින් විටින් විට නිරන්තරව මතුවෙයි. සාමාන්‍යයෙන් අප දැන් ගෙවා දමන මෙබඳු වසංගත තත්වයකදී, මෙයින් මිදීම සම්බන්ධයෙන්ම අපේ චිත්ත අභ්‍යන්තරයෙන් උපදින බිය, තැතිගැන්ම ආදිය නිසාම සාංකා තත්ත්වයක් ඇති වන්නට ඉඩ තිබේ. දිගින් දිගටම සිත් තුළ එය පැලපදියම් වන්නටත්, ඒ තුළින් නිරන්තරව පීඩාවට පත් වන්නටත් එය හේතුවක් වෙයි. අනෙක අප මුහුණ දී ඇති ගැටලුවේ අවිනිශ්චිතභාවය හා අවිනිශ්චිත කාලපරාසය ද මෙහිදී දැඩි ලෙස බලපාන්නට පුළුවන.

එහෙත් සාංකා තත්ත්වයකදී අප අත්විඳින දෙය නම්, ඒ හැටි බිය වන්නට කාරණාවක් ඒ අහලක නැතත් යම් අවිනිශ්චිතතාවයකින්, බියකින් හා අප්‍රසන්න භාවයකින් සිත පිරී තිබීමයි.

ආතතියට පත්වීම පීඩාවට පත්වීම හුදෙක් අමුත්තක් නොවේ. එය සියල්ලන්ටම පොදු තත්ත්වයකි. එහෙත් අප පරිස්සම් විය යුත්තේ එය සීමාව ඉක්මවා ඉතිරී පැතිරී යන්නට ඉඩ නොදීමට ය. එබැවින් වඩා වැදගත් වන්නේ යමකුට ආතති තත්වයක් ඇතිවී ඇත්දැයි දැන ගැනීමේ මූලික ලක්ෂණ මොනවා දැයි තේරුම් ගැනීමය. එය සරල කාරණා කිහිපයකින් අපට වටහාගන්නට පුළුවන. ඉන් එකක් නම්, අපේ එදිනෙදා ජීවිතය යම් අපහසුතාවකට, වෙනසකට, පැටලිල්ලකට ලක් වී ඇති බව අපට දැනීමයි. යම් යම් දේවල් මග හැර දමන්නට වුවමනා බවක් අපට හැඟීම ද තවත් ලකුණකි. එනම් යම් කාරණාවක් නිසා සිත කලබල වී ඇති බව අපට දැනීමයි. සෑම මොහොතකම පාහේ එකී කල්පනාව ඉස්මතු වීම ද මෙහිදී සිදුවෙයි.

සාමාන්‍ය තත්ත්වයකදී ආතතියෙන් මිදීම පිණිස අපට තෝරා ගත හැකි ක්‍රම නිශ්චිත වශයෙන් මොනවාදැයි කියන්නට නොහැකිය. එහෙත් උත්සාහ කිරීම් හා අත්හදා බැලීම් හරහා ඒ ඒ පීඩාකාරී හැඟීම්වලින් මිදී සාමාන්‍ය දවසේ ජීවිතයට පැමිණෙන්නට අපට උදව් වන ක්‍රියාකාරකම් හඳුනා ගන්නට හැකියාවක් තිබේ. ඒ විවිධ ක්‍රියාකාරකම් හරහා අන්තිමේ දී අපිට ගැළපෙනම ක්‍රියාකාරකමක් හෝ දෙකක් තෝරා ගන්නට අවස්ථාවක් ලැබේ.

සිතේ උපදින හැඟීම් ලියා වාර්තා කර ගැනීම, සිත එක්තැන් කිරීම පිළිබඳ ක්‍රියාකාරකම්වල යෙදීම, ව්‍යායාම ආදිය මෙහිලා සැලකිය යුතු සහයක් අපට ලබා දෙයි. විශේෂයෙන්ම පෝෂ්‍යදායි ආහාර හා නිසි වේලාවට ගැනීම මෙහිදී බෙහෙවින් වැදගත් ය. යමෙකු තමන්ගේ නින්ද පවත්වාගෙන යාමේ රටාව නිසි පරිදි පවත්වාගෙන යෑම ද මෙහිදී සිදුකළ යුත්තකි.

බොහෝ දෙනාගේ අදහස වන්නේ ශරීරය පිළිබඳව ඇතිවන්නා වූ අපහසුතාවන්වලටත් වඩා මනස සම්බන්ධයෙන් සිදුවන අපහසුතා හා පීඩා ගැන අවධානය යොමු කළ යුතු බවයි. මන්ද යත් එහි කෙළවර අප කිසි ලෙසකින් හෝ කල්පනා නොකළ මානසික හෝ ශාරීරික ව්‍යාධියක් විය හැකි බැවිනි. මේ වන විට දෙවසරක් තිස්සේ ලොව පුරා ජනතාව පීඩා විඳින්නේ මෙබඳු පසුබිමක ය. එබැවින් කොරෝනා වයිරසයෙන් ගැලවී ගන්නට උත්සාහ කරනවා මෙන්ම, ඒ හා සටන් කිරීමේදීත් වැදගත් කාරණයක් වන්නේ මනස නිරවුල්ව පවත්වා ගෙන යාමයි.

එහිදී " සාමාන්‍යකරණය"ට හුරු වීම වැදගත් එළඹුමක් ලෙස අපට හඳුන්වා දෙන්නට පුළුවන. එනම් කවර ප්‍රශ්නයක් හමුවේ හෝ වුව සාමාන්‍ය එදිනෙදා ජීවිතය ගත කරන බව මනසට හා ශරීරයට දැනෙන්නට හැරීමයි. එය කිසි ලෙසකින් හෝ කියන තරම් පහසු කටයුත්තක් නොවේ. අනෙක් අතට එය සියයට සියයක් සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන්නේ දැයි කිව නොහැකි ය. එනමුත් යම් ප්‍රමාණයක සැනසිල්ලක් සහනයක් හිතට හා ගතට ගෙන එන්නට එය සමත්ය. එබැවින් ඒවා ගැන ද යම් අදහසක් හිත තබා ගැනීම කවරෙකුට වුව වැදගත්ය.

දවස මුළුල්ලේ කම්පිත සිතිවිලිවලින් සිත පිරී යන්නේ නම් අපට කළ හැකි එක් දෙයක් වන්නේ ප්‍රයෝජනවත් යම් කාර්යයකට යොමුවීමයි. එනම් අප ස්වකැමැත්තෙන්ම යම් කාර්යයක යෙදීමයි. ගෝලීය වසංගත තත්ත්වය හමුවේ නිවෙස්වලටම කොටුවී ඉන්නට සිදු වීම අභාග්‍යයකි. එසේ නොවන්නට ආතතිය හා සාංකාවට ඇති හොඳම ඔසුවලින් එකක් වන්නේ එළිමහනේ, පරිසරයේ ටිකක් ඇවිදීම හා වැඩ කිරීමයි.

**පාලිත ජයකොඩි**

# ඇෆ්ගන් යුධ ගිනි මැද ගුවනේ දරු උපත්



ඇෆ්ගනිස්තානයේ බලය තලේබාන් ත්‍රස්තයන් අල්ලා ගැනීමත් සමග ම එරට ජනයා විශාල වශයෙන් පීඩාවට පත්වෙමින් සිටිති. මේ නිසා සිය රට හැර යන පිරිස පසුගිය දින කිහිපයේදී පුදුමාකාර වේගයෙන් වැඩි වූයේ ය. රටෙන් බැහැර වීමට උත්සාහ දරන දහස් සංඛ්‍යාත ඇෆ්ගනිස්තාන ජනයා කාබුල් නුවර හමිද් කර්සායි ගුවන්තොටුපොළේ රැස්කමින් බලා සිටියහ. සරණාගතයන් රැගෙන යන ගුවන් යානාවලට ගොඩවැදුණු සිය ගණන් ඇෆ්ගන් ජනයා අවිනිශ්චිත අනාගතයක් වෙත පියඹා ගියහ. විසි හය හැවිරිදි සෝමාන් නූරි ද එසේ පලා යන ජනයා අතර සිටියා ය.

දරුවන් දෙදෙනකු දෑතින් අල්ලාගෙන, අද හෙට ඉපැදෙන්නට සිටින තවත් දරුවකුගේ බර කුසෙහි දරාගෙන සැමියා සමග ඈ කාබුල්හි සිට ඩුබායි දක්වා පැමිණියේ දහසකුත් එකක් දුක් කම්කටොලු විඳ දරා ගනිමිනි. අතර මගදී කිසිදු කරදරයකට මුහුණ නොදී දරුවන් ද කැටුව එක්සත් රාජධානියේ බර්මින්ග්හැම් ගමනාන්තය වෙත ළඟාවීම මේ අඹු සැමි යුවළගේ එක ම ප්‍රාර්ථනය විය. ගමනෙන් කොටසක් නිම කර සිටි ඔවුහු පසුගිය විසි හත් වැනි දින රාත්‍රියේදී කුවේට් ගුවන් තොටුපොළෙන් තුර්කි ගුවන් සේවාවකට අයත් ගුවන් යානයකට ගොඩවැදුණහ. ගුවන් යානය අඩි තිස් දහසක් පමණ ඉහළ අහසේ පියාසර කරමින් තිබුණු අවස්ථාවකදී සෝමාන් නූරිට විළි රුදාව ඇතිවන්නට පටන් ගත්තේ ය. බැලූ බැලූ අත රාත්‍රි ඝන අන්ධකාරයේ ඇති වලාකුළු පමණක් දෙනෙතට හසුවන වටපිටාවක ලොව ඉහළ ම වේදනාව දැනෙන විට ඇතිවන හැඟීම කවරක්දැයි වචනයෙන් විස්තර කළ යුතු නොවේ. අනෙක් අතට ඒ පරිසරයේ ඇයට වෛද්‍යාධාර සපයන්නට කිසිවකු ද නැත. රෝහලක් පෙනෙන තෙක් මානයකවත් නොවේ. ප්‍රසූත වේදනාව ශරීරයට දැනෙන අතර තුරදී ම සෝමාන් නූරිගේ සිත කෙතරම් බියකින්, ආතතියයකින් සහ අසරණකමකින් පිරී යන්නට ඇත් දැයි අපට සිතාගත හැකිය.



ගැබිනියක් ගුවන් යානයට ඇතුලත් කරමින්

යානයේ වූ මගීන් අතර වෛද්‍ය වෘත්තිකයකු සිටින්නේ දැයි යානයේ කාර්යය මණ්ඩලය විමසා සිටියහ. එවැනි කිසිවෙක් එහි නොවීය. එනිසා තත්ත්වය තවත් බැරෑරුම් විය. විළි රුදාවෙන් පෙළෙන මවගේ පිහිටට සිටින්නේ තම තමන් ම පමණක් බැව් ගුවන් යානයේ සේවක මණ්ඩලය අවබෝධ කරගත්හ. දරු ප්‍රසූතියකදී ක්‍රියා කළ යුතු අන්දම පිළිබඳ දැනුවත්භාවයක් ගුවන් යානා කාර්යය මණ්ඩලය සිය පුහුණුවලදී ලබා සිටියහ. මේ අවස්ථාවේදී තම රාජකාරිය මෙන්ම යුතුකම ද වගකීමෙන් ඉටු කරන්නට ඔවුන්ට ඉවහල් වූයේ එලෙස ලද දැනුම ය.

දරු ප්‍රසූතිය සඳහා සුදුසු ස්ථානයක් ගුවන් යානයේ සේවක පිරිස වහ වහා සූදානම් කළහ. යානය ගමන් ගනිමින් සිටි ඇෆ්ගන් ජාතික වැඩිහිටි කාන්තාවන් කිහිපදෙනෙකුගේ සහය ලබා ගන්නටත් ඔවුහු අමතක නොකළහ. ඔවුන් සියලුදෙනාගේ සහයෙන් සෝමාන් නූරි දියණියක ප්‍රසූත කළා ය. වාසනාවකට මෙන් මව හෝ දියණිය හෝ සෞඛ්‍යමය වශයෙන් අන්තරාකාරී තත්ත්වයක පසු නොවූ හ. එනිසා සියල්ල හොඳින් පාලනය කර ගැනීමට ගුවන් යානයේ කාර්යය මණ්ඩලයට හැකිව තිබිණ. දවසේ අපරභාගයේ මෙලොව එළිය දුටු බැවින් සිඟිත්තියට "හවා" යන නම තබන ලද බව සඳහන් වේ. තුර්කි බසින් "හවා" යන්නෙහි අරුත සන්ධ්‍යාවයි.

ඩුබායි ගුවන්තොටුපොළෙන් යානය ගුවනට නැංවෙන අවස්ථාවේදී නොසිටි නව මගියකු ද රැගත් තුර්කි ගුවන් යානය අතර මගදී කුවේට් ගුවන්තොටුපොළට ගොඩ බස්වන ලදී. ඒ, යානයේ සෙසු අවශ්‍යතා සපුරා ගැනීම පිණිස ය. සෝමාන් නූරි සහ හවා මනා සෞඛ්‍යකින් පසු වූ බැවින් ඔවුන්ට ගමනේ මීළඟ අදියර වූ කුවේට් සිට බර්මින්ග්හැම් දක්වා ගමන් කිරීමට අපහසුවක් නොතිබිණ. එනිසා ඔවුන් කුවේට්හිදී රෝහල් ගත කිරීමේ අවශ්‍යතාවක්ද නොතිබුණේ ය. එය ඔවුන්ට පහසුවෙන් ම ගමනාන්තය වෙත ළඟා වීමට අවකාශය ලබාදුන්නේය.

සෝමාන් නූරිට පළමුව ද ඇෆ්ගන් සරණාගත කතක් ගුවන් ගත වුණු යානයක් ඇතුළතදී දියණියක ප්‍රසූත කළා ය. පසුගිය 21 වැනිද ඈ උපත ලැබුවේ ඇෆ්ගනිස්තානයේ සිට සරණාගතයන් රැගෙන ගිය ඇමරිකා ගුවන් යානයක් තුළදී ය. දැරිය ප්‍රසූත කළ කාන්තාව පිළිබඳ විස්තර අනාවරණය නොවේ. එහෙත් විළි රුදාවත් සමග ඇය යම් යම් සංකූලතාවලට මුහුණ දුන් බව සඳහන් වේ. ඊට පිළියමක් වශයෙන් යානයේ පීඩනය තරමක් වැඩි කරන්නට ගුවන් කාර්යය මණ්ඩලයට සිදුව තිබිණ. ඈ රැගත් යානය ජර්මනියේ රම්ස්ටේන් එයාර් බේස්හි ගොඩ බස්සවා මවට සහ බිළිඳියට වැඩිදුරටත් අවශ්‍යය වෛද්‍යාධාර ලබාදීමට එම ගුවන් යානයේ සේවක පිරිස කටයුතු කර තිබුණි. බිළිඳිය උපත ලද C - 17 ගුවන් යානය "රීච්" යන නමින් ද හැඳින්වෙන නිසා ඇයට "රීච්" යන නම තැබීමට කටයුතු කළ බව ද ඒ සමග වාර්තා විණ.

## රීච් ගුවන් යානයේ උපන් බිළිඳිය රීච්

## සවස් වරුවේ ගුවනේ උපන් දැරිය සන්ධ්‍යා අරුත් ඇති හවා

## දරුවන්ගේ පුරවැසිභාවය කොයි රටටද තීරණය ඉදිරියේදී



ගුවනේ උපන් බිලිඳුන්

සරණාගත තත්ත්වයට පත් කාන්තාවන් මේ අන්දමට ගුවන් යානාවලදී දරුවන් ප්‍රසූත කිරීම ඉතාමත් සංවේදී අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය. වෛද්‍යාධාර සහ පහසුකම් සීමිතවූත්, ආදරණීයයන් නොමැතිවූත් පරිසරයක ලොව ඉහළ ම වේදනාව අවදනම් සහගත ලෙස විඳිමින් දරුවකුට උපත දීම බෙහෙවින් ම බැරෑරුම් කාර්යයකි. මවගේ මෙන් ම මෙලොවට දෙනෙත් විවර කරන බිලිඳු දරුවාගේ ද ජීවිතවල සුරක්ෂිතතාව වෙනුවෙන් කැප වන්නට ගුවන් යානයේ කාර්යය මණ්ඩලයට සිදුවීම භාරධූර තත්ත්වයක් බැව් අමුතුවෙන් කිවයුතු නොවේ. ඒ සියල්ල පසෙක ලූ විට ගුවනේදී උපදින දරුවන් අයත් වන්නේ කවර රටකට ද?, ඔවුන් සලකන්නේ කවර රටක පුරවැසියන් හැටියට ද? යන ගැටලු මතු වේ.

''හවා'' බිලිඳිය උපත ලැබුවේ කවර රටකට අයත් ගුවන් සීමාවේ දී ද යන්න නිශ්චිතව සඳහන් නොවුණත් රීච් නම් උපත ලබා තිබුණේ ජර්මනියට අයත් ගුවන් සීමාවේදී ය. එහෙත් රීච්ට ජර්මනියේ පුරවැසි භාවය හිමිවේ ද? යන්න අවිනිශ්චිත ය. එයට හේතුව, ගුවනෙහි උපත ලබන මෙවැනි දරුවන්ගේ පුරවැසි භාවය සම්බන්ධයෙන් ක්‍රියාත්මක නීතිමය තත්ත්වය ඉතා සංකීර්ණ බැවිනි. ගුවන් යානයක උපත ලබන දරුවන් සම්බන්ධයෙන් විවිධ රටවල් විවිධ නීතිමය තත්ත්වයන් අනුගමනය කරන බව ද මෙහිදී අමතක කළයුතු නොවේ. කෙසේ වුවත් දරුවා උපත ලැබූ ගුවන් යානය අයිති රට එහිලා ඉතා වැදගත් සාධකයක් වේ. "Convention on the Reduction of Statelessness" (සරණාගතයන් පිළිබඳ සම්මුතිය) යනුවෙන් හැඳින්වෙන සම්මුතියට ගුවන් යානය ලියාපදිංචි කර ඇති රට අත්සන් තබා ඇත්නම් ගුවන් යානය ලියාපදිංචි කර ඇති රටේ පුරවැසිභාවය එතුළ උපත ලබන දරුවකුට හිමි වනු ඇත. ගුවන් යානය අයත් රාජ්‍යය එම එකඟතාවයට අත්සන් තබා නැත්නම් දරුවා උපත ලබන අවස්ථාවේදී ගුවන් යානය පසුකරමින් තිබුණු ගුවන් තීරය අයත් රටෙහි පුරවැසි භාවය දරුවාට හිමි වනු ඇත. එකී රාජ්‍ය දරුවාට පුරවැසිභාවය ලබාදීමට අකැමැත්ත ප්‍රකාශ කළහොත් දරුවාගේ මව හෝ පියා හෝ පුරවැසිභාවය දරන රටේ පුරවැසිභාවය දරුවාට ද හිමි වනු නිසැක ය. එනිසා රීච්ගේ සහ හවාගේ පුරවැසිභාවය තීරණය කිරීම ඉදිරියේදී සිදු වනු ඇත.



නිකොලේ ජී

ඇෆ්ගනිස්තානයේ සරණාගත තත්ත්වයට පත් කාන්තාවන් මේ අන්දමට ගුවනේදී දරුවන් ප්‍රසූත කරන්නේ ඔවුන් මේ වනවිට මුහුණ දී ඇති ඉතා බිහිසුණු තත්ත්වයෙන් මිදී වෙනත් රටවලට පලා යාමේදී ය. කෙටියෙන් ම කිවහොත් පණ බේරාගන්නට පලා යාමේදී ය. එහිදී එම කාන්තාවන්ගේ ගර්භණී බව ඇයගේ ගුවන්ගතවීමට බාධාවක් වනු ඇත් ද යන මානුෂීය සොයා බැලීම සිදු කිරීමට කිසිදු බලධාරියකු නැති බව පෙනී යයි. සාමාන්‍යයෙන් ගැබිනියක ගුවන් ගමනක නියැළෙන්නේ නම් ඇය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන නීති පද්ධතියක් තිබේ. එම නීති පද්ධතිය ද රටෙන් රටට සහ ගුවන් සේවයෙන් ගුවන් සේවයට වෙනස් ය. සති තිස්හය පිරූ ගැබිනි මව්වරුන්ට ගුවන් ගමන්හි නියැලීමට වාණිජ ගුවන් සේවාවන් අවසරය නොදීම සාමාන්‍යය තත්ත්වයයි. සති 36ට අඩු ගැබිනි මව්වරුන් වුව ගුවන් ගමනක යෙදෙන්නේ නම් අනුමත වෛද්‍යවරයකුගෙන් තම ගැබිනි බව පිළිබඳ වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කළයුතු ය. එම වෛද්‍ය වාර්තාව දින හතකට වඩා පැරණි එකක් නොවිය යුතු වීම ද එහිලා වැදගත් කාරණයකි. ගැබිනි මවකට කොපමණ වෙලාවක් දිගැති ගුවන් ගමනක යෙදෙන්නට අවසර දෙන්නේ ද යන්න සම්බන්ධයෙන් ද ගුවන් සමාගමවල ඇති එකඟතාව එකිනෙකට වෙනස් ය. ඒත් ඇෆ්ගන්ස්තානය මුහුණ දී ඇති තත්ත්වයේදී මේ නීතිරීති කිසිවක් බලනොපෑවේ ඒ ගුවන් ගමන් සියල්ල සුවිශේෂී තත්ත්වයේදී සිදුවූ ඒවා නිසාය.

මේ අතර පසුගිය අගෝස්තු 30 වැනිද කාබුල් නුවර හමිඩ් කර්සායි ගුවන්තොටුපොළට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයේ දී විසිතුන් හැවිරිදි ඇමරිකානු මැරයින් සැරයන්වරියකු වූ නිකෝල් ගී හෙරරේරා ද මිය ගියාය. ඇගේ ඇෆ්ගනිස්තානයේ සේවා කාලයේ දී විශේෂත්වය වූයේ අවතැන් දරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් ඇය වැඩි වෙහෙසක් හා කාලයක් දැරීමයි. මිය යෑමට දින හයකට ප්‍රථමයෙන්ද ඇය සිය ඉස්ටග්‍රෑම් පිටුවේ අවතැන් වූ ඇෆ්ගන් සිඟිත්තෙකු වඩාගත් ඡායාරූපයක්ද සමග ඇය සටහනක් තබමින් කියා තිබුණේ මම මගේ රැකියාවට ආදරෙයි යනුවෙනි. එම ප්‍රහාරයේ දී ඇය සමග තවත් හමුදා සෙබළුන් දෙළොස් දෙනෙක් මිය ගොස් තිබුණු අතර ලොව පුරා මාධ්‍යවලින් වැඩිපුරම කතාබහට ලක්වූයේ නිකෝලස්ගේ මරණයයි. ඒ ඇය කුඩා දරුවන් කෙරේ දැක් වූ සුවිශේෂී ඇල්ම නිසාය.

මංජුලා විජයරත්න


## ජර්මනියේ කෑම අදින ඇෆ්ගන් සන්නිවේදන ඇමැති

ඇෆ්ගනිස්තානයේ හිටපු සන්නිවේදනය බාර ඇමැතිවරයා වූ සයිඩ් අහ්මඩ් ෂහ් සදත් විදුලි සංදේශ සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු වරයෙකි. ඔහු එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් පශ්චාද් උපාධි දෙකක් ද ලබාගෙන තිබේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසු සදත් වසර විස්සකට ආසන්න කාලයක් රටින් රටට යමින් විවිධ සමාගම්වල රැකියාවන් කළ බව සඳහන් වේ. අඩු තරමින් රටවල් දහතුනකවත් ඔහු සේවය කර ඇත. සවුදි අරාබියේ දැවැන්ත විදුලි සංදේශ සමාගම් වන ඇරමාකෝ සහ සවුදි ටෙලිකොම් සමාගම්වලත්, ලන්ඩනයේ ඇරියානා ටෙලිකොම් සමාගමේත් ඔහු සේවය කර තිබේ. එහෙත් ඔහු බොහෝදෙනාගේ අවධානයට ලක් වන්නේ ඇෆ්ගනිස්තානයේ සන්නිවේදන විෂයය භාර අමාත්‍යවරයා ලෙස පත්වීම ලද 2018 වසරේ සිට ය. එනම් පසුගිය ද බලය හැරද පලා ගිය අෂ්රොෆ් ඝානි ජනාධිපතිවරයාගේ රජයෙහි කැබිනට් ඇමැතිවරයකු වශයෙන් සිටියදී ය.



ඇෆ්ගනිස්තානයේ විදුලි සංදේශ සේවාව වඩාත් දියුණු තත්ත්වයකට පමුණුවන්නට ඔහුට සැබෑ වුවමනාවක් තිබුණු බව ඔහු කළ කී දෙයින් පැහැදිලි වේ. එහෙත් ඇෆ්ගනිස්තානයේ විදුලි සංදේශ සේවාව දියුණු කරන්නට ඔහුට තිබුණු වුවමනාව අදියරයෙන් අදියරය බිඳ වැටෙන්නට පටන් ගත්තේ ජනාධිපතිවරයාට සමීප කවයට ඔහු ඇතුළත් නොවූ බැවිනි. බොහෝ දේශපාලනඥයන් වංචා සහ දූෂණවල නිරත වන අන්දම ඔහුට පෙනිණ. එයින් දැඩි කලකිරීමකට ද සදත් පසුගිය දෙසැම්බරයේ දී අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වීය. අනතුරුව ඔහු ඇෆ්ගනිස්තානයෙන් පිටව ජර්මනියට පැමිණියේ ය.


සදත් සිය රටෙන් පිටවූයේ ඇෆ්ගනිස්තානය නුදුරු දිනෙකදී තලේබාන් ත්‍රස්තයන්ගේ පාලනයට යටත් වන බව ඉවෙන් මෙන් හඳුනා ගත් හෙයිනි. ඇෆ්ගනිස්තාන සහ බ්‍රිතාන්‍ය ද්විත්ව පුරවැසිභාවය හිමි හතළිස් නව හැවිරිදි ඔහු එක්සත් රාජධානියට වෙනුවට තෝරා ගත්තේ ජර්මනියයි. ඇෆ්ගන් සරණාගතයන් රැකවරණය අපේක්ෂාවෙන් ඒ වනවිටත් ජර්මනියට පැමිණෙමින් සිටියහ. තම අධ්‍යාපන සුදුසුකම්වලට



සරිලන අන්දමේ රැකියාවක් ජර්මනියෙන් සොයා ගැනීම සදත්ට අසීරු විණ. අවසානයේදී ඔහු නැවතුණේ ජර්මනියේ ලිව්රැන්ඩෝ සමාගමේ ය. සමාගමට ලැබෙන ඇණවුම්වලට අනුව සැකසෙන ආහාර, එම ඇණවුම් ලබා දුන් පාරිභෝගිකයාට ගෙන ගොස් දීම ඔහුට එහිදී පැවරුණු රාජකාරියයි. එවැනි සේවකයන්ට සමාගම ලබාදෙන තැඹිලි පැහැ නිල ඇඳුමෙන් සැරසී පාපැදියෙන් පාරිභෝගිකයන් වෙත ගොස් කෑම භාරදීමට ඔහුට සිදුව ඇත. ඒ සඳහා ඔහුට පැයකට යුරෝ 15 ක මුදලක් සමාගමෙන් ලැබෙයි. තමන්ගේ එදිනෙදා වියහියදම පියවා ගැනීමට ඒ මුදල ප්‍රමාණවත් බව සදත් පසුගිය ද විදෙස් මාධ්‍ය වෙත පවසා තිබිණ. ආහාර බෙදා හැරීම සඳහා මසකට කිලෝමීටර 1200ක පමණ දුරක් පාපැදිය පැදවීමට ඔහුට සිදුව ඇත. එය තමන් මත පැටවුණු බරක් ලෙස නොසලකන හෙතෙම එමගින් තමන්ගේ සිරුරට මනා ව්‍යායාමයක් ලැබෙන බව ද පෙන්වා දෙයි.


හිටපු අමාත්‍යවරයාගේ මීළඟ ව්‍යායාමය ජර්මනියෙන් ඉහළ පෙළේ රැකියාවක් ලබා ගැනීම ය. ඒ සඳහා ඔහුට අඩුවකට ඇත්තේ ජර්මන් බස නොදන්නාකම ය. ජර්මන් බස ඉගෙන ගැනීම ඔහු මේ වනවිට ආරම්භ කර ඇත. ඒ සඳහා දිනකට පැය හතරක පමණ කාලයක් තමන් වැය කරන බව ඔහු පවසයි.

# තෙලිතුඩින් සැමගේම හිත දිනූ සේමගේ



**ශාන්ත කේ හේරත් මුලින්ම ජයසිරි සේමගේ නම් චිත්‍රශිල්පියා දැන හඳුනාගන්නේ රිවිරැස පත්තරේ ගුරුගෝල වෙනස චිත්‍රයෙනි. එකල කුඩා දරුවෙකු වූ ශාන්තගේ ලෝකයේ ජයසිරි සේමගේ දැවැන්තයෙකු වී සිටියේය. ඉන්පසු සේමගේ සේම ශාන්ත ද පත්තර ක්ෂේත්‍රයේ චිත්‍ර ශිල්පීයෙක් වුණේය. එවිට ඔහුට ජයසිරි සේමගේ හැබෑවට හමුවුණේය. ඒ එක්දහස් නවසිය අනූව වසර කාලයේය. චිත්‍ර ශිල්පීන් සේ ක්ෂේත්‍රයේ දී හමුවුණා මෙන්ම ඔවුන් පවුල් සංස්ථාව තුළ ද පෞද්ගලිකව දැන හඳුනනන්නෝත් වූහ. වසර තිහකට එහා ගිය ඒ දැන දැනහැඳුනුම්කමක් සමග සේමගේ මහතා මෙන්ම චිත්‍ර කලා ක්ෂේත්‍රයේ විවිධ භූමිකාවන්, රස සොයමින් ගමන් කළ ශාන්තට ඔහු දන්නා පසුගියදා දිවි මඟලින් සමුගත් ජයසිරි සේමගේ නම් චිත්‍ර ශිල්පියා ගැන ලියන්නට අපි ඇරයුම් කළෙමු**





ප්‍රකට චිත්‍ර ශිල්පියෙකු වුවත් සේමගේ සේමගේ හැමදමත් චිත්‍ර ඇන්දේ ජනතාවටය. ජනතාව සතුටු කිරීමටය. ඒ නිසා ඔහුගේ චිත්‍රයක් දකින්නේ කොතැන ද ඒවා සේමගේ ගේ නිර්මාණ බවට හඳුනාගැනීමට පුළුවන. ඒ තරමට ඒවා ජනතාවට හුරුය. සමීපය. ඔහුගේ චිත්‍රාවලිය පරික්ෂා කිරීමේදී ජාතික මෙන්ම ජාත්‍යන්තර චිත්‍ර ශිල්පීන් මෙන්, මත වාද ගොඩ ගොඩනැගීමට, ශිල්ප පෙළහර පෑමට ඔහු කිසිවිටෙකත් උත්සාහ කළ බවක් නොපෙනේ. චිත්‍රය හරහා සමාජය ශෝධනය කෙරේ රසිකයා නැඹුරු කිරීමට, ගැඹුරු නිම්නයන් ඔස්සේ භාවමය හැඟීම් ඉස්මතු කරමින් දුර ගමන් ගෙන යාමට, රසිකයා පෙළඹ වූ බවක් ද නොපෙනේ. එම නිසාම ජයසිරි සේමගේ මහතාගේ චිත්‍ර නිර්මාණ සහිත ඔහුගේ ජීවිතය සුන්දර පරිසරයක පිහිටි වර්ණවත්, නිස්කලංක, විචිත්‍ර විලක් ලෙස ද දැකිය හැකිය.

ඔහු උපන්නේ 1938 දී අම්බලන්ගොඩ දීය. ඔහු පාසල් අධ්‍යාපනය හැදෑරුවෙ අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙන් ය. පාසල් අධ්‍යාපනයෙන් පසුව ඔහු බාහිර චිත්‍ර ශිල්පියෙකු ලෙසින් ලංකාදීප පත්තරේට බැඳුණි. ඉන්පසුව දවස නිවස ආරම්භ වීමත් සමග "දවස" දිනපතා පුවත්පතේ "රිවිරැස" ඉරිදා පුවත්පතේත් චිත්‍ර ශිල්පියෙකු ලෙසින් පත්වීමක් ලබා ගත්තේය.

ජයසිරි සේමගේ මහතාගේ චිත්‍රයේ මූලික රිද්මය පුවත්පත් කලාවේ භාවිතයේදීත්, අනෙකුත් විවිධ ව්‍යවහාරික කලා තලයන්ගේ භාවිතයන්හි දීත් කිසිදු ආකාරයක වෙනස්වීමකට ලක්වන්නේ නැත. මෙය විශේෂයෙන් සලකා බැලිය යුතු කරුණකි. ඔහුගේ චිත්‍ර ශෛලිය ආසියානු කලාපයේ සාම්ප්‍රදායික චිත්‍රයෙහි ආභාසයෙන් ගොඩනැගුණකි. සමහරු පවසන පරිදි එහි අම්බලන්ගොඩ ආවේණික වූ කලා රිද්මයක ගති ලක්ෂණ ද මුසුවේ.

1974 දී පමණ යොවුන් තරුණයකු ලෙසින් සේමගේ මහතාගේ ඇසුරට පත් වූ අතුල මෙන්ඩිස් මහතා අද වෙනවිට කොළඹ සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්ය වරයෙකි. ඔහුට අනුව එද යොවුන් තරුණයෙකු ලෙසින් සේමගේ මහතාගේ චිත්‍රය රස විඳි ආකාරයටම අදත් නොවෙනස්ව ඔහුගේ චිත්‍රය රසවිඳිය හැකි බවයි. එසේ වීමට හේතුව ලෙස ඔහු දක්වන්නේ සේමගේ මහතාගේ චිත්‍රයෙහි, රේඛාවේහි, වර්ණයේ, හැඩයේ, මාතෘකාවෙ නැතිනම් වස්තු විෂයේ කිසිදු ආකාරයක වෙනසක්, වර්ධනයක් හෝ ක්ෂය වීමක් දැකීමට නොමැතිවීමයි. මේ කරුණෙහි දී මා ඉහතින් සඳහන් කළ "විලක" උදහරණය ඉතා නිවැරදි හා සාධාරණ බව නැවත පසක් වේ.



ජයසිරි සේමගේ

ජයසිරි සේමගේ මහතා පුවත්පතක් සමග සාකච්ඡාවක දී පවසා ඇත්තේ "මම මගේ චිත්‍රවලට ඈන කොටා ගැනීම්, මිනී මැරීම්, කළ කෝලාහල, වෛරය, ක්‍රෝධය වැනි මාතෘකා ඉස්මතු කරමින් අඳින එකෙන් හිතාමතාම වැලකී හිටියා" යනුවෙනි. වැඩිදුරටත් ඒගැන කියන ඔහු.. "මගේ චිත්‍රයේ රේඛාවේ ඇති ලාලිත්‍යය, වර්ණ වල ඇති සුමුදු, විචිත්‍ර බව, සුන්දර බව, මාතෘකාවෙ සරල භාවය, ඕනෑම බුද්ධි මට්ටමේ කෙනෙකුට අමාරුවකින් තොරව රස විඳීමට ඇති හැකියාව යන කාරණා කෙරෙහි මුල්තැන දී නිර්මාණය කරන්න උත්සාහ කළා" කියාය.

මේ කියමන් හරහා ඔහුගේ නිර්මාණ ජීවිතයේ ගමන් මාර්ගය පැහැදිලිව නිර්වචනය වේ. ලෝකයේ ප්‍රබල නිර්මාණ ශිල්පියෝ එක තැනක, එකම ආකාරයකට, එකම මාතෘකාවකට කොටුවී කටයුතු කර නැත. ඔවුහු සමාජය වෙනස් වෙන ආකාරය, දේශපාලනයේ විපරිත භාවය, ආර්ථිකයේ, සමාජයේ අනේකවිධ හැලහැප්පීම්, ගැටුම් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා උත්සාහ කර තිබේ. නමුත් සේමගේ කිසිවිටකත් ඒ කෙරෙහි තමාගේ අවධානය යොමු කර නැත. එම නිසා ඔහුගේ නිර්මාණ ජීවිතයට පාඩුවක්, අවාසියක් සිදු වූ බවක් ඔහු විසින් ප්‍රකාශ නොකරයි.

2006 දිනමිණ පුවත්පතේ කලා පිටුවකට ජයසිරි සේමගේ මහතා පිළිබඳව ලිපියක් ලියනන ඉන්ද්‍රජිත් වැවලගේ මහතා මේ සම්බන්ධයෙන් සඳහන් කර ඇති ප්‍රකාශය වැදගත්ය.

" එවකට හේවුඩ් ඇකඩමිය හරහා වර්ධනය වූ භාව චිත්‍ර සම්ප්‍රදය ඔස්සේ නොගොස් වෙනස් ස්ථානයකින් වර්ධනය වූ සේමගේ ගේ චිත්‍රය, පොදු ජනතාවගේ රසයට, අවධානයට ලක්ව තිබේ. මොහුගේ චිත්‍රයේ පොදු ජනතාවගේ සමීපයට ලක්වෙන වාණිජ ගති ලක්ෂණ මෙන්ම ශාස්ත්‍රී ගති ලක්ෂණ ඉස්මතු වේ. එනිසා පොදු ජනතාව අතරත්, කලාගාරයක් වෙත ගමන්කරන, එහිදී නිර්මාණ විඳින්නන් හටද වින්දනයක් ලබාගත හැකි නිර්මාණ බිහිකිරීමක් සේමගේ සිදුකර තිබේ "

සේමගේ මහතා උපතින් හෝ කිසියම් වාසනා ගුණයක් හේතුකරගෙන එක්වරකදී වර්ධනය කරගත් චිත්‍ර කලාවේ කුසලතාවයන් ඉන් පසුව වැඩි දියුණු කර ගැනීම සඳහා වෙහෙස වූ බවක් නිරීක්ෂණය නොවේ. එහෙත් ව්‍යවහාරික චිත්‍ර ශිල්පියකු ලෙස ඔහුගේ භූමිකාව කෙතරම් උච්ච ස්ථානයකට ගෙනගියේද යත් එවකට රටේ ජනාධිපති වරයාව සිටි ආර්. ප්‍රේමදාස මහතාගේ විශේෂ අවධානය ඔහු විසින් දිනා ගන්නා ලදි. එම නිසා ඔහුට රාජ්‍ය චිත්‍ර ශිල්පියා යන අන්වර්ථ නාමය ද පටබැඳිණි. ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් කෙරුණු ගම්උදව, විවිධ රාජ්‍ය උත්සව හා වෙනත් අවස්ථාවන්හිදී පැවැත්වූ සැණකෙළි, අලංකාර මෝස්තර, තොරන් වලින අලංකාර කරමින් ජයසිරි සේමගේ මහතා සිය කුසලතාවයන් මැනවින් හෙළි පෙහෙළි කර තිබේ.

දේශීය වශයෙන් පමණක් නොව මලයාසියාව, තායිලන්තය, ස්වීඩනය, පින්ලන්තය, ඕමානය මෙන්ම සිංගප්පූරුවේ මංගල ථෙරවාදී භික්ෂු මධ්‍යස්ථානය, එක්ස්පෝ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනය ආදී අවස්ථා රැසක් ඔහුගේ අලංකාර නිර්මාණවලින් අලංකාර වී තිබූ බව සටහන් කළ යුතුය.

ලංකාවේ චිත්‍ර කලාව පිළිබඳව උපන් හැකියාවන් ඇති පිරිස්වලින් හිඟයක් නැත. නමුත් එම හැකියාව ඔප කර නිසි ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සඳහා පවතින ගැටලු බොහොමයකි. නිසි පරිදි විධිමත් අධ්‍යාපනයක් ලබාදීම සඳහා ලංකාවේ චිත්‍ර මූර්ති පිළිබඳ අධ්‍යන ආයතනයක් නොමැති වීම ඉමහත් ගැටලුවක් බව සේමගේ මහතා මා සමඟ කතා කළ බොහෝ අවස්ථාවල දී ප්‍රකාශ කර තිබේ. සෞන්දර්ය විශ්වවිද්‍යාලය තුළින් උපාධිධාරී විද්‍යාර්ථයන් බිහි කරනවා විනා නිවැරදි ශිල්පීන් පිරිසක් බිහි නොවෙන බව පසුගිය ඉතිහාසය දෙස විමසීමෙන් බැලීමේදී අපට තේරුම් ගත හැකියි. ජේ. ඩී. ඒ. පෙරේරා වැනි විද්වතුන් කාර්මික විද්‍යාලය හරහා රජය කලායතනය (හේවුඩ්) බිහි කළ සමයේම කැලණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය උපාධිධාරීන් බිහිකිරීමට උනන්දුවූයේ ශිල්පියා සහ උපාධිධාරියා අතර ඇති වෙනස හඳුනාගෙනය. හේවුඩ් ආයතනය ගොඩනැගුණේ සම්පූර්ණ නිදහස් මනසක් ඇති නිර්මාණ ශිල්පීන් ගොඩ ගොඩනැගීම් සඳහාය. නමුත් අද වන විට ශිල්පීන්ට නිවැරදි ශිල්පීය ඥනය පූර්ණය කර ගැනීම සඳහා හෝ අධ්‍යයන කටයුතු සඳහා ලංකාවේ කිසිදු ආයතනයක් නැත. මේ අඩුව පූර්ණය කර ගැනීම සඳහා සේමගේ නිර්මාණ ශිල්පියෙකු ලෙස ගල්කිස්සේ කලාගාරයක් ද බිහි කළේය. ඔහු අනුගමනය කරන ගෝලබාලයන් පිරිසක් ද ඔහු වටා සිටි. නමුත් එය ප්‍රමාණවත් නොවන බව අපි හොඳකාරවමව දනිමු.

**සේමගේ චිත්‍ර ඇන්දෙ පොදු ජනතාවගෙ රසයට**

**ඔහුගේ ජීවිතය සුන්දර පරිසරයක ඇති නිස්කලංක විචිත්‍රවත් විලක් වගෙයි**

සේමගේ නම් කලා කලාකරුවාගේ නිර්මාණ සරල සිත්ගන්නාසුළු ප්‍රසාදය දිනාගත් නිර්මාණ කෘතීන් ලෙස ලංකාව පමණක් නොව ලෝකය ද දිනා ගත්තේය. එයින් ලංකාවට කීර්තිය පමණක් නොව විදේශ විනිමය ද ලබාගැනීමට හැකි වූවා නොවේද? මෙවැනි සම්පත් මතුවටත් උරගා බැලීමට අප විසින් කළ ඇත්තේ කුමක්ද යන්න අපි කල්පනා කළ යුතුය.

නිර්මාණ ශිල්පීන් ඔපමට්ටම් කරනවා මෙන්ම රටේ ජන ජනතාව නිර්මාණ රසයෙන් පූර්ණ කිරීමට ද කටයුතු කිරීම ඉතා වැදගත්ය. මේ සම්බන්ධයෙන් අපේ රටේ දක්වන උනන්දුව සහ ඒ සඳහා වූ ප්‍රතිචාරය ඉතාම කනගාටුදයක බව කියන්නේ තරහින් නොවේ. නිර්මාණ ශිල්පීන් යයි කියා කියාගන්නා පිරිස් නිර්මාණ අනුකරණය කරමින් නිසි අවබෝධයකින් තොරව කරන නිර්මාණ නිසා ලංකාව ජාත්‍යන්තරව අපකීර්තියට පත් වන අවස්ථා පිළිබඳවද අපට අසන්නට දකින්නට ලැබේ.

මේ තත්ත්වය වළක්වා ගැනීමට නම් කළ යුත්තේ කුමක්ද. නිර්මාණ ශිල්පීන්ට තම ශිල්ප දැක්වීම සඳහා කලාගාර බිහිකිරීමත් ඒවා රස විඳීම සඳහා රස විඳින්නන් දිරිමත් කිරීමක් කලාව පිළිබඳ වැඩිදුර දැනුවත්වීම සඳහා සියලු මාධ්‍යයන් හරහා විචාර රසවිඳීම පිළිබඳ අවස්ථාවන් වැඩි දියුණු කිරීමත් කළ යුතුමය. මේවා චිත්‍ර ශිල්පීන්ට පමණක් සිදු කළ හැක්කක් නොවේ. මේ අඩු අඩුපාඩු නිවැරදි කර ගැනීමට රජයත් පුද්ගලික් අංශයත් නව ප්‍රවේශයකින් බැලිය යුතු බව සේමගේ වැනි නිර්මාණ ශිල්පීන්ගේ ජීවිතය අධ්‍යයනයකි කිරීමේදී අපිට නිවරදිව දැකගැනීමටත් වටහා ගැනීමටත් හැකිවේ.

සේමගේ මහතා නිහඬ මිනිසෙකි. කනට ඇසෙන නෑසෙන පමණින් කතා කරන ප්‍රසන්න නිහතමානී මිනිසෙකි. ඔහුගේ මිතුරන් විටෙක කියන්නේ "සේමගේ ඇල්වතුරත් නිවා බොන චරිත්යක්" බවයි. එය සත්‍යයකි. මේ ඒ බව සනාථ කරන කදිම උදහරණයකි. රස කතාවකි. සේමගේ මහතා කියූ ඒ කතාව එසේම සටහන් කිරීමට මම උත්සාහ කරමි.

" ශාන්ත ප්‍රේමදස ජනාධිපතිතුමා එක්ක වැඩ කරන එක එච්චර ලේසි පහසු වැඩක් නෙවෙයි. එත්, එයත් එක්ක වැඩ කරන්න පුළුවන් නං, එහෙම කෙනෙකුට ලෝකේ කෙහේ ගිහිල්ලා හරි ඕනම කෙනෙක් එක්ක වැඩ කරන්න පුළුවන්."

ඔහු සිනාසෙන්නේ මතකය රසවිඳිමිනි.

" ප්‍රේමදස මහත්තයා වැඩක් බාර දීපුහාම ඒක බලන්න ඕන ම වෙලාවක එන්න පුළුවන්. මහ රෑත් එනවා. උදේ පාන්දරත් එනවා. වැඩේ බලන්න. ඒ විතරක්නෙවෙයි. ඇවිත් අඩුපාඩු එහෙම පෙන්වල දෙනවා. ඒ අඩුපාඩු හැදුවේ නැත්තං තරහත් යනවා. දවසක් හොඳ වැඩක් වුණා. අපි ගම් උදවට තොරණක් හදනවා. උදේ නැකතට විවෘත කරන්න ජනාධිපති ප්‍රේමදස මැතිතුමා තමයි එන්නේ. මෙන්න උදේ පාන්දරම එතුමා තොරණ බලන්න ආවා. ඇවිල්ලා තොරනේ එක පැත්තක් පෙන්නලා කිව්වා, මැනල බලන්න මේකෙ අඟල් දෙකක් විතර ඇදවෙලා තියෙනවා වගේ කියලා. අපි මැනල බැලුවා හරියටම හරි. අඟල් දෙකක ඇදයක් තියෙනවා. මම ජනාධිපතිතුමා ඉදිරිපිටම කට්ටිය දලා අඩුපාඩුව හැදුවා. ජනාධිපතිතුමා ට හරි සතුටුයි. වැඩ හොඳයි කියලා එයා ගියා."

ඔහු සිනාසෙයි. අපි කුතුහලයෙන් ඔහුගේ කතාවේ ඉතිරි ටික ඇසීමට බලාපොරොත්තුවෙන් සිටියි.

"ජනාධිපතිතුමා එක්ක මම වැඩ කරලා තියෙන නිසා මම දන්නවා මේ වැඩේ මොකක් හරි අඩු පාඩුවක්වක් එතුමා කියනවා කියලා. සමහර විට බරපතළ අඩුපාඩුවක් කිව්වොත් ඒක කරන්න ලේසී නෑ. ඒ නිසා මම ඕක හිතලම අඟල් දෙකක් විතර ඇද කරල තිබ්බ. නිවැරදි කරන්න ඕන විදිහ මම ඇන තව්ද විදල, හදලයි තිබ්බේ. ඒ නිසා වැඩි අමාරුවක් නැතිව වැඩේ නිවැරදි කලා. ජනාධිපතිතුමා සතුටින් ගියා. "

සේමගේ මහතා චිත්‍ර කලාවක් පමණක් නොවෙයි, ජීවත්වීමේ කලාව ද මැනවින් දත් අයෙක්.

ජාතික රූපවාහිනී සංස්ථාවේ "තෙලිතුඩ" නමින් චිත්‍ර ශිල්පීන් වෙනුවෙන් පැවැත්වෙන වැඩසටහනක් තිබුණා. මේක නිර්මාණය කළේ ගාමිණි අබේකෝන්. ඉදිරිපත් කිරීම් සහ සැලසුම් කළේ බන්දුල පීරිස්. මේ කියන දිනවල සේමගේගේ චිත්‍ර ප්‍රදර්ශනයක් ලයනල් වෙන්ඩට් කලාගාරයේ පැවැත් වුණා.බන්දුලත් මාත් මේ ප්‍රදර්ශනය බලන්න ගියා. මම බන්දුලව සේමගේ මහතාට අඳුන්වලා දුන්නා. ප්‍රදර්ශනය බලලා, කතාබහ කරලා අවසානයේ බන්දුල සේමගේ මහතාට කිව්වා ඊළඟ "තෙලිතුඩ" වැඩසටහනට ඔබව අපි තෝරගන්නවා. ඒ සඳහා සූදනම් වෙන්න කියලා. ඒක සේමගේ මහත්මයා බලාපොරොත්තු නොවුණු ආරාධනාවක්. ඔහු එකවරම කිව්වා..

" මට හරි සන්තෝසයි. අපේ ක්ෂේත්‍රයේ ඉන්න සමහරු මගේ කලාව ගැන එතරම් ලොකු සතුටක් නෑ කියල මම දන්නවා. නමුත් රූපවාහිනියේ "තෙලිතුඩ" වගේ වැඩ වැඩසසටහනකට මට ආරාධනා කරපු එක ගැන මට හරි සන්තෝෂයි" කියලා.

ඒ කතාව එතනින් නතර වෙන්නෑ. වැඩසටහන් පටිගත කරලා ප්‍රචාරය වුණාට පස්සේ බන්දුල ට හමුවෙලා තියෙනවා "හේවුඩ්" එකේ හිටපු ගුරුවරු කීප දෙනෙක් ඔවුන් කියලා තියෙන්නේ..

"ඇයි බන්දුල, ඔයගොල්ලන්ගේ වැඩ සටහනට අර සේමගේ වගේ කෙනෙක් ගත්තේ" කියලා. ඒකට බන්දුල මෙහෙම කියලා තියෙනවා.

" අපි ඊළඟ වැඩසටහනකට ඔබතුමා ගන්නම්. සූදනම් වෙන්න" කියලා.

එතකොට අර ගුරු තමා කලබල වෙලා කියලා තියෙනවා..

" ඔව් ඒකට නම් මං කැමතියි. ඒත් මම කරපු වැඩ, නිර්මාණ නම් මුකුත් නැනෙ " කියලා. බන්දුල එවිට හොඳ පිළිතුරක් දීලා තියෙනවා.

" අන්න ඒ නිසා තමයි වැඩකරන මිනිසුන්ව අපි තෙලිතුඩට තෝරගත්තේ" කියලා. බන්දුල පීරිස් කියන්නේ සේමගේ වගේ "ඇල්වතුරත් නිවල බොන කෙනෙක්" නෙවෙයි.

සේමගේ නිර්මාණ ශිල්පියා ගැන බොහෝ දේ ලිවිය හැකිය. මේ ලිපිය අවසන් කිරීමට මත්තෙන් තවත් එකක් මතකයක් ලිවීමට කැමතියි. මම "දිවයින" පුවත්පතේ රාජකාරි කරන මුල් සමයේ නැවතී සිටීයේ රත්මලානේ මගේ පුංචි අම්මා සහ බාප්පාගෙ නිවසේය. බාප්පා ගල්කිස්ස උසාවියේ වැඩ කළ කීර්තිමත් අධිනීතිඥවරයෙකි. ඔහු පී. ඊ. වී. ගුණදස ය. ඔහුට එම ප්‍රදේශයේ මිතුරන් බොහෝ විය. ප්‍රසිද්ධ චිත්‍රපට නළුවෙකු, චිත්‍රපට අධ්‍යක්ෂ කවරයෙකු වූ මිල්ටන් ජයවර්ධන, ප්‍රකට වාහන අලුත් වැඩියා කරන සමාගමක හිමි හිමිකරුවකු වූ මෙන්ඩිස් සහ තවත් පිරිසක් සමග සේමගේ රත්මලාන නිවසට පැමිණ සිටියා මතකය. මම ඔවුන්ගේ සමාගමය මග හැර කාමරයට වී සිටියා. මද වේලාවකින් පසුව බාප්පා මහ හඬින් මා ඇමතීය.

" කෝ අපේ සිත්තරා. එනවා තමුසෙට හොඳ නිර්මාණ ශිල්පියෙක් අඳුන්වලා දෙන්න."

මම කාමරයේ නොඇසුනා මෙන් සිටියා මතකය.

"මෙහෙ කවුද ඉන්නා සිත්තරා? "

සේමගේ මහතා අසන හඬ මට ඇසුණි.

" අර දිවයින පත්තරේ කුරුටුගාන්නේ. ශාන්ත කේ. හේරත්. අපේ නෝනගේ අක්කගේ පුතානේ. "

ගතවූ යේ සුළු මොහොතකි. කාමරයේ දොරට තට්ටුකරමින් ආවේ ජයසිරි සේමගේය. කාමරය පුරා විසිරී තිබුණ චිත්‍ර රසවිඳිමින් ඔහු මගේ ඇඳේ කෙළවරක වාඩි විය.

" මම දැනගෙන හිටියේ නැනේ ශාන්ත මෙහෙ ඉන්නවා කියලා. දන්නවානම් මම මීට කලින් ඇවිල්ල හම්බ වෙනවා නේ. බාප්පා "සිත්තරා" කියල කියපු එක ගණන් ගන්න එපා. අපි ඉතිං ඇත්තටම සිත්තරුන් තමයි නේ."

ඔහු සිහින් හඬින් කියන්නේ බාප්පා ගේ කතාවෙන් මගේ සිත රිදුනා යයි සිතා විය හැකිය.

ජයසිරි සේමගේ පොදු මිනිසා හඳුනන්නෙකි. ඔහුගේ බිරිඳ මගේ ගමට අල්ලපු ගමේය. පූජාපිටියේය. වර්තමාන රටේ පවතින තත්ත්වය තුළ සේමගේ මහතාගේ අවසන් කටයුතු සඳහා ඔහුගේ රසිකයන්ට සහ අපිට සහභාගි වීමට අවස්ථාව අහිමිවූ බව අපි දනිමු. ඔවුන් වෙනුවෙන් ද පුද්ගලිකව ද, පවුලේ සැමට අපේ කනගාටුව ප්‍රකාශ කරන අතර ජයසිරි සේමගේ මහතාට සුබ ගමනක් ප්‍රාර්ථනා කරමු.



ශාන්ත කේ. හේරත්





# පියෙරෝගේ ලංකා එකතුව

67 කොටස

**80 දශකයේ සංචාරයකට ලංකාවට පැමිණි ඉතාලි ජාතික නාවික ඉංජිනේරුවකු වූ පියෙරෝ පොරොන්ඩි දස වසරකට වඩා කාලයක් ලංකාවේ ගත කර ඇත්තේ සංචාරක නියෝජිතයකු ලෙසය. ඉතාලියට වඩා ලංකාවට ඇලුම් කරන පියෙරෝ විනෝදාංශයක් ලෙස ලංකාවට සම්බන්ධ බොහෝ තොරතුරු එකතු කර ඇති අතර ලංකාවේ යුරෝපීය යටත් විජිත යුග පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන විශාල ප්‍රමාණයක් ද ඔහු සතුව ඇත. එම ලේඛන අතර දහඅට සහ දහනව වන සියවස මුල් කාලයේදී එංගලන්තයේ හා යුරෝපයේ වෙනත් රටවල පුවත්පත් හා සඟරාවල ලංකාව පිළිබඳ පළ වූ වාර්තා, ඡායාරූප හා චිත්‍ර එකතුවක් ද පෘතුගීසීන් හා ලන්දේසීන් ඇඳින ලද ලංකාවේ විවිධ ස්ථානවල සිතියම් 150 කට වැඩි මුල් පිටපත්ද ඇතුළත්ය. පියෙරෝ එසේ ලංකාව පිළිබඳ එකතු කර ඇති ලිපි ලේඛන, වාර්තා එකතුව ඇසුරින් මේ ලිපි මාලාව සැකසෙයි.**

The view of Kandy, the capital of the central province, beginning with the Government granary on the right, comprises consecutively the Ceylon Rifle Mess-house, the Magazine, on an island, and formerly the King's harem; the Library (once the King's baths), the great Temple of Kandy, with its octagonal tower, the new Episcopal Church, and the Bank. To the right of the granary, is seen part of a coffee estate, while behind the centre of the view winds "Lady Horton's walk," a delightful and most picturesque ride, from part of which one sees the extensive vale of Doombera, with the Maha Villé Ganga, or Great Yellow-sand River, winding through it, and forming one of the most charming prospects in the world. The lake in the foreground is artificial, having been formed by one of the Kings of Kandy, by banking up the lower end of the valley, at that time full of terraced rice-fields. It improves the appearance of Kandy very much, and a beautiful drive runs along its banks, the whole way round.

## මහනුවර වර්ෂ 1850 දී



19 සියවසේ අග භාගයේ මහනුවර නගරයේ ස්වරූපය පිළිබිඹු කෙරෙන මෙම සිතුවම Illustrated London News හි 1850 අගෝස්තු 17 දින Kandy, Sketched from Under Castle Hill යනුවෙන් පළ වී තිබේ. මෙම සිතුවමට අදාළ විස්තරයට අනුව සිතුවමේ දකුණු පස සිට වමට පිළිවෙළින් දක්නට ඇති ගොඩනැගිලි වන්නේ රජයේ ධාන්‍යාගාරය, සිලෝන් රයිෆල් රෙජිමේන්තු සෙබළුන්ගේ විවේකාගාරය, ආයුධ ගබඩාව, රජුගේ අන්තඃපුරය, පුස්තකාලය (පැරණි රජවරුන්ගේ නාන ගෙය), දළඳ මාලිගාව, බිෂොප් මැදුර, සහ බැංකුව බව සඳහන් කර ඇත. ධාන්‍යාගාරයට දකුණෙන් කෝපි වත්තක කොටසක් පෙනෙන්නට ඇති බව සඳහන් කර තිබේ.

නුවන් ගන්කන්ද

# ඡායාරූපය ගනිද්දි ඒ ඇස් මට කතා කළා

## රටවල් 95ක ඡායාරූප 55000ක් අතරින් තේරුණ වනජීවී ඡායාරූප යුගලයේ කතාව

ලෝකය පුරා වනජීවී ඡායාරූප තරග රැසකි.ඒ සියලු තරග අතර විශේෂම හා මුළු ලොවම පිළිගන්නා ප්‍රමුඛම තරගය වන්නේ "wildlife photographer of the year" තරගයයි. එම තරගයේ ප්‍රදර්ශන මට්ටමට පත්වන තරමේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීම ද ඉතාම අසීරු ඉලක්කයකි.ඒ එම තරගය සඳහා ලොව පුරා අති දක්ෂ වනජීවී ඡායාරූප ශිල්පීන් දහස් ගණනක් කරට කර තරග කරන බැවිනි. බ්‍රිතාන්‍ය ස්වභාවික කෞතුකාගාරයෙන් පවත්වනු ලබන මෙම තරගය පසුගිය ද පවත්වන ලද්දේ 57වෙනි වරට ය.එහි නිහඬ පාර්ශ්වකරුවකු ලෙස බීබීසී ආයතනය ද සිටී.

ගෙවී ගිය 57 වසර පුරාවටම ලංකාවේ එකම එක් අයකු පමණක් ඒ විශේෂ වරම දිනා ගත්තේ ය.ඒ ලංකාවේ සිටින අංක එකේ වනජීවී ඡායාරූප ශිල්පියකු වන රුක්ෂන් ජයවර්ධන මහතා ය. ජූරියේ විශේෂ පැසසුමට (Highly Commended) ලක් වූ එම ඡායාරූපය ඉදිරිපත් වූයේ 2002 වර්ෂයේ දී ය.

මෙවර තරගය සමස්ත ලංකාවේ සියලුම දෙනාට සුවිශේෂී විය.ඒ ඉතිහාසයේ දෙවැනි වතාවට "wildlife photographer of the year" තරගයේ ජූරියේ විශේෂ පැසසුමට (Highly Commended) ලක්වීමට ශ්‍රී ලාංකික ඡායාරූප ශිල්පිනියකට හා අපේ ඉතාම ළාබාල ඡායාරූප ශිල්පියකුට හැකියාව ලැබීම ය.ඔවුන් දෙදෙනාම වෘත්තීය මට්ටමේ ජායරූප ශිල්පීන් නොවීම ද විශේෂත්වයකි.

එම ඡායාරූප ශිල්පිනිය ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර වෙසෙන බුද්ධිලිනි ඩී. සොයිසා ය. ඇය මෙම තරගයේ ක්ෂීරපායී අංශය යටතේ ඡායාරූප දෙකක් යොමු කළා ය. ඉන් එක් ඡායාරූපයක් මෙලෙස සම්මානයට පාත්‍ර විය.'A Great Swim' නමින් එය තරගයට ඉදිරිපත් කර තිබිණි.

එම ඡායාරූපයේ අපූරු පසුබිම් කතාව ඇය අපට හෙළි කළේ මේ ආකාරයට ය.

"මෙම ඡායාරූපය මම ගත්තේ 2020 ජනවාරි මුල් භාගයේදී වගේ. ඒ කෙන්යාවේ මසායි මාරා වනෝද්‍යානයේ දී. අප එහි සිදු කළ අටවන සංචාරය. ඒ වගේම එය ලෝකය වසා දැමීමට පෙර අපගේ අවසන් විදෙස් සංචාරය.අපි 2020 ජනවාරි මාසයේ දී තමයි කෙන්යාවට ගොඩබැස්සේ. ඒ කාලයේ කෙන්යාවට ඉතා අසාමාන්‍ය අන්දමේ ධාරානිපාත වර්ෂාවක් ලැබෙමින් තිබුණා. ඒ වනවිට මසයි මාරා මැද තිබෙන "මාරා තලේක්" ගංගාව ජලයෙන් උතුරා යමින් තිබුණා. ඉවුරු පවා කැඩී යමින් තිබුණේ. අපි එවර ගොඩ බැස්සුවෙත් වෙන තැනකට. 'මසායි' හි වැඩිහිටියන් තම ජීවිත කාලය තුළ මෙවැනි නරක ගංවතුරක් දැක තිබුණෙත් නැහැ. එකෙන්ම හිතා ගන්න පුළුවන් වැස්සේ තරම. මෙවර මසායි මාරා අපි ගියේම පිරිමි චීටා පහක අසාමාන්‍ය හා ප්‍රසිද්ධ සන්ධානය වන 'ටැනෝ බෝරා' කණ්ඩායම බලන්න."

ඇය එක දිගට කියාගෙන යයි.

මේ ඒ චිටාවන් ද මම ද පුදුම වීමි. ඒ අමුතු චීටා එකමුතුව ගැන මා මීට පෙර කියවා තිබිණි.

ඇය නැවත කතා කරන්නී ය.


"මෙය පිරිමි චීටා පස් දෙනකුගේ වාර්තාගත ප්‍රථම එකමුතුවයි. අපි ගොඩබසින විට, ඔවුන් 'තලේක්' ගඟේ



බුද්ධිලිනිගේ ජයග්‍රාහී ඡායාරූපය



බුද්ධිලිනි ඩී. සොයිසා



ගගන මෙන්ඩිස් වික්‍රමසිංහ

අනෙක් පැත්තේ සිරවී සිටින බවත්, මේ ගමනේ දී අපට ඔවුන්ව දැකීමට නොහැකි බවත් ආරංචි වුණා. මෙයින් අපි පුදුම දුකකට පත් වුණා.

දෙවැනි දිනේ දී අපේ පුදුමාකාර මග පෙන්වන්නා සහ මිතුරෙකු වූ මාතිරාට බුෂ්කැම්ප්හි ඇන්ටනි ටිරා "ටැනෝ බෝර" කල්ලිය තලේක් ගඟට ළං වන බවට ආරංචියක් දුන්නා.

ඒ වනවිටත් අපි හිටියේ සිංහයන් සමූහයක් බලන ගමන්. එය අත හැර අපි ගඟ දෙපස බලන්න ගියා. ගං දිය හරිම සැරයි. චීටලා එවැනි වතුරක් තරණය කරයි කියලා හිතන්නත් අමාරුයි.

ගඟේ එහා ඉවුරේ ඉඳන් මුර සංචාරයේ යෙදෙන චීටලා පස්දෙනා දෙස අපි පැය ගණනක් බලා සිටියා. ඔවුන් අනෙක් ඉවුරේ ඉහළට හා පහළට ගියා. සවස් වනවිට අපි බලාපොරොත්තුව අත හැරියා. දැන් අපි ආපහු යන්න හදන්නේ. ඒ වේලාවේ හදිසියේම නායක චීටා ජලයට පැන්නා. ඔහු පසුපස තවත් තිදෙනෙක් පැන්නා. පස්වැනියා තරකමක් පසුබට වුණා. ඒනිසා එයා මේ ඡායාරූපයේ නැහැ.

ඔවුන්ව ඒ රළු ජල පහරේ මීටර් 100 ක් පමණ පහළට ගසාගෙන ගියා. අන්තිමේ ඔවුන් ගොඩබිමට ළඟා වුණා. ඔවුන් ගඟ තරණය කරන තුරුම අපි හිටියේ පුදුම තිගැස්මකින්. එකෙක් ඇත්තෙන්ම තත්පර 10-15 අතර කාලයක් වතුරේ නොපෙනී ගියා. අපි හිතුවේ එයා ඉවරයි කියලා. නමුත් එක පාරටම එයත් ආයි මතු වුණා.අවසානේ ඔවුන් සියලු දෙනාම ආරක්ෂිතව අපි හිටපු ඉවුරට ගොඩ වුණා.

එය අදහ ගන්නත් අමාරුයි. ඒ සතුට සමරන්න අපි එකිනෙකා වැලඳ ගත්තා. ඇත්තට අපේ ඇස්වලින් සතුටු කඳුළු වැටුණා."

ඇය කියා ගෙන යන අතරතුර දී ද හැඟුම් බර වූවා ය.

"ඔවුන්ගේ මුහුණුවල පුදුම හැඟීම් ප්‍රකාශනයක් ඒ ඡායාරූපයේ තිබෙනවා."

මම ඇයට කීවෙමි.

"ඔව් ඇත්ත. නායක චීටාගේ හැඟීම් හරිම ප්‍රබලයි. ඡායාරූපය ගනිද්දී ඒ ඇස් මට කතා කළා.''

'අනේ ඔය කැමරාව පැත්තකින් තියලා අපට උදව් කරන්න' වගේ කතාවක් තමයි ඒ ඇස් මට කිව්වේ.

ඒක ඇත්තටම මට හොඳටම දැනුණා."

බුද්ධිලිනි කීවා ය. සැබැවින්ම ඒ ඇස් මාර ය.

බුද්ධිලිනිගේ මේ ඡායාරූපය දුටු දිනම එය මේ තරගය ජය ගනු ඇතැයි මට සිතිණි. මම ඒ බව මෙන්ඩිස් වික්‍රමසිංහට සේම රුක්ෂන් ජයවර්ධනට ද කී බව මම බුද්ධිලිනිට මේ මොහොතේ කීවේ ය.

"මට රුක්ෂන් කතා කළා. මේක මේ තරගයට දන්න කියලා ඔහු මට කිව්වා. ඇත්තටම ඔහුට ස්තුති කළ යුතුයි"

ඇය නිහතමානීව කියා ගෙන ගියා ය.එලෙසම ඇයගේ වනජීවී මග පෙන්වන්නාට සේම සිය සැමියාට ද මෙහිදී ඇය ස්තුති කළා ය.

මෙවර අනෙක් ජයග්‍රහකයා වූයේ ගගන මෙන්ඩිස් වික්‍රමසිංහ ය. ඔහු තවමත් එකොළොස් වියැති දරුවෙකි. ගගන මම දන්නේ කුඩාම සන්දියේ සිට ය.ඒ අපගේ කල්‍යාණ මිත්‍ර ප්‍රවීණ උරග හා උභය ජීවී විද්‍යාඥ මෙන්ඩිස් වික්‍රමසිංහගේ කනිටු පුත්‍රයා නිසා ය. ඔහු



ගගනගේ ජයග්‍රාහී ඡායාරූපය

සමග අප ද නොගිය වනයක් නැති තරම් ය.

ගගනසේම ඔහුගේ අයියා වන අමතත් පුංචි නැගණිය වන අරංගත් වනපෙත්වලට පුදුම ආදරයක් දක්වන දරුවෝ ය. ඔවුන් අධ්‍යාපනය ලබන්නේ ද නිවසේ සිටම ය. ඒ සිය මව වන නේත්‍ර වික්‍රමසිංහ සමගිනි. ඇය මේ දිනවල සිය ආචාර්ය උපාධියේ අවසන් අවදියේ පසු වන්නී ය.

**ගගන තවමත් එකොළොස් හැවිරිදි දරුවෙක්**

කුඩා ගගන මේ තරගයේ වසය අවුරුදු 10 හා ඊට අඩු කාණ්ඩය ඔස්සේ සිය ඡායාරූපය ඉදිරිපත් කර තිබිණි.ඒ 'Lockdown chicks' යන නමිනි.

"මේ පින්තූරේ ඇත්තටම ගත්තේ අපේ වත්තල ගෙදර උඩු මහලේ ඉඳන්. අපේ ඇස් මට්ටම හරි යන විදියට දිරා ගිය පුවක් ගසක් එහි පසෙක තිබෙනවා.ඒ තුළ තමයි මේ ගිරව් බිත්තර දැම්මේ.'' අයියා තමයි මුලින්ම පින්තූර ගත්තේ. ඊට පහුවෙනිද උදේ මම පාන්දර 5.30 ඉඳන් පින්තූර ගහන්න ගත්තා. ඒ වේලාවේ තමයි මේ පින්තූරේ වැදුණේ."

ගගන හුරතල් ලෙස කීවේ ය.

"මේ ගහ මිය ගිහිල්ලා තියෙන්නේ.ඒත් පහුගිය කාලයේ ගිරව් හය වතාවකට වඩා එකේ බිත්තර දැම්මා. එකෙන් පේනවා, ගහක් මැරිලත් තව කී දෙනෙක්ට උදව් කරනවා ද කියලා. එක නිසා මම හැමෝගෙන්ම ඉල්ලා සිටින්නේ මෙවැනි ගස් පවා ආරක්ෂා කරන්න කියලයි."

ගගන කීයයි.

පොඩි වුණත් ගගන දෙන්නේ රටක් වටින උපදේසයකි.

මේ දෙදෙනාගේම ජයග්‍රහණ රටක් හැටියට අප ලැබූ සුවිශේෂීම ජයග්‍රහණයකි. ලොව පුරා රටවල් 95කට ආසන්න අති දක්ෂ ඡායාරූප ශිල්පින්ගේ ඡායාරූප 55000ක් අතරින් මෙම ඡායාරූප යුගලය අවසන් කිහිපය අතරට පැමිණ තිබෙන ආකාරය විස්මය ජනක කරුණකි. එලෙසම එය අප රට සමස්ත වනජීවී ඡායරූප ක්ෂේත්‍රයටම නව මං විවරවීමකි.



නයනක රන්වැල්ල


වෙද සීයා දැන් ජීවත් වන නිවස

# රජ කුළේ නයා ගහේ බමුණු කුළේ නයා දේවාලේ

## සමන් දෙව් අඩවියේ විෂ වෙද ඉසිවරයා කියයි

### කට තියලා විෂ උරන්න පුළුවන් හපනෙක් අහල ගම් හතක හිටියේ නැහැ

### ආරච්චිගේ ජීවිතේ බේරුවට දුව දෙන්නත් ලෑස්ති වුණා

### බේත් කරපු කිසිම ලෙඩෙක් මැරිලා නැහැ

ඔහු බෝධියාබදුගේ පියසේනයි. වයස අවුරුදු අනූඑකකි. බුලත්සිංහල පරගොඩ ගමේ ඉපදුණ පියසේන සීයා දැන් ජීවත් වන්නේ සමන් දෙවියන්ගේ අඩවිය මායිමේ කිරිඇල්ලේය. බුලත්සිංහල උපන් පියසේන සමන් දෙව් අඩවියේම ප්‍රසිද්ධ වූයේ සර්ප වෙදකම නිසාය. කෙටියෙන් කිවහොත් ඔහු පළාතම දන්නා විෂ වෙද මහත්තයාය.

''මගේ අම්මා කෝට්ටගොඩ මහවිදානලාගේ ලිසිහාමි. තාත්තා බෝධියා බදුගේ සීමොන් පෙරේරා. මගේ සීයා තෙලේනිස් ගම්පති. එයාගෙ මුල්ගම මාතර. සීයාට ගම්මුලාදෑනිකම ඇරුණම පොලිස් ආරච්චි, වෙද ආරච්චි, වෙල් විදානෙ වගේ තානාන්තර පහක් තිබිලා තියෙනවා. සීයා වෙදකම, යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්, නැටුම් මේවා හොඳට දැනකියා ගත්තු කෙනෙක්. පැංචා කාලෙ ඉඳන්ම මම වෙදකමට ආසයි. සීයාගෙ පරම්පරාවේ වෙදකම තමයි මට පිහිටලා තියෙන්නේ.''

පියසේන ඉපදුණේද බරසාර පවුලකය. කන්දෙ විහාරයේ කපුධුරය ඉසිලූ පියදස ඔහුගේ සහෝදරයෙකි. යසෝහාමි සහ ඇඩ්ලින් සහෝදරියන් දෙදෙනාය. දෝලිස්, දිමෝනිස්, තෙලේනිස්, උක්කු සිංඤෝ, චට්ටප්පු සහ සූටිං පවුලේ ඉතිරි සාමාජිකයෝය. තාත්තාද හොඳ කට්ටඩියෙකි.

**වයස අවුරුදු පහ සපිරෙන විටම තාත්තා පියසේන කළුවාමෝදර පන්සලේ වැඩ වාසය කළ මොරගල්ලේ ඥානෝභාෂ හාමුදුරුවන්ට භාරදුන්නේ උගතකු කිරීමටය. කැමති නම් මහණ කිරීමට ද අවසරය දුන්නේය. එහිදී ඔහු බුද්ධ ගජ්ජය, සකස්කඩය, සූරිය ශතකය, අනුරුද්ධ ශතකය මෙන්ම පාලි සංස්කෘත ද ඉගෙන ගත් අතර පැරණි පුස්කොළ පොත් කියවීමේ හැකියාව ද ලබා ගත්තේය. ධර්ම කරුණු කාරණා මැනවින් අවබෝධ කරගත් හෙතෙම වෙද ගැට මෙන්ම කවි ස්තෝත්‍ර පවා ඉගෙන ගත්තේ වෙද හාමුදුරුවන්ගෙන්ය. නමුත් වසර පහක් හයක් ගතවෙත්ම මහණවීමේ ආසාව අත්හැර දැමූ පියසේන නැවත ගම්රට බලා ආවේ ගිහි ජීවිතයට ආසාවෙනි.**

''ආයෙ වංගියක් ගමට ආවේ පළමුවැනි ලෝක යුද්ධ කාලෙදි. තාත්තාගෙ ගොවිතැන් වැඩ හේන්වැඩ වැඩකරගෙන ටික කාලයක් ගමේ හිටියා. මට ඒකත් එපා වුණා. ඊට පස්සේ මම ගියා සයිමන් බාප්පා ළඟට. සයිමන් බාප්පා හිටියෙ රත්නපුරේ කිරිඇල්ලේ. උන්නැහැ සමන් දෙයියන්ගෙ රටේ හොඳ අඩව් කස්තිරං අල්ලපු නැට්ටුවෙක්. සුද්දන්ගෙන් පවා ගරු නම්බු ලැබිලා තියෙනවා. බලි තොවිල්, දෙවොල් මඩු, පූන මඩු, ගම්මඩු වගේම වෙදහෙදකම්වලට යනකොට බාප්පගෙ පුතා කවිකුමාරත් එක්ක මාත් යනවා. ඔහොම කාලයක් ඉන්නකොට බාප්පාගේ සාත්තරෙන් වැඩි හරියක් මං ඉගෙන ගත්තා.''


වෙද සීයා

මේක තමයි මගෙ පොත කියා ඔහු පපුව සහ හිස අත ගෑවේ සියලු දේ ඇත්තේ සිතේ සහ ඔළුවේ බව කියමිනි.

කලක් වෙද සීයා රත්නපුරේ ගොපලු කට්ටඩි ළඟ නැවතී වෙදකම ඉගෙන ගෙන ඇත්තේය.

''මම රත්නපුරේ ඉන්නකොට මුවගම පළාතේ හිටපු ආරච්චි මහත්තයාව පොළඟෙක් කාලා. වලව්වෙ මිනිහෙක්ව එවලා තිබුණා මාව එක්කරගෙන යන්න. මම යනකොට ආරච්චි උන්නැහැ ඇස් පිල්ලම් ගහන්නෙත් නැහැ. සිහි මූර්ජා වෙලා වගේ හිටියේ. මම මන්තරයක් කියලා විෂ ඉරුවා. ඊට පස්සෙ තවත් විෂ බස්සන්න කසාය බෙහෙත් දුන්නා. කැඳ උයලා දුන්නා. විෂ බස්සලාම තමයි මම නැගිට්ටෙ. හැමෝම හිතුවෙ ආරච්චි කම්මුතුයි කියලා.''

ඉන්පසුව ආරච්චිගෙන් ඔහුට ලැබුණේ එසේ මෙසේ තුටු පඬුරු නම් නොවේ. ආරච්චිගේ දියණිය සරණපාවා දීමේ අරමුණින් ඔහුව නිවසේ නතර කරගෙන සිල්ලර බඩු කඩයක් දමා දී එහි භාරකාරත්වයද ඔහුට පවරා දුන්නේය.

වසර දෙක තුනක ඇවෑමෙන් මට හිරේට ගෑනුත් එපා කියාල නැවත ආවේ කිරිඇල්ලේ සයිමන් බාප්පා ළඟටය. ඒ සයිමන් බාප්පා සමග තොවිල් පවිල්වලට රටවටා යාමටය. මේ අතරතුර මාතර බෝපාගොඩ විසූ අමරසිංහ කංකානම්ගේ හින්නිහාමිට හිත ගියෙන් පියදස ඇයව කරකාරයට ගත්තේය. ටිකකලක් මාතර පදිංචිව සිට දෙදෙනා නැවතත් ගමට ආවේ දරුවන් ද සමගය. මේ දෙපොළට දරුවන් හය දෙනෙකි. කරුණාරත්න, ඥානරත්න, ධර්මරත්න, ආරියරත්න, දයාරත්න, සමග එකම දියණිය චන්ද්‍රාවතී ඒ අයය.

නයෙක් දෂ්ඨ කළවිට විෂ නසන්නට වෙද සියා හැබෑ හපනෙකි. බුලත්විටක් ඒද ලොඹු කටේ ඔබාගත් වෙද සියා පුටුවක හරි බරි ගැහුණේ ලොකු කතාවකටය. දැන් ඉතින් අපට තිබෙන්නේ හූ මිටි තබමින් අසා සිටින්නටය.

''නයාව ඕනෙම කෙනකුට පහසුවෙන් අඳුර ගන්න පුළුවන් සර්පයෙක්. නයා ලංකාවේ ඕනෙම ප්‍රදේශයක ජීවත් වෙනවා. නයාට ඉලක්කය වරදින්නේ බොහෝම කලාතුරකින්. පොළඟා කොයිතරං විෂ වුණත් ඌට නයාට තරම් ඉලක්කය ගන්න අමාරුයි. ඔය ගුල්වල ඉන්න නයි දවසේ එක වෙලාවක එළියට ඇවිත් අව්ව තපිනවා.''

රජ බමුණු වෙළෙඳය
ගොවිකුල වෙසව් කුලමය
සපුන්ටද එකලෙසය
එයින් විස සපු මෙලෙස කියමුය

''මහත්තයෝ සර්පයෝ ගත්තහම කුල 18ක අය ඉන්නවා. නාගයෝ රජ, බමුණු, වෙළෙඳ ගොවි කුලවලට බෙදෙනවා. රජ කුලේ නයා ඉන්නේ ගස් උඩ. අපිට දකින්න ලැබෙන්නෙ නැහැ. ගහක් උඩදි නයෙක් දෂ්ඨ කළොත් සනීප කරන්න ලේසි නැහැ. හැබැයි ගහක් උඩ ඉන්න නයෙක් දැක්කොත් ඒක වාසනාවක් කියලා තමයි එද ඇත්තො කියන්නෙ. ඒ වගේම වෙළෙඳ කුලේ නයා ළඟ තමයි නාග මාණික්‍ය තියනවයි කියන්නේ. ඒවගේම තමයි මහත්තයෝ බමුණු කුලේ නයා ඉන්නේ දේවාලවල. ගොවිකුලේ නයා තමයි පහත් කුලයක ඉන්නේ. ඔය නයි විෂ තිබුණට කුණකටුවා, කරවලා, පොළොන් තෙලිස්සා, පොළඟා වගේ සර්පයෝ පහත් කුලවල සර්පයන්.''


වෙද සියා කොරෝනා එන්නත ලබා ගනිමින්

**නයෙක් දෂ්ඨ කළවිට ප්‍රතිකාර සඳහා ගන්නා බෙහෙත් වර්ග රාශියක් වෙද සීයා අපි සමග කීවේ කිසිම ගුරු මුෂ්ටියක් නැතුවය. නික කොළ, කළ කොළ, සමව ගෙන අඹරා මිරකා ගත් යුෂ පෙවීම, නික මුල් අඹරා පෙවිමත්, නික මුල් මුවෙන් සැපීමත් කළ හැකිය. මූණ මල් ඇට සීනි සමව ගෙන පිරිමි මුත්‍රයෙන් අඹරා පානය කරවීමත් නස්න කරවිමත් හොඳය. මිරිස් සහිඳ ලුණු පෙරුම් කායම් බුකිඳ සමව ගෙන අඹරා මිනිස් මුත්‍රයෙන් ඇඟ ගෑමත් නස්න කිරීමත් හොඳය.**

නාග විෂට බෙහෙත් කියන කවියක් ද වෙද සීයා ගායනා කළේය.

**මඟුලේ යන උන් දැක ලා - කුඹුරේ මඩ කළල් ක ළා**
**වැස්සට පැල යට ඉඳ ලා - නාග විෂට නස්න ක ළා**

මෙයින් කියවෙන්නේ මඟුල් කරඳ ඇට මද, කුඹුරු ඇට මද සමව ගෙන නර මුත්‍රයෙන් අඹරා නස්න කිරීමෙන් නයි විෂ නසන බවයි.

වෙද සීයා විෂ උරන්නට හැබෑ දස්සයෙකි. ඔහු පළමුව කරන්නේ කැලෙන් හොයාගත් බෙහෙත් කොළ ටිකක් සමග දෙහි බෑයක් කටේ ඔබා ගැනීමය. ඉන්පසුව කරන්නේ තවත් දෙහි බෑයක් ගෙන කෑ මුඛයේ හොඳින් අතුල්ලා මුඛය පාදු ගැනීමය. ඊට පසුව කරන්නේ මන්ත්‍ර ජප කරමින් කෑ මුඛයට වෙද සියාගේ මුඛය තබා උරමින් පඩික්කමට කෙළ ගැසීමය. හත්වරක් පමණ උරන විට සර්ප විෂ ශරීරයෙන් ඉවත් වී ලෙඩා සුව අතට හැරෙන්නේය.

''විෂ උරනවා කියන එක ලේසි පහසු වැඩක් නෙමෙයි මහත්තයෝ. හැම වෙදම ඒක කරන්නෙ නැහැ. විෂ අපේ ඇඟට ගියොත් සමහර වෙලාවට අපේ ඇස් අන්ධ වෙන්න පුළුවන්. කෙස් යන්න පුළුවන්. දද කුෂ්ඨ හැදෙන්න පුළුවන්. වකුටු වෙන්න පුළුවන්. ඒ විතරක් නෙමෙයි මැරෙන්න වැඩිවෙලාවක් යන්නෙත් නැහැ. ඒත් පළපුරුද්දෙන්ම කරන නිසා ඒ කාලෙ මාව ප්‍රසිද්ධ වෙලා හිටිය විෂ උරන වෙද හැටියට.''

සර්පයන් සපා කෑ කීදෙනෙකුට විතර වෙදකම් කරලා තියෙනවාදැයි අපේ පැනය විය.

''අම්මෝ මයෙ හිතේ එක සියදස් ගාණක් ගෙනත් ඇති සර්පයො කාලා. මා ළඟට ගෙනාව කිසි කෙනෙක්ව මැරිලා නැහැ. මං කරන්නේ පයිංඩෙ අරන් එන කෙනාගෙ දූත ලක්ෂණ බලනවා. සෙනසුරාදු පෝය දවසක අවටක දවසක සර්පයෙක් කෑවොත් ටිකක් අමාරු වෙනවා. දූත ලක්ෂණ හුඟක් තියෙනවා. ඇහැ කැසුවොත්, හිස කැසුවොත්, හෙමින් ආවොත්, වේගයෙන් ආවොත්, ගොත ගහමින් කිව්වොත්, අත් දෙක කැසුවොත්, වැඳලා කිව්වොත් මට සර්පයාව ටක්කෙටම අඳුර ගත්තැහැකි. ඒ වගේ අංග ලක්ෂණ දේහ ලක්ෂණ බලනවා.''


දියණිය

90 දශකයේ කුකුළේ ගඟ ජලවිදුලිබලාගාරය ආරම්භ කරන කාලයේ කොස්ගුලනේ සිට කලවාන දක්වා තිබුණේ එක දිගට රූහැයියන් හඬන මහ කැලෑවකි. මේ කැලය කපා සංවර්ධන කටයුතු සිදුකරන්නට සේවකයන් සිය ගණනක් පැමිණියේ ලංකාවේ හතරදිග් භාගයෙනි. ඒ ඇත්තන් කැලේ කොළේ වැඩ කරද්දි සතා සර්පයාගෙන් සිදුවූ පීඩාවන් අපමණය. ඒ හැම මොහොතකම ඔවුන්ගේ පිහිටට හිටියේ පියසේන වෙද සීයාය.

''මම කවදාවත් මහත්තයො සල්ලිවලට සාස්තරේ බාල්දු කරලා නැහැ. සමහරු බුලත් දුම්කොළ අතක් ගේනවා. බුලත්විට හපන නිසා ඒක මං භාරගන්නවා. ඒ හැරෙන්න හිතේ සංතෝසෙන් කීයක් හරි දීලා ගියොත් ඇරෙන්න සල්ලි ගන්නෙ නැහැ. සල්ලි ගත්තනං මාලිගා හදන්න තිබුණා . මැරෙන්න ගිය ඇත්තංව ගොඩ දලා මං කරන පින මට සංසාරෙන් එතෙර වෙන්න ඇති . ඒ පිනෙන් මට සාස්තරේ උගන්නපු තෙලේනිස් සීයයි, ගුරු හාමුදුරුවොයි මාව හැදුව වැඩුව මව් දෙමව්පියොයි බුදුන් දැක නිවන් දකින්න ඕනෙ.''

**එකල කුකුළේගඟ කෙළින් කන්ද පමණක් නොව හතරදිග් භාගයටම හිටියේ පියසේන වෙද සීයා පමණය. කපුගෙදර, පරගොඩ, ගලහිටිය, මුනිහින්කන්ද, සමන්පුර, බාම්පාර, ගවරගිරිය, කොළඹෑව, මෝල්කාව, තැන්නහේන, උඩුවන්කන්ද, ආදී මෙකී නොකී ගම්මානවල ඇත්තන් එන්නේද වෙද සීයා ළඟටය. වර්තමානයේ මෙන් ගමනාගමන පහසුකම් නොමැති එකල කඳු පල්ලම් බැස කුකුළේ ගඟෙන් එතෙරවී බුලත්සිංහල ඩිස්පෙන්සරියට හෝ මගුරු ගඟෙන් සහ පෙළොන් ගඟෙන් එතෙරව බදුරලිය ආණ්ඩුවේ බෙහෙත් ශාලාවට යා යුතුය. කොහේට ගියත් මෝල්කාව හන්දියට පැමිණිය යුත්තේ ලෙඩාව කඳක දමා ඔසවාගෙන අඩිපාර දිගේය. මෙවැනි අවස්ථාවල සුව අතට පත්වන තෙක් දින දෙක තුනක් රෝගියා තම නිවසේ නවතාගෙන වෙදකම් කරන අවස්ථාද එමටය.**

**රුසියගෙ දෙරකඩ උපන් ගසේයා**
**රිසි ඇති දලු ගෙන සින කෙරේයා**
**අඩි විෂ ගත පැතුරුන නොලසේයා**
**බසි රිවි දුටු පිනි විලසේයා**

**මල් තුඹ අලයක් උදුරා ගන්නේ**
**දෙහි ඇඹුලෙන් ගලගා විලසින්නේ**
**මුත්‍රාවෙන් කෑ මුබේ ගාන්නේ**
**සර්ප විෂය නැති කරවයි දන්නේ**

''සර්පයන්ට කරදර නොකර කුලප්පු නොකර ඉන්නවා නම් උන්ගෙන් අපිට කදරයක් නැහැ මහත්තයෝ. උන් ඉන්නෙ අපිට බයේ. අපි කුලප්පු කරලා ඌව බය කළාම තමයි ඌ අපිට දෂ්ඨ කරන්න එන්නේ. සර්පයෙක් දැක්කොත් මහඇරලා යන එක තමයි නුවණක්කාරම වැඩේ. මිනිස්සු වගේම සර්පයනුත් මේ කැලේ කොළේ ඉන්න එපැයි. උනුත් ජීවිතේට ආදරෙයිනේ මහත්තයෝ.''


වෙද සීයා සර්ප විෂ වෙදකමට පමණක් නොවේ සර්වාංග වෙදකමටම දස්සය. දරුවන්ගේ වලිප්පුවට නූල් බඳින අතරේ බාලගිරි දෝෂය හෙටට පමණක් නොවේ සදහටම කල් දමයි. ඇස්වහ කටවහ දෝෂ යක්ෂ ප්‍රේත භූත දෝෂ හදි හූනියම් මේ සියල්ලටම පිළියම් ඔහු සතුය. බොහෝ විට බුදුගුණයෙන් සෙත් ශාන්ති සිදුකරන අතර හැමදාම නින්දට පෙර දෙවියන් බුදුන් වන්දනාමාන කර පින් දෙන්නට අමතක කරන්නේ නම් නැත.

අනූවයස් ඉක්ම ගිය වෙද සියා දැන් දිවි ගෙවන්නේ චන්ද්‍රාවති දියණියගේ ආදරය සහ රැකවරණය මැදය. වයෝවෘද්ධ බවත්, කොරෝනා වසංගතයත් සලකා මේ දිනවල වෙදකම් කිරීම සඳහා ගෙයින් පිටට යන වාර අඩුය. කෙසේ වෙතත් පරපුරෙන් පරපුරට උරුම වූ වෙදකම යන්තමින් හෝ ඉදිරියට ගෙන යාමට චන්ද්‍රාවතී දියණිය ඉදිරිපත්වීම ගැන වෙද සියා ඉන්නේ බලවත් සතුටිනි.

ඉන්දික සංජීව විතාන


# ප්‍රශ්න පත්‍ර සාකච්ඡාව
## සෑම ඉරිදා දිනකම
## උදෑසන 6.30 - 8.00 දක්වා

PEOTV Dialog TELEVISION
Channel No. 14
අද දෙරණ
Education නාලිකාව
ADA derana EDUCATION
තුළින්




දිවයින පුරා පුවත්පත් නියෝජිතයන්ගෙන් සහ පොත්හල් වලින්
දැන් මිලදී ගත හැක
විශේෂ ඇනවුම් සඳහා විමසන්න, රුවන් - 0762568348

## ලංකා බැංකුවේ 82 වන සංවත්සරයට සමගාමීව 'BOC Connect' නියෝජිත බැංකු සේවාව ඇරඹෙයි

ලංකා බැංකුවේ 82 වන සංවත්සරයට සමගාමීව එහි නවතම හඳුන්වා දීම වන 'BOC Connect' Palmtop සේවාව ක්‍රියාත්මක කිරීම ආරම්භ කෙරිණි. මෙමගින් තම ගනුදෙනුකරුවන්ගේ එදිනෙදා බැංකු කටයුතු වඩාත් පහසු කිරීම ලංකා බැංකුවේ අරමුණයි.

මෙම සේවාව පසුගියදා ගෝනවන්නෙන්ල සහ මහදිවුල්වැව්වේදී ආරම්භ කෙරුණු අතර, එම අවස්ථාවට ලංකා බැංකුවේ සභාපති කාංචන රත්වත්තේ, ඇතුළු ආයතනික හා විධායක කළමනාකාරිත්වයේ නිලධාරීහු සහභාගි වූහ.

නගරයට මෙන්ම ගමටද සමාන ලෙස සේවාවන් ව්‍යාප්ත කිරීම, ග්‍රාමීය ප්‍රජාව වෙත ඩිජිටල්කරණයේ ප්‍රතිලාභ ලබාදීම මෙන්ම, මෙරට ශාඛා රහිත බැංකුකරණය ප්‍රචලිත කිරීම යන අරමුණු මුල්කර ගනිමින් ලංකා බැංකුව ආරම්භ කළ 'BOC Connect' සේවාව මගින් සියලුම මූල්‍ය සේවාවන් ඒ වෙනුවෙන්ම පත් කරන ලද විශේෂ නියෝජිතයන් හරහා ලබාදීම කැපී පෙනේ. මෙහිදී මෙරට සෑම පළාතක්ම ආවරණය වන පරිදි ලංකා බැංකුව විසින් බලයලත් නියෝජිතයන් පත් කර ඇති අතර, මුදල් තැන්පත් කිරීම, මුදල් ආපසු ගැනීම, මුදල් හුවමාරු කිරීම (පවතින BOC ගිණුම් අතර) බිල්පත් ගෙවීම ඇතුළු වෙනත් බොහෝ මූල්‍ය සේවාවන් සඳහා පහසුකම් සැපයීම වගකීම මෙම නියෝජිතයන්ට පැවරී ඇත. 'BOC Connect' ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ණ අනුමැතිය සහිතව ක්‍රියාත්මකවන සේවාවක් වන එමගින් මෙරට මූල්‍ය ක්ෂේත්‍රයට නවමු අත්දැකීමක් ලබා දෙයි.

BOC Smart Online බැංකු සේවාව, B app, BOC Smart ගිණුම් හිමියන් වෙත හඳුන්වා දුන් Smrt Passbook, Smartpay හා SmartGen ඩිජිටල් ගිණුම වැනි නව ඩිජිටල් බැංකු සේවාවන් රැසක් මෙරට මූල්‍ය ක්ෂේත්‍රය වෙත හඳුන්වා දීමෙන් ලංකා බැංකුව තම ඩිජිටල් මාවතේ බොහෝ සන්ධිස්ථානයන් පසුකර තිබේ. එමෙන්ම Branch on Wheels ජංගම බැංකු සේවාව, ගිණුම් විවෘත කිරීම සහ ණය අයැදුම් කිරීම සඳහා Online පහසුකම් ලබාදීම, අන්තර්ජාලය හරහා ගෙවීම් කටයුතු සිදු කළ හැකි IPG සේවාව එවැනි බොහෝ නවීන තාක්ෂණික සේවාවන් ලංකා බැංකුව මගින් ක්‍රියාත්මක කරයි.

## 2020 වර්ෂයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විශාලතම ණය දෙන්නා බවට කොමර්ෂල් බැංකුව පත් වේ

කොමර්ෂල් බැංකුව 2020 වසරේ දී මෙරට සියලුම රාජ්‍ය, පෞද්ගලික සහ විශේෂිත බැංකු අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විශාලතම බැංකු ණය දෙන්නා බවට පත් වූ බව මුදල් අමාත්‍යාංශය තහවුරු කර ඇත. සමස්ත ණය වටිනාකම සහ ණය සංඛ්‍යාව යන දෙකම ද එය රටේ මුළු ණයවලින් පහෙන් එකකට වඩා වැඩි අගයක් නියෝජනය කරයි.

2020 සඳහා වූ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවට අනුව, වසංගතයෙන් බලපෑමට ලක් වූ වර්ෂය තුළ මූල්‍ය ආයතන 19ක් විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ලබා දුන් රුපියල් බිලියන 759.7ක ණය අතුරින් 21.57%ක් හෙවත් රුපියල් බිලියන 163.98ක ණය කොමර්ෂල් බැංකුව ලබා දී ඇති අතර බැංකුව මගින් ලබා දුන් 58,584ක් වූ ණය සංඛ්‍යාව ලබා දී ඇති සමස්ත ණය සංඛ්‍යාව වන 245,883න් 23.82%ක් නියෝජනය කරයි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා කොමර්ෂල් බැංකුව ලබා දුන් ණයවල වටිනාකම ඊළඟ ණය දෙන්නා ලබා දුන් ණයවල වටිනාකමට වඩා රුපියල් බිලියන 21.6කින් හෙවත් 15%කින් වැඩි වන බව අමාත්‍යාංශ ප්‍රකාශිත දත්ත හෙළි කරයි.

ණය 9,654ක් තුළින් රුපියල් බිලියන 45.9ක් හෙවත් මුළු වටිනාකමින් 21.3%ක් ලබා දීමෙන් කර්මාන්ත අංශයට වැඩිම ණය ලබා දුන් මූල්‍ය ආයතනය බවට ද කොමර්ෂල් බැංකුව පත් විය.

මේ පිළිබඳව අදහස් දැක් වූ කොමර්ෂල් බැංකුවේ කළමණාකාර අධ්‍යක්ෂ එස්. රෙනගනාදන් මහතා පැවසුවේ "අපේ මෙහෙවර සහ ජාතික අභිලාෂයන් සඳහා වූ අපගේ කැපවීම පිළිබඳව මීට වඩා හොඳ නිදර්ශනයක් නොතිබිය හැක" බවයි. "ශ්‍රී ලංකාවේ පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් ලෙස අප දරන තත්ත්වය ද මෙම දත්ත නැවත තහවුරු කරනවා. මෑතකදී එක්සත් රාජධානියේ සීඩීසී සමූහයෙන් බැංකුව ලබා ගත් එක්සත් ජනපද ඩොලර් මිලියන 50ක ණය සමග සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහයෝගය දැක්වීමේ අපගේ භූමිකාව තවදුරටත් ශක්තිමත් වනවා," යැයි ඒ මහතා තවදුරටත් පැවසීය.

## පැරා ඔලිම්පික් යන අපේ දක්ෂයන්ට සරසවි ඉන්ඩස්ට්‍රීස් වෙතින් අතහිත

### RESPIRONE NANO AV 99 Face Mask සමගින් Yoo පාවහන් බෙදා දෙයි

ගුණාත්මක බවින් යුත් නිෂ්පාදන වෙළෙඳපොළට හඳුන්වා දෙන මෙරට කීර්තිමත් ආයතනයක් වශයෙන් පාරිභෝගික විශ්වාසය අඛණ්ඩව දිනාගත්, අප කා අතරත් ආගන්තුක නාමයක් නොවන මෙන්ම මේ වන විට මෙරට විශාලතම මේස් නිෂ්පාදන කරනු ලබන සරසවි ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම මෙවර පහළොස්වන ටෝකියෝ පැරා ඔලිම්පික් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වන අපගේ දක්ෂයන් ඇගයීමට ලක් කෙරිණි. ඒ අනුව සරසවි ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය කරනු ලැබූ RESPIRONE NANO AV 99 මුහුණු ආවරණ සහ 100%ක් දේශීය නිෂ්පාදනයක් වශයෙන් වෙළෙඳපොළට හඳුන්වා දුන් Yoo පාවහන් ඔවුන්ට ප්‍රදානය කළේ මස 22 වන දින සිදු කරනු ලැබීය. මෙවර පැරා ඔලිම්පික් තරගාවලිය සඳහා සම්බන්ධ වන අපගේ මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම සඳහා RESPIRONE NANO AV 99 මුහුණු ආවරණ මගින් සුවිශේෂී පිටිවහලක් හිමිවන අතර විවිධ තරඟ අංග සඳහා වඩාත් ශක්තිමත්ව සහ විශ්වාසයෙන් යුතුව මුහුණ දීමටත්, තරඟ කිරීමටත් උසස් ප්‍රමිතියෙන් නිෂ්පාදිත Yoo පාවහන් ඔවුන්ට රුකුලක් වනු නියතය.

විශේෂයෙන්ම මෙරට වෙළෙඳපොළෙහි පවතින 75%ක මේස් නිෂ්පාදන ප්‍රතිශතයකට හිමිකම් කියන සරසවි ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම 1991 වසරේ සිට මේ වන තෙක් දශක තුනකට අධික කාලයක් මේස් නිෂ්පාදනය කරමින් සිය නිෂ්පාදනයන්හි ප්‍රමිතිගත සන්නාමය තහවුරු කිරීමට සමත්ව සිටී. නවෝත්පාදන තාක්ෂණික ප්‍රගතිය සහ කාර්යක්ෂම ශ්‍රම බළකාය මගින් සිදු කරනු ලබන මෙම දැවැන්ත මෙහෙයුම තුළින් මෙරට පාරිභෝගිකයන් අතර ආනයන මේස් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අවම කිරීමටත්, එමගින් ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට මුදල් ගලා යාම අවම කිරීමටත් සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇති බව කිව යුතුමය. සරසවි අපනයන පුද්ගලික සමාගම සහ දකුණු ආසියානු කලාපයේ දෙවැනි විශාලතම මේස් නිෂ්පාදන ආයතනය වන ඉසබෙලා පුද්ගලික සමාගම සරසවි ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගමේ අනුබද්ධිත ආයතනයක් වන 2020 වසරේ ජනවාරි මාසයේදී Yoo Brands පුද්ගලික සමාගම පළමුවරට 100%ක් මුවදු රහිතව මසන ලද පාවහන් නිෂ්පාදනය කරමින් Yoo වෙළෙඳනාමය යටතේ ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබීය. එපමණක් නොව විශේෂිත මැහුම් තාක්ෂණයට අනුගතව පාදයට හොඳින් ගැළපෙන පරිදි පාවහන්වල නිමාව සිදුකරනු ලබන අතර එම තාක්ෂණ ක්‍රමවේදය මගින් දැනට වෙළෙඳපොළේ ඇති පාවහන්වලට වඩා 50%කින් අඩු මිලකට මෙම නිෂ්පාදන ලබා ගැනීමට හැකිවීම සුවිශේෂී කරුණකි.



## ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට භාවිත නොකළ ඩේටා ඊළඟ බිල්පත් ගෙවීම දක්වා ගෙන යෑමේ පහසුකම Airtel සිය පසුගෙවුම් පාරිභෝගිකයන්ට ලබා දෙයි




එයාර්ටෙල් ලංකා සමාගමේ විප්ලවීය 4G සේවා සහ Freedom Packs දියත් කිරීමෙන් අනතුරුව, සමාගම සිය පළමු Freedom පසුගෙවුම් සැලසුම් සඳහා වූ සුවිශේෂී 'Data Rollover' පහසුකම ප්‍රථම වරට ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇත. මෙම නව හඳුන්වාදීමත් සමග භාවිතයට නොගත් සියලුම ඩේටා ඊළඟ බිල්පත් ගෙවීම දක්වා භාවිතයට ගැනීමට පාරිභෝගිකයන්ට අවස්ථාව හිමි වේ.

සිය පසුගෙවුම් පාරිභෝගිකයන්ගෙන් වාරිකයක් අය කරන අන්තර්ජාල සේවා සපයන සමාගම් වර්තමානයේ දී සිදු කරනුයේ එක් එක් බිල්පත් කාලය අවසානයේ අලුතින්ම ඩේටා quota එකක් ලබා දී පසුගිය, භාවිතයට නොගෙන ඉතිරි වූ ඩේටා සීයල්ල අහෝසි කිරීමයි. මේ දක්වා තමන් මුදල් ගෙවා ඇති මෙම පසුගිය ඩේටා ප්‍රමාණය ප්‍රයෝජනයට ගැනීමට පසුගෙවුම් පාරිභෝගිකයන්ට විකල්පයක් නොතිබුණ අතර 'Data Rollover' මගින් එම අවස්ථාව දැන් හිමි වේ. ඒ අනුව, 'Data Rollover' පහසුකම එයාර්ටෙල් විසින් සරල හා වඩා හොඳ වටිනාකමක් ඇති ජාලකරණ අත්දැකීමක් පමණක් නොව සමස්ත ක්ෂේත්‍රය තුළම පාරිභෝගිකයා කේන්ද්‍ර කර ගැනීම සඳහා වූ ක්‍රියාකාරී ප්‍රවේශයක් මගින් පාරිභෝගිකයා සවිබල ගැන්වීම උදෙසා ශ්‍රී ලංකාවේ ජංගම විදුලි සංදේශ ක්ෂේත්‍රයට මෙවැනි ආකාරයේ නව හඳුන්වා දීමක් සිදු කළ පළමු අවස්ථාව වේ.

පසුගෙවුම් පාරිභෝගිකයන්ට තම ඉතිරි ඩේටා ප්‍රමාණයෙන් 200 GB දක්වා ප්‍රමාණයක් ඊළඟ මාසයට ගෙන යා හැකි අතර එය නව මාසයේ ප්‍රතිලාභ ලෙස භාවිත කළ හැකිය. මෙම නව පහසුකම මගින් පසුගෙවුම් පාරිභෝගිකයන්ට වඩා කල් ඉකුත් වීම ගැන කරදර විය යුතු නැති අතර ඔවුන් දැනටමත් මුදල් ගෙවා ඇති ඩේටා නාස්ති වීමක් සිදු නොවන බවට සහතික කෙරේ. මෙම rollover පහසුකම නව Freedom පසුගෙවුම් සැලසුම් සහ වෙනත් තෝරාගත් සැලසුම්වල නිතැතින්ම පැමිණේ.

## කෙල්සි හෝම්ස් එහි විශාලතම මිශ්‍ර නිවාස ව්‍යාපෘතියේ 3 වන අදියර ආරම්භ කරයි



ශ්‍රී ලංකාවේ පුරෝගාමී දේපළ වෙළෙඳාමකරුවා වන කෙල්සි හෝම්ස් විසින් සිය නවතම ව්‍යාපෘතිය වන සෙන්ට්‍රල් පාර්ක් ජා-ඇල ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියරයන් සාර්ථකව අවසන් කර එහි තුන්වැනි අදියරත් ආරම්භ කිරීමට බලාපොරොත්තුවෙන් සිටියි. ශ්‍රී ලංකාවේ විශාලතම මිශ්‍ර නිවාස ව්‍යාපෘති අතරින් එකක් වන සෙන්ට්‍රල් පාර්ක් ජා-ඇල නිවාස ව්‍යාපෘතියේ නිවාස ඒකක 350කට අධික විවිධ පහසුකම් 40කටත් වඩා වැඩි නවාංකරණය හා සබැඳුණු නිවාස ව්‍යාපෘතියකි.

කොවිඩ් 19 වසංගතය මධ්‍යයේ වුවත් වාර්තාගත කාලයක් තුළ සෙන්ට්‍රල් පාර්ක් ජා-ඇල ව්‍යාපෘතියේ පළමු හා දෙවැනි අදියරයන් පෙර නොවූ විරූ ලෙස 70%කටත් වඩා වැඩියෙන් අලෙවි වී තිබීම අප සමාගම ලද විශිෂ්ට ජයග්‍රහණයකි.

මෙරට ප්‍රධාන නගරයක් වන ජා-ඇල නගරයේ පිහිටි සෙන්ට්‍රල් පාර්ක් ජා-ඇල ආසන්නයේ ප්‍රමුඛ පෙළේ පාසල්, රෝහල්, බැංකු සහ සුපිරි වෙළෙඳසල් සහ කොළඹ නගරයටත් (විනාඩි 30), කටුනායක ගුවන් තොටුපළටත් (විනාඩි 20) සහ විවෘත කිරීමට නියමිත වරාය පිවිසුම ගුවන් අධිවේගී මාර්ගය හරහා වරාය නගරයටත් (විනාඩි 30) කෙටි වේලාවකින් ප්‍රවේශ විය හැකිය. කොළඹ-මීගමුව ප්‍රධාන පාරට මීටර් 500ක දුරකින්, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයට පිවිසීමට ඇති පහසුවත් නිසා සෙන්ට්‍රල් පාර්ක් ජා-ඇල පාරිභෝගිකයන්ට සුවිශේෂී වටිනාකමක් ගෙනදෙන්නක් ලෙසත් හැඳින්විය හැක. තවද, දියත් කර මාස 12ක් ඇතුළත 20%ට වඩා දේපළ අගය ඉහළ යාම පාරිභෝගිකයන්ට භව වාසිදායක මෙන්ම ලාභදායී ආයෝජනයක් ද වේ.

## AIA ඉන්ෂුවරන්ස් වෙතින් ප්‍රෝජා ලංකා සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ කාර්යමණ්ඩලයට විශේෂයෙන් සැකසූ විශ්‍රාම ආවරණ



AIA ඉන්ෂුවරන්ස් විසින් ප්‍රෝජා ලංකා පුද්ගලික සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ කාර්යමණ්ඩලය වෙත ඔවුනටම විශේෂයෙන් සකසන ලද විශ්‍රාම ආවරණ ක්‍රමයක් නොබෝදා හඳුන්වා දෙන ලදී. මෙම විශ්‍රාම සැලසුම ඔස්සේ විශ්‍රාම යාමට පෙර සහ විශ්‍රාම ගත් පසුවත් ඔවුනගේ මූල්‍ය සුරක්ෂිතභාවය තහවුරු කෙරෙනු ඇත. මෙම විශ්‍රාම සැලසුම ඔස්සේ සමාගමේ සේවකයන්ටත් ඔවුනගේ පවුලේ අඳෙන්හියන්ටත් සෑහෙන සමයින් විශ්‍රාම ආදායමක් සුරක්ෂිත කෙරෙනු ලබන අතර විශේෂයෙන් සකසන ලද මෙම විශ්‍රාම විසඳුම ඔස්සේ හදිසි අනතුරු, මරණ ප්‍රතිලාභයක්, රෝහල් ප්‍රතිලාභයක් (දෛනික ප්‍රතිලාභ) අසාධ්‍ය රෝග ප්‍රතිලාභයක් සහ විශ්‍රාම අරමුදලක් සමගින් ජීවිත රක්ෂණ ආවරණයක් ද ලැබෙනු ඇත.

ශ්‍රී ලංකාවේ හොඳම ජීවිත රක්ෂණ සමාගම ලෙස අඛණ්ඩව වසර දෙකක් පිදුම් ලද AIA ඉන්ෂුවරන්ස් (ග්ලෝබල් බෑන්කින් සහ ෆිනෑන්ස් වෙතින් ප්‍රදානය කරන ලදී 2019/2020) හි පරමාර්ථය සහ සන්නාම ප්‍රතිඥාව වන්නේ ශ්‍රී ලංකාවේ ජනතාවට සුවපත්, සැපවත්, දිගුකල් ජීවිතයක් ගත කිරීමට සහාය වීමයි. ඒ අනුව මෙම විශේෂයෙන් සකසන ලද විශ්‍රාම ආවරණය ඔස්සේ ද අපගේ අපේක්ෂාව වනුයේද එයමයි.

## සෙලින්කෝ ලයිෆ් සමාගමේ දෙවැනි විශාලතම ශාඛාව ලෙස මීගමුවේ නව හරිත ශාඛා ගොඩනැගිල්ල විවෘත කරයි


සෙලින්කෝ ලයිෆ් සමාගම මීගමුව නගරයේ සමාගමට අයත් ඉඩමක ඉදිකළ නවතම පරිසර හිතකාමී ශාඛා ගොඩනැගිල්ල විවෘත කරමින් මීගමුව ප්‍රදේශයේ සිය මෙහෙයුම් කටයුතු කැපී පෙනෙන ලෙස පුළුල් කර තිබේ.

මෙම නව ගොඩනැගිල්ල මගින් මීගමුවේ සෙලින්කෝ ලයිෆ් ශාඛාවට වර්ග අඩි 7,950 ක ඉඩකඩක් අලුතින් එක්කිරීමත් සමග සමස්ත වර්ග අඩි ප්‍රමාණය 18,859 ක්වී තිබේ. මේ අනුව, මෙය ශ්‍රී ලංකාවේ දෙවැනියට විශාලතම සෙලින්කෝ ලයිෆ් ශාඛාව බව සමාගම සඳහන් කරයි. මෙය ගම්පහ දිස්ත්‍රික්කයේ සමාගමටම අයත් ඉඩමක ඉදිකළ පස්වන ගොඩනැගිල්ල වන අතර මීට පෙර දිවුලපිටිය, කඩවත, ගම්පහ සහ පවතින මීගමුව ශාඛා ගොඩනැගිලි සමාගම විසින් තමන්ටම අයත් ඉඩම්වල ඉදිකර ඇත.

තිරසර බලශක්තිය වැඩිපුර භාවිත කරමින් සම්පත් සුරක්ෂිත කිරීමේ සමාගමේ හරිත සංකල්පය අනුව මීගමුව ශාඛාවට ඉදිකළ මෙම තට්ටු පහක ගොඩනැගිල්ල මගින් තවදුරටත් සමාගමේ හරිත න්‍යාය පත්‍රය ශක්තිමත් කර තිබේ. මේ අනුව යමින් ජාතික විදුලිබල පද්ධතියෙන් ලබාගන්නා විදුලිය අඩුකරමින් මෙම ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම සූර්ය බලශක්තියෙන් ආලෝකකරණය කර තිබෙන අතර ඒ වෙනුවෙන් කිලෝවොට් 57.2 ක සූර්ය විදුලිබල පද්ධතියක් ස්ථාපිත කර තිබේ. මෙම සූර්ය බලශක්ති පද්ධතිය සමාගමේ ගොඩනැගිලි ජාලයේ දෙවැනියට විශාලතම සූර්ය බලශක්ති පද්ධතිය වන අතර ශාඛා ජාලය තුළ ස්ථාපිත කළ විශාලතම සූර්ය බලශක්ති පද්ධතිය වේ. මීට අමතරව, මෙම ගොඩනැගිල්ල සෙලින්කෝ ලයිෆ් විසින් ගොඩනැගූ දෙවැනියට විශාලතම වර්ෂා ජලය රැස්කිරීමේ පහසුකමකින්, අප ජලය පිරිපහදු කර වැසිකිළි සහ ගෙවත්ත සඳහා නැවත ජලය ලබාගන්නා අති නවීන අප ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රාගාරයකින් සහ බලශක්ති පරිභෝජනය අඩුකරන බලශක්ති කාර්යක්ෂමතාවයෙන් යුක්ත නවතම වායුසමීකරණ යන්ත්‍ර වලින් සමන්විත වේ.



## ශ්‍රී ලංකාවේ පළමු වරට ප්‍රයිම් සමූහය ඇදහිය නොහැකි දේපළ ආයෝජන සැලැස්මක් හඳුන්වා දෙයි



වසර 26ක පාරිභෝගික විශ්වාසය දිනූ මෙරට විශාලතම දේපළ සමාගම වන ප්‍රයිම් සමූහය සිය අද්විතීය මෙන්ම මෙතෙක් දේපළ වෙළෙඳ ක්ෂේත්‍රයේ ලබා නොදුන් නවීනතම ගෙවීම් සැලැස්මක් සමග පාරිභෝගිකයන්ගේ නිවසක සිහිනය සැබෑකරවීමට සමත් විය.

මෙම අද්විතීය පහසු ගෙවීම් ක්‍රමය මගින් පාරිභෝගිකයන්ට නිවාස ඒකකයේ මුළු වටිනාකමින් 20% ක් වැනි ඇදහිය නොහැකි මූලික ගෙවීමක් සිදුකළ හැකි අතර,25% ක් මාස 30 ක් තුළදී පහසු වාරිකවලින් ගෙවීමට සහ 55% ක් ඔවුන්ගේ නව නිවස භාර දෙන විට ගෙවීමට හැකිවන පරිදි මෙම පහසු ගෙවීමේ ක්‍රමය සැලසුම් කර ඇත. එමෙන්ම වසර 2 කදී ආයෝජනයෙන් 75% ක් නිසැක වශයෙන් ප්‍රතිලාභයක් ඉපැයීමේ හැකියාව මේ සමගම පාරිභෝගිකයන්ට ලැබේ.

වසර 26ක ක්ෂේත්‍රයේ ඉහළ ම අත්දැකීම් සහිත ප්‍රයිම් සමූහය මෙම පහසුගෙවීමේ ක්‍රමය මගින් මෙතෙක් තම නිවාස සිහිනය සැබෑ කර ගැනීමට නොහැකි වූ පාරිභෝගිකයන් හටද තමන්ගේම නිවසක් හිමිකර ගැනීමට අවශ්‍ය පසුබිම සලසා ඇත. පිළියන්දල කහතුඩුවේ හරිත පරිසරයක සුඛෝපභෝගී පහසුකම් සහිතව ඉදිවන 88 Residence නිවාස ව්‍යාපෘතිය හරහා ආයෝජනයට මෙන්ම පදිංචියටත් සුදුසු අනර්ඝ තත්ත්වයේ නිවාස 88ක් පාරිභෝගිකයන්ට සමීප කරන ප්‍රයිම් සමූහය මෙම පහසු ගෙවීමේ සැලැස්ම තුළින් නවතම පාරිභෝගික සමූහයක් හා අත්වැල්බැඳ ගැනීමට ද සමත් වී ඇත.

"වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට අනුරූප වන ලෙස නිවාස ව්‍යාපෘති දියත් කිරීම සහ ඊට ගැළපෙන වඩාත් නම්‍යශීලී නව්‍ය ගෙවීම් පහසුකම් පාරිභෝගිකයන්ට ලබා දීම සඳහා ප්‍රයිම් සමූහය සෑම විටම දැඩි කැපවීමකින් කටයුතු කරනවා. එබැවින් මෙම 'අද්විතීය දේපළ වෙළෙඳ ආයෝජන සැලසුම' පළමු වරට ශ්‍රී ලාංකීය පාරිභෝගිකයන්ට හඳුන්වා දෙන්නේ ඒ කැපවීමේ ප්‍රතිඵලයක් ලෙසයි. බොහෝ ශ්‍රී ලාංකිකයන්ගේ බලාපොරොත්තුවක් වන තමන්ගේම නිවසක ජීවත්වීමේ සිහිනය සැබෑ කරවීම සඳහා 20%ක් වැනි දැරිය හැකි මූලික ගෙවීමකින් එම ප්‍රාර්ථනාව යථාර්ථයක් බවට පත් කර ගන්නට මෙම මූල්‍ය සැලසුම සමගින් හැකි වෙනවා. අභියෝගාත්මක ආර්ථිකයක් පවතින මෙවැනි තත්ත්වයක් තුළ මෙවැනි පහසුකමක් පාරිභෝගිකයන්ට ලබා දීම ඔවුන්ගේ ජීවිතයන්ට ද නව ආලෝකයක් ගෙන එනු නිසැකයි."

## සෙලාන් බැංකුව PayHere සමග එක්වී ඔන්ලයින් ගෙවීම් පහසුකරයි

සුහද හදක් ඇති දේශීය බැංකුව, සෙලාන් බැංකුව ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ගෙවීම් සේවාව වන PayHere සමග විශේෂ හවුල්කාරීත්වයකට එළඹී තිබේ. ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ව්‍යාපාර වලට මාර්ගගත (ඔන්ලයින්) ක්‍රමයට ගෙවීම් භාරගැනීමේ අවස්ථාව සලසා දීම මෙම හවුල්කාරීත්වයේ ප්‍රධාන අරමුණ වී ඇත. මෙම ක්‍රමෝපායික හවුල්කාරීත්වය හේතුවෙන් අලෙවිසල් හිමියන්ට ඕනෑම දේශීය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක් භාවිතයෙන් PayHere සේවාව සමග සම්බන්ධ වීමට හැකියාව ලැබේ.

දිගු කලක පටන් මෙරට ඩිජිටල් බැංකුකරණ සේවාවන් සම්බන්ධ පුරෝගාමියකු ලෙස ඉදිරියෙන්ම සිටින සෙලාන් බැංකුව මේ වනවිට පුද්ගලයන් සහ ව්‍යාපාර වෙනුවෙන් සේවාවන් රාශියක් හඳුන්වා දී ඇත. මූල්‍ය-තාක්ෂණික (FinTech) සේවා සමාගමක් වන PayHere, ව්‍යාපාර හා ආයතනවලට ක්‍රමවේදයන් කිහිපයක් අනුව මාර්ගගත ගෙවීම් භාරගැනීමට අවස්ථාව සලසා දී තිබේ. සෙලාන් බැංකුව සහ PayHere අතර ඇතිකරගත් මෙම හවුල්කාරීත්වය නිසා, PayHere ගනුදෙනුකරුවන්ට මින් ඉදිරියට එක් නිශ්චිත බැංකුවක ගිණුමක් පවත්වාගෙන යාම අවශ්‍ය නොවන අතර, තමන් කැමති බැංකුවක ගිණුමක් භාවිත කරමින් PayHere හරහා ගෙවීම් භාරගැනීමට අවස්ථාව හිමි වී ඇත.




චමින්ද සෙනෙවිරත්න
සෙලාන් බැංකුවේ ඩිජිටල් බැංකුකරණ ප්‍රධානී

ධනික පෙරේරා
PayHere ප්‍රධාන විධායක නිලධාරී

මේ වනවිට අලෙවිසල් හිමියන් 300 කට අධික පිරිසකට සේවාවන් සලසමින් PayHere ගනුදෙනුකරුවන් ජාලය තවදුරටත් පුළුල් කිරීමට සෙලාන් බැංකුව දායක වී තිබේ. මෙම හවුල්කාරීත්වය, 'ශ්‍රී ලංකාවේ සියලුම ව්‍යාපාරවල ගෙවීම් ඩිජිටල්කරණය කිරීම' යන දැක්ම යථාර්ථයක් බවට පත්කර ගැනීමට PayHere දරන උත්සාහයට පැහැදිලි ශක්තියක් වනු නිසැක ය.

## SLT-MOBITEL මෙරට ප්‍රථම වරට ස්ථාවර දුරකථන සඳහා 'Caller Tune' සේවාව හඳුන්වා දෙයි




ශ්‍රී ලංකාවේ ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ හා ජංගම දුරකථන ජාලය වන SLT-MOBITEL, මෙරට දුරකථන සේවා ක්ෂේත්‍රයේ තවත් ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ප්‍රථම වරට SLTMobitel Home (ස්ථාවර දුරකථන) පාරිභෝගිකයන් සඳහා 'Caller Tune' සේවාව හඳුන්වා දීමට කටයුතු කර තිබේ.

Evoke International සමාගම සමග අත්වැල් බැඳගෙන SLT-MOBITEL මෙම සේවාව හඳුන්වා දී ඇත. Evoke International යනු ජංගම දුරකථන සේවා සම්පාදකයන් වෙනුවෙන් ඩිජිටල් මාධ්‍ය පදනම්, ජංගම යෙදුම් සහ අනෙකුත් සේවාවන් රැසක් කළමනාකරණය කරන පිළිගත් බාහිර සේවා සමාගමකි.

SLT-Mobitel Fibre, 4G LTE සහ Megaline පාරිභෝගිකයන්ට මෙම නව Caller Tune සේවාව ලබාගත හැකි අතර, තමන්ට අවශ්‍ය Caller Tunes තෝරාගැනීමට ඔවුන්ට අවස්ථාව හිමි වේ. සේවාව සක්‍රිය කිරීම සඳහා SLTMobitel Home (ස්ථාවර දුරකථන) පාරිභෝගිකයන් කළ යුතු වන්නේ 1259 අමතා ලැබෙන උපදෙස් අනුව අවශ්‍ය පැකේජය තෝරාගැනීම පමණි.

"මෙරට ප්‍රථම වරට SLTMobitel Home (ස්ථාවර දුරකථන) පාරිභෝගිකයන් සඳහා 'Caller Tune' සේවාව හඳුන්වා දීමට හැකිවීම අප ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක්. මෙම සේවාව මගින් පාරිභෝගිකයන්ට නැවුම්, සුවිශේෂී සහ විනෝදාත්මක අත්දැකීමක් හිමිවේවි." SLT හි ප්‍රධාන අලෙවි නිලධාරී ප්‍රභාත් දහනායක මහතා පැවසී ය.

නව සේවාව නිසා දැන් SLTMobitel Home (ස්ථාවර දුරකථන) පාරිභෝගිකයන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ හින්දි ඇතුළු භාෂා කිහිපයක ගීත අතරින් තමන් කැමති ගීත තෝරාගෙන තම 'Caller Tune' ලෙස එය භාවිත කිරීමට අවස්ථාව ලැබේ. සාම්ප්‍රදායික ringtone වෙනුවට ගීතයකට සවන් දීමට හැකිවීම, මෙම දුරකථන වෙත ඇමතුම් ලබාගන්නා පුද්ගලයන්ටද තෘප්තිමත් අත්දැකීමක් වනු නිසැක ය.

"SLT-MOBITEL මගින් මෙම සේවාව සඳහා හවුල්කරු ලෙස අප තෝරාගනු ලැබීම අපට මහත් සතුටක්. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ අගය එකතු කළ විසඳුම් සපයන්නෙකු ලෙස දිගින් දිගටම SLT-MOBITEL හි පාරිභෝගිකයන් වෙත මෙවැනි විශේෂාංග වැඩි වැඩියෙන් සමීප කරවීමටත්ටත්, සමාගම් හා ආයතන වෙනුවෙන් Corporate Caller Tunes වැනි සේවාවන් හඳුන්වා දීමටත් අප බලාපොරොත්තු වනවා."Evoke International" හි ප්‍රධාන විධායක නිලධාරී ළහිරු වික්‍රමසිංහ මහතා පැවසී ය.

## නවලෝක රෝහල් සමූහය ශ්‍රී ලංකා චීන තානාපති කාර්යාලය විසින් නම් කරන ලද PCR පරීක්ෂණ සහකරු ලෙස නැවතත් පත් කෙරේ



ශ්‍රී ලංකාවේ පෞද්ගලික රෝහල් ක්ෂේත්‍රයේ පුරෝගාමී නාමය වන නවලෝක රෝහල් සමූහය 2021 අගෝස්තු 2 වන දින සිට ශ්‍රී ලංකාවේ මහජන චීන සමූහාණ්ඩුවේ තානාපති කාර්යාලයේ PCR පරීක්ෂණ හවුල්කරු ලෙස නැවතත් පත් කර ඇති බව නිවේදනය කළේය.

චීන තානාපති කාර්යාලය මෙම තීරණය ගනු ලැබුවේ පසුගිය සති කිහිපය තුළ (Nawaloka Hospitals) නවලෝක රෝහල් සමග පැවැත්වූ දීර්ඝ සාකච්ඡාවලින් පසුව කොවිඩ්-19 පරීක්ෂණය සඳහා නව තාක්ෂණික මාර්ගෝපදේශ මාලාවක් ක්‍රියාත්මක කිරීමෙනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් චීනයට යන මගීන් සඳහා PCR සහ IgM ප්‍රතිදේහ පරීක්ෂා කිරීමේ පළමු නිර්දේශය ලෙස (Nawaloka Hospitals) නවලෝක රෝහල් සමූහය ක්‍රියාත්මක වේ.

(Nawaloka Hospitals) නවලෝක රෝහල් සමූහය 1985 දී රෝහල් සේවා ක්ෂේත්‍රයට ඇතුළත් වූයේ තෘතීය සෞඛ්‍ය සේවා සැපයූ ශ්‍රී ලංකාවේ ප්‍රථම පෞද්ගලික රෝහල ලෙස ය. එතැන් පටන්, ආචාර්ය ජයන්ත ධර්මදාස මහතාගේ දූරදර්ශී නායකත්වය යටතේ, රෝහල සැලකිය යුතු දේශීය හා ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ඇති අතර, රටේ සායනික දියුණුව සඳහා පුරෝගාමී විය. 2020 දී නවලෝක රෝහල් ජාත්‍යන්තරව පිළිගත් සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම වෙනුවෙන් කීර්තිමත් Joint Commission International's (JCI) රන් මුද්‍රාව ලබා ගත්හ.

## ඩයලොග් ටෙලිවිෂන් විසින් නැණස හා ගුරු ටීවී අධ්‍යාපනික නාලිකා නොමිලේ ලබාදීමට කටයුතු කරයි

මෙරට අධ්‍යාපනය ලබන සෑම දරුවෙකුටම බාධාවකින් තොරව සිය අධ්‍යාපන කටයුතු කරගෙන යාමට සහායවීම වෙනුවෙන් ක්‍රියාත්මක වැඩපිළිවෙල තවත් ඉදිරියට ගෙනයමින්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සන්නිවේදන සම්පාදකයා වන ඩයලොග් සමාගම ඩයලොග් ටෙලිවිෂන් සහ ViU App ඔස්සේ නැණස සිංහල, නැණස දෙමළ සහ ගුරු ටීවී යන අධ්‍යාපනික නාලිකා ත්‍රිත්වය නොමිලේ ලබාදීමට කටයුතු කර ඇත.

පවතින වසංගත තත්වය මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයට දැඩි බලපෑම් එල්ල කරන පසුබිමක් තුළ දිවයිනේ සමස්ත සිසු පරපුරට සිය අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව ඉදිරියට ගෙනයාමට සමාන අවස්ථා ලබාදීම වෙනුවෙන් ඩයලොග් සමාගම කැපවී සිටියි. ඩයලොග් ටෙලිවිෂන් පෙරගෙවුම් හා පසුගෙවුම් පාරිභෝගිකයන්ට නැණස සිංහල, නැණස දෙමළ සහ ගුරු ටීවී නාලිකා නොමිලේ නැරඹීමේ අවස්ථාව හිමිව තිබේ. ඩයලොග් ටෙලිවිෂන් නාලිකා අංක 24 ඔස්සේ විකාශය වන නැණස සිංහල හා නාලිකා අංක 25 ඔස්සේ විකාශය වන නැණස දෙමළ නාලිකා හරහා 3 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා රජයේ පාසල් විෂය නිර්දේශය ආවරණය කෙරෙන අතර, නාලිකා අංක 22 ඔස්සේ විකාශය වන ගුරු ටීවී තුළින් ආවරණය කෙරෙන්නේ 5 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා රජයේ පාසල් විෂය නිර්දේශයයි. පළපුරුදු ගුරු මඬුල්ලක් විසින් නවීනතම ඉගෙනුම් ක්‍රම භාවිත කරමින් විෂයයන් ඉගැන්වීමේ කටයුතු සිදුකරනු ලබයි. තවද ඉහත සඳහන් කළ නාලිකා ත්‍රිත්වයට අමතරව ViU App, ViU Hub සහ ViU Mini ඔස්සේ 160 කට අධික අතිරේක පාඩම් මාලා සහ අධ්‍යාපනික අන්තරගතයන් සමඟ නොමිලේ සම්බන්ධ විය හැක. ඒ සඳහා ඩයලොග් ජාලය තුළ කිසිඳු ඩේටා ගාස්තුවක් අයනොකෙරේ.

ඩයලොග් ටෙලිවිෂන් ව්‍යාපාර අංශ ප්‍රධානී චිරන්ත ද සොයිසා මහතා මේ පිළිබඳව මෙලෙස අදහස් දැක්වීය. "මේ රටේ සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම නිසි අධ්‍යාපනයක් ලබාගැනීමට සමාන අවස්ථා ලබාදී ඔවුන්ගේ අනාගතය ජයගන්න අත්වැලක් සැපයීම වෙනුවෙන් අප දරන උත්සාහයේ තවත් ඉදිරි පියවරක් ලෙස නැණස සිංහල, නැණස දෙමළ සහ ගුරු ටීවී අධ්‍යාපනික නාලිකා නොමිලේ ලබාදීමට කටයුතු කිරීම පිළිබඳව සඳහන් කළ හැකියි. පවතින වසංගත තත්වය නිසා අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන අඩු ලුහුඬුකම් පිළිබඳව නිසි අවබෝධයක් ලබාගැනීමට අපිට හැකියාව ලැබී තිබෙනවා වගේම, සෑම දරුවෙකුටම නිසි අධ්‍යාපනයක් ලබාගැනීම වෙනුවෙන් ප්‍රවේශ විය හැකි Public මාධ්‍යයන්ට පහසුකම් සැලසීමේ වැදගත්කමද මැනවින් පිළිබිඹු කිරීමට සමත්ව තිබෙනවා. ඒ වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සලසමින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂමතා අවම කිරීමට ඩයලොග් සමාගම ඉදිරියටත් කටයුතු කරනවා."

Dialog TELEVISION

නැණස TV – චැනල් අංක 24 | නැණස TV – චැනල් අංක 25 | guru.lk TV – චැනල් අංක 22

දැයේ දූ දරුවන්ගේ අධ්‍යාපන අරමුණු මල්ඵලගැන්වීමේ අරමුණෙන් ඩයලොග් සමාගම විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් රැසක තවත් සුවිශේෂී කඩඉමක් වශයෙන් මෙම කටයුත්ත අර්ථ දැක්විය හැක. මෙම කාර්යයට අමතරව **'නැණස'** වැඩසටහන යටතේ නැණස ටීවී, නැණස ස්මාට් ස්කූල්, නැණස ඇප් සහ නොමිලේ ක්‍රියාත්මක වන නැණස 1916 දුරස්ථ අධ්‍යාපන සේවාව යනාදී අධ්‍යාපනික මාධ්‍ය ඔස්සේද මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය බලගැන්වීමට ඩයලොග් සමාගම කටයුතු කර තිබේ. තවද දුෂ්කර පාසල්වල ඉගෙනුම ලබන සිසුන්ගේ මාර්ගගත (Online) අධ්‍යාපන කටයුතුවලට පහසුකම් සැලසීම වෙනුවෙන් **'නැණදිරි ඩේටා ශිෂ්‍යත්ව'** වැඩසටහන යටතේ සිසුන් ලක්ෂයකට ඩේටා ශිෂ්‍යත්ව පිරිනැමීමටද පියවර ගෙන ඇත. මීට අමතරව ඊ-තක්සලාව, ජාතික ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය (LCMS) ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS ) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින රාජ්‍ය විශ්වවිද්‍යාලවල සියලුම නිල විද්‍යුත් ඉගෙනුම් පද්ධති සඳහා ඩයලොග් සමාගම කිසිඳු ඩේටා ගාස්තුවකින් තොරව නොමිලේ ප්‍රවේශය ලබාදී තිබේ.

## රැකියා ඇබෑර්තු

බියගම පිහිටි කිරිපිටි නිෂ්පාදන සමාගමක් සඳහා වයස අවු. 20ත් 45ත් අතර **සේවකයින්** බඳවා ගැනේ.

- **දෛනික වැටුප 1400/-සිට ඉහළට**
- **ආහාර / නවාතැන් සහන මිලට**

**සති වැටුප්**

**0719 101 739**
**0714 353 430**

## රැකියා ඇබෑර්තු

**ජාත්‍යන්තර මූල්‍ය සමාගමක රැකියාවක් සඳහා...**

අ.පො.ස සා/පෙළ සමත් වයස අවුරුදු 20-55 අතර (ගැහැණු / පිරිමි) ඔබට අනගි අවස්ථාවක්

දක්ෂතාවය මත විදෙස් සංචාර දිනාගත හැක

ප්‍රධාන ශාඛාව - කිරිබත්ගොඩ

**077 751 13 98 / 070 410 61 72**

## රැකියා ඇබෑර්තු

දක්ෂ මේසන් බාස්වරු හා අත්උදව්කරුවන් අවශ්‍යයි.

නවාතැන් පහසුකම් ඇත

**077 531 86 06**

## තරුණ ක්‍රියාශීලී ඔබට අති නවීන මුද්‍රණාල පරිශ්‍රයක අගනා රැකියා අවස්ථාවක්.

### Junior Machine Minder

**සුදුසුකම්**

- අ.පො.ස. උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබීම.
- වෙබ් මුද්‍රණ (Web Printing) ක්ෂේත්‍රයේ වසර 2ක පළපුරුද්ද.
- වයස අවු. 25ට නොවැඩි.
- මුද්‍රණ ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපනය ලබා තිබීම විශේෂ සුදුසුකමක් වේ.

### Trainee Machine Minder

**සුදුසුකම්**

- අ.පො.ස. උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබීම.
- වයස අවු. 22ට නොවැඩි.
- මුද්‍රණ ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපනය ලබා තිබීම.
- වසර 03ක අවම සේවා ගිවිසුමකට යටත් වේ.

### Trainee Maintenance Assistant – Mechanical

**සුදුසුකම්**

- අ.පො.ස. උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබීම.
- වයස අවු. 22ට නොවැඩි.
- කාර්මික/ තාක්ෂණික පාඨමාලාවක් (Mechanical / Technical Certificate) හදාරා තිබීම.
- වසර 03ක අවම සේවා ගිවිසුමකට යටත් වේ.

### Management Trainee - Printing & Production

**සුදුසුකම්**

- පිළිගත් විශ්ව විද්‍යාලයක භෞතික විද්‍යා (Physical Science Graduate) උපාධියක් ලබා තිබීම.
- වයස අවු. 25ට නොවැඩි.
- වසර 03ක අවම සේවා ගිවිසුමකට යටත් වේ.

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇති අයෙක් නම්
තැ.පෙ: 2310, කොළඹ යන ලිපිනයට හෝ **cv2021.sales@gmail.com** යන විද්‍යුත් තැපැල වෙත ඔබගේ අයදුම්පත යොමු කරන්න.

## ප්‍රමුඛ පෙළේ ජාතික පුවත්පතක අළෙවි කණ්ඩායම සමඟ එක්වීමට ක්‍රියාශීලී තරුණ ඔබට අනගි අවස්ථාවක්.

### අළෙවි විධායක (පිරිමි)

**සුදුසුකම්**

- අ.පො.ස. උසස් පෙළ
- වයස අවුරුදු 20 - 35 අතර
- අළෙවි ඉලක්ක හඹායෑමට ඇති හැකියාව
- ඉංග්‍රීසි භාෂාව/ පරිගණක දැනුම
- යතුරුපැදියක් සහ යතුරුපැදි බලපත්‍රයක් සතුවීම
- අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමකි.

**මාසික වැටුප සමඟ ප්‍රවාහන දීමනා, දුරකථන දීමනා ඇතුළුව අළෙවිය මත දිරිදීමනා හිමිවේ.**

### පුහුණු අළෙවි (පිරිමි)

**සුදුසුකම්**

- අ.පො.ස. උසස් පෙළ
- වයස අවුරුදු 20 - 30 අතර
- ඉංග්‍රීසි භාෂාව/ පරිගණක දැනුම
- යතුරුපැදියක් සහ යතුරුපැදි බලපත්‍රයක් සතුවීම
- අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමකි.



ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇති අයෙක් නම් 2021/09/19 දිනට පෙර පහත ඊමේල් ලිපිනයට ඡායාරූපය සහිත අයඳුම්පතක් යොමු කරන්න.
**cv2021.sales@gmail.com**

අපි, අපේ ගාල්ල නාකියාදෙනියේ පිහිටි පාම් තෙල් නිෂ්පාදන කර්මාන්තශාලාවේ හි සේවය සඳහා පහත සුදුසුකම් හා පළපුරුද්ද සහිත ඔබව සොයන්නෙමු.

### ජීවාණුහරණ ක්‍රියාකරු (STERILIZER OPERATOR)

- යාන්ත්‍රික/විදුලි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලාව හදාරා ඇති
- A/B/C බලපත්‍රලාභී විදුලිකාර්මිකයින් වෙත වැඩි අවධානය
- බොයිලේරු ක්‍රියාකරවීම පිළිබඳ II ශ්‍රේණියේ බලපත්‍රය සහිත

### බොයිලේරු ක්‍රියාකරු/බොයිලේරු කාර්මික (BOILER OPERATOR/BOILER TECHNICIAN)


- යාන්ත්‍රික/විදුලි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලා හදාරා ඇති
- A/B/C බලපත්‍රලාභී විදුලිකාර්මිකයින් වෙත වැඩි අවධානය
- බොයිලේරු ක්‍රියාකරවීම පිළිබඳ I ශ්‍රේණියේ බලපත්‍රය සහිත

### විදුලි කාර්මික/කාර්මික (ELECTRICIAN/TECHNICIAN)

- CGTTI/HNDE (NVQ මට්ටම 5) ඩිප්ලෝමාව හදාරා ඇති
- මූලික විදුලි හා ඉලෙක්ට්‍රොනික යෙදුම්/ස්ථාපනය කිරීමේ හි වසර 03 ක පළපුරුද්ද
- මෝටර්, සිසිලන, සම්පීඩක, වායුසමීකරණ, බොයිලේරු සහ විදුලි උත්පාදක යන්ත්‍ර ආදී උපකරණ
- VDF, PLC ආදියෙහි පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත

### සහයක (යන්ත්‍ර ක්‍රියාකරු) (ASSOCIATE - MACHINE OPERATOR)

- අ.පො.ස. උසස් පෙළ හදාරා ඇති
- NVQ මට්ටම 04 හෝ ඊට වැඩි (ජර්මානු තාක්ෂණ විද්‍යායතනයෙන් හෝ ඊට සමාන)
- පෙර සේවා පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත



තෝරා ගන්නා අපේක්ෂකයන්ට ක්ෂේත්‍රයේ තරඟකාරී වැටුප් පැකේජයක් ලබා දෙනු ඇත.

මෙම දැන්වීමෙන් දින 10 ක් ඇතුළත ඔබේ සවිස්තරාත්මක තොරතුරු, සම්බන්ධ කරගත හැකි දුරකතන අංක, ලිපිනය සහ ඥාතීන් නොවන සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ පහත දී ඇති ලිපිනයට ඔබගේ අයදුම් පත ඉදිරිපත් කරන්න.

මානව සම්පත් ප්‍රධානී
වටවල ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
754/5, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
දු: 011 477 2504 / 076 715 5749 / 077 054 3231
වෙබ්: www.watawalaplantations.lk

ඊ මේල්: careers.agri@sunshineholdings.lk

### සමස්ථ ශ්‍රී ලංකාව ලොවට ම රැගෙන යමින්

**සන්ෂයින් හෝල්ඩිංග්ස් පීඑල්සී**, මෙරට ආර්ථිකයේ අත්‍යවශ්‍ය අංශයන් හි වටිනාකම් ඇති කරමින් 'ජාතිය පෝෂණය කිරීම' සඳහා විවිධාකාරයෙන් දායක වන විවිධාංගීකරණය වූ සමාගම් සමූහයකි. එය ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය සේවා සහ පාරිභෝගික නිෂ්පාදන අංශ මෙන්ම කෘෂිකාර්මික ව්‍යාපාර සඳහා උපායමාර්ගික ආයෝජන සිදු කර ඇත. ශ්‍රී ලාංකික ජනතාව හොඳින් දැන හඳුනන, ඒ ඒ ව්‍යාපාරික අංශවල ප්‍රමුඛයන් වන සන්ෂයින් හෙල්ත්කෙයාර් ලංකා, සන්ෂයින් කන්සියුමර් ලංකා, ඩේන්ටි රස කැවිලි, ලීනා නිෂ්පාදන සහ වටවල ප්ලාන්ටේෂන්ස් පීඑල්සී ඇතුළත් වේ. මීට වසර 50කට පෙර 1967 දී ගම්පොළදී ඔසුසලක් ලෙස ආරම්භ කරන ලද මෙම සමූහය, සේවකයින් 2,300 කට අධික සංඛ්‍යාවක් සහ රුපියල් බිලියන 21ක පමණ ආදායමක් සහිතව, සෙස්ටා තේ, වටවල තේ, රන් කහට, ඩේන්ටි රසකැවිලි සහ හෙල්ත්ගාඩ් ෆාමසි වැනි ප්‍රමුඛ පෙළේ කීර්තිමත් ශ්‍රී ලාංකික වෙළෙඳ නාමයන්ගෙන් සමන්විත වේ.

Lina Manufacturing · Daintee · Zesta · වටවල · රන් · Healthguard

Great Place To Work Certified MAY 2021 - APR 2022 LKA

සෞඛ්‍ය සත්කාර | පාරිභෝගික | කෘෂි ව්‍යාපාර

sunshine

www.sunshineholdings.lk

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී. 2021-09-05









කොරෝනා වසංගතයත් සමග ලෝකයට අගුළු වැටී ඇත්තේ මිලියන සිය ගණනක ජනතාවක් හුදෙකලා කරමින්ය. ගෝලීය වසංගතය අපව ගෙනැවිත් තිබෙන්නේ තීරණාත්මක තැනකටය. මතක ඇති ඉතිහාසය තුළ අප සියලුදෙනා අතර සබඳතාවන් මෙතරම් දුරස් කර නොමැති තරම්ය. මේ එළඹ ඇත්තේ ලෝකයට සුවය ප්‍රාර්ථනා කළයුතු කාලයයි. පීඩාවට පත්වූවන්ට, මානසික සෞඛ්‍යය දුර්වලවූවන්ට, සරණක් විය යුතු කාලයයි. අප වෙනුවෙන් වෙහෙසෙන්නන්ට, ආදරය, ගෞරවය හා ප්‍රණාමය දැක්විය යුතු කාලයයි. ධෛර්යයවන්ත බව අගය කළ යුතු කාලයයි. ඒ කාලයේ ඔබේ නිර්මාණයකින් වෙනෙකෙකුගේ සිතක් සුවපත් කළ හැකිනම් එය කෙතරම් සැනසිලිදයක දෙයක් වන්නේද? එය අනාගතයේ හොඳම නිර්මාණයක් වන්නටද සමහරවිට ඉඩකඩත් ඇත්තේය.

"සරලව කියනවා නම් අපි ක්‍රියාත්මක කරන්නේ කොවිඩ් කාල සීමාවේ දී පොදු ජනතාව මුහුණපාලා තිබෙන ගැටලු සඳහා සමාජයීය විසඳුමක් ලබා දීමට තැපැල් මුද්දරය සහ තැපැල් පත් පාවිච්චි කරමින් "ලිවීමේ" වැඩසටහනක්. මේ අවස්ථාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල ප්‍රමුඛව ත්‍රිවිධ හමුදාව, පොලීසිය, රාජ්‍ය සහ පුද්ගලික අංශයන්හි සේවක මණ්ඩල මහත් වෙහෙසවී කටයුතු කරනවා. මේ කටයුත්තේ නිරත වෙන්නේ ඔවුන්ගේ ජීවිතය පවා අවදානමට ලක්කරලා. ඔවුන් ඇදහිය නොහැකි තරම් පරාර්ථකාමීයි. ඒ සියලු වෙහෙස මහන්සි වී වැඩ කිරීම් ගැන අප ඇත්තෙන්ම ඔවුන්ට හදවතින් ස්තුතිවන්ත වියයුතුයි. ඒ ස්තුති කිරීම සඳහා සැකසූ ව්‍යාපෘතියක් තමයි "ලිපියක් ලියන්න - සිනහවක් ගෙන එන්න" වැඩසටහන."

මේ නිර්මාණශීලී අලුත්ම වැඩසටහන ගැන සාමන්ත නිරෝෂණ පීරිස් කියන්නේ එහෙමය. මේ රටට මුද්දර කියවීමේ සාහිත්‍යයක් හඳුන්වා දුන් කියවන මුද්දර' නිර්මාතෘවරයා වන්නේ සාමන්ත නිරෝෂණ පීරිස් ය. ඔහු මේ අතතබා ඇත්තේ පූර්ව පශ්චාත් කොරෝනා සමයේදී, නිර්මාණශීලීවීමට සහ අනාගතයට ලිවීමටය. අකුරුවලින්, සජීවීව සැම දෙනාටම වේදිකාවක් විවර කර දීමටය. එතැනින් නොනැවතී බලාපොරොත්තුව, අධ්‍යාපනය, ආදරය, අගය කිරීම, ගෞරවය, ස්තුතිය, සැනසීම සහ සහයෝගයේ පණිවුඩය සහිත ලිපි, තැපැල් පත් හුවමාරු කරවීමට ය. ඒ සඳහා ඔහු ප්‍රවේශයක් ලෙස අතරමැදියා කරගෙන ඇත්තේ මහජන පුස්තකාල සහ ඒ අතරේ සිටින පොත් කියවන්නන් ය..

"ලෝකයට සුවය ප්‍රාර්ථනා කළයුතු හොඳම කාලයයි මේ. පීඩාවට පත්වූවන්ට කායික, මානසික, සෞඛ්‍ය දුර්වලවූවන්ට අපි සරණක් විය යුතු කාලයක් මේ. අප වෙනුවෙන් නිරන්තරයෙන් වෙහෙසෙන්නන්ට ආදරය, ගෞරවය හා ප්‍රණාමය දැක්විය යුතු කාලයක් මේ. ඔවුන්ගේ ධෛර්යවන්ත බව කැපවීම අප අගය කළ යුතුයි. ඒ වගේමයි අපේ හිතුත් කියවීමෙන් වගේම ලිවීමෙනුත් සුවපත් කරගන්න පුළුවන්. මේ කාලේ හොඳම නිර්මාණයක් බිහි කරන්නත් පුළුවන්. මීට පෙර අපි කොරෝනා වසංගතයට මුහුණ දීලා නැහැ. අපිට ඒ සම්බන්ධ ලිඛිත ඉතිහාසයක් නැහැ. නමුත් ලෝකයේ විවිධ ව්‍යසනයන්වලදී ඉතිහාසය අපට එවැනි පාඩම් කියලා දීලා තිබෙනවා. ඈන් ෆ්‍රෑන්ක්ගේ දින පොතත් එවැන්නක්."

1947 වසරේ මුල්වරට ලන්දේසි බසින් ප්‍රකාශයට පත්වූ ඈන් ෆ්‍රෑන්ක්ගේ දිනපොත ඈන් අතින් ලියැවෙන්නේ නාසින් විසින් නෙදර්ලන්තය ආක්‍රමණය කිරීමත් සමගමය. වසර දෙකක් තිස්සේ තම පියාගේ කාර්යාලයේ සැඟවී සිට ඈන් තම අවධානයට හසුවන සැම දෙයක්ම සිය දින පොතේ සටහන් කළාය. යුද්ධය හමුවේ මිත්‍ර හමුද පසු බසින ආකාරයත්, ඈම්ස්ටඩෑම් නගරය විනාශ වී ආහාර හිඟයක් නිර්මාණය වී ඇති ආකාරයත්, නාසින්ගේ මහා මිනිස් සංහාරය පිළිබඳ භයානක සහ සංකීර්ණ තොරතුරුත් ඇය මෙම දින පොතේ සටහන් කළාය. පසුකාලීනව ජර්මන්, ඉතාලි, රුසියානු, ස්පාඤ්ඤ හා ග්‍රීක වැනි ලෝකයේ බොහෝ භාෂාවලට පරිවර්තනය වූ මෙම පොත ඇසුරින් නිෂ්පාදනය වූ නාට්‍යයට 1955 වසරේ දි පුලිස්ටර් සම්මානය පවා හිමිවිය. මේ ඇසුරෙන් බිහිවන චිත්‍රපටයේ ඈන්ගේ චරිතය නිරූපණය කරන ෂෙලී වින්ටර් ඔස්කාර් සම්මානය පවා දිනා ගත්තාය.

"ඇත්තෙන්ම ඉතිහාසය කියන්නේ තොරතුරුවල එකතුවක්. සුරුවිරුකම්, මෝඩකම්, පුරසාරම්, බේදවාචකයන් මෙන්ම අපට හරිගිය තැන් වගේම වැරදුණු තැන් අපේ ඉතිහාසයට එකතු වෙනවා. මේ වසංගතයේ දි අපි කටයුතු කළ ආකාරය මේ මොහොතේ අපිට පෞද්ගලික සටහනක් වුණාට අනාගතයේ දී එය වටිනා තොරතුරු මූලයක් විය හැකියි. ඈන්ගේ දින පොත වගේ අනාගතයේ දී එවැනි ලිපි ඓතිහාසික සටහන් වෙන්න පුළුවනි. දැනටමත් අපි වසංගත ඉතිහාසයේ කොටස්කරුවන්. ලෝකයේ බොහෝ දියුණු රටවල් මේ අර්බුදයේ දී අත් අකුරින් ලියු ලිපි, සුබ පැතුම් හා තැපැල් පත් සේවාවේ හෘදයාංගම බව




# කොරෝනා කාලේ ලියුම් ලියන තාලේ

පිළිබඳව විශ්වාසය තැබුවා. කෙනෙකුට කියන්න පුළුවන් මේවා ඉතා සරල මහජන සම්බන්ධතා උපක්‍රම කියලා. නමුත් එය කිසිදින අමතක නොවන මතකයන් ලෙස ලේඛන ගතවේවි "

කොරෝනා වසංගතය අපගේ ජීවිත වෙනස් කර ඇති ආකාරය සිතා ගත නොහැකිය. සමහරුන්ට ජීවිත අහිමි වී ඇත. සමහරුන්ට දෙමාපියන්, වැඩිහිටියන්, නෑදෑයන්, භාරකරුවන්, මිතුරන් අහිමි වී ඇත. සමහරුන්ට රැකියා හා ව්‍යාපාර අහිමි වී ඇත. අප සියල්ලන්ම පීඩාවට පත්ව ඇත. මුද්දර නිකුතුවකින් 'වසංගතය සමග සටන් වදින සියලු දෙනාටම ස්තූති කරන්නේ' කෙසේද? හෙදියන්, වෛද්‍යවරුන්, සෞඛ්‍ය සේවකයන්, ආරක්ෂක අංශය, බස් රියැදුරන්, සාප්පු සේවකයන් ලැයිස්තුව නිමක් නැතිය. ස්තූතියි කියන්නට එය ප්‍රමාණවත්ද? තවත් බොහෝ දේ කළ හැකිද? කරුණාවන්තකම, එකමුතුකම, රැකවරණය සහ ධනාත්මකභාවය වැනි ආකල්ප වර්ධනයක් සිදු වීමයි.

"මේ අර්බුදය ඉදිරියේ දී පහව යනමුත් මෙම ව්‍යසනයෙන් පීඩාවට පත් වූවන්ට සහ ඊට ගොදුරු වූ බොහෝ දෙනකුට ධෛර්යය සම්පන්න දිරි ගැන්වීමක් අවශ්‍ය වෙනවා. අර්බුදය සහ ඉන් මිදී යථා තත්ත්වයට පත්වීම සඳහා ප්‍රධාන තේමාවන් කිහිපයක් මත පදනම්ව, මුද්දර මගින් බලාපොරොත්තුවේ පණිවුඩය එළිදක්වලා තිබෙනවා. ගෝලිය අර්බුධයක දී ශක්තිය, ධෛර්යය සහ ආදරය යන තේමාවන් මත මෙම මුද්දර නිකුත් කර ඇත්තේ බ්‍රිතාන්‍යයේ යටත් විජිත රාජ්‍යයක් වන 'අයිල් ඔෆ් මෑන්' හි තැපැල් අධිකාරියෙන්. දැනට ලෝකයේ කොරෝනා තේමාව පදනම් කරගෙන නිකුත් කර ඇති සමරු මුද්දරවලින් විශිෂ්ටතම නිකුතුව ලෙස පිළිගන්නේ මේ මුද්දර එකතුවයි. එහි දෘෂ්‍ය කියවීම මුළු ලෝකයටම පොදු නිසා අපිත් එය අපේ තැපැල් පත් සඳහා මූලාශ්‍ර කර ගත්තා."

එසේ මුද්දර යොදගෙන සැකසූ තැපැල්පත් සමග මේ නිර්මාණශීලී ඉසව්ව ස්පර්ශය කරන්නට ඔවුන් තෝරා ගත්තේ දිස්ත්‍රික්ක තුනක් නියෝජනය වන මහජන පුස්තකාල තුනකි. ඒ රත්නපුර දිස්ත්‍රික්කයෙන් රත්නපුර මහජන පුස්තකාලය, කෑගල්ල දිස්ත්‍රික්කයෙන් බුලත්කොහුපිටිය මහජන පුස්තකාලය මෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ

> **අපේ හිතුත් මේ මොහොතේ ලිවීමෙන් සුවපත් කරගන්න පුළුවන්**

> **මේ කාලේ ලියන දෙයක් අනාගතේ හොඳම නිර්මාණයක් වෙන්නත් හැකියි**

> **බොහෝ රටවල මේ අවස්ථාවේ අත් අකුරින් ලියූ ලිපි, සුබ පැතුම් පත් හා තැපැල් පත් හුවමාරුව කළා**

> **ශක්තිය, ධෛර්යය, ආදරය එක් කොට මේ මුද්දර නිකුත් කළේ අයිල් ඔෆ් මෑන් හි තැපැල් අධිකාරියෙන්**

කිරිමැටියාන මහජන පුස්තකාලයයි.

"මේ පුස්තකාල තුන කේන්ද්‍රකරගෙන එම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමයි මුලින්ම කළේ. ඊට පස්සේ පාඨක සමාජවල සාමාජිකයන් පුස්තකාලවලට ගෙන්වුවා. අපෙන් සම්පත්දායකයන් කිහිප දෙනෙක් ඒ වැඩසටහන්වලට සම්බන්ධ වුණා. ඒකෙදි අපි කතා කළේ මුද්දරයක් තැපැල් පතක් කොහොමද මහජන සම්බන්ධතා උපකරණයක් වශයෙන් භාවිතා කරන්නේ කියන කාරණාව. ඉගෙනුම් උපකරණයක් අධ්‍යාපන මෙවලමක් හැටියට භාවිතා කරන්නේ කොහොමද? මුද්දරය සහ මුද්දර කියවීමේ තිබෙන වටිනාකම. එහි විෂයානුබද්ධ බව සහ ජාතික එකමුතුව සඳහා මුද්දරයක තිබෙන වැදගත්කම. මේ සම්බන්ධයෙන් පුළුල් දැනුමක් සහ අවබෝධයක් ඔවුන්ට ලබා දුන්නා."

පුස්තකාල මණ්ඩල දැනුවත් කිරීමෙන් පසුව ඔවුන් කළේ පුස්තකාල තුන අතරේ තැපැල් පත් 5000ක් බෙදා දීමය. එතැන් සිට කාර්ය පැවරුණේ පුස්තකාල සාමාජිකයන්ටය. මෙම වසංගත සමය ඔබට දැනුණේ කෙසේද? ඉතිහාසයේ ඔබේ කොටස ඔබ ලියන්නේ කෙසේද? කාට හෝ එය දැනගැනීමට ඔවුන් ලිව්වේය. පෑනකට, කඩදාසියකට, ඔවුන්ගේ සිතුවිලි නිදහසේ ගලා යාමට ඉඩකඩ සලසා දුන්නේය. අත් අකුරින් ලියූ ලිපියක් කියවීම චිත්තරූප මවා ගැනීමකි, ඒකාකාරී භාවයෙන් අත් මිදීමකි. හුදකලාව සිටින අයට, වචන සිය ආත්මයන් ඔසවා තබන්නකි. මතකයන් අවදි කරනවා පමණක් නොව හැඟීම් පුබුදුවාලන්නකි. සැබැවින්ම එය කෙටි පණිවුඩයකට හෝ ඉක්මන් ඇමතුමකට වඩා වැඩි යමකි. එය සිතට සැනසිල්ල ගෙන දෙන්නකි.

"කොරෝනා කාලේ අපේ පාසල් දරුවො ගෙවල්වලට වෙලා ඉන්නෙ. සංචාරණ සීමා කාලෙ දෙමව්පියන් වැඩිහිටියන් පවා ගෙදරටම වෙලා හිටියෙ. ලිවීම කියන්නේ ආතතියෙන් පෙළෙන කාලෙක දි වඩාත්ම ප්‍රයෝජනවත් කටයුත්තක්. එයින් ලේඛන කුසලතා වර්ධනය වීම එක පැත්තක්. අනෙක් පැත්ත සමාජ දුරස්ථභාවය තිබිය දී නව මිතුරන් ඇති කර ගැනීම. මෙහිදී තමන්ගෙ පන්තියෙ මිතුරන්ට ලියන්න පුළුවන්. තමාගේ ගුරුතුමාට ගුරුතුමියට ලියන්න පුළුවන්. නෑදෑයන්ට පෑනේ මිතුරන්ට ලියන්න පුළුවන්. මේ දවස්වල වැඩිම වෙහෙසක් වෙන දෙස්තර මාමලා නැන්දලාට සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල අයට ලියන්න පුළුවන්."

මෙම වැඩසටහන පළමුවෙන්ම ආරම්භ කළේ රත්නපුර මහජන පුස්තකාලයේය. රත්නපුර නගරාධිපති ටිරෝන් අත්තනායක සහ පුස්තකාල කාරක සභාවේ සභාපති නාගරික මන්ත්‍රී දුමින්ද කොස්වත්ත මහත්වරුන්ගේ මූලිකත්වයෙන් වැඩසටහන ක්‍රියාවට නැංවූයේ රත්නපුර මහජන පුස්කාලයාධිපති උත්තලා නයනී විමලවංශය.

"අපේ රත්නපුර මහජන පුස්තකාලයට අනුබද්ධව ශාඛා පුස්තකාල 18ක් තිබෙනවා. ඒවායේ කාර්ය මණ්ඩලය 50කට වැඩි ප්‍රමාණයක් සේවය කරනවා. මුලින්ම කළේ මේ කණ්ඩායම රැස්කරලා දවසක වැඩමුළුවක් පැවැත්වීම. ඒකෙදි තමයි ලිපියක් ලියන වැඩසටහන පිළිබඳව දැනුවත් කළේ. ඒකෙදි ඔවුන් කළේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක්. එම වැඩමුළුව ඉතා සාර්ථක වුණා".

පුස්තාලයාධිපති උත්තලා පවසන ආකාරයට මෙම වැඩමුළුවෙන් පසු ඔවුනට ලැබුණු තැපැල් පත් සියලුම ශාඛා වෙත බෙදා දුන්නේය. අනතුරුව වැඩසටහන ක්‍රියාත්මක කළේ අදියර දෙකක් යටතේය. කොරෝනා වසංගතය හමුවේ දැඩි කැපවීමකින් කටයුතු කරන සුව විරුවන් ඔවුන්ගේ ඉලක්කගත කණ්ඩායම විය. රත්නපුර නගර සභාවේ නාගරික වෛද්‍යතුමන්ගේ සිට පහළම සේවකයා දක්වා සියලුම දෙනා වෙත මෙම තැපැල්පත් ලියා තැපැල් කිරීම සිදුකෙරිණි. දෙවන අදියර ක්‍රියාත්මක කළේ රත්නපුර ශික්ෂණ රෝහලේ කොවිඩ් වාට්ටුවේ කාර්ය මණ්ඩලය අරබයාය. ඒ අප්‍රේල් 07 දිනට යෙදුණ සෞඛ්‍ය දිනය නිමිතිකර ගෙනය. මෙහිදී වෛද්‍යවරයාගේ සිට ගිලන් රථ රියැදුරා දක්වා සියල්ලන්ගේම අතටම තැපැල්පත් ලබා දීම සිදුවිය.

එමෙන්ම නගර සභාවේ නගරාධිපතිවරයාගේ සිට පහළම සේවකයා දක්වා තැපැල් පත් යොමු කෙරිණි.

'ලිපියක් ලියන්න සිනහවක් ගෙන එන්න' ව්‍යාපෘතියට ශක්තිය ලබා දෙන්නේ ශ්‍රී ලංකාව ද ඇතුළු දකුණු ආසියානු කලාපයේ ක්‍රියාත්මක වන Awareness With Human Action (AHA) ව්‍යාපෘතියයි. එය යුරෝපා සංගමය සහාය දෙන ව්‍යාපෘතියකි. සාමය, සහජීවනය, සමාජ ඒකාබද්ධතාව, ගොඩනැංවීමේ කාර්ය සාධනයට අදාළව ශ්‍රී ලංකාව තුළ මෙය ක්‍රියාත්මක කරන්නේ සර්වෝදය ව්‍යාපාරයයි.

මෙම වැඩසටහනට සම්පත්දායකත්වය සපයන පුස්තකාලවේදි සඳරුවන් ලියනාරච්චි පවසන්නේ මෙවැනි වැඩසටහනක් ලංකාවේ පුස්තකාලයක් ඇසුරු කරගෙන සිදුවන පළමු අවස්ථාව මෙය බවත් එය පුස්තකාල ක්ෂේත්‍රයේ නව කියවීමක් සඳහා හොඳ මග පෙන්වීමක් බවත්ය. නවීන තාක්ෂණය හමුවේ මොටවූ නිර්මාණ චින්තනය සහ ලිවීම යළි මතුකර ගැනීමට ද මෙය සුවිශේෂී අවස්ථාවක් බවද ඔහුගේ අදහසයි.

"ඔබ තවත් ප්‍රමාද නොවන්න. ඔබ වෙනුවෙන් ලියන්න. සෙස්සන් වෙනුවෙන් ලියන්න. සොඳුරු සිතුවිල්ලක් ධෛර්යවන්තකම ලබාදෙන සටහනක් ආශිර්වාද ප්‍රාර්ථනයක් ලියන්න. මෙවන් ගෝලීය අර්බුදයක දි ශක්තිය සහ ආදරය යන තේමාවන් මත ඔබගේ ආශිර්වාද ලෝකයට පතුරවන්න. පවත්නා අර්බුදය තුළ පිඩා විඳින සියල්ලන්ටම මෙම ප්‍රවේශ සහ පණිවුඩ අදාළ කරවන්න. ඔබගේ තැපැල් පත සහ නිර්මාණශීලී සුභ පැතුම තවත් කෙනෙකුගේ දවස දිප්තිමත් කරනු ඇත. ඒ වගේම ඔබට මේ දිනවල ඔබ අසන දේ දකින දේ මේ කාලයේ ලියන්නට පුළුවන, එය දිනපතා ලියවෙන ලියවිල්ලක් ලෙස වුවද ලිවිය හැක. ඊට වයස් බේදයක් නැත. සමහර විට මේ එකතුවක් අනාගතයේ ඈන් ෆ්‍රෑන්ක්ගේ දිනපොත වන් හොඳමහොඳ නිර්මාණයක් වන්නට ද පුළුවන්.

ඒ නිරෝෂණ ලියන්නට හැකි සැමගෙන් ඉල්ලා සිටින ඉල්ලීමයි.

**ඉන්දික සංජීව විතාන**

# යක්කු ගස් නගින වෙලේ චිත්‍ර අඳින සිත්තරාවි



පොඩි කාලයේ කවුරු කවුරුත් චිත්‍ර අඳිති. සමහරවිට ඒ පුංචි පුංචි ඉරි කෑලි හැඩ තල අතරේ බොහෝ දක්ෂයෝ ද සිටිති. ඒත් වැඩිහිටි වෙද්දි ඒ පාරේ යන්න තෝරා ගන්නෙ අතළොස්සකි. බොහෝ දෙනෙක් තමන් ළඟ ඒ හැකියාවන් තිබියදීත් ඒවා පසෙක තබා ඔවුන් තෝරාගත් ගමනක් යයි. ඒ නිසා චිත්‍ර ඇඳිල්ල ළමා කාලයට හෝ පාසල් කාලයට පමණක් බොහෝ දෙනෙකු සීමා කරති. තිළිණි ගමගේ ද එවැන්නියකි. මීට අවුරුදු පහළොවකට, දහසයකට පෙර කඳාන සාන්ත සෙබෙස්තියන් විද්‍යාලයේදී ඈ චිත්‍රවලට බොහෝ දස්කම් දැක්වූ දැරියකව සිටියාය.



ඒත් උසස් පෙළ විෂය ධාරාව වාණිජ අංශයට මාරු වීමත් සමග ඇගේ ඒ හැකියාවන් වැළලී ගියේය. ඒ හැකියාවන් ගොඩගෙන වැඩිදියුණු කරගන්නට මේ අවුරුදු ගණනාවටම ඇයට ඕනෑකමක් වූයේවත් වෙලාවක් ලැබුණේවත් නැත. ඒත් කොරෝනාවේ ආගමනය තිළිණිගේ හිතේ වැළලී තිබූ චිත්‍ර හැකියාව ආයේ ගොඩගත්තේය. ඒ අනුව තිළිණි සායම්, කැන්වස් ආයේත් ළඟට ගත්තේය. ඒත් ඒ බොහෝ දෙනකුට සේ කොරෝනා කාලයේ කරන්නට දෙයක් නැති නිසා චිත්‍ර ඇඳ සතුටු වන්නට නොව, චිත්‍ර ඇඳ තවත් හිත් ගණනාවක් සතුටු කිරීමේ පරමාර්ථයෙනි.

" මං චිත්‍ර අඳින්න ගත්තෙ මගෙ සත්තු වෙනුවෙන්. ඒ කොවිඩ් එනවත් එක්කම ආව මූල්‍යමය ප්‍රශ්නවලට විසඳුමක් විදිහට. ඒ කාලේ ගන්න පඩිය අඩුවුණාට එකතුවෙන සත්තු ගාන අඩුවුණේ නෑ. මගේ ළඟ ඉන්න සත්තු ඔක්කෝම විශේෂ අවශ්‍යතා ඇති අය. ඇස් පේන්නෙ නැති, කොන්දෙන් පහළ පණ නැති , අත් පා නැති සත්තු තමයි මං ගාව ඉන්නේ. ඒ කියන්නේ මිනිස්සු අහක බලාගෙන යන සත්තු මගේ ඇස්වලට පේනවා. මං ඒ අහිංසකයෝ ගෙදර ගෙනත් සුවපත් කරලා පුළුවන් අය ගෙවල් හොයලා බාර දෙනවා. බැරි අය මං ගාව නතර වෙනවා. එවැනි පූසන් විසිපහකුත් බල්ලන් හය දෙනෙකුත් ගෙදර විතරක් ඉන්නවා. ඒ අය මං ගෙනාවා නම් කාටවත් කරදර නොකර මං බලාගන්න ඕනිනේ. අන්න ඒකයි චිත්‍ර අඳින්න හිතුවෙ. එකට මට හැකියාවක් තියෙනවා. මං ඉස්කෝලෙ යන කාලේ ඇත්තටම චිත්‍රවලට දක්ෂයි. අවුරුද්දක් දෙකක් හැරෙන්න අනිත් හැම අවුරුද්දක්ම පාසලේ වර්ෂ අවසාන ත්‍යාග ප්‍රදානෝත්සවයේදී චිත්‍රවලට තෑග්ග ගත්තෙ මමයි. ලංකාවෙ වගේම ජපානයෙ, ඉන්දියාවෙ වගේ විවිධ රටවල පැවති චිත්‍ර තරගවලට චිත්‍ර ඇඳලා පදක්කම් සහතික ගොඩක් දිනුවා. සාමාන්‍ය පෙළ විභාගෙට චිත්‍ර විෂය අරන් ඒ සාමාර්ථයකුත් ලැබුවා.."



එවන් දක්ෂතා තිබූ තිළිණි එදා චිත්‍ර අතහැර වාණිජ්‍ය විෂය ධාරාවෙන් ඉගෙන අද පෞද්ගලික ආයතනයක ගිණුම් විධායකවරියක් ලෙස රැකියාව කරන්නීය. ඇය මේ සියල්ල කරනුයේ ඒ රැකියාවෙන් පරිබාහිර වෙලාවේය. සත්තුන්ගේ සියලු වැඩ කටයුතු කර කාර්යාලයට ගොස් එන තිළිණිට රෑ එකොළහ දෙළහ වෙනතුරුත් වැඩ කන්දකි. රාත්‍රියට නිවසේ සතුන්ට කෑම බීම දෙනවාට අමතරව රෝගී සතුන්ට ප්‍රතිකාර කරන්නට යන්නටත්, රෝහල්වල නවතා ඇති සමහර රෝගී සතුන් බලන්නට යන්නත් ඇයට ඇත්තේ ඒ සන්ධ්‍යා කාලයයි.

" මං ඒ වැඩ ඔක්කෝම ඉවර කරලා මහ රෑ දෙළහට විතර තමයි අඳින්න ගන්නෙ. පැය දෙක තුනකින් අදාළ චිත්‍ර මං ඇඳලා ඉවර කරනවා. අනික මං චිත්‍ර අඳිනවා කියලා හැම වෙලේම චිත්‍රයක් ඇඳලා විකුණගන්න කරදර වෙන්නෙත් නෑ. සත්තුන්ගෙ මට දරන්න බැරි මුදල් අවශ්‍යතාවල් එනවා. කෑම, බීම, රෝහල් ගාස්තු, ප්‍රවාහන වියදම් වගේ. සමහර පැරලයිස් පූස්ලා ඉන්නවා ඒ ගොල්ලන්ට විශේෂ කෑම දෙන්න ඕන. ඒවා අනෙක් කැට් ෆුඩ් වගේ නෙවේ ගණන්. ඒක ගන්න ඕන වුණාම මං චිත්‍රයක් ඇඳලා ඒකේ ෆොටෝ මගෙ art fir the voiceless by thilini gamage කියන ෆේස්බුක් පිටුවට දනවා ඒ චිත්‍ර විකුණන්නෙ ඇයි කියන කතාවත්, අදළ සතාගේ පින්තූරෙත් දලා. ගොඩක් වෙලාවට චිත්‍රේ විකිණෙනවා. රෝහල්වල නවත්තලා ඉන්න සත්තුන්ගෙ බිල් ගොඩ ගැහෙනකොටත් චිත්‍රයක් දෙකක් ඇඳලා දනවා. මේ වෙනකොටත් එක රෝහලක ලක්ෂ දෙකකට වැඩි බිලක් තියෙනවා. ඒත් මං බිල් දලා කාගෙන්වත් උදව් ඉල්ලන්නෙ නෑ. මං වියදම් කරලා කැන්වස් ගෙනත්, පාට ගෙනත් රෑ නිදිමරලා ලස්සන චිත්‍රයක් ඇඳලා ඒකට මිලක් නියම කරනවා."

ඇය කියන්නේ ඒ ක්‍රමයෙන් කිසිවකුටත් බරක් නොවෙන්නා සේම මහ රැයේ චිත්‍රයක් නිදිමරාගෙන පාන්දර තුන හතරවෙනතුරු අඳින විට තම සිතටත් සතුටක් ලැබෙන බවයි. තිළිණි ඇගේ චිත්‍ර සඳහා කිසි විටෙකත් පැන්සලක් පාවිච්චියට නොගන්නීය. ඒ වෙනුවට ඇය සතුව ඇත්තේ පින්සල්, අයිස් ක්‍රීම් කූරු, පොඩි හැඳි, පිත්තල කෑලි, වගේ ඒවාය.



" මං මේ ගොඩනගා ගෙන තියෙන්නේ මගේම ශෛලියේ චිත්‍රකලාවක්. මම ඉස්කෝලෙ යන කාලෙත් පින්සලෙන් අඳින්න දක්ෂ නෑ. අපේ ඕලෙවල්වලට හිටපු ශ්‍රියාණි මිස් තමයි මේ ශෛලිය මට කියලා දුන්නේ. එයා කිව්වා කැන්ටින් එක ළඟින් ළමයි කාලා දපු අයිස්ක්‍රීම් කෝට්ටක් ඇහිඳන් එන්න කියලා.ඒ ආවාම කිව්වා මං ඇඳපු චිත්‍රේ අයිස් ක්‍රීම් කූරෙන් පාට කරන්න කියලා. ඒක වූල් පේන්ටින් ක්‍රමයක්. ඒක වැඩිදියුණු කරගෙන මං ඕලෙවල්වලට ඇන්දෙත් අයිස්ක්‍රීම් කූරෙන්. ඒ වගේමයි මං චිත්‍ර අඳින්න පාවිච්චි කරන්නෙ ඇක්‍රලික් පේන්ට් . ඒවා ටිකක් මිල අධිකයි. මුල් කාලේ නම් ෆ්‍රේම් එක ගහපු කැන්වස් එකමයි ගෙනාවේ. ඒත් ඒවත් මිලයි. එතකොට මට චිත්‍රේට මිලක් නියම කරන්න බෑ. ඒ නිසා දැන් මං ලී මඩුවකින් ෆ්‍රේම් හදගෙන මමම කැන්වස් එක ෆ්‍රේම් එකේ අලවනවා. ඊට පස්සෙ ඒ කැන්වස් එකේ තව රබර් පේන්ට් එකක් ගාලයි චිත්‍රේ අඳින්න පටන් ගන්නේ. ඒ ෆ්‍රේම් එක හදන්න එක රැයක් යනවා. ඊළඟ රැයේ චිත්‍රේ අඳින්නේ. ඇත්තටම මං සීනරිස් විතරක් අඳින හේතු කීපයක් තියෙනවා. එකක් මට ඒ වැඩේ ඉක්මනින් ඉවර කරගන්න. අනික කවුරුත් කැමති හිත සතුටු වෙන දෙයක් දිහා බලා ඉන්නනේ. මගේ චිත්‍ර හැම එකක්ම හිතට සතුටක් සුවයක් ගේන ඒවා. "

කෙනෙකුගේ හිතට සතුටක් සුවයක් ගේන තිළිණිගේ චිත්‍රවලින් ලැබෙන මුදලින් දිනපතා සතුටුවන්නෝත් පනහකට එහා පිරිසකි. ඒ නිවසේ මෙන්ම තැන් තැන්වල තබාත් බත් කටක් හෝ කන්නට ගේට්ටුව ළඟට වී බලා ඉන්නා නවයක දහයක බලු බලල් රංචුවටත් මේ මුදල් බෙදී යන නිසාය.

" මං පහුගිය දවස්වල අලුත් චිත්‍ර ටිකක් ඇන්ද වෙනස්ම වැඩක. ඒ කොච්චර රකින්න හැදුවත් අන්ධ පූස් පැටව් එහෙ මෙහෙ වත්තෙ යනවා. ඒ අය කොටු කරලා දැලක් ගහන්න සල්ලි හොයන්න චිත්‍ර ඇන්දේ. ඇත්තටම හිතාගෙන හිටියේ පාරේ තැනක තියාගෙන හරි ඉදිරියේ චිත්‍ර විකුණනවා කියලා. ඒත් ඒ හිත ආපස්සට ගියා ඩෙල්ටා නිසා. මම හැම වෙලේම මගේ පරෙස්සමත් බලනවා. මට ලෙඩක් හැදුණොත් මේ අසරණයො තවත් අසරණ වෙනවා.."

තිළිණිට දැන් චිත්‍ර වැඩියෙන් අඳින්නට සිදුව ඇත. ඒ ඇගේ දරුවන් වන් සතුන්ගේ අවශ්‍යතාවන් මෙන්ම ඇගේ රැකවරණයටත් වැඩි වැඩියෙන් සතුන් එක්වන නිසාය. මොන තරම් වෙහෙසී සිටියත් කවුරුත් නිදන රැයේ අවදියෙන් අදත් හෙටත් ඈ කැන්වසය තුළ ඇගේ අහිංසකයන් වෙනුවෙන් පාට තවරනු ඇත. ඒ මොහොතට කවුරු නැතත් ඇයට තනි රකින්නේත් ඒ සතුන්ගේ සෙනෙහසමය.

**බියංකා නානායක්කාර**

# ප්‍රහේලිකාව නිවැරදිව පුරවා

## වටිනා මුදල් ත්‍යාග දිනාගන්න

විසඳන ලද මෙම ප්‍රහේලිකාව ලියුම් කවරයක බහා එවන්න

- **පළමු ත්‍යාගය මුදලින් රුපියල් 25,000ක්**
- **දෙවැනි ත්‍යාගය මුදලින් රුපියල් 15,000ක්**
- **තුන්වැනි ත්‍යාගය මුදලින් රුපියල් 10,000ක්**
- **රුපියල් 5,000ක් වටිනා සැනසිලි තෑගි 5ක්**




### තරග කොන්දේසි

- තරගකරුවකුට ඕනෑම විසඳුම්පත් ප්‍රමාණයක් එවිය හැකි අතර ඡායාපිටපත්වලින් එවනු ලබන විසඳුම් භාර නොගැනේ.
- ලිබර්ටි පබ්ලිෂර්ස් ආයතනයේ කිසිවකුට හෝ එම පවුල්වල කිසිදු සාමාජිකයකුට තරගයට සහභාගි විය නොහැක.
- නිවැරදි විසඳුම් භාර ගන්නා අවසන් දිනය සැප්තැම්බර් 14 වැනිදා වන අතර එදිනට පසු ලැබෙන විසඳුම් තරගයට වලංගු නොවේ.
- තරගය සඳහා ඕනෑම වයසක අයකුට ඉදිරිපත් විය හැක.
- ජයග්‍රාහකයන් කුසපත් ඇදීමෙන් තෝරා ගන්නා අතර තරගයේ අවසන් තීරණය ලිබර්ටි පබ්ලිෂස් සතු වේ.

ඔබේ නිවැරදි විසඳුම්පත් සති අග අරුණ ප්‍රහේලිකා අංක 20 ලිබර්ටි පබ්ලිෂර්ස්, අංක 91, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයට සැප්තැම්බර් 14ට පෙර ලැබීමට සලස්වන්න.

## අරුණ ප්‍රහේලිකා අංක 20



නම: ..............................

ලිපිනය: ..............................


දුරකථන අංකය: ..............................

### හරහට

1. කොවිඩ් 19 වසංගතය සාර්ථකව පාලනය කළ රටකි
4. උළෙල යන්නට සමාන පදයකි
8. යටත්විජිත යුගයේ මහනුවර ගොඩනගන ලද ප්‍රකට හෝටලයකි
9. ජන සාහිත්‍යයේ වර්ණනා කෙරෙන වෘක්ෂයකි
10. දෙවියන් උදෙසා කන්නලව් කෙරෙන ස්ථානය වේ.
11. ගැළපෙන සුදුසු වැනි අර්ථ දේ
12. කොඩි යන්නට සමාන පදයකි
13. හිමිදිරියේ පායන සූර්යයාය
15. වෙළෙඳුම් ක්‍රම අතර ප්‍රධාන ක්‍රමයකි
16. පුද්ගලයන් අතර හුවමාරු වන ලිඛිත ලේඛනයකි
17. පුවත්පත් කලාවේදී ධර්මසිරි ගමගේ මහතාගේ යොවුන් සාහිත්‍ය ව්‍යාපාරයකි
20. රජුගේ ආම්පන්න අතර ප්‍රධාන ස්ථානයක් ගන්නා ආයුධයයි
21. එංගලන්තයේ අග නගරය වේ
24. තනි අඟක් සහිත ගොඩබිම වෙසුණු දුර්ලභ සත්ත්වයෙකි
26. අප්‍රිකානු ජනතාව හැඳින්වීමට භාවිත කෙරෙන සිංහල වචනයකි
28. අඟුලු විවෘත කළ හැකි වන්නේ මෙමගිනි
29. ලංකාවේ වී වගා කෙරෙන කාල දෙකෙන් එකකි
32. හිරු රශ්මියට සමාන අර්ථ දෙන පොදුජන වහරකි
33. පංචශීලය රකින විට මේවා සිදු නොවේ
35. ශරීරය සිසිල් කරන ගුණදායක පානයකි
37. ලෝහ වර්ග උණු කිරීමට භාවිත කරයි
40. ආදම් සහ ඒව ගෙඩි කෑවේ මෙයින් කියයි
41. සාම්ප්‍රදායික මිනුම් ඒකකයකි
42. මිනිත්තුවකින් හැටෙන් එකකි
43. උඩරට නර්තන කලාවට අයත් නර්තනාංගයකි

### පහළට

2. ලක්දිව ආක්‍රමණය කරන ලද එක් බටහිර ජාතියකි
3. විද්‍යුත් මාධ්‍යයට අදළ ප්‍රධාන සම්ප්‍රේෂණ කුලුනක් පිහිටි ප්‍රදේශයකි
4. බඩ ගා ඇදෙන සත්ත්ව විශේෂය
5. වී ගොවිතැනට ප්‍රසිද්ධ මන්නාරමට ආසන්න ප්‍රදේශයකි
6. පහත රට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන බෙරය වේ
7. ජ්‍යොතිෂයේ සඳහන් වන නැකතකි
11. උපද්‍රවයෙන් තොර යන අර්ථය දේ
12. ප්‍රමිලා බිසවගේ අනියම් පෙම්වතාය
14. කිඳුරිය යන්නට සමාන පදයකි
18. මුල්වරට ශ්‍රීපාදය කරුණා කරන්නා
19. මෙරට වාපි ශිෂ්ටාචාරයේ පුරෝගාමී රජු
21. බර්ගර් ජාතිකයන් ජනවහරට මෙලෙසද හඳුන්වයි
22. ජනප්‍රිය පෙරදිග සංගීත භාණ්ඩයකි
23. ඉන්දියාව අතීතයේ දී මෙනමින් ද හඳුන්වන ලදී.
25. හිරුට නමකි
27. දකුණු පළාතේ ප්‍රකට ධීවර කර්මාන්ත ක්‍රමයකි.
30. සතර යන්නට සමාන පදයකි
31. පුරාතනයේ ඉන්දියාවේ පැවති යාග කර්මයකි
32. උඩරට නර්තනයට අයත් වෙස් ඇඳුම් කට්ටලයේ අංගයකි
34. ජනප්‍රිය මුද්‍රිත සන්නිවේදන මාධ්‍යයකි
35. 1969 වර්ෂයේ සිදු වූ ලෝකප්‍රකට ඓතිහාසික සිදුවීමකි
36. ජනප්‍රිය විනෝදස්වාදය සපයන කර්මාන්තයකි
38. රජරට ප්‍රසිද්ධ ගොවි ජනපදයක් වේ
39. බෞද්ධ සංස්කෘතියේ මූලික අංගයකි




# "වනකතා" තහනම් වුණේ ඩී.ඇස්. සේනානායකට අපහාස කළා කියලා

සාහිත්‍යයට, කලා නිර්මාණයන්ට වාරණ පැනවෙන්නේ අද ඊයේක පටන් නොවේ. එයිනුදු, පොත් පත්වලට "තහනම්" පැනවීම, ඈත ඉතිහාසයේ පටන්ම ලෝකයේ රටවල් බොහොමයක සිදුව ඇති දෙයකි. පොත්පත් තහනම් කිරීමේ, පුලුස්සා දැමීමේ ඉතිහාසය අවුරුදු දහස් ගණනක් ඈතට දිවයයි. මුස්ලිම් ආක්‍රමණිකයන් විසින් ඉන්දියාවේ නාලන්ද විශ්වවිද්‍යාලය ගිනිබත් කර එහි පොත්පත් විනාශ කර දැමීම, ඒ අයුරින්ම මිසරය ආක්‍රමණය කළ ඉස්ලාම් අන්තවාදීන් විසින් මිසරයේ ඇලෙක්සැන්ඩ්‍රියා නුවර පුස්තකාලය ගිනිබත් කොට පොත්පත් විනාශ කර දැමීම ඒ අතීතයේ කවුරුත් දන්නා මතක සලකුණුය. අපේ රටේද මහා විහාර පොත්ගුල විනාශ කර දැමීමේ පටන්, යාපනය පුස්තකාලය ගිනිබත් කිරීම දක්වා සාහිත්‍යයට සතුරුකම් කිරීමේ ඉතිහාසය දිව යයි.

ඉදින් මේ සටහන තබන්නේ මෑත ඉතිහාසය තුළ විනාශ කරන ලද, හා තහනම් කරන ලද පොත්පත් පිළිබඳවය.

පොතක් තහනම් කෙරෙනුයේ එහි අන්තර්ගත වන මතභේදකාරී යම් කාරණයක් හේතුවෙනි. එම පොතේ අන්තර්ගතය පාඨකයාට හා සමාජයට හානිකර වේදැයි මෙහිදී සලකා බලනු ලැබෙයි. ප්‍රධාන වශයෙන් මෙහිදී සලකා බැලෙන්නේ දේශපාලනික, සාමාජික, ආගමික, හෝ සංස්කෘතික හේතුවක් විය හැකිය.

දේශපාලනික හේතුවක් මත මුලින්ම මෙරට තහනම් වූ පොත වනුයේ "වනකතා" නම් ග්‍රන්ථයයි. උගත් භික්ෂූන් වහන්සේ නමක වන යක්කඩුවේ ප්‍රඥාරාම හිමියන් විසින් රචනා කරන ලද "වනකතා" ග්‍රන්ථය පංච තන්ත්‍රය ආශ්‍රය කර ගනිමින් ලියූවකි. මෙම පොත 1950 දශකයේ ජ්‍යෙෂ්ඨ විභාගයට පවා නිර්දේශ වූ ග්‍රන්ථයකි. මේ ග්‍රන්ථය ජ්‍යෙෂ්ඨ විභාගයට නිර්දේශ ග්‍රන්ථයක් ලෙසින් තෝරා ගන්නා ලද්දේ එවකට ලංකා විශ්වවිද්‍යාලයේ සිංහල මහාචාර්ය ධර්මසිරි රත්නසූරිය, විශ්වවිද්‍යාලයේ පාලි මහාචාර්ය ගුණපාල මලලසේකර හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ග්‍රන්ථ පරිවර්තන පාලක ඊ.ආර්. එරත්න යන මහත්වරුන් ය.

මෙම පොත තහනම් වීමට හේතු වූයේ ප්‍රඥාරාම හිමියන් විසින් සිංහලයට පරිවර්තනය කරන ලද පංච තන්ත්‍රයේ ශ්ලෝකයකි. එය මෙසේය.

**අපායට යන්න ඕනෑ නම් නුඹ ට**
**කරපන් මහ ඇමැතිකම එක දවසක ට**
**නැත්නම් පන්සලක දේවාලයක සි ට**
**අදිපතිකම කරපන් තුන් දවසක ට**

මෙම කවියෙන් එවකට අගමැතිව උන් ඩී.ඇස්. සේනානායක මහතාට අපහාසයක් සිදු විණි යැයි චෝදනාවක් එල්ල විය. එවකට අධ්‍යාපන ඇමැති ධුරය දැරූ ඊ. ඒ නුගවෙල මහතා, මෙම පොත ජ්‍යෙෂ්ඨ විභාගය සඳහා තෝරාගත් තිදෙනාගෙන්ම මේ පිළිබඳව නිදහසට කාරණා පවා විමසා තිබේ. එපමණකින් නොනැවතී පොතට එම කවිය ඇතුළත් කිරීම පිළිබඳව ප්‍රඥාරාම හිමියන්ගෙන්ද නිදහසට කරුණු විමසා තිබේ. තමා වෙත එල්ල වුණු චෝදනාවට පිළිතුරු දක්වමින් ප්‍රඥාරාම හිමියන්, පංච තන්ත්‍රයේ අදාළ ශ්ලෝකයද උපුටා දක්වමින්, මේ කවිය පංච තන්ත්‍රයේ ශ්ලෝකයක පරිවර්තනයක් බව පෙන්වා දී, මේ නිසා පොතක් තහනම් කරනවා නම් මුලින්ම තහනම් කළ යුත්තේ පංචතන්ත්‍රය බවත් පවසා ඇත. කෙසේ වුවත් උන්වහන්සේ ඉදිරිපත් කළ අදහස් එවකට සිටි බලධාරීන් විසින් පිළිගෙන නැත. ඔවුන් දිගින් දිගටම විශ්වාස කර ඇත්තේ මෙම කවියෙන් අගමැතිවරයාට ව්‍යංගයෙන් අපහාසයක් එල්ල කළ බවය. අන්තිමේදී අගමැතිවරයාට අපහාස කෙරෙන බව කියමින් "වනකතා" තහනමට ලක් කර ඇත. එපමණක් නොව එම පොත තෝරා ගැනීම නිසා ඊ. ආර් එරත්න මහතාට අධ්‍යාපන කාර්යාලය තහනම් කලාපයක් විය. ඔහුව රැකියාවෙන් මාරු කර දුෂ්කර පාසලකට යැවීමට පවා කටයුතු සිදු කොට ඇත. "වනකතා" නම් පොත තහනමින් නොනැවතී, පොත් වෙළෙඳසැල්වල තිබුණු වනකතා පොත් පවා සියල්ල එකතු කොට ගිනිබත් කරන්නටද කටයුතු කළ බවක් කියැවෙයි.

## ලංකාවෙ තහනම් වුණ පොත් කතා

මේ හා සමගාමීවම, දේශපාලන හේතුවක් මතම තහනම් වූ තවත් පොතක් විය. ඒ ප්‍රකට උගතෙකු, හා එකල ජනප්‍රිය පුවත්පත් කලාවේදියෙකු වූ ඩී. ආර් ජයවර්ධන මහතා විසින් ලියන ලද "සමාජ සංදර්ශනය" නම් කෘතියයි. එයද "වනකතා" කෘතියත් සමගම ජ්‍යෙෂ්ඨ විභාගයට නිර්දේශ කොට තිබුණු කෘතියකි. මේ පොත තහනම් වනුයේ රාජ්‍ය විරෝධී අදහස් මෙහි අඩංගු වන බව කියමිනි. ඇත්ත වශයෙන්ම එම කෘතියෙහි විස්තර වන්නේ ඒ වන විට ලාංකීය සමාජයට අත්වෙමින් තිබුණු ඉරණම පිළිබඳවය. ඒ පිළිබඳව ඩී. ආර් ජයවර්ධන මහතා විසින් තම කෘතියේ ප්‍රස්ථාවනාවේ මෙසේ සඳහන් කොට තිබේ.

"ලංකා සමාජය අද පවතින අන්දම ව්‍යාජයෙන් තොරව තත්ත්වාකාරයෙන් විස්තර කිරීමට මෙම ග්‍රන්ථය මගින් ප්‍රයත්න දැරුවෙමු. ඒ වනාහි සමාජයේ දූෂණ ලක්ෂණ නැති කොට එය විනීත තත්ත්වයකට නැංවීමේ අපේක්ෂාවෙන් දරන ලද ප්‍රයත්නයකි. ලංකාව වනාහි ස්වර්ගයට සමාන ස්ථානයක් යයි කියමින් නූගත් ඡන්ද දායකයන් රැවටීමේ නිරත වන දේශපාලනඥයෝ විදේශිකයන්ගේ මේ කියුම්වලින් හොඳ ප්‍රයෝජන ගනිති."

කෙසේ හෝ මෙම කෘතියෙන් ජනතාවට සම්ප්‍රේෂණය කරන කරුණු හේතුවෙන් ජනතාව අතර රාජ්‍ය විරෝධයක් ගොඩ නැගෙන බවද, ඒ විරෝධය හේතුවෙන්ම තමා මැතිවරණයෙන් පවා පරාජය වූ බවද කියමින්, 1950 වසරේ බලපිටියේ අතුරු මැතිවරණයට එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වී පරාජය ලැබූ ඉයන් ද සොයිසා මහතා විසින් ලිපියකින් අගමැතිතුමාව

### ජී.බී.ගේ පළිගැනීම තහනම් කරන්න හේතුවුණේ අම්මා කෙටි කතාව

### පාසල් පුස්තකාලවල තිබූ සමාජ සංදර්භයන්පොත් සියල්ල ගෙන්වා ගිනිබත් කළා

### බවතරණය තහනම් කළයුතු නැති බව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය තීරණය කළා

දැනුවත් කොට ඇත. එවකට අග්‍රාමාත්‍ය ධුරය දැරූ ඩී. එස් සේනානායක මහතා විසින් මේ පිළිබඳව සොයා බලන්නට ඒ වන විට අධ්‍යාපන ඇමැති ධුරය දැරූ ඊ.ඒ. නුගවෙල මහතාට පැවරීය. මෙහි ප්‍රතිඵලයක් ලෙසින් අවසානයේ චක්‍රලේඛයක් නිකුත් කරමින් පාසල් පුස්තකාලවල තිබෙන "සමාජ සංදර්ශනය" පොත් සියල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවට එවන්නැයි නියෝග කෙරිණ. පසුව මේ පොත තහනම් කරනු ලැබූ අතර, ඒ පොතේ පිටපත් සියල්ල එක් කර ගිනිබත් කර දැමූ බවද කියැවෙයි. මෙයින් පෙනී යන්නේම අදට සාපේක්ෂව ඒ යුගයේදී, දේශපාලනය සම්බන්ධයෙන් භාෂණයේ නිදහස අතිශයින් සීමිත වූ බවය.

1950 දශකයේ ජ්‍යෙෂ්ඨ විභාගයට නියම වුණු පොත් අතරින් තහනම් වන්නේ "වනකතා" සහ "සමාජ සංදර්ශනය" යන කෘතීන් පමණක් නොවේ. සිංහල සාහිත්‍යයේ විශිෂ්ට ලේඛකයකු වූ ජී. බී. සේනානායක මහතාගේ "පළිගැනීම" නම් කෙටිකතා සංග්‍රහයත් මේ හා සමගාමීවම තහනම් කරනු ලැබිණ. එයද ඒ වන විට ජ්‍යෙෂ්ඨ විභාගය සඳහා නිර්දේශව තිබුණු ග්‍රන්ථයකි. එහෙත් "පළිගැනීම" තහනම් වෙන්නේ නම් දේශපාලන හේතුවක් නිසා නොවේ. සංස්කෘතිකමය හේතුවක් මතය.

ජී. බී. සේනානායක මහතාගේ "පළිගැනීම" කෙටිකතා සංග්‍රහයේ ඇතුළත් වන "අම්මා" නම් කෙටිකතාවේ විවාහක පුද්ගලයකු පවත්වන අනියම් සම්බන්ධතාවක් පිළිබඳව කියැවෙයි. මෙය සමාජ විරෝධී අසම්මත දෙයක් බවද, එවැනි දේවල් සාහිත්‍යයටත්, විශේෂයෙන් අධ්‍යාපනය සම්බන්ධ දේවලටත් ඇතුළත් නොකළ යුතු යැයි පවසමින් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් "පළිගැනීම" පොත විෂය නිර්දේශයෙන් ඉවත් කළා පමණක් නොව එය තහනම් කරන්නටද පියවර ගැනිණ. එහෙත් බොහෝ උගතුන්, හා ලේඛකයන් මේ සාහිත්‍ය තහනමට විරුද්ධව අදහස් දැක්වූහ.

ලංකාවේ සංස්කෘතිකමය හේතූන් මත තහනම් වූ පළමු පොත, "පළිගැනීම" නොවේ. අතීතයේදී සංස්කෘතිකමය සීමාවන්ද වර්තමානයේ අප දකින අත්විඳින සීමාවන්ට වඩා බලවත් විය. ඒ හේතුවෙන්ම ලිංගිකත්වය ගැන කතා කිරීමද බරපතළ වැරැද්දක් සේ සැලකිණ. 1949 අවුරුද්දේදී, ටී. එස්. ධර්මබන්ධු මහතා විසින් ලියා පළ කරන ලද "විවාහය හා රති සැපත" නම් ග්‍රන්ථයද සංස්කෘතික හේතූන් මත තහනම් කරන ලද්දකි. ලිංගිකත්වය, එළිපිට කතා නොකළ යුතු යැයි සම්මතව තිබුණු කාලයක, ඒ පිළිබඳව පොතක් ලියා පළ කිරීම සමාජය දුටුවේ මහා භයානක වරදක් ලෙසිනි. ඒ නිසා මෙරට සංස්කෘතියට අභියෝග කිරීම යන වරදට මෙහි කතුවරයාට එරෙහිව නඩු පවරන ලදී. එයින් ඔහුට රුපියල් 20 ක දඩයක් නියම කරන්නටත් කටයුතු කෙරිණ. වර්තමානයේ සුළු මුදලක් වුවද ඒ කාලයේ හැටියට රුපියල් විස්සක් යනු සැලකිය යුතු මුදලකි.

ආගමික හේතූන් මත පොත්පත්, සිනමා නිර්මාණ හෝ එවැනි කලාකෘති තහනමට ලක් වීම ලොව පුරා දකින්නට ලැබෙන සුලභ කාරණාවකි. ලංකාවටද එය ආගන්තුක නැත.

ආගමික හේතූන් මත ප්‍රථම වතාවට ලංකාවේ පොතක් තහනම් වන්නේ 1967 වර්ෂයේදීය. ඒ ටෙනිසන් පෙරේරා නම් ලේඛකයා විසින් ලියන ලද "දැති රෝදෙන් උපන් බුදුන්" නම් කෘතිය තහනම් කිරීමය. මේ පොතෙන් බුදු දහමට අපහාස කෙරෙන බව පවසමින් මේ පොත අභියෝගයට ලක් විය. එය එකල සමාජය තුළ මහත් ආන්දෝලනයක් ඇති කළ ග්‍රන්ථයකි. එයට එරෙහිව ප්‍රබල ජන විරෝධයක් ඇති විය. ඒ නිසාම පොත ලියූ කතුවරයාව රහස් පොලිසියට ගෙන්වා ප්‍රශ්න කිරීමක්ද සිදු විය. අවසානයේ පොත තහනම් කෙරිණ. පොත තහනම් කිරීමෙන් නොනැවතී, එහි ඉතිරි පිටපත් සියල්ලත්, පොත්වලින් ලැබූ ආදයමත් රාජසන්තක කරන්නටද කටයුතු කෙරිණ.

ලංකාව බෞද්ධ රටක් වුවත් අන්‍ය ආගම්වලට අපහාස වන සේ ලියවුණු පොත්පත් පවා තහනම් කරන්නට කටයුතු කර ඇති අවස්ථාවන් වෙයි. ඒ 2000 වසරේදී මංජුල වෙඩිවර්ධන මහතා විසින් ලියන ලද "මේරි නම් වූ මරියා" නම් ග්‍රන්ථය තහනම් කිරීමයි. තම ආගමේ ශුද්ධ වූ චරිතයකට හානි සිදුවෙතැයි කියමින් කතෝලික සභාව සෘජුවම මෙයට මැදිහත් වූයේය. කතෝලික සිනමා පර්ෂදයේ අධ්‍යක්ෂ සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා විසින් මෙම ග්‍රන්ථයට එරෙහිව ගොනු කරන ලද පැමිණිල්ල නිසා එහි කතුවරයා වූ මංජුල වෙඩිවර්ධන මහතාට රහස් පොලිසිය හමුවේ පෙනී සිටින්නට සිදුවූ බවත් කියැවේ. කෙසේ හෝ කතෝලික සභාවේ විරෝධය නිසා මෙම පොත පිටවෙන්නටත් පෙරම වාරණයට ලක් වීය.

තහනම් නොකෙරුණත්, ආගමික හේතූන් නිසා දැවැන්ත අභියෝගයකට ලක්වුණු ග්‍රන්ථයකි, හෙළයේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් බුද්ධ චරිතය නව කෝණයකින් විස්තර කරමින් ලියන ලද "බවතරණය". "බවතරණය" මාර්ටින් වික්‍රමසිංහයන් විසින් ලියූ අවසන් කෘතියයි. එය සිදුහත් චරිතය, සිදුහත් කුමරුවන්ගේ ළමා විය, තරුණ විය හා අභිනික්මන පාදක කොට ගනිමින් ලියැවුණකි. මෙම කෘතියෙන් බුද්ධ චරිතයට හානියක් සිදුවන බව කියමින් බොහෝ භික්ෂූන්ද, සමාජයේ ඇතැම් උගතුන් හා විචාරකයන්ද මත පළ කළ අතර, ඒ හේතුවෙන් "බවතරණය"ට එරෙහිව දැවැන්ත විරෝධතාවක් ගොඩ නැගිණ. මේ විරෝධතාව කොතරම් දුර දිග ගියාද යත්, එවකට අගමැතිනිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය විසින් මේ පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පවා පත් කළාය.

බොහෝ භික්ෂූන්, උගතුන් හා බෞද්ධ සංවිධාන "බවතරණය" ට එරෙහිව නැගී සිටිද්දී, මාර්ටින් වික්‍රමසිංහයන්ට හා බවතරණයට පක්ෂව පෙනී සිටි බෞද්ධයන් මෙන්ම උගතුන් හා ලේඛකයන්ද හිඟ නොවීය. අකුරටියේ අමරවංශ හිමි, මොරටුවේ ශාසනරතන හිමි වැනි ප්‍රසිද්ධ භික්ෂූන් වහන්සේලා මෙන්ම, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා, ප්‍රසිද්ධ ලේඛක ගුණදාස අමරසේකර මහතා වැනි අය "බවතරණය" කෘතියෙහි කිසිම වරදක් නැති බව පෙන්වා දුන් පිරිස අතරෙහි වූහ. එවකට ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් එරික් ජේ. ද සිල්වාද "බවතරණය" ට පක්ෂ තීන්දුවක් ලබා දෙනු පිණිස සෘජුවම මැදිහත් වූයේය. අවසානයේදී "බවතරණය" තහනම් කිරීමක් අවශ්‍ය නොවන බව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් තීරණය කරන ලදී.

2018 වසරේදී කේ.කේ. ශ්‍රීනාත් නමැත්තා විසින් ලියන ලද "බුදුන්ගේ රස්තියාදුව" ද එවැනි මතභේදයට තුඩුදුන් ග්‍රන්ථයකි. එම නවකතාවට එරෙහිවද ලාංකීය බෞද්ධයන්ගෙන් දැඩි විරෝධයක් එල්ල විය. භික්ෂූන් පිරිසක් විසින් එයට එරෙහිව පැමිණිල්ලක් සිදු කිරීම නිසාම පොත එළිදක්වන දිනයේම එහි කතුවරයාව පොලිසියට ප්‍රශ්න කරන්නට ගෙන ගිය බවක් සඳහන් වෙයි. කෙසේ වුවත් මෙම පොතද තහනම් කිරීමකට ලක් කෙරුණේ නැත.

ඉහත කී කාරණාවලට අමතරව යම් යම් චරිතයන් අලළා ලියැවුණු පොත්පත්ද එම චරිත වලට අපහාසයක් සිදුවෙන බව කියමින් අභියෝගයට ලක්වුණු අවස්ථාවන්ද ඇත. නිව්ටන් ගුණසේකර නම් ලේඛකයා විසින් ලියන ලද "දඩකෙළිය" නම් පොත එවැන්නකි. මෙම පොතට පාදක වී තිබුණේ "ඇඩ්ලින් විතාරණ" නම් ඝාතනයට ලක් වූ තරුණියගේ කතාවය. මෙම ග්‍රන්ථයෙන් ඇඩ්ලින් විතාරණගේ චරිතයට හානියක් සිදුවෙන බව පවසමින් ඇගේ දියණිය විසින් පොතට එරෙහිව නඩු පවරන ලදී. එහෙත් ඇය එම නඩුවෙන් පරාජය වූ බැවින් පොත තහනම් කරන්නට හැකියාවක් නොලැබිණ.

පොතක් වාරණයට ලක් වීම හෙවත් "තහනම් කිරීම" ඒ පොත කෙරේ පාඨකයන් වැඩි වශයෙන් ආකර්ෂණය කෙරෙන කාරණාවක්ම වෙයි. ඒ එම ග්‍රන්ථය "තහනම් කෙරුණේ ඇයි" කියා සොයා බලන්නට පාඨකයන් තුළ ඇතිවන කුහුල නිසාමය. එක් පොත් දෙරට වැඩීමකදී මහාචාර්ය කාලෝ ෆොන්සේකා ඉදිරිපත් කළ කතාවේදී, ඔහු අධ්‍යාපනය ලබන සමයේදී තහනම් වුණු "පළිගැනීම" නම් කෘතිය පිළිබඳව අදහස් දක්වමින් කියා සිටියේ, තහනමට ලක් වූ නිසාම ඔවුන් ඒ පොත සොය සොයා කියවන්නට පෙලඹුණු බවය. ඉතින් මෙහි සඳහන් පොත්පත් පිළිබඳව සොයන්නට අනිවාර්යෙන්ම ඔබටත් සිතෙනු ඇත.

**නිම්මි මුදිතා හේරත්**


## පොත් පුවත්

### මැදවච්චියේ විමලධම්ම හිමිගෙන්
## මුල් බුදුසමය හා ආදි මහායානය තුලනාත්මක අධ්‍යයනයක්



දර්ශනපති මැදවච්චියේ විමලධම්ම ස්වාමින් වහන්සේ ලියූ මුල් බුදු සමය හා ආදි මහායානය තුලනාත්මක අධ්‍යයනයක් කෘතිය මුද්‍රණයෙන් නිකුත් වී ඇත.

මේ කෘතිය ථේරවාද හා මහායාන සම්ප්‍රදායන් දෙක පිළිබඳ නව මගක් ඔස්සේ කරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයක් සේ හැඳින්විය හැකි බවට පොතට පසුවදනක් ලියන සම්මානිත මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා සඳහන් කර ඇත. මුල් බුදුසමය නියෝජනය කෙරෙන පාලි ත්‍රිපිටකයත්, ආදී මහායානය නියෝජනය කෙරෙන සූත්‍ර අතර ඉතා ප්‍රකට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයත් පදනම් කරගත් නිශ්චිත අරමුණක් ඔස්සේ කර ඇති මේ පර්යේෂණය හුදු ධර්මමය කරුණුවලට පමණක් නොව ආගමික සාහිත්‍යාත්මක හා භාෂාත්මක වැනි කරුණු කෙරෙහිද නොමද අවදානයකින් සකස් කොට තිබීම මෙහි ඇති සුවිශේෂත්වය බව සඳහන්ව ඇත. කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියත් එහිම බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් දර්ශනපති උපාධියත්, ශ්‍රී ලංකා



බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇති මැදවච්චියේ විමලධම්ම හිමියෝ සහජයෙන්ම ලද කවි කමෙහිද දක්ෂ හිමි නමකි. හයිකු කවි, කිරිමැටියානේ ධර්ම දේශනා මින් පෙර ලියා පළකළ කෘතීන් වේ. මුල් බුදු සමය හා ආදී මහායානය කෘතිය.බෞද්ධ අධ්‍යාපනයේ නියැළි ගුරු සිසු දෙපාර්ශ්වයටම වටිනා පොතකි.

### අරුණ ලක්ෂ්මන්ගේ
## ගම්බාරේ




මාධ්‍යවේදී අරුණ ලක්ෂ්මන් ප්‍රනාන්දුගේ පළමුවැනි නවකතාව 'ගම්බාරේ' දැන් මුද්‍රණයෙන් නිකුත් වී තිබේ.


1960-70 දශකවල මේ රටේ දේශපාලන තත්ත්වය, 1971 අසාර්ථක වූ තරුණ කැරැල්ල මෙන්ම ඒ යුගයේ ගැමි ජීවිතය, ගැමියන් අතර තිබූ අන්‍යෝන්‍ය බැඳීම ආදිය මෙම කෘතියෙන් අපූරුවට චිත්‍රණය වී තිබේ.

ඉතාමත් ලගන්නා සුළු සරල සුගම බසකින් ලියැවී ඇති 'ගම්බාරේ' සැබැවින්ම මීට අඩසිය වසකට එපිට මෙරට ගැමි ජීවිතයේ සැබෑ පැතිකඩක් වැනිය.

### දර්ශන එරංගගෙන්
## බලකාම




දර්ශන එරංග විසින් රචිත බලකාම නවකතාව සැප්තැම්බර් 02 වැනිද එළි දකියි.



ඇඩ්ර්ටයිසින් කලාවෙ ප්‍රමුඛයෙක් ජනාධිපතිවරණයක තම අපේක්ෂකයා දිනවීම සඳහා සැලැසුමක් සහ තිරය පිටුපස කූට දියත් කළ රහසිගත මෙරට දේශපාලනයේ මෙහෙයුම් පදනම් කරගත් කතාන්දරයක් ගැන කියවෙන දර්ශන එරංග විසින් රචිත "බල කාම" නවකතාවට පසුබිම්ව තිබේ. ඒ අතරතුර කතා නායකයා විසින් තම අහිමි ප්‍රේමය යළි තමා සතුකරගැනීමට දරන ප්‍රයත්නය හා ඒ අතරෙ පැටලෙන රාගික සබඳතාවක් කුහුල දනවමින් "බල කාම" පිටු තුළින් දිගහැරේ. ෆාස්ට් පබ්ලිෂින් ප්‍රකාශනයකි. සුරස පොතකි.

# බින්තැන්නට ගිය ඉස්කෝලයාගේ කතා

බින්තැන්නේ ගුරු සේවයට ආව මට දිගාමඩුල්ලේ ආචාරියා ගැන මතක් වුණේ මනරංජන්ගේ පොත කියවලා තිබුණ හින්ද විතරක් නෙමෙයි ඒ වෙනකොට ආර්. එල්. ස්පිටල්ගේ පොත් දෙක තුනකුත්, බ්‍රෝහියර්ගේ, ජෝන් ඩේවිගේ සංචාරක වාර්තා කිහිපයකුත් කියවලා තිබුණු හින්දයි.

ඔයිත් එක්කම පළමු පත්වීම අරගෙන ගිරාගම ගුරු විද්‍යාලයෙන් අපට යන්ට වුණේ ටැම්පිටියේ ඉස්කෝලෙටයි.ඔයි ගාව තිබුණේ මගේ මතකේ හැටියට නම් අම්පාර මඩකලපු දිස්ත්‍රික් මායිමේ. එහා පැත්තෙන් තොප්පිගල පෙනුණි.ඒ දවස්වල අම්පාර දිස්ත්‍රික්කය ස්ථාපිත කරලා තිබුණට අධ්‍යාපන, සෞඛ්‍ය වගේ දෙපාර්තමේන්තුවල වැඩ කෙරුණේ මඩකළපුවෙන්. අධ්‍යාපන අධ්‍යක්ෂතුමා හිටියෙත් මඩකළපුවේයි. ඊරියගොල්ල අධ්‍යාපන ඇමැතිට පේරාදෙණිය ගුරු විද්‍යාලයේදී 'හූ' කිව්වා කියලා ගිරාගම ගුරු විද්‍යාලයේ පුහුණුව ලබපු අපිවත් අම්පාරේ දුෂ්කර සේවයට තල්ලු විය. ඒකත් අපට සුන්දර අත්දැකීමක් වගේම සමහරුන් අර කියනවා වගේ ජීවිතේ හැරවුම් ලක්ෂ්‍යයක් වුණි.

අපි හත්දෙනෙක් ටැම්පිටියේ ඉස්කෝලෙට ආවාම ළමයින්ගේ ඉසේ මල් පිපුණා වගේයි. එච්චර කාලයක් ගුරු හිඟයෙන් පෙළුණු බින්තැන්න, වැව්ගම්පත්තුවේ, දිගාමඩුල්ලේ සෑම ඉස්කෝලෙකටම ගුරු හිඟයක් නොවුණි.හැබැයි ඉතින් ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව කියලවත් ක්‍රීඩා, සෞන්දර්යය කියලවත් වෙන වෙනම ගුරුන් හිටියේ නැත. අපේ කණ්ඩායමේ හිටිය ප්‍රැන්සිස් අයියා හොඳ නැටුම්කාරයා වගේම චිත්‍ර, සංගීතකාරයායි. මිනිහා පහළ පන්තිවල ඉඳලා සාමාන්‍ය පෙළ දක්වා ඉගැන්විය.අපි හිටියෙ එක් එක් පන්තිය බාරගෙනයි. ඔය අතරේ ඔන්න පාසල් පරීක්ෂාවට මඩකළපුවෙන් ඇවිත්ය. එක් නිලධාරියෙක් මං උගන්වමින් හිටිය පන්තිය දිහා බලාන ඉඳලා පන්තියට ආවේය.

ඒ ඇවිත් කියන්නේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි 'මහේෂ්වරන්.' මටත් වැඩිය හොඳට සිංහල පුළුවන් විය. මේසේ උඩ තිබුණු ඉගැන්නුම් ආධාරක එකින් එක දිගඇරලා බැලුව ඔහු,

''මාස්ටර් තාම පඩි හදලා නෑ නේද?''

''ඔව් සර් තාම ප්‍රතිඵල පිටවුණේ නෑ.''

''ඉතින් කොහොමද රුපියල් හත්සිය හැට අටේ පඩියෙන් ජීවත් වෙන්නේ?''

''අපි ගෙයක් කුලියට අරගෙන උයාගෙන කනවා. වාරේ මැද්දෙයි, අවසානේ නිවාඩුවටයි විතරයි ගම්වලට යන්නේ. මේ උපකරණ ට්‍රේනින් කොලේජ් එකේදී හැදුව ඒවා.''

''ආ ෂරි ෂරි... මාස්ටර් ඉගැන්නුවා හොඳයි. ඒත් බෝඩ් එකේ අකුරු ලියනකොට ලස්සනට ලියන්න ඕනෑ. අකුරු තමා හැඩ මදි.''

''හොඳයි සර් මං උත්සාහ කරන්නම්.''

''සිංහල පුහුණු ගුරුවරු ගැන අපට බලාන්ට දෙයක් නේ. මාස්ටර් මේ පොත් මොකක්ද? නවල් එකක්ද?''

''එකක් බැද්දේගම. අනෙක වනසරණ. ආර්. එල්. ස්පිට්ල්ගේ.''

''ඕ.... මයිගෝඩ්. Savage Sanctuarry. ඔය පොතේ තියෙන කපුරුල්ල, උණු වතුර බුබුළ වගේ තැන්වලට මාස්ටර්ලා ගියේ නැද්ද?''

''කපුරුල්ලට ගියා. ඒ විලේ වතුර හරිම රස්නෙයි. ඊළඟ වීක්එන්ඩ් එකේ උණුවතුර බුබුළටත් යන්නයි හිතාන ඉන්නේ.''

''මාස්ටර්, ජෝන්ට උගන්වන්ට කලින් ජෝන් කවුද කියලා ඉගෙන ගන්ට කියලා කියනවා වාගේ මේ ළමයින්ට උගන්නන්ට. ඉස්සර වෙලා මේ පැත්තේ හිස්ට්‍රි එක ගැන ඉගෙන ගන්නට වෙනවා. මාෂ්ටර්ලාගේ ටැම්පිටිය ඉස්කෝලේ තමයි දැනට මේ පැත්තේ තියෙන පරණම ඉස්කෝලේ.''

> **"සිංහල මිනිසුලා බෝම වෙරදි වැඩ කේනවා "**

''කවද්ද සර් මේ ඉස්කෝලේ ආරම්භ කරලා තියෙන්නේ?''

''1922.09.05. ඒ වුණාට ඊට ඉස්සර වෙලා 1838 දී ඔමුණෙයි, දම්මින්නෙයි ඉස්කෝල දෙකක් පටන් අරගෙන අවුරුද්දක් දෙකකට පස්සේ වැහිලා ගිහින්.''

''ළමයි නැතුවද?''

''ළමයි නැතුව නෙමෙයි. ඒ මාෂ්ටර්ලා දෙන්නගේ වැරදි වැඩ හින්ද. සිංහල මිනිසුලා බොහොම වෙරදි කෙරනවා. මාෂ්ටර්ලා විතරක් නෙවෙයි ආරච්චිලලා. රේන්ජ් ඔපිසර්ලා, රටේ මහත්තුරු ඔක්කොම ඒම තමා. උණුවතුර බුබුළෙයි, ඔමුණෙයි වෙද්දන්ට තමා මේ නිලධාරීන් හරියට හිරිහැර කෙරනවා. බදුල්ල, මඩකළපුව රෝඩ් එක කපද්දිත් පාර බෙද්ද ගෙව්වේ නේ කියලා මහඔයේ ආරච්චිල ඔමුණේ වෙද්දෝ දෙන්නෙක් එල්ලාගෙන එවිත් දස වද දිදී පාරේ වැඩ ඇරගත්තලු. ඔය වෙඩ කෙරන දවසක රේස්ට් හවුස් එකට ඇවිල්ලා හිටියා මඩකළපුවේ ජජ් වුඩ්ලන් මාතියා දැකලා යේ.. පව්... කියලා උන් දෙන්නට කන්ටත් දීලා නිදහස් කේළා තීනවා. මහඔය ප්‍රදේශයේ ඉතිහාසය ගැනත්, නිලධාරීන්ගේ අත්තනෝමතික ක්‍රියාකලාප ගැනත් කියාදුන් මහේෂ්වරන් මහතා එසේ සිහියට ආවේ කුරුඳුවින්න ඉස්කෝලේ වැඩ කරන කාලේ ගුරු වැටුප් ගෙන යාමට මහඔය තැපැල් කාර්යාලයට පැමිණ සිටියදී පච්ච ගුණේ දුවගෙන ඇවිත් කීව ආරංචියක් නිසාය.

''ලොකු මහත්තයා, උණුවතුර බුබුළේ මහ සන්තෑසියක් වීලා. පඩි අරන් යමුකොයි බලන්ට.''

''මොකක්ද ගුණේ වෙලා තියෙන්නේ?''

''ආරංචියේ හැටියට ලොකු මහත්තෙයෝ ආරච්චිලලා වෙනුවට අලුතෙන් ආපි හීන්බණ්ඩා ග්‍රාම නිලධාරි මහත්තෙයයි, තවත් දෙන්නෙකුයි කුඹුරු යායෙදි වෙඩි තියලා මරා දලා. මිනීමැරුව තුවක්කුවත් ඇන්න කැලේ පැනලා තියෙන්නේ. තව එකෙක් ඉන්නවා බාවන්ට, ඔයි මහ එකත් මං බාවනවා කියලා කෑගහගෙනලු.''

''එහෙනම් ඉඩම් ආරවුලක් වෙන්ට ඇති.''

''එහේම තමයි මහත්තෙයෝ, යමුකොයි බලන්ට'' යැයි කීවෙන් ඔහුගේ පාපැදියේ නැගී මහඔය කඩවීදියේ සිට උණුවතුර බුබුළ ගම්මානය දෙසට දිවෙන අතුරු මාර්ගයේ හැතැප්ම දෙකක් පමණ ගමන් ගත්තෙමු.ඒ වනවිට සිද්ධිය සිදුවූ ගතවී තිබුණේ පැය කිහිපයක්. දෙසීයක් පමණ දෙනා වැල නොකැඩී කුඹුරු යාය දෙසට ගමන් කරමින් සිටියහ. මාර්ගයෙන් හැරී කලා බිම්කඩ දෙසට අපිත් ගමන් කළෙමුබුබුළ ගමේ වැසියකු වූ ඩිංගිරි බණ්ඩයියා මා දෙසට ආවේ "මහත්තෙයා, මේ පැත්තෙන් එන්ට කොයි" කියමිනි.

''මොකක්ද බණ්ඩයියා වෙලා තියෙන්නේ?''

''හත්තණ්ඩේ මහත්තෙයා, මෙච්චා පෙර කියා පතාගෙන එන කරුම පටිසන් දෙන වැඩ. ආං බලන්ට කොයි... ටැක්ටරේ උඩ එකෙක් අනිත් එකා බිම වැටිලා. ඔයි කුඹුරු ඉඩම කාලෙක හිට වැඩ කෙරුවෙ ජයවර්ධන අයියා. උන්දෑ නරක මිනිහෙක් නෙමෙයි, පස්සෙන් පහු මේ ඉඩම ටික කාලයක් පුරන්වීලා තිබුණා. පස්සෙදි ඔයි බිම වැටිලා ඉන්න ඇත්තා වතාවක් මේකේ කවුපි වගා කෙළා. පස්සෙදි ජයවර්ධන අයියා ඉදිරිපත් වෙලා ඒ.ජී.ඒ. මහත්තැන්ට කියලා මාස ගාණකට ඉස්සර වෙලා ඉඩම තහංචි කෙළා. පරීක්ෂණයක් තියලා නියම අයිතිකාරයට ඉඩම දෙනකන් දෙපාර්ශ්වයටම වැඩ කේන්ට එපා කිව්වා.

එහෙම තියෙද්දී මෙයෙයි ළඟදි පත්වෙලා ආව ග්‍රාම මහත්තයාට මුන් පඬුරු පාක්කුඩම් දීලා අද උදේ ටැක්ටරයක් අරන් ඇවිදුන් කුඹුර කපන්ට ගත්තා. ටැක්ටර් සද්දේ ඇහුණම ජයවර්ධන ඇවිදුන් මුන්ට කියලා තියෙනවා. මේ කුඹුරු ඉඩම මගේ, උඹලට අයිති නෑ, මං පැමිණිලි කෙළාම ඉඩම තහනම් කේලා නෝටිස් එකකුත් අරෙයි දඹ ගහේ ගැහුවා...එහෙම තියෙද්දී ඈ තොපි කුඹුර හාන්නේද කීවාම මුන් බයවෙලා. වැඩේ නවත්තලා යන්ට සූදනම් වුණාම ජයවර්ධන ගෙදර ගෙහුන් තියෙනවා.

ඒ අතරෙදි මුං දෙන්නා ග්‍රාම මහත්තයාට පයිණ්ඩයක් යවලා. "කවුරු උඹලට හාන්ට එපා කියන්නේ, මං නේ ග්‍රාම නිලධාරි, උඹලා හාපල්ලා මාත් දැන් එනවා" කිව්වාම මුං ආයෙමත් හාන්ට පටන්ගෙන. මේක දැනගත්තු ජයා දුවගෙන දුවගෙන ඇවිදුන් ඉස්සෝටම බිම හිටිය එකාට වෙඩි තිබ්බා. දෙවනුවට ටැක්ටරේ එකාට වෙඩි තිබ්බා. වෙඩි තියලා හිටන් ටැක්ටරේට ඩීසල් වත් කේළා ඒකටත් ගිනි තියලා. ගිනි ගත් ටැක්රේ දිහා බලාන ඉඳලා යන්ට යනකොට හින්බණ්ඩා ග්‍රාමසේවක මහත්තෙයාට වෙඩි හද්දේ ඇහිලා දුවගන ආවම අරෙයි ඇතින් පේන තේක්ක කඳන් ගොඩ ගාවදී මාරාවේෂ වෙලා එන ජයාව දැකලා මේකා කඳන්න් ඇස්සෙ ගැස්සි ගැස්සි දුවන්ට ගත්තාම මේකා කොකා ගැස්සුවා. ආයි මොනා උන්දැත් කම්මුතුයි'' කීවේ සුසුම් සලමිනි.

ගිනි ගෙන දැවෙමින් තිබුණු ටැක්ටරයත්, ඒ අසල වූ මිනී දෙකත් අපට කීවේ ''තණ්හාය ජායතී සෝකෝ'' යන්න විය හැක. එහෙත් වන වගාවෙන් කපා ගෙන විත් ගොඩකර තිබූ තේක්ක කඳන් මැද අවසන් ගමන් ගොස් සිටි ග්‍රාම උන්නැහේගේ සිරුරෙන් කියාපෑවේ ඊටත් වැඩි ඔවදනකි. එහෙත් බින්තැන්නට ආපි ග්‍රාම නිලධාරීන් වගේම අනිකුත් නිලධාරීන්ද මින් මට්ටු වී නැතුවා සේය. මිනී තුනක් මරා, උප දිසාපතින් මරණවා යැයි පාරම්බාමින් තුවක්කුවක් කරපින්නාගෙන වන ගැබ තුළ වූ ගල් ගෙයකට වැදුණ අපරාධකාරයා පොලිසියට අල්ලා ගැනීමට නොහැකි විය.

ඔහු අතේ තිබෙන ගිනි අවිය පොලිස් නිලධාරීන්ගේ ගිනි අවිවලට වඩා බලවත් වෙතැයි ඔවුහු බියට පත්ව සිටියහ. මාස තුනකට පමණ පසු ගල්ලෙන දෙසින් ඇහුණ වෙඩි හඬකින් ඔහු කළ පාප කර්මයේ ඵලවිපාක පෙන්වා දුනි.

ඔහු තමන්ම වෙඩි තබා ගත්තාද, වැරදීමකින් වෙඩි වැදුණාද කිව නොහැකි වුවද මුහුණ පුරා වැදුණ උණ්ඩයකින් මුහුණ චප්ප වුණ අපරාධකරු රෝහල් ගතකර බදුල්ලේදී සැත්කමකට ලක්ව සුවපත් විය.එහෙත් ඔහු සතු වූයේ විකෘති මිනිසෙක්. නඩුවේ අවසන් තීන්දුව දීමට පෙර ඔහු මියගියේ ඇප මත නිදහස්ව සිටියදීයි. වැරදිකරුවන් හතර දෙනාටම එද දඬුවම් පමුණුවා තිබුණේ සොබා දහමෙනි.

**සඳරුවන් ලොකුහේවා**


---

# මේක අබුද්දස්ස යුගයක්

## ආචාර්ය ගුණදාස අමරසේකර

**දෙටුතම ගත් කතුවර ආචාර්ය ගුණදාස අමරසේකරයෝ මෙරට දැනට ධරමානව වෙසෙන මහා සාහිත්‍යධරයාණෝය. සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි නන් ඉසව් ඔස්සේ සිය ප්‍රතිභාව පැතිරූ අමරසේකරයාණෝ එමගින් මානව ජීවිතය විෂයෙහි සූක්ෂමාර්ථ මැනවින් විශද කළහ. එපමණක් නොව ඔහු මහජන බුද්ධිමතකු වශයෙන් මෙරට සමාජ, දේශපාලන හා සංස්කෘතික අර්බුදය පිළිබඳ යම් ව්‍යවහාරික ප්‍රවේශයකින් කාලයක් තිස්සේ ගැඹුරින් සාකච්ඡා කර තිබේ. ඔහුගේ එම සමාජ විවරණ නවකතා වැනි නිර්මාණ කෘතිවලින්ද ශාස්ත්‍රීය නිබන්ධවලින්ද එළිදක්වා තිබේ. නිරන්තරයෙන් සමාජ දේශපාලන සංස්කෘති සංචලනයන් තම විචාර දෘෂ්ටියට ලක්කරන මෙරට සිටින ප්‍රමුඛතම විවේචනාත්මක චින්තකයා අමරසේකරයන් බව අමුතුවෙන් කිවයුතු නැත. මෙරට සමාජ ගමන්මග පිළිබඳ එතරම් අවදියෙන් සිටින වෙනත් බුද්ධිමතෙක් නොමැත.**

**පහත දැක්වෙන්නේ කොරෝනා වසංගත සමයෙහි කලාකරුවාගේ සමාජ හා නිර්මාණාත්මක කාර්යභාරය පිළිබඳ අප ඔවුන් සමග කළ සංක්ෂිප්ත සංකථනයකි.**



**මේ කොරෝනා වසංගත සමයේදී අපට දක්නට ලැබෙන්නේ එක්තරා ආකාරයකින් අතරමංවූ සමාජයක්. ප්‍රවීණ කලාකරුවකු, සාහිත්‍යකරුවකු හැටියට ඔබ කොහොමද මේක දකින්නේ?**

මේක කාලාන්තරයක් තිස්සේ වල්මත් වෙච්ච සමාජයක්. නිදහස ලැබූද පටන් අප ඇවිල්ලා තියෙන්නේ වල්මත් ගමනක්. දේශපාලනිකව සහ ආර්ථිකව ගත්තත් වල්මත් ගමනක්. ඒ වල්මත්වීමේ අවසන් ප්‍රතිඵලය තමයි අප මේ අත්දකිමින් ඉන්නේ. මේ වල්මත් ගතිය සමාජ ආර්ථික සංස්කෘතික ආදී සියලුම ක්ෂේත්‍රවල දකින්න පුළුවන්. අප නිදහස ලැබුවත් මේ වල්මත් ගතියෙන් නිදහස් වෙන්න බැරිවුණා. මෙතන තමයි අප මුහුණ දෙස සමාජ, සංස්කෘතික, දේශපාලනික, ආර්ථික අර්බුදයේ නිදානය තියෙන්නේ. ඒ නිදානය තේරුම් ගන්නේ නැතුව ප්‍රතිකර්ම කරන්න බැහැ.

**ඔබ දකින හැටියට මේ වල්මත් ගමනට බලපා තිබෙන සාධක මොනවාද?**

අපට මූලික වශයෙන් පුළුල්, ප්‍රබුද්ධ සංවාදයක් මගින් දර්ශනික හා චින්තනමය වශයෙන් හරයක් සහිත ගමන් මගක් හදගන්න බැරිවුණා. එද ඉඳලා මෙහේ පැලපදියම් වුණේ අනුකාරකවාදී චින්තනය.

**එවැනි දාර්ශනික පදනමක් ගොඩනගා ගැනීමට අපට නොහැකි වූයේ ඇයි?**

එවැනි ගමන් මගක් හදගන්න ඕන ප්‍රාඥයන්. එහෙත් මේ රටේ බලලෝභී, දැක්මක්, වැඩපිළිවෙළක් නැති දේශපාලන අඳ බාලයන් මිසක් ප්‍රාඥයන් බිහිවුණේ නැහැ. ඒ වගේ ප්‍රාඥයන් ආකස්මිකව බිහිවෙන්නේ නැහැ. ඒකට ඉතා ප්‍රබුද්ධ අන්තර් සංවාදයක් අවශ්‍යයි. ඒ ප්‍රබුද්ධ අන්තර් සංවාදය උත්තර සංවාදයක් කළ යුත්තේ සාහිත්‍යකරුවා. නමුත් එවැනි සංවාදයක් මේ රටේ නිදහසෙන් පස්සේ ඉඳලා ඇතිවුණේ නැහැ. සාහිත්‍යකරුවා එවැනි සංවාදයක් ඇති කරන තැනට සමාජය මෙහෙයවන්න සමත් වුණේ නැහැ.මොකද ඔහුට ප්‍රබුද්ධ සංවාදයක් මගින් පෝෂණයක් ලැබුණේ නැහැ.

**එවැනි තැනකට අපේ සාහිත්‍යකරුවා යොමු නොවුණේ ඇයි?**

සාහිත්‍යකාරයා කියන්නේ සමාජ නිෂ්පාදනයක්. ඔහු ඉබේ ආකස්මිකව බිහි වෙන්නේ නැහැ. සමාජයේ ප්‍රබුද්ධ සංවාදයක් නැති නිසා ප්‍රබුද්ධ කලාකරුවන්, සාහිත්‍යකරුවන් බිහිවුණේ නැහැ. ප්‍රාඥයන් බිහිවුණේ නැහැ. යම්තාක් දුරකට හෝ අපට එහෙම බිහිවෙච්ච සාහිත්‍යකරුවා, ප්‍රාඥයා තමයි මාර්ටින් වික්‍රමසිංහ. නමුත් ඔහු ආරම්භ කළ ගමන ඉදිරියට ගියේ නැහැ. ඔහු අපට ආවේණික ආකාරයට නව දැනුම සහ වෙනස්කම් ගලපා ගැනීම ගැන සාකච්ඡා කළා. ඔහු එතැනදී කිව්වේ අපේ සංස්කෘතිය නමැති කෝවේ දමලා අපට ඕනෑ විදියට ඒවා හදගන්න ඕනෑ කියලයි. නමුත් මේ අදහස ප්‍රබුද්ධ සංවාදයකට ලොකුවට ලක්වුණේ නැහැ.

**එයට හේතුව කුමක්ද?**

පේරාදෙණිය ගුරුකුලය නිසා ඒක විනාශ වුණා. පේරාදෙණිය ගුරුකුලය ප්‍රචාරය කළේ සාහිත්‍යය කියන්නේ හුදෙක් විනෝදස්වාදය සපයන මාධ්‍යයක් කියන මනඃකල්පිත අදහසයි. ඕක ඇති වුණේ ආචාර්ය සරච්චන්ද්‍රගේ කල්පනා ලෝකවාදයෙන්.

ඇලෙක්සැන්ඩර් සොලිසිට්නිට්ස් සඳහන් කරන ආකාරයට සාහිත්‍යකරුවා කියන්නේ රාජ්‍යයක් ඇතුළේ රාජ්‍යයක් කියලයි. ඒකෙන් පේනවා සාහිත්‍යකරුවාට කළ හැකි කාර්යභාරය. ඒ නිසා සාහිත්‍යකරුවා කියන්නේ මනඃකල්පිත ලෝකවල ජීවත් වන්නෙක් නොවෙයි. සැබෑ සාහිත්‍යකරුවා කියන්නේ ප්‍රාඥයෙක්. ඔහු තමයි සමාජ සංවාදය ප්‍රබුද්ධ තැනකට යොමු කරන්නේ. ඒක ඔහුගේ කාර්යභාරයක්.

**ඔබ කියන ප්‍රාඥයා මේ රටේ තරුණ සාහිත්‍යකරුවන් අතරින් මතුවෙලා නැද්ද?**

ඔය කියන තරුණ සාහිත්‍යකරුවොත් අහුවෙලා ඉන්නේ අර මං මුලින් කිව්ව පේරාදෙණිය ගුරුකුලය ප්‍රචාරය කළ මනඃකල්පිත මතවාදයට. මේ සාහිත්‍යකරුවන් අතරින් සමහරු නව ලිබරල් අනුකරණවාදියෝ. තවත් සමහරු මාක්ස්වාදී අනුකරණවාදියෝ. දේශපාලන ක්ෂේත්‍රයේත් දකින්න තියෙන්නේ මේ අනුකාරණවාදියෝ තමයි. මේ අනුකරණවාදයෙන් මිදීම සඳහා සංවාදයක් අවශ්‍යයි. අලුත් බුද්ධිමය සංවාදයක් අවශ්‍යයි. ඇරිස්ටෝටල් කිව් ආකාරයේ දේශපාලන සත්ත්වයන් බිහිවෙන්නේ එවැනි සංවාදයකින් පමණයි. එහෙම නැතිව මේ

> **ප්‍රඥා සම්පන්න පාලකයෙක් අවශ්‍යයි**

> **සියල්ලට කලින් ප්‍රබුද්ධ සංවාදයක් ඇතිවිය යුතුයි**

> **මාක්ස්වාදී හෝ නව ලිබරල්වාදී අනුකරණවාදීන්ට විසඳුමක් දෙන්න බැහැ**

බංකොලොත් බවෙන් මිදෙන්න මගක් නැහැ. සාහිත්‍යකරුවා එම සංවාදය මතුකළ යුතුයි. ඔහු එය උත්තර සංවාදයක් කරා රැගෙන යා යුතුයි. අප මුහුණ දෙන අර්බුදයට එතනින් තමයි විසඳුමක් ලැබෙන්නේ. එවැනි සංවාදයක් මගින් අපට ප්‍රඥ සම්පන්න නායකයෙක් බිහිකරන්න පුළුවන්. එහෙම නැතිව මේ අබුද්දස්ස යුගයෙන් මිදෙන්න බැහැ.

**විශ්ව සාහිත්‍යය දෙස බැලුවොත් අපට ලබාගත හැකි නිදර්ශන මොනවාද?**

එවැනි නිදර්ශන අතර රුසියානු සාහිත්‍යය ප්‍රධාන තැනක් ගන්නවා. වැටුණු රුසියාව නැගිට්ටේ රුසියානු සාහිත්‍යකරුවා ඉටු කළ ඓතිහාසික මෙහෙවර නිසයි. නව සමාජ වෙනසකට වුවමනා කරන දැක්ම හා ප්‍රඥාව රුසියානු සාහිත්‍යකරුවා එරට සමාජය ප්‍රදානය කළා. වැටුණු රුසියාව නැගිට්ටේ ඒ ලැබුණු පන්නරයෙන්. රුසියානු ජනතාවගේ හද මනස පෝෂණය කළ එවැනි සාහිත්‍යකරුවන් රැසක් ඉන්නවා. ඔවුන් ලිව්වේ පුළුල් සමාජ දැක්මකින් යුතුවයි.

චීනය දෙස බැලුවොත් කෙටි කාලයකින් එරට බලවත් රාජ්‍යයක් ලෙස නැගිට්ටේ චීන නායකයන් තමන්ට වුවමනා කරන චින්තනය - දර්ශනය පැරණි චීන සභ්‍යත්වය පදනම් කරගෙන ගොඩනගාගත් නිසයි. චීනය මාක්ස්වාදය අනුකරණය කරන්න ගියේ නැහැ. ඔවුන් මාක්ස්වාදය තමන්ට වුවමනා කරන විදියට න්‍යායාත්මකව කපලා කොටලා හදලා ගත්තා. විශේෂයෙන් මාඕ ඔවුන්ට ආවේණික දැක්මක්, චින්තනයක්, කොන්ෆියුසියස් දර්ශනය ඇතුළු ඉගැන්වීම් සහ චීන සභ්‍යත්ව උරුමය පදනම් කරගෙන ගොඩනගා ගත්තා. අපේ රටත් චීනය වගේ සභ්‍යත්ව රාජ්‍යයක්. වසර දෙදහසකට අධික කාලයක් තිස්සේ අපට රාජ්‍යයක් තිබුණා. ඒ රාජ්‍යයත් එක්ක ගොඩනැගුණු සභ්‍යත්වයක් තිබුණා.

ඒ අතීත උරුමය, සභ්‍යත්වය පදනම් කරගෙන තමයි අපට වුවමනා කරන, චින්තනය හදගන්න ඕනෑ. දැන් ඒකට සංවාදය ආරම්භ කළ යුතු කාලය ඇවිල්ලා.

එහෙම නැතිව පිටරටින් එන ඕන දෙයක් ගෙඩි පිටින් දිරව ගන්න පුළුවන් යැයි සිතන අනුකාරකයන්ට මේ රට ගොඩනගන්න බැහැ. නමුත් ඒ අනුකරණවාදීන්ගෙන් මේ රට මිදෙන බවක් පෙනෙන්නට නැහැ. එක්කෝ මාක්ස්වාදී අනුකරණවාදීන්, නැතහොත් නව ලිබරල් අනුකරණවාදීන්. මේ අනුකරණවාද දෙකෙන්ම අප නිදහස් වෙන්න ඕන. දැන් මේ අප මුහුණ දෙස ව්‍යසනය නිසා ඇතිවී තිබෙන අර්බුදයෙන් පේනවා ඔය අනුකරණවාදවලින් කිසිදු විසඳුමක් නොලැබෙන බව.

**ඔබ මේ දිනවල නිර්මාණ කටයුතුවල යෙදෙනවාද?**

දැන් මම කායිකව දුර්වලයි. වැඩ කරන්න ටිකක් අමාරුයි. ඉස්සර වගේ නෙමෙයි. නවකතාවක් නම් ලියන්න පටන් ගත්තා. ඒකෙනුත් මං පෙන්නා දෙන්න උත්සාහ කරන්නේ අප මේ මුහුණ දෙන අර්බුදය.

**නවකතාවේ වැඩ අවසන් වෙන්න තව කාලයක් යාවිද?**

ඔව්, තවම ලියන්න පටන් ගත්තා විතරයි. ඒක හෙමි හෙමිහිට කරගෙන යනවා.


**වරුණ අබේසේකර**

---

## නිවැරදි කිරීමයි



සති අග අරුණ පුවත්පතේ ස්වර්ණ පුස්තක සම්මානයට නිර්දේශිත පොත් දෙළහ සම්බන්ධයෙන් පළවූ ලිපියට අනුව ආරාමදූස නවකතාව ලියූ ආරියවංශ අබේසේකරගේ රුව මේ ලෙසින් නිවැරදි විය යුතුය. ආරාමදූස විදර්ශන ප්‍රකාශනයකි.



**අනුරසිරි හෙට්ටිගේ සම්මානලාභී ලේඛකයෙකි. ඔහු අතින් කළුවරයි පුර හඳ, කොළඹ ළමයි, සිංහබාහු එනකං, චේ! කෝ?, දිමියා, බැඳමාරිය, පණ්ඩක පුත්‍ර වස්තුව වැනි නවකතා, කෙටිකතා, තීරු ලිපි, ළමා කතා, යොවුන් කතා විෂයේ කෘතීන් ගණනාවක් ලියැවී, පළවී ඇති අතර ඇතැම් කෘති සම්මානයටද පාත්‍ර වී ඇත්තේය. පසුගිය වසරේ ඔහු විසින් රචිත මැරීන් ඩ්‍රයිව්, කෙටිකතා සංග්‍රහය රජත පුස්තක සම්මානයෙන් පුද ලද අතර ඒ වසරේම හොඳම තීරු ලිපි සංග්‍රහය වෙනුවෙන් විද්‍යෝදය සම්මානය ලද්දේ ඔහු ලියූ කොළඹ කතා තීරු ලිපි කෘතියයි. මේ අනුරසිරි හෙට්ටිගේ වරුණට ලියූ ආරාධිත ලිපියයි.**

## ආරාධිත ලිපිය



# මගේ සාහිත්‍යය දිලුනෙ අම්මාගේ කඳුලෙන්



ලේඛකයා කියන්නෙ සිය රටේ පුරවැසි සමාජය නියෝජනය කරන මිනිස් පොකුරට අයිති ජීවියෙකුට. ඔහුත් අන් අය සේම මිනිස් හැඟීම් දැනීම් සහිත ප්‍රාණියෙක්. සමාජයේ සියලු නිර්මිතයන්ට සංවේදී සාමාජිකයෙක්. එහෙම නැතිව වෙනත් ග්‍රහලෝකයකින් ප්‍රාදූර්භූත වූ අමුතු සත්ත්වයෙක් නෙමෙයි. ඒ අනුව ලේඛකයෙක් වන මමත්, ඔබ ජීවත් වන සමාජයට අයිති මිනිස් හැඟුම් දරන්නෙක්. සමාජයක් කියන්නෙ සංකීර්ණ මානව සම්මුතීන්ගේ එකතුවක් තුළට ගොනු වූ මිනිස් පොකුරකට. එකිනෙකාගෙන් පැහැදිලිව වෙනස් වන සංස්කෘතික හා භාෂාමය වෙනස්කම් සහිත ලක්ෂණ දරතත් ඕනෑම සමාජයක්, එහි සමාජිකත්වය දරන තනි තනි පුද්ගලයාට තමන් අභිමත ආකාරයට ජීවත් වීමට නිදහසක් හෝ අවස්ථාවක් ලබා දෙන්නෙ නැහැ. මන්ද සමාජය විසින් සම්මුතික ජීවනයකට ඔහුට බලපෑම් කරනු ලබන නිසා. සමාජයක් කියන්නෙ සම්මුතීන්ගෙ එකතුවකින් ස්ථාපිතවන්නකට.

මිනිසුන් ලෙස අප ජීවත් වන මේ මහා සමාජය හැම විට ම එහි තනි පුද්ගල බලය අබිබැවූ බලවත් අධිරිත්වයක් උසුලනවා. එය සජීව ව පවතින්නෙ සම්ප්‍රදාය මුල් කොට ගෙනයි. සම්ප්‍රදාය හැම විට ම නියෝජනය කරන්නෙ අතීතය. ඒ නිසා සාම්ප්‍රදායික සමාජ සම්මුතිකත්වය කියන සාධකය, වර්තමාන සමාජ මොහොත විසින් නිර්මාණය කරන නව ගතිකයන් දිහා බලන්නෙ වපරැසින්. අප අපේ කුදු මහත් ජීවන අපේක්ෂාවන් ඉෂ්ට සිද්ධ කරගන්නෙ මේ මහා බලාධිකාරයට යටත් ව. ඉන් පරිබාහිර කිසිවක් කළ විට හෝ කරන්න උත්සාහ දරද්දි හෝ අපට ඒ සඳහා විශේෂ ශක්තියක් උත්පාද කරගන්න වෙනවා; අරගලයක් කරන්න වෙනවා. නැතිනම් සිද්ධ වෙන්නෙ ඉන් පිටව යන්න. හුදෙකලාවන්න. එය මරණීය හුදෙකලාවක්. ඒ නිසා අපට සිදු වෙනවා එක්කෝ මේ මහා සමාජාධිකාරිබලයට යටත් වන්න. එහෙම නැතිනම් ඊට එරෙහිව අරගලයක් කරන්න. අන් කලා භාවිතාවන්ට වගේ ම ලේඛකයාටත් තමාගේ සක්‍රිය කලා මොහොත, මහා සම්මතාධිකාරිය ඉවසමින් පවත්වා ගන්න බලපෑමක් කරනවා.

ලේඛකයෙක් වීමේ මගට අවතීර්ණ වෙද්දි මටත්, මා නියෝජනය කරන සමාජය සමග ලොකු අරගලයක් කරන්න සිද්ධ වුණා. මන්ද, ඒ වනවිට 'ලේඛකයා යනු මෙසේ යැයි' සමාජ ස්ථාවරයක් සම්මුතික තලයක පිහිටුවා තිබුණ නිසා. ඒ අර්ථයෙන් ගත්තහම ලේඛකයකු වීම උදෙසා ප්‍රකාශිත කිසිම සුදුසුකමක් මට තිබුණෙ නැහැ. මගේ අරමුණ කරා යාම වෙනුවෙන් ස්ථිරසාර විශ්වාසයක් ඇතිව, නොපසුබස්නා උත්සාහයෙන් යුතුව අපේක්ෂා සාධනය කර ගැනීමට මට සිදු උනා.

අප ජීවත් වන සමාජය හැමවිටම සැමට සාධාරණ ජීවනයක් උරුම කරන සම බිමක් නොවෙයි. විවිධ උප සංස්කෘතික වටපිටාවන් තුළ අනේක විධ නොපැහීම් සහිත, දුෂ්කර වූ දරා ගැනීම් උරුමයක් ලෙස අප ඉදිරියේ රංගනයක නිරත වෙනවා. අප කැමති ආකාරයේ ජීවන ලාලසාවන් කරා අප ගමන් කළ යුත්තෙ මේ අසමාන භූමිය තරණය කරමින්. එක් අතකින් බලන විට එය 'උඩුගං බලා පිහිනීමක්'. ලේඛකයකු වීමේ අපේක්ෂාව උර තබා ගනිමින් මා ද උඩුගං බලා පිහිනූ බව ඒ ගමන ගැන සිහි කරද්දි අද මට දැනෙනවා.

ඔබ කවුරුත් මේ වනවිටත් දන්නා පරිදි මා උප්පත්තිය ලබන්නෙ සාපේක්ෂව, ලාංකික සමාජ ස්ථරායනයේ පහළ තීරුවට උරුම කරුම සහිත සමාජ පරිසරයක. වඩාත් පැහැදිලි ව කිවහොත් කොළඹ අග නගරයේ හද්ද නාගරිකයෙකු ව; අඩු ආදායම් සහිත වූ මවුපිය උරුමයක් ඇති දරුවන් දස දෙනකුගෙන් යුක්ත පවුලක නමවැනියා ව. එම කුටුම්භ ජීවනය හැම අතින් ම දුක්බදයි වූ එකක්. ලොකු පවුලක්. එය දරා ගැනීමට තරම් ශක්තිමත් කුටුම්භගත වටපිටාවක් නැති පරිසරයක අපේ පවුල නිරන්තරයෙන් විසිරුණ සාමාජිකත්වයක් සහිත පවුලක් ලෙසයි පැවතුණේ. තදබදයෙන් යුතු වතු ජනපදිකත්වය මිනිසුන්ගෙ පුද්ගලිකත්වය පවා තුනී කරන පසුබිමක ගොඩනැංවී තිබුණේ. මහා සමාජ සංස්ථාවක් විසින් පැහැදිලි ඉරක් ගසා වෙන් කර දක්වන ලද පිටුවහල්භාවයක් සහිත ජීවිත අත්දැකීමක් ලෙසත් එය වර්ග කර දක්වන්න අසීරු නැහැ.

රජයේ රැකියාවක් සහිත ස්ථාවර ආදායම් මාර්ගයක් තිබුණත් තමන් ජීවත් වන සමාජ ගොනුව විසින් ඔහු වෙත අතුරණ ලද පීඩනය හේතුවෙන් තමාගේ ම ස්වයං වින්දන කලාපයකට ගොඩ වී සිටි පියාට, ඔහුගේ බිරිඳ- අපේ අම්මා ව මග හැරෙනවා; ඒ නිසා ම අපවත් යම් ආකාරයකින් ඔහුට මග හැරෙනවා. මගේ ජීවන ශක්තිය බවට අම්මා පත්වන්නෙ මේ පසුබිම තුළයි. කොළඹ නාගරිකය තුළ ඒ කාලයේ මෙවැනි තත්ත්වයන් සුලබයි. තාත්තලාට මග හැරෙන බරපතළ දරු පවුලක අම්මලා කියන්නෙ, ගැහැනියක තුළ ඇති මහා ශක්තිය, සිය ආත්මය බවට පත් කර ගත් වීරවරියන්ට. අපේ අම්මා එහෙම වීර ගැහැනියක්. ඇගේ දුකත්, සැපත් මගේ ද දුක හා සැප ලෙස විඳින්නට පුරුදු වීම මගින් සමාජය මා කරා එල්ල කළ බොහෝ අභියෝග ජය ගැනීමේ ශක්තියක් මට උත්පාද කළා කියලයි මට දැනෙන්නෙ. මගේ ළමා අවදිය ගෙවෙන්නෙ පිටු දැකීමත්, ආදරයත් එකවර ලැබෙන සංකීර්ණ වින්දනයක් ආකාරයට.

කොළඹ ළමයකු ලෙස මට අත්විඳින්නට වූ බොහෝ දේ බේදනීය උරුමයක්. මා ලැබූ අධ්‍යාපනය පවා අවිධිමත් එකක්. මගේ පූර්ව පාසල් අවදිය ගෙවුණෙ රැකියාවට යන අම්මලාගෙ දරුවන් දිවා කාලයෙදි රැක බලාගන්නා 'මඩම'ක. අද ඒවායේ නූතන මුහුණුවර 'ඩේ කෙයාර්' නමින් හැඳින් වූවත් එදා ඒවා මඩම්. අනාථ ළමයින් බලා හදා ගන්නා ස්ථාන. මගේ පසු පාසල් අවධිය ගෙවුණෙ ගුරුවරුන් නැති, පහසුකම් අවම වූ තනි ශාලාවෙ ගොඩනැගිල්ලක පවත්වා ගත් මිෂනාරි පාසලක. කොළඹ 12, වෙල්ල වීදියේ මහ කච්චේරිය ඉදිරිපිට එය පිහිටා තිබුණ නිසා, එය හැඳින් වූයේ 'කච්චේරි ඉස්කෝලෙ' කියලයි. හැම කාලයකදි ම පාහේ එහි සිටියෙ නේවාසික විදුහල්පතිතුමියක් පමණයි. මුල් කාලයෙ අප පාසල පටන් ගත්තෙ ගීත ගයමින්. පන්සිල් ගැනීමක් සිදු වූයේ බොහෝ කාලයකට පසුවයි. අපි ඉගෙන ගත්තෙ ගුරුවරුන් සඳහා නිකුත් කරන 'සිලබස් පොත' ඒ ආකාරයෙන් ම සටහන් කරගනිමින්, ඒවා කට පාඩම් කරගනිමින්. අද දවසේ සිහි කරද්දි එය සුන්දර මතකයක් වුවත් සැබැවින් ම එය සමාජ අසාධාරණයෙ නියැදියක්.

මගේ ද්විතීය අධ්‍යාපනය කොටහේන මධ්‍ය මහා විද්‍යාලය ඇසුරේ ආරම්භ වුවත් එය පවා අඩුපාඩු සහිත එකක්. සාමාන්‍ය පෙළ සමත් වීම සිදුවන්නේ පාසලෙන් පරිබාහිර ව පතපොත ඇසුරේ ලබන අවිධිමත් අධ්‍යාපන මාවතක් ඔස්සෙ. ඊට මහා බලපෑම වුණේ මගේ අම්මා. ඇය ජීවන අරගලයේ මහා බාදකය දරමින් සිටිය දී වුව, අන් මාර්ගයකින් ලද ආරංචියකට අනුව ඇඬූ කඳුළෙන් යුතුව මා අතේ 'රුපියල් තිස් පහක්' ගුළි කර කීවේ විභාගයට සල්ලි බැඳ යළි වතාවක් විභාගය ගන්නා ලෙසයි. ඇගේ එම ඉල්ලීම සහ ඒ වෙලාවෙ ඇගේ දෑසේ තිබූ කඳුළුත්, ඇය ඉදිරියේ වූ 'පකිස් පෙට්ටිය' මත ගොඩ ගසා තිබූ 'ගොටුකළ' මිටිවල හේබාගිය ශෝකයත්, මගේ ජීවන මාර්ගයේ හැරවුම් ලක්ෂ්‍යය වූ බව නොසඟවා කියන්නෙ ශෝකයෙන් නොව ආඩම්බරයෙනි.

1974 මාර්තු මාසයේ එක් දවසක, පිටකොටුවෙ මැනිං මාර්කට් භූමියේ දී අම්මගේ දෑස දෙස බලමින් මා ගත් ස්ථිර තීන්දුව අද මා මෙතනට ගෙනා බව සත්‍යයක්. ඉන්පසු මා ලැබූ කිසිවක් ඇත්නම් ඒ සියල්ල අම්මාගෙ දෑසේ නොවියළුනු කඳුළුවල බර මතින් ලද දේ ය. මගේ ලේඛනයේ මහා ශක්තිය වූයේ ද එයයි. ඒ නිසා මගේ සාහිත්‍යික භූමිකාව, අම්මා අප වෙනුවෙන් හෙළන ලද දහඩිය කඳුළට වටිනාකමක් ලබා දීමක් උදෙසා පවරා ගත්තක් කීම නිවැරදියි. කොටින්ම කිවහොත් මා ලියන්නට පටන් ගත්තෙ මගේ ජයග්‍රහණයක් පතා මග බලා සිටින අම්මගෙ සිතට සැනසුමක් ලබා දෙනු පිණිසයි.

එම අවදිය මහා නවකතාවකට ගොනු කර ගත හැකි අන්දමේ අත්දැකීම් කලාපයකට උරුම කියන, මගේ ජීවිතයේ මහා පංගුව ලෙසයි මට දැනෙන්නෙ. ඒ නිසා මේ පුංචි ලිපියෙ ඒ සියල්ල සටහන් කරන්න අවසරයක් මට නැහැ. නමුත් මට ඔබට කියන්නට අවශ්‍ය වෙන්නෙ, මා මුහුණ දුන් සංකීර්ණ සමාජ මොහොත විසින් එතෙක් මා තුළ නිද්‍රාගතව සිටි මගේ අනෙකා මට සම්මුඛ කිරීමේ අවස්ථාව උදා කළ බවයි; ලේඛකයකු වීමේ මාවත මට පෙන්නුම් කළ බවයි. ඒ මාවත සකස් ව තිබුණේ නිශ්චිත එක් ගමනාන්තයක් කරා විහිදුන, එකිනෙකට සමාන්තර පටු මාවත් දෙකක් විදිහටයි.

ඉන් පළමු මාවත හුදෙකලාව ඔස්සේ බිහිවුණ එකක්. මා ජීවත් වූ සමාජයේ සාමාජිකයන් විසින් එම මාර්ගය අත්හැර දමා තිබුණෙන් එහි කිසිවෙකු ගමන් කළේ නැහැ. එනිසා ම එම මාවත පාළුයි; හුදෙකලයි. ඒ වනවිටත් පාළුව සහ හුදෙකලාවට පෙම් කරමින් සිටි මට ඉතා සැහැල්ලුවෙන්, මගේ ම වින්දන කලාපයක් තුළ තනි වෙමින් එහි ගමන් කළ හැකි උනා.

අනෙක් මාවත සකස් වී තිබුණේ 'පැපරස් කඩදාසි'වලින්. එම 'කඩදාසි ලෝකය' මා දිවි ගෙවමින් හිටිය ලෝකය මොන තරම් කුඩාදැයි මට අවබෝධ කරන්න තරම් ප්‍රබල වූවක්. පැපරස් කඩදාසි ලෝකය මත සිට මා අමතනු ලැබූ සිය ගණනක් ගැහැනුන් සහ මිනිසුන් මා එතෙක් දැන නොසිටි අපූරු වූ මිනිස් සමාජයක් කරා මා කැඳවා ගත් අතර එතෙක් මට නොදැනුණ ආකාරයේ සැහැල්ලුවක් මගේ ජීවිතයට අත්පත් කර දුන්නා. කිසිදු පැකිළීමකින් තොරව මා එම පටු මාවත් දෙකෙහි එකවර දෙපා රඳවමින් අවසානයක් නොපෙනෙන ගමනක් ආරම්භ කළා. සමාජය ගැන කියවමින්, වටහා ගනිමින්, නිරීක්ෂණය කරමින්, නව මිනිහෙකු ලෙස වැඩෙමින් ඒ මාවතේ මං ගමන් කළා.

මා දැන් සිටින්නේ එම ගමන ආරම්භ කරද්දී මා නොදැන සිටි ගමනාන්තයේ යි. මේ ගමනාන්තය, ලෝකයේ බොහෝ මිනිසුන් සිය සමාජය විසින් තමන්ට උරුම කිරීමට නියමිත වූ සාම්ප්‍රදායික උරුමයට පිටුපා යමින් පිහිටුවා ගත්තක්. එය තමන් ද සාමාජිකත්වය දරන සම්මුතිකත්වය මත පිහිටු වූ සමාජය සමීප ව නිරීක්ෂණය කරමින් පිහිටු වූ, නව සමාජ ව්‍යූහයක් මැදි කරගත් වෘත්තාකාර සමබිමක්. ඊට ඇතුළු වූ පසු චක්‍රගත ගමනක් උරුම කරනවා විතරක් නෙමෙයි එය සම්මුතික සමාජයට මහා බලපෑමක් කරන්න හැකි ආකාරයේ නිදහස් කලාපයක් ද වෙනවා. එවැනි නිදහස් ගමනාන්තයකට අවතීර්ණ වූ මට පූර්වාදර්ශිත මිනිසුන් තෝරාගත් මග යනු විනා ඉන් බාහිර කිසිවක් කරා යොමු වීමට අවස්ථාවක් නැහැ. ඒ නිසයි මං ලේඛකයෙක් ලෙස ස්ථාවර ව පවතින්න උත්සාහ ගත්තෙ. මා තෝරාගත් මාර්ගයේ දී මට හමු වූ සෝවියට් රුසියානු සමාජය මට මහා දිරියක් වුණා. මැක්සිම් ගෝර්කිගෙ සමාජ අත්දැකීම් වගේම අයිත්මාතෙව්, ගොගෙල් සහ චෙකොෆ් මා යන මාවත ඉදිරියේ සිට ගෙන සිටියා. ඔවුන් සමග හුදෙකලා වූ විට මට තනිකමක් දැනුණෙ නැහැ. මගේ මේ ජීවන විලාසය සමහරුන් දැක්කෙ උන්මාදයක් විදිහටයි. පොත් පිස්සෙක්! ඔවුන් මා හඳුනා ගත්තෙ එහෙමයි. එහෙත් එමගින් මා ලද ශක්තිය මා අද සිටින තැනට ඔසවා තැබූ බව දන්නෙ මං විතරයි.

මේ අපේක්ෂාව සාධනය කර ගන්න මට උපකාර වුණේ හීන පෙළක් කීවාම ඔබ පුදුම වෙන්න පුළුවන්. ඔව්. එය ඇත්තක්. සමාජයෙන් හුදෙකලා වෙමින්, සම්මුතිකත්වයට එරෙහිව උඩුගං බලා පිහිනූ මිනිස් ආදර්ශයන් වෙතින් දිරිය උකහා ගනිමින්, නිරන්තරයෙන් දකින හීන වින්දනය කරමින් මා මගේ අපේක්ෂාව ජය ගැනීමේ මාවත සකස් කරගත්තා. මේ හීන අතරින් මට ලේඛකයකු වීමේ ප්‍රබල උත්තේජනයක් වූ හීන තුනක් තියෙනවා. ඒවා මගේ ජීවිතයත් එක්ක බද්ධ වෙලා තියෙන්නෙ ඇටයි හමයි වගේ. මං කෙටියෙන් ඒ හීන ගැන ඔබට කියන්නම්.

විශාල සාලාවක එළන ලද පැදුරු මත සම වයසෙ කුඩා ළමුන් දහ දෙළොස් දෙනෙක් ඉන්නවා. ඒ අතර සිටින පිරිමි ළමයෙක් නිදා උන් පැදුරෙන් නැගිටල මහ හඬින් අඬනවා. ඒ අසන අනෙක් ළමයින් ද අඬන්නට පටන් ගනිද්දි සුදු ලෝගුවක් ඇඳගත්ත කරුණාවන්ත තරුණ ගැහැනියක් අඬමින් සිටින පිරිමි ළමයව සනසන්න උත්සාහ ගන්නවා. ළමයා 'අම්මා' කියමින් නොනවත්වාම අඬනවා. 'අම්ම දැන් ඒවි..' ලෝගුධාරි ගැහැනිය කීවත් දරුවා හඬමින් ශාලාවෙ දොර දෙස ම බලනවා. පළමු හීනය එයයි.

වියරු විලාසයකින් කෑමොර දෙන මිනිහෙක් ගැහැනියකගේ හිස කෙස්වලින් අල්ලාගෙන ඇයට පහර දෙද්දි ගැහැනිය විලාප දෙනවා. ගැහැනිය ඇඳ සිටින ගවුමේ එල්ලී සිටින කුඩා පිරිමි ළමයෙක් මහ හඬින් හඬද්දී වියරු මිනිසා දරුවාගෙ අතකින් අල්ලා ඔහු ගැහැනියගෙන් වෙන් කොටගෙන තල්ලු කර දමනවා. බිත්තියේ හිස වැදී පොළොවට වැටෙන දරුවා වෙතට නැඹුරු වන ගැහැනියගේ හිසෙන් ගලන ලේ දහරක් දරුවාගේ මුහුණට වැටෙනවා. ඒ දෙවන හීනයයි.

කලබලකාරි වෙළෙඳ පොළක පලා තට්ටුවක් අසල පකිස් පෙට්ටියක් මත හිඳ සිටින කෙට්ටු ගැහැනියක් ඒ සමීපයේ සිටින ගැටවරයෙකු අතට මුදල් නෝට්ටු කිහිපයක් දිගු කරනවා. 'මේ සල්ලි බැඳලා ආයි සැරයක් විභාගෙ ගනිං.. උඹට බෑ මේ අවුකාස්ටෙ මැද්දෙ පලා විකුණන්ඩ..' ගැහැනියගේ දෑස දෙස බලන ගැටවරයා ඇගේ දෑස්වලට මොහොතක් බැඳී සිට ඇය තමන් වෙත පා සිටින නෝට්ටු කිහිපය අතට ගන්නවා. තුන්වන හීනය වනාහී එයයි.

මේ සිහින පෙළ නිරන්තරයෙන් මගේ හුදෙකලාව ආමන්ත්‍රණය කරද්දි මගේ දෑස් ඉදිරිපිට මැවෙන්නෙ ඒ ගැහැනියගේ දෑස්වල තිබූ අපේක්ෂාව සහ දරුවාගෙත්, ගැටවරයාගෙත් මුහුණේ තිබූ අසරණකමයි. එම ගැහැනිය මගේ කවුරුද? ඒ දරුවා මා ද? ගැටවරයාට මුදල් දිගු කරද්දී ගැහැනියගෙ දෑස්හි තිබූ අපේක්ෂාව කුමක්ද? සිතත්, පෑනත්, කඩදාසියත් මට අවනත කරන ඒ දෑස්හි තිබූ මලානික පැහැය යට හකුළා ගත් අපේක්ෂාවක් නොවීද?

මම, මවෙතින් ම ප්‍රශ්න කරනු ලබන එම සිහිනාශ්‍රිත සිතුවිලි මා ලේඛකයකු බවට පත් කළ බවයි මට දැනෙන්නෙ. අදටත් කිසිවක් ලියන්නට පෙර මට ඒ දෑස් හි කාන්තිය පෙනෙන්නට පටන් ගන්නවා. එවිට මං මගේ මියගිය අම්මාගේ උඩුකය ඡයාරූපයේ මා දෙසට යොමුව තිබෙන ඇස් දිහා බලනවා. සිහිනයේ දකින ගැහැනියගේ සහ අම්මාගෙ ඇස්වල තිබෙන අපේක්ෂා දීප්තිය කොතරම් සමාන ද? ඇගේ අපේක්ෂාව එය දැ යි නොදනිතත් මා පළමු සාහිත්‍ය සම්මානය ලබන විට මගේ අම්මා සිය දිවි සැරිය නිමා කර තිබුණා. අදටත් මා ලේඛකයකු ලෙස පවතින්නෙ කිසිදු වචනයෙන් නොකී අම්මාගේ අපේක්ෂාවන් ජයග්‍රහණය කිරීමේ මග එහි රැඳී තිබෙන බව මට දැනෙන නිසයි.

ලේඛකයකු ලෙස මා ආ මාවතෙහි ඇත්තේ මල් පියලි නොව රළු ගල් බොරලු ය. එම රළු මග තරණයට මා ශක්තිමත් කළ මහා ප්‍රහර්ෂය රැඳී තිබුණෙ අපේ අම්මාගෙ ඇස්වලයි. එය ඊයේත්, අදත් හෙටත් එසේ ම වන බව මට දැනෙනවා. ඔබත් එවැනි අපේක්ෂාවක් දල්වා ගන්න. එවිට ගමන පහසුයි. කලාව සහ මිනිසා අතර බන්ධනය පවතින්නෙ තමන් නිරත කලාව කෙරෙහි කලාකරුවා දක්වන අවංකභාවය මතයි. මිනිස් වගට අවංක නොවන කලාව පවතින්නෙ නැහැ. පවතින්නත් බැහැ. මානව ප්‍රේමය කුළුනොගැන්වෙන සාහිත්‍යය හෝ කලාව හෝ සමාජයේ ප්‍රගමනයට දායක වෙන්නෙ නැති බවයි මගේ විශ්වාසය. මං මගේ කලාව පිහිටුවන්නෙ මානව ප්‍රේමය මත. ඔබ මා කියවූයේ නම් ඔබට එය වැටහෙනු ඇත.

සාහිත්‍යකරුවාට සමාජය නිවැරදි මගට ඇද දමන්න බැහැ. එහෙත් ඔහුට හැකියි සමාජ සාමාජිකයන්හට තමාව යළි අවබෝධ කරගැනීමේ ශක්තිය උත්පාද කරවන්න. සමාජයක සාමාජිකයන් පළමු ව තමාව අවබෝධ කරගත් විට සමස්ත සමාජය ම නිවැරදි වන බවයි මං හිතන්නෙ. මං ලියන්නෙ ඒ වෙනුවෙන්. එනිසා ඔබ, ඔබ ව හඳුනා ගන්න. එය මේ මොහොතේ ඔබ සතු සමාජයීය වගකීමයි. අපි, අප වෙසෙන සමාජය වඩාත් සුන්දර තැනක් බවට පත් කර ගන්න උත්සාහ දරමු.

**මං මගේ කලාව පිහිටුවන්නේ මානව ප්‍රේමය මත**

**මැක්සිම් ගෝර්කි, අයිත්මාතෙව්, ගොගෙල් සහ චෙකොෆ් සමග හුදකලා වූ විට මට තනිකමක් දැනුනෙ නෑ**

**මගේ ජීවන විලාසය සමහරු දැක්කෙ උන්මාදයක් විදිහටයි**

**මට ලේඛකයෙකු වීමේ ප්‍රබල උත්තේජනයක් වූ හීන තුනක් තියෙනවා**

**අනුරසිරි හෙට්ටිගේ**

කොළඹ නගරයේ ජර්මන් සංස්කෘතික ආයතනයක් ඇත. ඉන්දියානු මෙන්ම ප්‍රංශ සංස්කෘතික ආයතනයක්ද, රුසියානු සංස්කෘතික ආයතනයක් මෙන්ම කලාවට වෙන්වූ ඇමරිකානු මධ්‍යස්ථානයක්ද ඇත. ඒ ඒ තානාපති කාර්යාල විසින් මේ සඳහා අනුග්‍රහය දක්වනු ලබයි.

ඒ අතර බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව ඉදිරි පසින් සිංහල සංස්කෘතික ආයතනයක්ද ඇත. බොහෝ දෙනා එය දන්නේ 'සුදර්ශිය' නමිනි. සුදර්ශිය කී පමණින්

# සුදර්ශිය ගැන කතාකරන්න අවුරුදු දෙකක් තිස්සෙ අගමැතිතුමාගෙන් සාකච්ඡාවක් ඉල්ලන්නේ

එබිම ඇති දැවැන්ත නුග ගහ සිහියට නැගේ. මෙරට බිහිවූ දැවැන්ත කලාකරුවන්ට මේ නුගරුක සෙවණ ලබා දී ඇත. පණීභාරත, චිත්‍රසේන, වජිරා, අමරදේව, එදිරිවීර සරච්චන්ද්‍ර, දයානන්ද ගුණවර්ධන, හෙන්රි ජයසේන වැනි දැවැන්තයන් ඒ අතරින් කිහිප දෙනෙකි.

එදා බොහෝ කලාකරුවන් ගැවසුණ කලාකරුවන්ගෙන් හිස් නොවූ ඒ බිම කොවිඩ් වසංගතය නිසා අද හුදෙකලා වී ඇත. නුගරුක යට පාළුවට ගොසිනි. වෙනදාට ඇසෙන බෙර හඬ අද නැත. පුහුණුවීම් සඳහා එන නාට්‍යකරුවන් දක්නට නැත.

සුදර්ශිය පිහිටි බිම රජයට පවරාගෙන ජපානයට දීමට සූදානම්වන බවට පසුගිය කාලයේ ප්‍රචාරයක් පැතිරිණ. පසුව එය චීනයට දීමට සූදානම් වන බව කලාකරුවෝ පැවසූහ. කෙසේ වෙතත් මේ බිමට යම්කිසි තර්ජනයක් ඇති බව පෙන්වන හෝඩුවාවල් පසුගිය කාලයේ විටින් විට කරලියට ආවේය. "සුදර්ශිය'ට එල්ලවී ඇති මේ තර්ජනය සම්බන්ධයෙන් එහි පාලක මණ්ඩලයේ ලේකම්, ප්‍රවීණ රංගන ශිල්පී ලක්ෂ්මන් මෙන්ඩිස් සමග කළ සාකච්ඡාවක් මෙසේ පෙළ ගස්වමු.

**සුදර්ශිය සමග ඔබට ඇති සම්බන්ධය කොතරම් පැරැණිද?**

මම වයස අවුරුදු දහතුනේදී තමයි පළමුව සුදර්ශියට ආවේ. ඒ සමන් අතාවුදහෙට්ටිත් සමග. රාජකීය විද්‍යාලයේ ඉගෙන ගන්නා කාලේ අපේ නාට්‍යය හොඳම නාට්‍යය වුණා. අපේ ප්‍රධාන අචාර්ය එම්.ජී. සුගතපාල මහත්තයා කිව්වා සුදර්ශියේ හොඳ නාට්‍යයක් පෙන්වනවා සතිස්චන්ද්‍ර එදිරසිංහ කියලා කෙනෙක්ගේ 'හොටබරි යුද්ධය' නමින් ගිහින් බලන්න කියලා. ඒ ආපු ගමන තමයි මේ. ඉන්පස්සේ දයානන්ද ගුණවර්ධන මහත්තයාගෙන් ලියුමක් අරගෙන ආවා ' අනේ අබ්ලික්' නාට්‍යයේ රඟපාන්න. ඒත් මම ප්‍රමාද වෙලා ආපු නිසා හැරිලා ගියා..ඉන්පස්සේ නවසිය අනූගණන්වල තමයි නිමල් ලක්ෂපති ආරච්චිලා සමග සුදර්ශියට ඇවිත් ලංකාවෙ ඉන්න ප්‍රසිද්ධම ශිල්පීන් සමග සාකච්ඡා කරමින් ප්‍රවීණයන්ගේ ඇසුර ලැබුවේ.. මම රඟපෑ වේදිකා නාට්‍ය විස්සක පුහුණුවීම් කළෙත් මෙතන. අද මම සුදර්ශි පාලක මණ්ඩලයේ ලේකම්. ඩබ්ලිව් . ජයසිරි තමයි සභාපති.

**සුදර්ශියේ සැබෑ අයිතිකරුවා කවුද?**

සුදර්ශිය ආරම්භවී තිබෙන්නේ 1954 දී. අද වන විට අවුරුදු හැට හතක්. එද සුදර්ශිය පවත්වාගෙන ගොස් තිබෙන්නේ ගංගාරාම පන්සල අසල අද ගාමිණී මාතා වැඩිහිටි නිවාසය තියෙන තැන. 1963 දී තමයි බෞද්ධාලෝක මාවතේ පර්චස් 189 ක දැනට තිබෙන ඉඩමට පැමිණියේ. නවසිය පනස් ගණන්වල සුදර්ශියේ පළමු භාණ්ඩාගාරිකවරිය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය. රනිල් වික්‍රමසිංහ මහතාගේ මව නාලනී වික්‍රමසිංහ මහත්මියත් තනතුරක් දරලා තියෙනවා. ඇයගේ මැදිහත්වීමෙන් තමයි මේ බෞද්ධාලෝක මාවත ඉඩම සුදර්ශියට අරගෙන තියෙන්නේ. ඒ බණ්ඩාරනායක මහත්තයා අගමැතිවරයා කාලේ. රට යටත් කර ගෙන සිටි බ්‍රිතාන්‍ය පාලකයන්ගේ ආයුධ ගබඩාව පැවැති බිම තමයි අද අපි සුදර්ශිය ලෙස පාවිච්චි කරන්නේ.

1989 දී අගමැති ආර්.ප්‍රේමදාස සුදර්ශිය සංස්ථාගත කරනවා. අපි මේ භූමිය වෙනුවෙන් ආණ්ඩුවට බද්දක් ගෙවනවා. ඊට අමතරව නගර සභාවට වරිපනම් බදු ගෙවනවා. 1963 සිට 2007 දක්වා ඒ විදිහටයි පැවතුණේ. වරිපනම් ලේඛනයේ අයිතිකරු ලෙස සඳහන් වන්නේ සිංහල සංස්කෘතික ආයතනය නමින්. 2007 දී ඉඩම් බදු සංශෝධන පනතක් රජය ගෙන එනවා. ඒ යටතේ ඉඩමේ වටිනාකම තක්සේරු කරලා බද්ද ලෙස අවුරුද්දකට රුපියල් තුන් ලක්ෂ ගණනකට බදු මුදල වැඩි වෙනවා. ඊට කලින් ගෙවුවේ අවුරුද්දට රුපියල් එක් දහස් හයසීයක් වැනි මුදලක්.

**රජයෙන් සුදර්ශියට අනුග්‍රහයක් ලැබෙනවද?**

2004 දී සුදර්ශියට අවුරුදු පනහක් පිරෙද්දී එවක අගමැති මහින්ද රාජපක්ෂ සමරු කලාපයට ලබා දුන් සුබ පැතුම් පණිවුඩයේ කියනවා මේ බිම සිංහල සංස්කෘතික ආයතනයට අයිතියි කියා. නමුත් රජයකින් කවදාවත් මේ ආයතනයට සහායක් ලැබිලා නැහැ. අද වෙද්දී මිලියන 84 ක හිඟ බදු මුදලක් ගෙවන්න තියෙනවා කියලා අපට ලියුම් එවනවා.

**සිංහල සංස්කෘතික ආයතනය සුදර්ශිය නමින් හඳුන්වන්නේ ඇයි?**

සුදර්ශිය කියන්නේ මෙහි තියෙන ප්‍රධාන ශාලාවේ නම. බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව විවෘත කරන ආරාධනා පත්‍රයේත් යටින් සටහන් කර තිබෙනවා මෙය පිහිටා ඇත්තේ සුදර්ශි ශාලාව ඉදිරිපිට කියලා. එවන් සුප්‍රසිද්ධ තැනක් තමයි සුදර්ශිය.

**මේ ආයතනය පාලනය වන්නේ කොහොමද?**

සුදර්ශිය පාලනය වන්නේ අනු මණ්ඩල නවයකින්. සභාපති, ලේකම්, උප සභාපති, උප ලේකම් සහ භාණ්ඩාගාරිකට අමතරව අනු මණ්ඩල නවයේ ලේකම්වරුන් නව දෙනෙක් සිටිනවා. නාට්‍ය, නැටුම්, සංගීතය, සාහිත්‍ය, ජනසම්මත සාහිත්‍ය, මැහුම්, කලාව හා නිර්මාණ, හස්ත කර්මාන්ත, චිත්‍රපට විෂයයන් සඳහා මේ අනු මණ්ඩල වෙන්ව තිබෙනවා.

**සුදර්ශියෙන් සිදුවූ සේවාවන් සහ ඉදිරියේදී කලාවට සිදුවන සේවාවන් මොනවද?**

වැඩක් කරන්න සූදනම් වෙද්දී තමයි කෙරෝනා වසංගතය ආවේ. අපි තවම බලා ඉන්නවා කොවිඩ් අවසන් වන තුරු අපේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න. සුදර්ශි කලා ශිල්ප ශාලිකාව ආරම්භ කිරීමේ සැලැස්මක් තියෙනවා. නාට්‍ය වැඩමුළු සඳහා තමයි පළමු පියවර තබන්නේ.

**ඒ කියන්නේ සුදර්ශිය දැන් මේ ඉඩමේ පවත්වාගෙන යන්නේ අනවසරයෙන්ද?**

2020 දෙසැම්බර් මාසේ අපට ලිපියක් එවනවා පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය විසින්. 2015 සිට මේ දක්වා අනවසරයෙන් බුක්තියේ රැඳී සිටින බවත් බදු අනුමැතිය අවලංගුව පැවැති කාල සීමාවේ හිඟ රුපියල් කෝටි අටකට වැඩි මුදලක් ගැන ලිපියේ සඳහන් කර තිබෙනවා. අපට එතරම් මුදලක් ගෙවන්න බැහැ.

**කලක පටන් මේ භූමිය රජයට පවරා ගැනීමේ සූදානමකුත් තිබෙනවා නේද?**

2017 දී සංස්කෘතික අමාත්‍යාංශය මගින් කැබිනට් පත්‍රිකාවක් සකස් කර මේ භූමියේ අයිතිය සිංහල සංස්කෘතික ආයතනයට ලබා දෙන්න තීරණය කළා. කැබිනට් පත්‍රිකාව හැදුවා. ඒ අතර විෂයභාර ඇමැතිව සිටි සජිත් ප්‍රේමදාස ජනාධිපතිවරණයට තරග කළා. ඊට කලින් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේත් සුදර්ශි ඉඩම ජපානයේ සසකාවා ආයතනයට දෙන්න හැදුවා. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ඒ ප්‍රයත්නය නැවැත්තුවා.

**මේ ඉඩම සම්බන්ධයෙන් වර්තමාන ආණ්ඩුවේ ප්‍රතිචාරය කෙබඳුද?**

මේ ආණ්ඩුවේ බන්දුල හරිශ්චන්ද්‍ර කියන සංස්කෘතික ලේකම්තුමාත් කැබිනට් පත්‍රිකාවක් හැදුවා. ඒ අතරේදී ගිය අවුරුද්දේ මහ මැතිවරණය ආවා. මහාචාර්ය කපිල ගුණවර්ධන ලේකම් වුණා. එතුමා සමග කළ සාකච්ඡාවේදී සංස්කෘතික අමාත්‍යාංශයට ඉඩමෙන් භාගයක් සහ සුදර්ශියට භාගයක් දෙනවා කිව්වා. ඒකට අප ලැස්ති නැහැ කියා මම කිව්වා.

**සංස්කෘතික ඇමැති ලෙස කටයුතු කරන අගමැතිතුමාට මේ ගැන පැවසුවේ නැද්ද?**

අපි අවුරුදු දෙකක් තිස්සේ අගමැතිතුමාගෙන් සාකච්ඡාවක් ඉල්ලනවා. තවම අවස්ථාවක් දීලා නැහැ. සුදර්ශියේ හිටපු ලේකම් සමන්ප්‍රිය මාරසිංහත් අගමැතිතුමා සමග කතා කළ අවස්ථාවකදී විමසලා තියෙනවා චීන ආයතනයකට මේ බිම දෙන්න යෝජනාකර තිබෙනවා නේද කියා. එතුමා කියා තියෙනවා නෑ ඒක යෝජනාවක් විතරයි කියලා. එවැනි යෝජනාවක් කර ඇත්නම් එය භයානකයි. විදුර වික්‍රමනායක රාජ්‍ය ඇමැතිතුමාත් අගමැතිතුමාට ලිපියකින් දැන්වූවා මේ සුදර්ශි බිමේ අයිතිය පැවරීමේ කැබිනට් පත්‍රිකාව ගැන සාකච්ඡා කිරීමට දිනයක් ලබා දෙන්න කියලා. කලාකරුවන් දෙසිය පනහක් පමණ අත්සන් තබලා අගමැතිතුමාට දෙන්න අපි පෙත්සමකුත් හදලා තියෙනවා.

**සුදර්ශියෙන් කලාවට වන සේවයක් නැහැ. සමහරු ඇවිත් රස්තියාදු ගහන තැනක් බවට පත්වෙලා කියමින් තමයි පහුගිය කාලේ මේ භූමිය අත්පත් කර ගන්න ඇතැමුන් උත්සාහ කළේ.. මේ චෝදනාව ගැන මොනවද කියන්න තියෙන්නේ**

නැහැ..අපිට කිසිම දෙයක් මේ කොරෝනා වයිරසය නිසා කරන්න බැරිවෙලා තියෙන්නේ. කෙටි චිත්‍රපට උළෙලක් කරන්න අපි සූදනම්ව සිටිනවා. චිත්‍රපට ටික ලැස්තියි. මේ වසංගතය අවසන්වූ වහා උළෙල පවත්වනවා. අනෙක මෙතැනට කලාකරුවන් එන්නේ කලා කටයුතු වලට මිසක් රස්තියාදු ගහන්න නොවේ. මෙතැන කලාකරුවන් එකිනෙකා හමුවන තැනක්. ලංකාවේ හතර දිග්භාගයටම නාට්‍ය පෙන්වන්න ශිල්පීන්ගේ බස් එක පටන් ගත්තේ සුදර්ශියෙන්. මේක කලාකරුවන්ගේ කේන්ද්‍රස්ථානය. මේක කිසිම කෙනෙකුට දෙන්න බැහැ.



ප්‍රවීණ රංගන ශිල්පී ලක්ෂ්මන් මෙන්ඩිස්

**අජිත් අලහකෝන්**


## කොළඹ නගර සීමාව තුළ අමතර ගාස්තුවකින් තොරව "ධරණී" පුවත්පත ඇතුළු අරුණ ප්‍රකාශන නිවසට කාර්යාලයට හෝ පුස්තකාලයට ගෙන්වා ගැනීමට

කාන්තා පුවත්පත් වෙළෙඳපොළේ ඉතාමත් කෙටි කාලයක් තුළ අංක එක ස්ථානයට පත් වෙමින් සුවහසක් කාන්තාවන්ගේ ආදරය දිනාගත් "ධරණී" ජාතික කාන්තා පුවත්පත ඇතුලු අපගේ සියලුම පුවත්පත් කිසිදු අමතර අයකිරීමකින් තොරව, නිකුත්වන දිනම, උදෑසන ඔබ අතට පත් කිරීමේ සේවාවක් අරුණ ප්‍රකාශන බෙදාහැරීම් අංශය ආරම්භ කොට ඇත. ඔබේ නිවස, කාර්යාලය හෝ පුස්තකාලය කොළඹ 1 සිට කොළඹ 15 අතර නගර සීමාවේ පිහිටා ඇත්නම් සහ මෙම සේවය මගින් අපගේ පුවත්පත් ලබා ගැනීමට බලාපොරොත්තුවේ නම් පහත දුරකථන අංක මගින් අපව අමතන්න. මේ සඳහා මාස තුන, හය හෝ අවුරුද්දක කාලයක් වෙනුවෙන් පහත සඳහන් පරිදි කලින් මුදල් ගෙවා ඔබට අවශ්‍යය පුවත්පත / පුවත්පත් ඇනවුම් කරගත හැක.

| පුවත්පත | මිල | දායකත්ව මිල | | |
|---|---|---|---|---|
| | | මාස 3 | මාස 6 | අවුරුදු 1 |
| ධරණී | 40/= | 520.00 | 1040.00 | 2080.00 |
| සති අග අරුණ | 80/= | 1040.00 | 2080.00 | 4160.00 |
| අරුණ | 30/= | 1920.00 | 3870.00 | 7830.00 |
| the sunday morning | 70/= | 910.00 | 1820.00 | 3640.00 |
| the morning | 30/= | 1920.00 | 3870.00 | 7830.00 |
| தமிழன் | 40/= | 520.00 | 1040.00 | 2080.00 |
| தமிழன் | 30/= | 1920.00 | 3870.00 | 7830.00 |
| තරුව | 40/= | 480.00 | 1000.00 | 2080.00 |

**වැඩි විස්තර සඳහා අප හා සම්බන්ධ විය හැකි ආකාරයන්**

දු.ක අංක 0112127207
0112127209
0112127210
0115886186
0115978987
ෆැක්ස් 0112455134


තැපැල් ලිපිනය: කළමනාකරු බෙදාහැරීම්
ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
46/8, දොම්පෙ පාර
කළුකොඳයාව, මල්වාන

විද්‍යුත් තැපෑල: distribution@liberty.lk
Hotline 0761367620





# කෙටිකතාව



# මංගල සාදය

වාහනයක හඬක් ඇසුණු විගස ඉද්ද ගැසුවාක් මෙන් කෙළින් වූ පියනන්ද යළිත් හාන්සි පුටුවට බර වූයේ මුළු ශරීරයම වෙලාගෙන ඇති දුක් වේදනා බර තවදුරටත් ඉවසා දරා සිටිය නොහැකි හෙයිනි.

ඇසළ මහේ පුරහඳ අහසේ මුදුනටම පායමින් තිබිණි. පොල්ගස් අතරින් පෙරී බිමට ගලා ආ සඳ එළිය දෙසම පියනන්ද බලා සිටියේය. සඳතරු අතර ඇත්තේ මලානික බවකි. මුළු ගේ පුරාවටත් දොරේ ගලාගෙන ගොස් ඇත්තේද ඒ මූසල බවය. ඒ අතරින් නිශානිගේ ඉකිබිඳුම යාන්තමට ආවේය. එකම අඳෝනාවක් මෙන් තිබූ ඇගේ හැඬුම දැන් ඉකිබිඳුමකට සීමා වී ඇත. ඒ ඇයටම වෙහෙස නිසා වන්නට ඇත. පියනන්දට කාමරේට යන්නට සිතිණි. එහෙත් උන් තැනින් නැගිටීමට පවා නොහැකි ලෙස දෙපා අප්‍රාණික වී ඇත. ගෙවුණු පැය කිහිපය මතක් වනවිට ඔහුගේ පපුව පැරෙයි.

බොහෝ වේලා වැස්සකට අරඇද්ද අහස හතර වටින් කළු කරනා අයුරු පියනන්දට පෙනේ. ලස්සනට පායා තිබූ සඳ, දිළිසෙන පැහැයක් විහිදවූණ සඳ, තිබූ තැනවත් පෙනෙන්නට අපහසු සේ කළු වලාවකින් වැසී ඇත. පියනන්දට විශාල තනියක් දැනිණි. ඔහු හාන්පස බැලුවේ ඒ තනියෙන් අත්මිදීමට තැනක් ඇද්දැයි සොයන්නාක් මෙනි. බලන බලන හැම පැත්තෙන්ම ඔහුට පෙනුණේ කළු පැහැති යකුන් වැනි අන්ධකාරයයි. ඒ අතර කොහේදෝ ඈතක සිට දත් විලිස්සන යකෙකු මෙන් අඳුර අතරින් රිදීපාට විදුලියක් කෙටුවේය. ඒ සමගම සිත කීරි ගැහෙන හඬකි. එකක් දෙකක් නොව හඬවල් කිහිපයකි.

මහා සෝෂාවක්, ඒ එක්කම කන් අඩි පැළෙන තරම් විශාල හිනාවක්.

**''උන් ඔක්කොම හිනාවෙනවා. උන්ට හිනා. මලයක්කු''**

පියනන්ද දත්මිටි කෑවේය.

**''නවත්තපියව් යකුනේ ඔය වැඩේ''** කිසිවක් නොඇසුණා සේ ඔවුහු හැම තවත් හයියෙන් සිනාසුණහ. ඔවුන්ගේ විනෝදය දෙගොඩ තලා ගියේය.

**"නවත්තපං බං ඔය වඩේ දැන් ඇති"** බැරිම තැන පියනන්ද කීවේ, නිශානිගේ ඇඟට තුන් වෙනි කුණු බිත්තර සාරුව සලද්දීය.

**''පිස්සුද බං. තව ඉවර නෑ. මේ පටන් ගත්තා විතරයි''**

එවර පියනන්දටත් නිශානිටත් නාන්නට සිදුවූයේ බියර්වලිනි.

**''ඇති බං, ඔය ඇති''**

නිශානිගේ අහිංසක මුහුණ දෙස බලා සිටිය නොහැකි තැන පියනන්ද යළිත් ඇවිටිලි කළේය. පියනන්දට දෙතොල් පියවන්නට අවසර නොලැබුණි. කුණු තක්කාලි වරුෂාවක් ඔවුන් දෙසට හතර අතින්ම ගලා ආවේය.

පියනන්දට ගලුත්, මලුත් එකසේ ඔරොත්තු දුන්නද, ඒ කිසිවෙකට මුහුණදීමට තරම් හයියක් නැති නිශානී එන එන පහරට මුහුණ වසා ගත්තාය. හැඬුවාය. කෑ ගැසුවාය, විලාප දුන්නාය. එහෙත් ජවනිකාව අවසන් වූයේ නැත. ඊළඟ පහර පාන්පිටි උරයකි.

මඟුල් ගෙදර හැම මුහුණක්ම රකුසු වෙස් ගෙන ඇත. සියල්ලන්ම හොල්මන් දුටුවා සේ බිය වී ඇත.

**''උඹලට පිස්සුද බොලව්. නරි හැත්ත. වල් බල්ලෝ''**

ඒ නිශානිගේ තාත්තාගේ හඬය.

දෑස් නිලංකාර කළ විදුලි එළියත් කන් බිහිරි කරවන අකුණු සැරයකින් පියනන්ද නැවත වරක් තිගැස්සී ගියේය.

**''නාකි පප්පේ ඔහේටයි පිස්සු''**

දිව ගැවසුණු වචන පෙළක් පියනන්දට ඇසිණි. ඒ හඬ සමීරගේද සමන්ගේද යයි නිනව් නැත.

**''අපි බල්ලෝ නෙවෙයි. අපිත් ඔහේලා වගේම හොඳ නම්බුකාර කොල්ලෝ, හරිද? අපිට අපේ පාඩුවේ, අපේ වැඩක් කරගන්න ඉඩදීලා අයින් වෙනවද? නැද්ද?''**

සමීරගේ වේගවත් වචන. එකම කාලගෝට්ටියක් වූ මඟුල් ගෙදර. බිමට වැටුණු නිශානිගේ තාත්තා. පියනන්ද දුටුවේ එපමණය. ඒ සමගම වතුර බාල්දි වරුසාවක් ඔවුන් දෙසට ගලා ආවේය. මඟුල් ගෙදර සෝදාගෙන ගියේය.

අහස පොළොව දෙදරවාගෙන නැගුණු ගෙරවිලි හඬකුත් සමගම මහ වැස්සක්ද ඇදහැලුණි. එකවරම ඇදහැලුණු වැස්ස, කොහේ සිට පැමිණියේදැයි පියනන්දට නොතේරේ. 'හෝ...හෝ' ගාමින් වැටෙන වැස්ස නැවතුණේ නැත්තා සේ තව තවත් කඩා වැටෙන්නට විය. හිරිගඬු පිපෙන සීතල සුළඟක්ද සමග ගස්වැල් අඹරවාගෙන කඩා හැළෙයි. කිසි අනුකම්පාවක් නැති අයුරින් පීඩා දෙති. සමීරලාගෙන් ද ලැබුණේ මෙබඳුම පීඩාවක් නේදැයි පියනන්ද සිතුවේය.

වැහි බිඳු බිමට වැටෙන හඬ අභිභවා නිශානිගේ ඉකිබිඳුම ඔහුට ඇසෙයි. ඒ හඬ තුළ ඇති දැරිය නොහැකි වේදනාව පියනන්දටත් දැනේ.

''මං දන්නව නිශා; මට තේරෙනවා නිශා; ඔයාගේ දුක. ඔයාගේ තාත්තට බුදු සරණින් මුකුත් වෙන්නේ නෑ'' මෙලෙස ඇයගේ දැවෙන හදවත ආදර පිනි දියෙන් සීතල කරන්නට පියනන්දට නොයෙක් වර සිතිණි.

''කොහොම කළත් වෙච්ච දේ වෙලා ඉවරයි. කරපු වැරද්ද නිවැරදි කරන්න බැහැ''

පියනන්ද සිත සනසා ගත්තේය. ඔහුට නිශානි ගැන දුක සිතේ. ජීවිතය පිළිබඳ නැවුම් හැඟීම් ඇතිකරගෙන අලුත් ලෝකයකට පියමං තැබීමට පියනන්දත්, නිශානීත් සූදනම් වූයේ අනෙක් හැම මනාල මනාලියක මෙනි. උදේ සිට පිබිදුණු රෝස මලක් මෙන් සිනාපිරි මුහුණින් ඇය සිටියේ ජීවිතයේ හැම බලාපොරොත්තුවක්ම සඵල වූ සේය.

පැරණි චාරිත්‍රානුකූලව, පියාගේ අතින් පෝරුවට නැගගත් නිශානී, මාමාගේ අතින් අල්ලා පියනන්දත් සමග පෝරුවෙන් බැසගත්තේ, ඒ පැරණි සිරිත් විරිත් ගෞරවයෙන්ම ආරක්ෂා කරමිනි. ඉන්පසු එළඹුණු සෑම අවස්ථාවකටම අකැමැත්තෙන් අසීරුවෙන් ඈ මුහුණ දුන්නාය. පියනන්දගේ හදවත හඬා වැළපෙන්නට විය.

**''නව යුවතිපතී දෙපළට පිටත් වෙන්න සුදුසු නැකැත් වේලාව ළං වේගෙනයි එන්නේ. ඒ නිසා උත්සව සභාව පවත්වලා නව යුවළට 'සුභ මංගලම්' කියලා මංගල ගමනට අවසර දෙන්නයි දැන් අපට තියෙන්නේ''**

එසේ පැවසූ නිශානිගේ තාත්තා, මඟුල් ගෙදර ප්‍රධානියා, පිපුණු නැවුම් කුසුමක් වැනි තම දියණිය ගෙයින් පිටත් කිරීමට සූදනම් වූ නිශානිගේ තාත්තා, චාම් මංගල උත්සවයක් නිමාකොට නැවුම් පැතුමකින් පිරි දෙනෙතින් සිනාසෙමින් සිටි නිශානිගේ තාත්තාට එහි අවසානයක් දකින්නට බැරිවිය. මංගල ගමන, පීත්ත පටිවලින් සරසා තිබූ මංගල රථය, මනාල යුවළ, යෙහෙළියන්, මල් කුමර කුමරියන්, පියනන්දගේ දෑස් කඩතුරාව අස්සෙන් බොඳවී ගියේය. නිශානිගේ අම්මා තාත්තා, මාමා, නැදෑයන්, පියනන්දගේ පවුලේ ඥතීන්, ලස්සන හිත්මල් රාශියක් ඇසිපිය හෙළන පමණින් තලා පාගා පොඩිකර දමන ලද්දේ තමා විසින් නේදැයි පියනන්දට සිතිණි. වාවාගත නොහැකි ඒ දුක විෂ ඊතලයකින් මෙන් සිත පසාකොට ගෙන ගොස් එම විෂ මුළු ශරීරය පුරාම විහිදී යන්නා සේ දැනෙන්නට විය. ඒ සමගම තම යහළුවන් කෙරෙහි මහත් වෛරයක් ද ඔහු සිත උපන්නේය.

''ජීවිතේට ම එළැඹෙන ප්‍රීතිමත් අවස්ථාවක්. අනෙක යාළුවන් නෑදෑයන් එකට එකතුවෙන දවස. ඒ විතරක් නෙවෙයි, බොහෝ විට ජීවිතේට එක් වරක් පමණක් උදාවන මොහොතක්. එදාට අප සතුටු වෙන්න ඕන සතුට කියන්නේ බෙදාගන්න දෙයක්. ඒකයි මං කන්තෝරුවේ යාළුවන්ටත් ආරාධනා කළේ''

පියනන්ද සිත සනසා ගැනීමට උත්සාහ කළේය.

**''තාත්තාට උවමනා කරන්නේ, අපේ උත්සවේ ලස්සනට වගේම චාමෙට කරන්නයි. ඔයාගේ යාළුවෝ ඇවිත්...''**

යහළුවන්ටත් මංගල උත්සවයට ආරාධනා කළ බව පියනන්ද කී විට නිශානි එසේ කීවාය.

**''යාළුවෝ එන්නේ බෝතල්වලින් නාන්න නෙ. ඔයා දන්නවනෙ අපේ තාත්තා ඒවට හොඳටම විරුද්ධ බව''**

**''මං දන්නව නිශා. ඒ හින්ද මං ආරාධනා කළේ මගේ හිතවත්ම යාළුවන් කීපදෙනකුට විතරයි''** පියනන්ද කීවේ නිශානි සතුටු කිරීමට නොව, අවංකවමය.

**''උඹ හොරෙන්ම මඟුල් කන්නයි ලෑස්තිය නේද?''**

දිනක් කෑම පැයේදී පියනන්ද අසලට පැමිණි සමීර කීවේය.

**''අපට පොඩි ජොලියක් දන්න තියෙන දවස. උඹ ඒකටත් වැට කඩුලු බඳින්නයි හදන්නේ''**

සමීරට උඩගෙඩි දෙමින් සමන් කීවේය. තමාට සමීප නොවූ තවත් යහළුවන් කීපදෙනකුටම කරුණු පහදදීමට පියනන්දට සිදුවිය.

**''හරි...හරි. උඹ ඒ ගැන කලබල වෙන්න එපා. අපි ඒව සප්ලයි කර ගන්නම්''**

සමීරට උඩ ගෙඩි දෙමින් සමන් කීවේය.

සමීර සමන් මෙන් නොව රාජකාරි කටයුත්තක දී හෝ තමාට කිසිසේත් සමීප නොවූ තව කිහිප දෙනෙක් ම මේ අවස්ථාවේ කෑම මේසයේ සිටියහ. ඔවුන්ගේ උකුසු ඇස් තමා වෙත රැඳී ඇති බවක් පියනන්ද දුටුවේ අනාගත් බත් පිඬක් කටට දමා ගැනීමට හිස ඔසවද්දීය. නිරන්තරයෙන් රතු වූ දෙනෙත් ඇති කෙනෙක් ඔවුන් අතරින් පියනන්දගේ ඇස ගැටිණි. ඒ දයාරත්නය.

ආරාධනාවක් ලදත් නොලදත් කාර්යාලයේ කවරකුගේ හෝ මඟුලක් අවමඟුලක් වෙතොත් ඔහු එතැන සිටින්නෙකි. ඔහුගේ උකුසු ඇස තමා වෙත එල්ල වී තිබෙනු දුටු පියනන්දගේ හිත කීරි ගැසී ගියේය.

ශානිකා යතුරු ලියන්නිය. ඇගේ පියාගේ අවසන් කටයුතු කරන දිනය නොමැකෙන සටහනක් සේ පියනන්දගේ හදවත තුළ ඊයම් බරුවක් සේ කිඳා බැස ඇත.

මතක වස්ත්‍ර පූජාව අවසන් විය. ස්වාමීන් වහන්සේලා ආපසු වැඩම කළහ. අවසන් වරට පැමිණ සිටි ඥති මිත්‍රාදීහු දේහයට අවසන් බුහුමන් දැක්වූහ.

ශානිකාටත් ඇගේ අම්මාටත් සිටි එකම හිතවතා, නෑදෑයා, ආරක්ෂකයා අවසන් ගමන් යාමට සූදනම්ය.

කොහේදෝ සිට දයාරත්න එක්වරම එතැනට කඩා වැටුණු සැටි කිසිවෙක් නොදැක්කා නොවේ.

ඔවුන් දෙස එක එල්ලේ බලාගත් පියනන්ද තම විවාහය ඉතා චාම් සරල අන්දමින් සිදු කෙරෙන බව පහදා දීමට මහත් වෙහෙසක් ගත්තේය.

පියනන්දගේ හදවත හඬා වැටිණි.

වැසස් වියරු වැටුණා සේ අලුත් වෙමින් මහ හයියෙන් බිමට වැටේ....

දඩබ්බරයකුට තවත් දඩබ්බරයකු ළංවූවා සේ සුළඟත් වැස්සට අත්උදව් දෙන්නේ ''තවත් වැහැපන්''යි කියන්නාක් මෙනි. ඉස්තෝප්පුවේ හාන්සි පුටුවේ වාඩි වී සිටින පියනන්දට, පොල් කරටි සුළඟින් ඇඹරෙන අයුරු හොඳින් පෙනේ.

**''මේ ඔක්කොටම තමුසෙ වග කියන්න ඕන තේරුණාද?''**

නිශානිගේ මාමාගේ තර්ජනාංගුලිය පියනන්ද දෙසට එල්ල වූයේ, ''ලෙඩාට ටික්ක අමාරුයි ඉක්මනට ඉස්පිරිතාලෙට එක්ක යන්න''යි හන්දියේ දෙස්තර මහතා කී විටය.

මඟුල් ගෙදර යුද පිටියක් මෙනි. මේස පුටු පෙරළමින් මිනිස්සු එහෙ මෙහෙ දුවති. ගැහැනු හඬති.

**''ලෙඩාට අමාරුයි... ඉක්මනට වාහනයක්... කෝ මේ කාර් එකේ ඩ්‍රයිවර් මහත්තයා''**

පියනන්දත් එහෙ මෙහෙ දිව්වේය. ''කෝ නිශානි'' ඔහුගේ දෑස නිශානි සෙව්වේය. බතික් කළාක් වැනි සුදු සේලය පාවාඩයක් සේ දිගට දිගේ ඇඳගත් නිශානි කාරයට මුහුණ ඔබාගෙන විලාප දෙයි. එය කන් සිදුරු පලාගෙන යන තරම් දුක්බර වූවකි.

දෑස අඳුරු කරවන විදුලියක් කෙටුවේය. ඒ සමගම හදවත දෙදරුම් වන ගෙරවිලි හඬක් පරිසරය සිසාරා පැතිර ගියේය. පියනන්දගේ සිත නුහුරු නුපුරුදු බියකින් සලිත වී ගියේය. ජීවිතයේ තමාට මෙතෙක් අත්විඳින්නට නොලැබුණ අන්දමේ බියක්ද, ඒ සමගම තනිකමක්ද ඔහුගේ හිත තව තවත් අසරණ කළේය.

''වාහනයක්, කට්ටිය එනව වගේ. ඇති යාන්තං'' පියනන්දගේ සිතට ක්ෂණික අස්වැසිල්ලක් දැනිණි. ගේ දෙසට පැමිණි රථයක් ඔහුගේ හිත හොල්මන් කොට අතුරු පාරෙන් හැරී නොපෙනී ගියේය.

''මටත් යන්නයි තිබුණේ.'' පියනන්දගේ සිත කීවේය. බරපතළ වරදක් කොට සිරගෙට නියම වූවා සේ ඔහුගේ හිත ඔහුට වද දෙන්නට විය.

හමා ආ වේගවත් සුළඟකින් පියනන්දගේ මතක පොතේ පිටු කීපයක් පෙරළී ගියේය.

**''උඹලයි අම්මගේ අප්පච්චි, මට අම්මා බලන්න ආපු දවසෙ දුන්නේ හොඳ දඬුවමක් තමයි''**

**''ඒ මොකක්ද තාත්තෙ?''**

වැඩෙන ගසකට පොහොර දමන්නාක් මෙන් නිශානි පියා දිරි ගන්වයි. නිශානිගේ

**''ශානිකාගේ තාත්තාගේ මිනී පෙට්ටිය අපි අපේ කර පිටින්ම ගෙනියන්න ඕන ඒක අපේ යුතුකම''**

දැත් දෙපසට විහිදුවමින් අපැහැදිලි වචන සමග ආ දයාරත්නගේ දෙපා දෙතැනකය. දෙපා එකතැන රඳවා ගැනීමට ඔහු ගත් වෙහෙස අසාර්ථක විය. භ්‍රමණය වන කය ඊට ඉඩ නොදෙන්නා සේය. දයාරත්න පෙට්ටිය අසලට ළං විය. මිනිය එසවීමට අත තැබුවේය. ඔහුත් සමග පෙට්ටියද වැටෙන්නට ගියේය.

සිහි ඇත්තෝ සිහි රඳවා ගත්හ. පැත්තකට බර වූ පෙට්ටිය වැටෙන්නට නොදී සමබර කර ගත්හ.

උරහිසට බර වූ අතක් පියනන්ද පියවි ලොවට කැඳවූයේය. ඒ දයාරත්නය.

**''මේ මචං උඹ කිව්වත් නැතත් මාත් උඹේ මඟුල් ගෙදර ඉන්නවා. ඒකෙ දෙකක් නෑ තේරුණාද?''**

ඒ අණ කිරීමකි.

පියනන්ද අසරණ විය. නිශානි සිහි විය. කළ යුත්තේ කුමක්දැයි සිතා ගැනීමට පවා අසීරුය. ඔහු පමණක් නොව ඔහුගේ බ්ලැක් ලේබල් මිතුරන් දෙදෙනාද එන බව ස්ථිරය.

පියා රසවත් කතාවකට මුල පිරුවේය. එය රසවත් බව ඔහුගේ මුහුණේ ඉරියව්වලින් පියනන්දට තේරුම් ගියේය.

**''හා...හා... පුතේ ඔහොම යන්න දෙන්න බෑ. තව එක වැඩක් තියෙනවා කරන්න කියලා**

**අම්මගෙ අප්පච්චි කියනකොට මං යන්න පිටත්වෙලා බක්කි කරත්තෙට නගින්න පයකුත් උස්සාගෙනයි හිටියේ. ගහෙන් ගෙඩි එන්නා සේ මේ මොකදැයි කියලා මාත් බිරන්තට්ටු වුණා."**

**" ඉතින් .."**

**''ඕං...පුතේ මේ පිහිය අරන් ආං අර තියෙන ගහ කපලා දන්න කියල ගේ දොරකඩ තිබුණ තරමක් ලොකු තම්පලා ගහක් පෙන්නලා කිව්වනෙ මට''**

පියනන්ද නිශානිගේ නිවසට යන එන කාලයේ දිනක් ඇගේ පියා කිව් ඒ සිද්ධිය ඔහුට අලුත් අත්දැකීමක් විය. එද නිශානිගේ පියා යන ගමන නවතා ඇඳුම් ආයිත්තම් ගලවා අමුඩය පිටින් එම අභියෝගයට සතුටින් මුහුණ දුන් හැටිත් නියම ගැමි, ගොවියකු ලෙස තම අභිමානය ඔහු පෙන්වූ සැටිත් පියනන්ද අසා සිටියේ ආඩම්බරයෙනි.

ටිකෙන් ටික අභාවයට යන මෙබඳු විවිධ ක්‍රියාකාරකම් රාශියක් එද පියනන්දට දැන ගන්නට ලැබිණි. ඒ අතරින් වඩාත් රසවත් වූයේ අර්ථවත් වූයේ විනෝදයක් ගෙනදෙන 'මඟුල් තහංචි' ගැන ඔහු අසා සිටියේ නැවුම් ප්‍රබෝධයක්ද සමගය. 'කඩුලු තහංචි, මාළු තහංචි ගැන කළ විස්තරය පමණක් නොව එබඳු අවස්ථාවලට තමාද මුහුණදුන් ආකාරය ඔහු පැවසුවේ උතුරායන සතුටිනි.

ඊටත් වඩා විනෝදාත්මක මඟුල් වදයක් ගැන තොරතුරක් පියනන්ද ඔහුගෙන් දැන ගත්තේය. ගැමි කතා කීමේ හැබෑ බුහුටියාවක් දැක්වූ ඔහු කියූ ඒ සිද්ධියද පියනන්දගේ සිත් ගත්තේය.

**''ඒකෙදි මොකද දන්නවද කරන්නෙ? කකුල් තුනේ පුටුවක එක කකුලකට තියනව කෙහෙල් කොටයක්.''**

**''ඒකෙන් මොකක්ද තාත්තේ බලාපොරොත්තු වෙන්නෙ?''**

**''ඔය සමහර මනමාලයො ඉන්නව කිසිම විචාරයක් නැති, මඟුල් ගෙදරට ආවම ඔහේ කොතනක හරි වාඩිවෙනවා. එහෙම අය වට්ටන්න තමයි ඒ කකුල් තුනේ පුටු කෙහෙල් කොටේට සම්බන්ධ කරලා තියෙන්නේ''**

මෙබඳු මඟුල් වදවලින් මනාලයාගේ ක්‍රියාශීලි බවත්, විචාරශීලී බවත් විමසා බැලීමට පැරැන්නන් උත්සාහ කළ අන්දම පියනන්ද සිහි කළේය. මෙබඳු අවස්ථාවලින් බොහෝ විට සිදුවූයේ අහිංසක ලෙස සිනාසීම පමණි. කිසි ලෙසකත් එයින් හානියක් වීමට ඉඩ තබා නැත.

කාලපරාසයක වෙනස පියනන්ද සිහි කළේය. සමීරලාද කළේ විහිළුය. එහෙත් එය සිහිවත්ම ඔඩුගිය තුවාලයක් මෙන් පියනන්දගේ ගත සිත දෙකම රිදුම් දෙන්නට විය. තව කිනම් මොහොතක හෝ කුමන ආකාරයක අවස්ථාවකට මුහුණ දෙන්නට වේදැයි යන බයක්ද සමග දරුණු සිත් වේදනාවක්ද ඇති වෙයි.

මංගල සාදයේ සතුට දුකක් බවට පත්වෙද්දී ආරාධනා ලැබ පැමිණි බොහෝ දෙනා සමුගැනීමකින් තොරවම පිටව ගියහ. නිවසේ රැඳුණු අය කොතැනක හෝ ඇත. නිශානිගේ ඉකිබිඳුම් හඬද නැසේ. වෙහෙස නිසා ඇයට නින්ද ගොස්වත්ද? කෙනෙක් දෙන්නෙක් වරින්වර උළුවස්ස ළඟට පැමිණ පාර දෙස බලා යති. ඔවුන් පියනන්ද සමග හෝ පියනන්ද ඔවුන් සමග හෝ කතා කළේ නැත. ඔහුට මේ ගෙය නුහුරු නුපුරුදු තැනක් නොවුණත් අද ඔහු මෙහි ආගන්තුකයකු මෙනි.

තවමත් නොකඩවා ඇදහැලෙන වැස්ස අනුකම්පා විරහිත ලෙස පියනන්දට හිරිහැර කරයි. කීස්...කීස්...හඬ නංවමින් වැහි බිඳු ඉස්තෝප්පුව දෙසට වැදෙයි.

'මඟුල් දවස තරුණ හිතක බිම්මල් වගේ මතුවන ආසාවන්, බිය, දෙගිඩියාව, පියනන්දගේ හිතට වැහිබිඳු මෙන් වැටෙයි.

**''මොනවත් වුණොත් තමුසෙයි වග කියන්න ඕන. තේරුණාද? අයියා හාට් කාරය''**

නිශානිගේ මාමාගේ ගෙරවිල්ල හද පසා කරගෙන යයි.

විදුලියත්, ගෙරවිල්ලත්, ඒ එක්කම එක පිට එක වැදුණු අකුණු කිහිපයකින් එකක් පියනන්දගේ පා අසලටම විත් ඉස්තෝප්පුව අයිනට වැදී පුපුරා ගියේය. දෑස් නිලංකාර කරන එළියක් විහිදුවමින් හයියෙන් පැමිණි රථයක් මිදුලේ නතර විය. පියනන්ද ඉදිරියට ආවේය. එය මංගල ගමනට සූදනම් කළ රථයයි. කීපදෙනෙක් එයින් බැස ගත්හ. මහ වැස්සේම ගෙට ගොඩ වූ නිශානිගේ අයියා, මාමා, පියනන්ද ගිල ගැනීමට මෙන් දරුණු බැල්මක් හෙළමින් ගෙට ගියහ.

''බුදු පුතේ...තාත්තා....''

ගෙට ගොඩ වූ නිශානිගේ අම්මා, බදගත්තේ සිතින් දැවී අළු වී ගිය පියනන්දය.

**විශ්‍රාමික පාඨශාලාචාරිනි**
**එච්. එම්. සුජාතා නාලිනී**
**කොස්ගම**

# අඳුර සොඳුරු විය

මෝනිං ඊවිනිං තැන තැන අතට අත
මේ වගෙ සිරිත් සිංහල කම අතර නැත
පෙරදු ආයුබෝවන් කිව් සිරිත වෙත
නැවතත් යොමු කළා "කෝවිඩ්" බලය මත

දැනගත් විට නරක මිනිසුන් ළඟට නොයන්
කළයුතු වෙයි ඇසුර හැමවිට අතර දුරින්
කිව් හැටි පැරණි අය දැන "දහනවය" හොඳින්
නිසි පරතරය තැබුවා "මීටරය" අරෙන්

යනවිට මගතොටෙහි කරමත තිබුණේය
කමතේ කෙතේ එය හිසම ත එතුණේය
නිසි තැන කට නහය නිසි ලෙස වැසුණේය
අද නොව එදත් "මුකවාඩම" තිබුණේය

හැම කල සුවඳ නැහැ පිපි මල් ගුලාවේ
දුක සැප සමව ඇත දිවි මං තලාවේ
පංහිඳ අතට ගත් කල හුදකලාවේ
පෙනුණා රිදී ඉර "කෝවිඩ්" වලාවේ

**ඩී.සී.ඩබ්.එන්. මාබරන**
**ඕපනායක**

# ගිරි කඳුර

මුදුන් තැනකින් පහළ ව
පහත් බිම් පොබයා
ගලා යන දියකඳුරක් සේ
ඔබේ කවිතා වඩී පැහැදුලිව,
රසික සිත් සනහා
පැතිර යනු පිණිස මෙතැන් සිට
මහරු කවි නිමැවුම්
සඳහම විවර වේ.

**නිමැවුම් යොමු කළ යුතු ලිපිනය**
**ගිරිකඳුර, අරුණ පුවත්පත,**
**නො: 91, විජේරාම මාවත, කොළඹ 07.**

**සංස්කරණය**
**අමරසිරි වික්‍රමරත්න**

# ආයාචනයක්

කලා සපිරි පුර සඳවත කිසිම ලෝභකමක් නැතුව
බෙදු හරින සඳ දියරෙන් - නැහැවෙයි සීගිරි පව්වම
අදත් ඇහැළ ගහ පාමුල - බාසුරු පා අද්දර හිඳ
කඳුළු සුසම් හෙළනෙමි මම - සාධාරණයක් පතමින

කාශ්‍යප රජ පෑ අබිමන - තනි වූ ලලනාවන් ගැන
මොනතරමක් ලියන්නැතිද - සිගිරියම කවියක් කර
එක මොහොතක් සිතුවද ඔබ - බෝධි කුමරිගේ දුක ගැන
නිමල පෙමට කඳුළු හෙළන - අනේ අදත් ඈ තනිවම

කුමාරියට බෙම් බැන්දට - පියරජ දුන් දඬුවම ගැන
උත්පලවණ්ණා නැගණිය- සිනහ වුණත් ඔච්චම් කර
හුස්ම පොදින් වන්දි ගෙවූ - මට පෙම් කළ මගෙ හිමි සඳ
අදත් තැවෙමි වැළපෙමි මම - කවුරු බලනු මගේ දුක ගැන

හැමදමත් පෝය සඳට - සීගිරි පව් අසලම මම
සැරිසරමින් සිහි කරනෙමි - රහසේ ගෙතුන පෙම් මල් දම
ස්වර්ණමාලි සෑ රඳුනට - මල් දෝතක් පූජා කර
පතනු මැනවි ලබනත් බැව් - අපි දෙන්නට එකතු වෙන්න

**රේණුකා විජේවික්‍රම**

# රුදුරු දිවි මග

විසල් වූ සයනයේ මුල්ලකට වී නිදන
දරු පැටවු තුන්දෙනා බියෙන් ඇලළී ගිහින්
කිරි බිව්ව පොඩි පුතා
හීනෙනුත් ඉකි ගසයි
රුදු සුරත පහස ලද
රිදුම් දෙන දෙකම්මුල
සෙමෙන් අත ගා බලා
රුහිරු දැවටෙනු දැනිනි
දැඳුරු වූ කැඩපතට කළා එබිකම්
නෙතු විපිලිසර වෙමින්
කොයිමදැයි ඔහු සොයා
ඇස ගැටෙන මානයක
බිඳුණු වීදුරු පිඟන්
විසිර ගිය බත්මාලු
රස බලයි කුහුඹු රැළ
දරු පැටව් කුසගින්නෙ
ගෙවුණු රැය බිකරුය
හෙමි හෙමින් මැකී යන අඳුර බිඳ
අරුණැල්ල ගලා එයි
රැයේ මැදියම මැදින් හොරෙන් පිටමංව ගිය
ගැබ්බර වූ තරුණියක
සමග ඔහු දෙරකඩම
නළලතේ මුදුන් වූ
නෙත් යුගල විමතියෙන්

**අනුලා රූපසිංහ**

# උරුමයක් නැති අයිතියක්


සෙනෙහෙ කළඳක් මගේ සිත් අග
හීනියට යන්තමින් තවරා
රහස් කීවලු නුඹේ අම්මා
තවත් බඹරුන් ළඟට කොඳුරා
වැස්ස නැති ද දිය සොයා උන්
අපේ ගෙපැලට හොරෙන් ඇදුණා
ආදරේ මග හැරුණු තැන්වල
ඉඳලෝලු හතු ජයට පිපුණා
පිපුණු කැකුළක් නටුව සිඳ ද
විසි කරන්නට බැරිම හින්ද
දුවේ ඇයමයි නුඹේ අම්මා
නුඹට පණ දුන් කුසේ රන්ද
කාටවත් හෙම නොකී රහසක්
හදේ නොපෙනෙන තැනක හංගා
අහිමි නොකරම නමේ මුලකුරු
දුන්නෙ නුඹ හට හුස්ම කැන්ද
පිපෙන නුඹෙ මුව සිනහ කැටයම්
මගේ නෙතු අග කඳුළු සින්ද
උරුමයක් නැති අයිතියට නුඹ
වුද්ධිකාරෝ කියා වැන්ද
රැයක දුටුවා සඳේ කැල්මන්
වගේ අකුලක පිපුණු කුසුමක්
කළු වලා පිරි මගේ අහසේ
දුවේ උඹ මට පහන් තරුවක්

**නෙලුකා අතුකෝරල**
**බණ්ඩාරගම**

# මහිමය

අඹරේ පැහැ නිල හින්දයි
වලාවේ සුදු මතුවන්නේ
පෙතිවල ඇති හැඩ හින්දයි
සුවදැති මල් සිත් ගන්නේ
මග ඇති ගල්පර හින්දයි
ගලනා ගඟ හැඩ වෙන්නේ
සිතක් නිසල වන හින්දයි
මුව කමලත් දිදුළන්නේ
නෙක ගස්වැල් සතුන් නිසයි
සොබා සිරිය ඇතිවන්නේ
ගුණවත් මනු කැල හින්දයි
ලොවෙති ගමන පවතින්නේ
දරු කැලගෙ සිනා හඬයි
වියනක් යට සුවදෙන්නේ
බිරිඳකගෙ උණුසුමෙනුයි
පෙමක අරුත උපදින්නේ

**සරත් අබේසුන්දර**
**කෙන්ගල්ල**



# අට ලෝ දහම

පිං පව් දෙක හොඳට දන්න
නමුත් පවට බරව උන්න
දෙවියන්ටත් අයියෙ කියන
මොනරෙක් වුණි හිස ඉඳමුණ
බේබද්දන් සිප සනසන
සලෙළුන් ළඟ උණුසුම්වුණ
මෝඩයන්ව පිස්සො කරන
පිස්සොන්වත් රජ කරවන
වඳින අයව කරට ගන්න
නොවඳින අය දණ ගස්සන
ඔයාගෙමයි කියා පැමිණ
මොහොතින් වෙනතක ඉගිලෙන
දහස් ගණන් බිල් අරගෙන
එක කඳුළක්වත් නොසලන
මහ උළුගෙයි ගිනි තපින්න
නිවරදිවම පාර කියන
රහතුන්ගෙත් සිල් බිඳලන
සර්පයෙකුට සමාන වුණ
උගෙ අල්ලේ හැම නටවන
ඌත් නැටුව උඩඟු කමින
කොරෝනාව ලොවට පැමිණ
මොනරාගේ තටු ගැළවිණ
ළඟට ගන්නටත් බිය විණ
අපුලෙන් හැම ඉවත බැලින
හැමදෙනාට ඉගන ගන්න
අටලෝදම පසක් වෙන්න
සඳලුතලෙන් බිමට වැටුණ
මොනරටත් කොවිඩ් හැදින

**රංජනී අබයකෝන් - පුරුදුවැල්ලේ**

# වයිරසය

පොරණ තතු ඇති බියකි තුන්බිය යටකි වු සඳ විසල්පුරයේ
සමග උරෙනුර ගැටුණු දියතෙහි සිත් සතන් නිති කැලඹූයේ
ගුණය පරයා මුදල සරිකොට ගත් දනන් දුන් නිමිතියේ
නොපසු බට වූ අමත පදමය කාට කාටත් නොවැට හිටියේ

රටේ නොරටෙහි ගම් දනව් නිති අමු සොහොන් මෙනි දිස්වුණේ
බලැති දුබලැති දනන් නසමින් ගගන තලයද හිස්වුණේ
පැල්පතේ රජමැදුරේ මිනියට දෙන්නාගෙය අත් එසවුණේ
නොවිරු කන් ඇති මෙවන් බිහිසුණු මහා විපතකි සිදුවුණේ

පොහොදු පන්සලේ සිටි උවසුන් සහර පොයෙත් හිස්වුණා
ලෙඩට බෙහෙතද දුකට සැපතට සිටි සකියන් දුරුවුණා
චරිත චාරිත සිරිත විරිතද බක්මහේ සැම නැතිවුණා
දුන්නේ අනියත බියකි සැමහට බීල හැඩතිව් කොරෝනා

**අයි.ඩී.එම්. විජේබණ්ඩාර**
**ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය**
**මහනුවර**

# අවුරුද්ද

කුඹුර
කමත කොට
කමතේ
බෝල
ගසද්දී
බඩ පිරෙන්නට
මදි
මේ කිරිබත

**සමන්ත මහතන්තිල**
**රත්නපුර**

# විකුමැස ඇස ගිය කව

## නූතන යශෝධරාවගෙන් නරසීහ ගාථා

සතර පෙර නිමිති නොව,
මපුතු ඉපදුනු පසුව
වැඩූගෙයි තුන් මසක
'කිල්ලි' නොදරනු හැකිව
ඇසළ පුන් පොහොයෙ නොව
අමාවක ගනඳුරක
ඡන්න හා නම් නොවේ
අසල ගම පරඹුවක
හා සමග සන්තොසින්
කන්ථකට නොව දඬු
මොනරයට බරදෙමින්
නේරංජනෙන් නොව
ගම්දෙරෙන් සැඟව ගිය
නුඹගෙ පිය තුමන්මය
අරයන්නෙ වහ වහා..
තම ලෙයින් උපන් උන්
බඩසයින් මොර දෙද්දි
බත් උලක් කිරිපොදක්
පතා සුසුමන් ලද්දි
පරඹුවත මුව පොඩියෙ
හිම කිරම තවරමින්
රසබොජුන් වලඳමින්
අර ඉන්නෙ නුඹෙ පියා
වැරහැලිව දිරාගිය
කඩමාලු හෝ නොමැති
තම දරුත් සීතලෙන්
මිරිකෙමින් විඳවද්දි
සිනිඳු මුදු සේලයෙන්
පරඹුවක සරසමින්
ඇත පියමැන යන්නෙ
පුතනුවනි නුඹෙ පියා.......
විගස දිවගොස් එමග
එල්ලෙමින් සුළැඟිල්ලෙ
ඉල්ලගනු 'එතුමගෙන්'
'දයාද' නොව පුතුනි
නුඹලාට 'නඩත්තු'

**වෛද්‍ය මධුපුෂ්පිකා වීරරත්න**
**ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකය**
**කීරගල කුරුවිට**

# යථාර්ථය

මුතු ඇට සොයා
එලයක් වෙද
ගොහොරු මඩේ
නැත නැත කිසිවිටෙක
වත්සුණු
යකඩ කඩේ
ගී තනු සොයා කුමකට
වවුලෙකුගෙ බඩේ
වැල් මී වැල් දුවන්නේ නැත
කසළ ගොඩේ
මදුවැල්වල නොමැත
මිදිගෙඩි පලගත්තේ
පිරිසිදු දියේ පමණය
පෙණපිඩු ඇත්තේ
ගජමුතු නොමැත පෙනුමට
අල්ලපු වත්තේ
නාමල් හැදෙන්නේ
නාගසකම අත්තේ

**දඹේගොඩ ජිනදාස**

# සුදුස්සෙක්

ඡන්දය දෙන්න නම් අද දෙවියන් පල්ලා
හොර බොරු නොමැති හොඳ මිනිසුන් නැති ඉල්ලා
සුදු පිරුවටය ඇන්දත් අප ඉව අල්ලා
පිරිසිදු අත් තිබෙන මිනිසුන් හොයපල්ලා

**ප්‍රේමසිරි හේවගේ - රද්දොළුගම**

# ඉකිබිඳින මල් ගස

ගස පුරා අතු අගිසි නටුවල
පොකුරු පොකුරු පිපුණු මල් කැල
නැළවි නැළවි වැද පවන් රැල
දිනිඳු රැස් පහසින් රඟන කල

සිත සසල කරවන රුවින්
කිති කවන සුරලිය ගඳින්
පපා ඉඟිබිඟි ඇස් කොනින්
කෝල යෞවනියක ලෙසින්

පැලඳ ගෙල මුතු දෙකන රන්කම්
අඳුන් ගා ඇස් හිසට මල්කම්
විලාසිනියක විලස මනරම්
අහා! සුන්දර වේද කෙතරම්

භක්තිමත් අඳ බාලයෙක් නර
අතුද සිඳ බිඳ කඩන ලෙස මොර
තලා මල් හැම නෙළා පැසි පුර
සොරා ගෙන යයි පතා මොක්පුර

සොරාගෙන ගොස් අපේ පණනල
දෙහොත් දී වැඳ සමිඳු පාමුල
පුදු පින්කම් සිතා පව් කළ
මොවුන් නොමදත් දහම වදහළ

අහෝ! සැමියා මළ සොවින්
පැලඳි අබරණ හැර දමන්
තැවෙන වැන්දඹුවක ලෙසින්
ඉකි බිඳියි මල් ගස හොරෙන්

**රංජිත් වීරසේකර - රාජගිරිය**

# නූපන් සිදුහත්

සුදු පියුමක් අරගෙන විත් මහ රැක
පැදකුණු කරන නුඹෙ සිහිනය දුර ඇත
ඇත් පැටියෙක් එන මග බැලුවත් අවට
මග වැරදිලයි මං ආවේ නුඹෙ කුසට

පස් මහ බැලුම් බැලුවත් සසරේ දිගට
කිම වැරදුණේ මේ භවයේදී මෙමට
මුලකුරු අහිමි දරුවකු අරගෙන අතට
පිළිතුරු බඳින්නේ කොහොමද නුඹ ලොවට

භවයෙන් නික්ම යමි නූපන් හෙට දිනට
දුක්වෙනු එපා පැමිණෙමි යළි නුඹ ළඟට
මහමායා වෙලා එනවද පෙර මගට
සිදුහත් වෙලා මතු එන්නම් ඔය කුසට

**නෙලුකා අතුකෝරල**
**බණ්ඩාරගම**

# නිවන් යෑම

ඇස්දෙක වාගේ රැකගෙන එකම පුතයි උන්නේ
එහෙව් පුතා මහණකමට සාසනේට දුන්නේ
අනේ අපිත් පුතත් එක්ක නිවන් යන්න උන්නේ
එහෙව් පුතා කළිසම ඇඳ උගන්නන්න යන්නේ

පන්සල ළඟ ගෙදර හිටිය පොඩි මැණිකේ කෙල්ලේ
උඹම නේද පොඩි සාදුට ඉනා ගුළිය දුන්නේ
පන්සල පැත්තට ආයෙත් කොහොමද අපි යන්නේ
අපෙ සාදුට පව් නෑ අපි චීවරේට වැන්දේ

**කරුණාතිලක ජයතුංග**
**හලාගිරිය**

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.